Women are not considered to be leaders in BAs, and except for exceptional women entrepreneurs in the accommodation sub-sector, most women entrepreneurs remain, members without holding influential positions in the BAs. Since the accommodation business is more prominent than other businesses, the women entrepreneurs who are engaged in accommodation sector could appear in more influential roles than women in other sub-sectors.

Women entrepreneurs in the food and beverage sector are not nominated for higher-level BA positions, but women entrepreneurs in the tourism-affiliated retail service sub-sector became more interested in BA than other sub-sectors. The present study also confirmed that women are more disadvantaged in accessing business networks and thus join BAs. Women entrepreneurs' connections are constrained since cultural expectations desire women to be good home-makers than income-earners. Hence, women are less likely to be included in informal and high-level connections than men (Brass, 1985).

BAs can encourage to support female entrepreneurs more by providing them with access to training, networks, social support, and bank financing for business growth. Women entrepreneurs could develop confidence and play more prominent and influential roles in BAs by developing strong social support. Women's business associations at the grassroots level can further encourage women to gain self-confidence. Forming structural and psychological empowerment is crucial for active involvement in domestic matters. In that context, entrepreneurs motivated through psychological counselling and adversary programmes to develop their personalities can be created positive attitudes and impacts.

Such activities can make both men and women aware of gendered learning in society and ensure no gender stereotypes, as women are capable of successful employment and career development.

The patriarchal view of women as unsuccessful beings in managing stress impacts women vehemently, limiting their participation and rising into advantageous positions. This suggests the need for substantial progress on women's perception of self-empowerment and, more importantly, alteration of gender norms, roles, and power dynamics, which would help reduce the existing power structures inside BAs. A narrow focus may perhaps worsen them by providing more power to men to control women's powers and decisions. Enhanced policies could be identified among women entrepreneurs, skilled and fit into specific sectors and facilitate them with new strategies to overcome sector-specific barriers identified in this study.

**References**

Acker, Joan. (1990), "Hierarchies, jobs, bodies: A theory of gendered organizations", *Gender & Society* 4(2): 139-158.

Arttachariya, P. (1995), Women managers: Is there room at the top? *ABAC Journal* 15(2): 16-23

Bastian, B.L. and Zali, M. R. (2016), "Entrepreneurial motives and their antecedents of men and women in North Africa and the Middle East", *Gender in Management: An International Journal*, *31*(7), pp.456-478.

Bennett, Robert J. (1998), "Business associations and their potential contribution to the competitiveness of SMEs", *Entrepreneurship & Regional Development: An International Journal*, 10 (3): 243-260.

Brass, D. J. (1985), "Men's and women's networks: A study of interaction patterns and influence in an organization", *Academy of Management journal*, 28(2), pp.327-343.

Cliff, J. E. (1998), "Does one size fit all? Exploring the relationship between attitudes towards growth, gender, and business size", *Journal of business venturing*, 13(6), pp.523-542.

Costa, Eric, António Lucas Soares, Jorge Pinho de Sousa, (2017), "Institutional networks for supporting the internationalisation of SMEs: the case of industrial business associations", *Journal of Business & Industrial Marketing*, Vol. 32(8): 1182-1202.

Department of Census and Statistics (2010), *Sri Lankan Labour Force Survey: Annual Report, 2009,* Colombo*:* Government of Sri Lanka.

Doner, Richard F. and Ben Schneider (2000), *The New Institutional Economics, Business Associations and Development*, Geneva: ILO/International Institute for Labor Studies, DP/110/2000.

Hartman, Dennis, (2017), *The Advantages of a Business Association*. Houston: Hearst Newspapers.

Hearn, J., Piekkari, R. and Jyrkinen, M. (2009), "Managers Talk about Gender: What managers in large transnational corporations say about gender policies, structures and practices", Available at http://hdl.handle.net/10227/476. (Accessed on 12.01.2018).

Hewapathirana, Gertrude I. (2011), "The role of social identity in internationalization of women- owned small businesses in Sri Lanka", *Journal of Asia Business Studies*, Vol. 5(2): 172-193.

Hontz, Eric (ed.) (2009), *Women's Business Associations Experiences from Around the World*, Washington DC: The Center for International Private Enterprise (CIPE).

Hikkaduwa Urban Council (HUC) (2015), *Trade Tax Register*. Hikkaduwa: Hikkaduwa Urban Council.

Jayawardhana, Kishali Pinto and Guneratne,Jayantha de Almeida (Eds.) (2010). *Is Land Just for Women? Critiquing discriminatory laws, regulations and administrative practices relating to land and property rights of women in Sri Lanka*. Colombo: Law & Society Trust.

Keller, B. and Mbewe, D.C. (1991), "Policy and planning for the empowerment of Zambia's women farmers", *Canadian Journal of Development Studies/Revue canadienne d'études du développement*, *12*(1), pp.75-88.

Madurawala, S., Hirimuthugodage, D., Premarathne, D., and Wijayasiri, J. (2016), *Trade Winds of Change. Women Entrepreneurs on the Rise in South Asia.* Bangkok: United Nations Development Programme.

McElwee, G. and Al-Riyami, R. (2003), "Women entrepreneurs in Oman: some barriers to success", *Career Development International*, *8*(7), pp.339-346.

OECD (2012), *Closing the gender gap: Act Now*. Paris: OECD.

Olson, M. (1971), *The Logic of Collective Action: Public Goods and the Theory of Groups*, 2nd edn, Cambridge: Harvard University Press.

Paustian-Underdahl, S.C., Walker, L.S. and Woehr, D.J. (2014), "Gender and perceptions of leadership effectiveness: A meta-analysis of contextual moderators", *Journal of Applied Psychology*, *99* (6), p.1129.

Plaza, Joan Pere, Casilda Gûell and Iván Medina (2014), "Analysis of the present (and impact) of Women in Business Organizations in Contemporary Spanish Democracy. The impact of Spanish Law of Equality Reviewed," *Working Paper 324,* Barcelona: Institut de Ciències Polítiques i Socials.

Ratten, V. and Tajeddini, K., (2018), Women's entrepreneurship and internationalization: patterns and trends. *International Journal of Sociology and Social Policy*, *38*(9/10), pp.780-793.

Richardson, P., Howarth, R. and Finnegan, G. (2004), *The challenges of growing small businesses: Insights from women entrepreneurs in Africa*. Geneva: International Labour Office.

Risseeuw, C., (1992). Gender, kinship and state formation: Case of Sri Lanka under colonial rule. *Economic and Political Weekly*, pp.WS46-WS54.

Schein, V.E. (2007), "Women in management: reflections and projections", *Women in management review*, 22(1), pp.6-18.

Sri Lanka Tourism Development Authority (2017), *Annual Statistical Report of Sri Lanka Tourism – 2016*. Colombo: Sri Lanka Tourism Development Authority.

Still, L.V. and Timms, W. (2000), "Women's business: the flexible alternative workstyle for Women", *Women in Management Review*, 15(5/6), pp.272-283.

Valla, S. (2001), *Barriers facing female entrepreneurs: A study in the Gauteng Province, South Africa*, Doctoral dissertation, University of Johannesburg.

De Vita, L., Mari, M. and Poggesi, S., 2014. Women entrepreneurs in and from developing countries: Evidences from the literature. *European Management Journal*, 32(3), pp.451-460.

Vossenberg, S. (2013), "Women Entrepreneurship Promotion in Developing Countries: What explains the gender gap in entrepreneurship and how to close it". *Maastricht School of Management Working Paper Series*, 8, pp.1-27.

Wellalage, N.H. and Locke, S., (2013), "Women on board, firm financial performance and agency costs", *Asian Journal of Business Ethics*, 2(2), pp.113-127.

Wellalage, N.H., Locke, S. and Scrimgeour, F., (2012), "Does one size fit all? An empirical investigation of board structure on family firms' financial performance", *Afro-Asian Journal of Finance and Accounting*, 3(2), pp.182-194.

ආඛ්‍යාන narrations
**Volume 08 | Issue 01 | January-June 2023 | Article 02**
**ISSN 2478-0642**

On-line Refereed Biannual Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# මහනුවර නාගරික කලාපයේ දෘශ්‍ය සංඥාවලින් නිරූපිත භාෂා භූ දර්ශනය

**ජේ. එම්. කලණ හසන්ත ජයසුන්දර,** පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයල
kalanajayasundara@gmail.com

**මනෝජ් ආරියරත්න,** භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, manojsab@gmail.com

**රත්නසිරි අරංගල,** සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
arangala@sjp.ac.lk

**සාරසංක්ෂේපය**

නූතන ව්‍යවහාරික වාග්විද්‍යා විෂයක්ෂේත්‍රයට භාෂාවේ භාෂණ ව්‍යවහාර පමණක් නොව ලිඛිත (දෘශ්‍ය) ස්වරූපය ද අධ්‍යයනය ද ඇතුළත් වෙයි. ඒ අනුව තෝරා ගන්නා ලද භූමියක හෝ කලාපයක හෝ පොදු හා වාණිජ සංඥා මත පදනම් ව භාෂාවල දෘශ්‍යතා හා ලක්ෂණ අධ්‍යයනය 'භාෂා භූ දර්ශනය' ලෙස හඳුන්වනු ලැබේ. මහනුවර නාගරික කලාපයේ දෘශ්‍ය සංඥා පාදක කොට ගනිමින් භාෂා භූ දර්ශනය අධ්‍යයනය කිරීම මේ පර්යේෂණයේ අභිමතාර්ථය යි. එකී නාගරික අවකාශයේ දෘශ්‍ය සංඥා රාශියක් දක්නට ලැබෙන අතර එහි දී දෘශ්‍ය සංඥා සඳහා භාවිත කෙරෙන භාෂාව ජන වාර්ගික පදනමින් භාවිත කෙරේ ද එසේ නම් එය කෙබඳු පදනමකින්, දෘෂ්ටියකින් භාවිත කෙරේ ද එමගින් නිරූපිත බහුසංස්කෘතික භාෂා සම්බන්ධතාව කුමන ආකාරයක් ගනී ද යන්න මේ පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වේ. මේ අධ්‍යයනයේ දී මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය (Mixed Method) යොදා ගැනුණු අතර,දෘශ්‍ය පර්යේෂණ ක්‍රම (Visual Method) භාවිතය මගින් දත්ත රැස් කිරීම සඳහා අදාළ නාගරික කලාපවලට ගොස් ප්‍රධාන වීදි කිහිපයක් නියෝජනය වන පරිදි වීදි නාම පුවරු, වෙළෙඳ දැන්වීම් පුවරු, රජයේ ගොඩනැගිලිවල නාම පුවරුවල ඡායාරූප ලබා ගන්නා ලදි. මහනුවර නගරයේ ප්‍රධාන වීථිවල ඇති දෘශ්‍ය සංඥා 411ක ඡායාරූප ලබා ගැනිණි. පසු ව ඒ ඡායාරූප ඒකභාෂක, ද්විභාෂක, ත්‍රෛභාෂක ලෙස වර්ග කෙරුණු අතර, මහනුවර දිස්ත්‍රික්කයේ ජන හා සංඛ්‍යාලේඛන දත්ත පදනම් කර ගනිමින් *SPSS* පරිගණක මෘදුකාංගය භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කෙරිණි. එහි දී ලබා ගත් ඡායාරූප 411න් දෘශ්‍ය සංඥා 66%ක් ඉංග්‍රීසි භාෂාව පමණක් යෙදූ දෘශ්‍ය සංඥා ය. දෙවන ප්‍රමුඛතාව හිමි ව ඇත්තේ සිංහල හා ඉංග්‍රීසි භාෂාව පමණක් යෙදූ දෘශ්‍ය සංඥාවලට වන අතර එය 16%කි. මේ ප්‍රදේශයේ බහුතර ජනගහනය සිංහල හා දෙමළ භාෂකයන් වුව ද එම භාෂා ද්වය පමණක් යෙදුණු දෘශ්‍ය සංඥා දක්නට නොලැබිණි. දෙමළ භාෂාව පමණක් ඇති සංඥා දක්නට නොලැබීම ද විශේෂත්වයකි. බහුතර ජනතාවක් කතා කරන සිංහල භාෂාව සහිත දෘශ්‍ය සංඥා ඇත්තේ 4%ක තරම් ඉතා අඩු ප්‍රතිශතයකි. සිංහල-ඉංග්‍රීසි-දෙමළ යන භාෂා ත්‍රයය ම යෙදුණු දෘශ්‍ය

සංඥා 14%කි. ඒ අනුව මහනුවර නාගරික කලාපයේ නිරූපණය වන භාෂා භූ දර්ශනයෙන් ඉංග්‍රිසි භාෂාව ප්‍රමුඛ වී ඇති බව නිගමනය කළ හැකි ය. එමෙන් ම මහනුවර සංචාරක කලාපයක් වන බැවින් ඉංග්‍රිසි භාෂාව ප්‍රමුඛ කොට ගෙන දෘශ්‍ය සංඥා යොදන්නට ඇති බවත් දේශීය ජනයා ඉංග්‍රිසි භාෂාව සමාජ තත්ත්වය නිරූපණය කරනු ඇතැයි දරන දෘෂ්ටිවාදාත්මක ආකල්පය හේතුවෙන් ඉංග්‍රිසි භාෂාව නිල රාජ්‍ය භාෂාවේ ස්වභාවයට පත් වෙමින් පවතින බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** *භාෂා භූ දර්ශනය, දෘශ්‍ය සංඥා, බහුභාෂකත්වය, බහුසංස්කෘතිකතාව, රාජ්‍ය භාෂාව*

**හැඳින්වීම**

භාෂා භූ දර්ශනය (Linguistic landscape) වාග්විද්‍යා ක්ෂේත්‍රයේ මෑත කාලයෙහි උද්භව වූ පර්යේෂණ මාර්ගයකි. සමාජවාග්විද්‍යා අධ්‍යයනයෙහි දී 'භාෂණ ව්‍යවහාරය' ප්‍රධාන මූලාශ්‍රය කොට ගත්ත ද නූතන ව්‍යවහාරික වාග්විද්‍යා අධ්‍යයනයන්හි දී එකී මූලාශ්‍රයවල පරාසය පුළුල් කරමින් භාෂාවේ දෘශ්‍ය සංකේත ද අධ්‍යයන සඳහා පර්යේෂණ නියැදි ලෙස උපයුක්ත කොට ගනු ලැබේ. ඒ අනුව භාෂා භූ දර්ශනය යනු "තෝරා ගන්නා ලද භූමියක හෝ කලාපයක හෝ පොදු සහ වාණිජ සංඥා මත පදනම් ව භාෂාවල දෘශ්‍යතා හා ලක්ෂණ අධ්‍යයනය" ලෙස අර්ථ දැක්වේ (ලැන්ඩ්රි හා බෝර්හිස්, 1997: 23). මේ පර්යේෂණ ක්ෂේත්‍රය නාගරික අවකාශයන්හි, විශේෂයෙන් ද්විභාෂක හා බහුභාෂක සමාජ ඒකකයන්හි ලිඛිත පාඨ භාවිත කිරීමේ දී ව්‍යවහාරික වාග්විද්‍යාව කෙරෙහි වැඩි අවධානයක් දැක්වනු ලැබේ (ශොහාමි 2009 හා ගොටර් 2013). අධිනාගරික කලාපවල සිට ග්‍රාමීය කලාපවල දෘශ්‍ය සංඥා එකී කලාපවල ජන සංයුතියේ ප්‍රක්ෂේපණයක් මෙන් ම එම ජන කණ්ඩායම්වල දෘෂ්ටිවාදී චින්තනයේ ද ප්‍රක්ෂේපණයක් වේ. එබැවින් පොදු මාර්ග සංඥා, වෙළෙඳ දැන්වීම් පුවරු, වීථි නාම, ස්ථාන නාම, වාණිජ ව්‍යාපාර ස්ථාන සංඥා, රජයේ ගොඩනැගිලිවල පොදු සංඥාවල භාෂාව ඒකාබද්ධ වී යම් භූමි ප්‍රදේශයක, කලාපයක හෝ නාගරික සමූහකරණයේ හෝ භාෂාමය භූ දර්ශනය නිර්මාණය කෙරේ (ලැනඩ්රි හා බෝර්හිස්, 1997: 25) යනු මේ විෂයයෙහි මූලික සංකල්පයකි.

භාෂා භූ දර්ශනය සමාජ වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් වුව ද එය සමාජ වාග්විද්‍යාව, සමාජ විද්‍යාව, සමාජ මනෝවිද්‍යාව, භූගෝල විද්‍යාව හා මාධ්‍ය අධ්‍යයනය යන විෂයන්හි සංකලනයක් සේ සැලකේ. යම් ප්‍රදේශයක පොදු හා වාණිජ සංඥාවලින් නිරූපිත භාෂා විශදතාව හා භාෂා දෘශ්‍යතාව භාෂා භූ දර්ශනය යනුවෙන් අදහස් කෙරේ (ලැන්ඩ්රි සහ බෝර්හිස්, 1997: 23). සමාජ වාග්විද්‍යාව හා භාෂා ප්‍රතිපත්ති අධ්‍යයනය යන ක්ෂේත්‍රයන්ට අදාළ සංකල්ප වශයෙන් එය ප්‍රභවය වූයේ විශාල පුරවරයන්හි සිට ඇමසෝනියාව තෙක් බහුභාෂක සමාජවල භාෂාවන්හි දෘශ්‍ය ප්‍රකටනය හා ධුරාවලීකරණය සම්බන්ධ අධ්‍යයන පදනම් කොට ගනිමිනි. ජෙරුසෙලමේ ඇතැම් පොදු සංඥාවන්හි හීබ්රූ, ඉංග්‍රිසි හා අරාබි භාෂා භාවිතය සම්බන්ධයෙන් බර්නාඩ් ස්පොල්ස්කි හා රොබට් කූපර් සිදු කළ අධ්‍යයන මෙහි ආරම්භක අවස්ථාවක් සේ දැක්විය හැකි ය. අනිකුත් විෂය ක්ෂේත්‍රවල පර්යේෂණ සඳහා ද භාෂා භූ දර්ශන පර්යේෂණ දත්ත හා විශ්ලේෂණ අදාළ කර ගත හැකි වීම විශේෂ තත්ත්වයකි. එමෙන් ම භාෂාමය භූ දර්ශනය අධ්‍යයනයෙන් භාෂා තේරීම්, භාෂාවන්හි

ධුරාවලිය, සම්බන්ධතා - සංසිද්ධි, රෙගුලාසි සහ සාක්ෂරතා අංශ කෙරෙහි අවධානය යොමු කිරීමෙන් සමාජ බහුභාෂා පිළිබඳ අපගේ දැනුමට නව මානයක් එක් කෙරේ (ගෝටර්, 2013: 193).

මේ අධ්‍යයනය සඳහා පාදක වන්නේ බහුවාර්ගික, බහුභාෂක හා බහුසංස්කෘතික නගරයක් වන මහනුවර යි. භූගෝලීය වශයෙන් කඳුවලින් වට වූ නිම්නයක පිහිටා ඇති මහනුවර මධ්‍යම පළාතේ ප්‍රධාන නගරය වේ. මහනුවර දිස්ත්‍රික්කය බදුල්ල, නුවරඑළිය, කෑගල්ල, මාතලේ, කුරුණෑගල යන දිස්ත්‍රික්කවලට මායිම් වී පවතී. පහත සිතියම් අංක 1හි මහනුවර පිහිටීම දැක්වෙයි.

**සිතියම් 1:** මහනුවර පිහිටීම




මූලාශ්‍රය: Google Map

වර්ග කිලෝ මීටර් 28.53ක වපසරියක පැතිරුණු මහනුවර දිස්ත්‍රික්කයේ 1375382ක ජනගහනයක් වාසය කරන අතර මේ නගරය බහුවාර්ගික පදනමක් මෙන් ම බහුසංස්කෘතික ස්වභාවයක් ද උසුලයි. මේ අධ්‍යයනයේ දී මහනුවර නාගරික කලාපයේ ව්‍යාපාරික ස්ථාන නාම පුවරු, රාජ්‍ය ආයතනවල නාම පුවරු, මාර්ග නාම පුවරු, පූජනීය ස්ථාන හා සංචාරක ස්ථාන නාම පුවරු දත්ත මූලාශ්‍රය කොට ගනිමින් එමඟින් නිරූපිත භාෂා භූ දර්ශනය අධ්‍යයනය කරනු ලැබේ.

**සාහිත්‍ය විමර්ශනය**

මේ පර්යේෂණයේ දී උපයුක්ත කොට ගැනෙන සාහිත්‍ය මූලාශ්‍රය විෂය ක්ෂේත්‍ර අනුව කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය. එහි දී පර්යේෂණ දත්ත ලබාගැනීමේ හා විශ්ලේෂණය කර ගැනීමෙහි ලා අවශ්‍ය මූලික න්‍යායාත්මක සංකල්ප සංගෘහීත භාෂා භූ දර්ශනය විෂය (Linguistic landscapes) ග්‍රන්ථ සුවිශද ය. ඒ යටතේ Peter Backhaus විසින් රචිත *Linguistic Landscapes: A Comparative Study of Urban*

*Multilingualism in Tokyo* යන ග්‍රන්ථය ප්‍රමුඛ වේ. භාෂා භූ දර්ශනය යනු කුමක් ද යන්න සම්බන්ධ විවරණ හා පීටර් බැක්හවුස් විසින් ජපානයේ ටෝකියෝ නුවර පාදක කොට ගනිමින් සිදු කරනු ලැබූ භාෂා භූ දර්ශනය පිළිබඳ පර්යේෂණය හා එහි දී ඔහු විසින් උපයුක්ත කොට ගනු ලැබූ ක්‍රමවේද හා පර්යේෂකයා මුහුණ දුන් අභියෝග පිළිබඳ කරුණු මෙහි අන්තර්ගත වේ. එය මේ අභිනව පර්යේෂණයට පූර්වාදර්ශයක් ලෙස භාවිත කරන ලදි.

තව ද Durk Gorter විසින් සංස්කරණය කරන ලද *Linguistic Landscape: A New Approach to Multilingualism* කෘතියෙහි ඊශ්‍රායලය, තායිලන්තය, ජපානය, නෙදර්ලන්තය හා ස්පාඤ්ඤය වැනි රටවල නගර පාදක කොට ගනිමින් කරන ලද භාෂාමය භූ දර්ශන පර්යේෂණ පත්‍රිකා පහක් ඇතුළත් වෙයි. Durk Gorterගේ Introduction: The Study of the Linguistic Landscape as a New Approach to Multilingualism යන ලිපිය ද Eliezer Ben-Rafael, Elana Shohamy, Muhammad Hasan Amaraand Nira විසින් සම්පාදිත *'Trumper-Hecht: Linguistic Landscape as Symbolic Construction of the Public Space: The Case of Israel'* යන ලිපිය ද Thom Huebner විසින් සම්පාදනය කෙරුණු *'Bangkok's Linguistic Landscapes: Environmental Print, Code mixing and Language Change'* යන ලිපිය ද Peter Backhaus විසින් ලියන ලද *'Multilingualism in Tokyo: A Look into the Linguistic Landscape'* යන ලිපිය ද Jasone Cenoz හා Durk Gorter විසින් ලියන ලද *'Linguistic Landscape and Minority Languages'* යන ලිපිය ද Durk Gorter විසින් ලියන ලද *'Further Possibilities for Linguistic Landscape Research'* යන ලිපිය ද සංග්‍රහ කරනු ලැබ ඇත. මේ පර්යේෂණයේ පර්යේෂණ ක්‍රමවේදය සකසා ගැනීමට හා දත්ත විශ්ලේෂණයට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා ගැනීමට මේ කෘති ඉවහල් වේ.

*'Linguistic Landscape as a Mirror: the Case of the Slovene Minority in Italy'* මැයෙන් වන පර්යේෂණ පත්‍රිකාව ඉතාලියේ ස්ලෝවිනියානු භාෂාව පාදක කොට ගනිමින් කරන ලද භාෂා භූ දර්ශනය පිළිබඳ පර්යේෂණයකි. මෙමඟින් රටක උපභාෂා ස්වරූපයක් හෝ ප්‍රධාන භාෂාවට අමතර ව පවතින භාෂාවක් භාෂා භූ දර්ශනය යටතේ අධ්‍යයනයට භාවිත කෙරෙන ක්‍රමවේද හා දත්ත විශ්ලේෂණයේ දී සලකා බැලිය යුතු කරුණු පිළිබඳ ව හැදෑරිය හැකි ය. එබැවින් මේ පර්යේෂණයේ භාෂා භූ දර්ශනය පාදක කොට ගැනුණ පර්යේෂණ වපසරියෙහි භාවිත කෙරෙන ශිල්ප ක්‍රම හා ශික්ෂණයන් පිළිබඳ ව දැනුම් රික්තකය පූරණය සඳහා උක්ත පර්යේෂණ පත්‍රිකාව උපයුක්ත කොට ගත හැකි ය.

Samhita Bharadwaj Priyanka Shukla විසින් ඉන්දියාවේ ඇසෑම් ප්‍රාන්තයේ ටෙස්පුර් නගරය පාදක කොට ගනිමින් සිදු කරන ලද *Linguistic Landscaping in North-East India: A Case Study of Tezpur Town in Assam* යන පර්යේෂණ පත්‍රිකාව ද මෙහි ලා මාර්ගෝපදේශයක් ලෙස යොදා ගත හැකි ය. එහි දී ටෙස්පුර් නගරයේ ජන සංයුතිය, එහි භාවිත දෘශ්‍ය සංඥාවල ස්වභාවය, එම සංඥා දත්ත විශ්ලේෂණය හා එම

විශ්ලේෂණයෙන් නිරූපිත භාෂා භූ දර්ශනය යන අංශ සාකච්ඡා කෙරේ. මේ අනුව පැහැදිලිවන්නේ මහනුවර නාගරික කලාපයේ දෘශ්‍ය සංඥාවලින් නිරූපිත භාෂා භූ දර්ශනය පිළිබඳව මෙතෙක් ප්‍රමාණවත් අධ්‍යයනයක් සිදුකර නොමැති බවයි.එම පර්යේෂණ හිඩැස පිරවීම මේ අධ්‍යයනයෙහි අරමුණයි.

**පර්යේෂණ අරමුණු**

- තෝරා ගන්නා ලද නාගරික අවකාශවල දෘශ්‍ය සංඥාවල භාවිත භාෂා අධ්‍යයනය.
- එමගින් දෘශ්‍ය සංඥාවල බහුභාෂකත්වය හා බහුසංස්කෘතිකභාවය අධ්‍යයනය.
- එම දෘශ්‍ය සංඥාවල බහුසංස්කෘතික දෘෂ්ටිවාදී අදහස්, භාෂාව හා සමාජ ආකල්ප හා දෘෂ්ටිවාදාත්මක ප්‍රකාශන අධ්‍යයනය
- එම දෘශ්‍ය සංඥාවලින් නිරූපිත භාෂා සම්බන්ධතා අධ්‍යයනය

**පර්යේෂණ ක්‍රමවේදය**

මහනුවර නාගරික කලාපයේ භාෂා භූ දර්ශනය පිළිබඳ අධ්‍යයනයක් යන මැයෙන් සිදු කරනු ලබන මේ අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය (ප්‍රමාණාත්මක හා ගුණාත්මක) යොදා ගනු ලැබේ. මේ අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද ප්‍රදේශවලට අයත් ජනගහනය, ජනවර්ග, සාක්ෂරතාව ආදි තොරතුරු ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලදි. ඉන් පසු ව දෘශ්‍ය පර්යේෂණ ක්‍රම (Visual Method) භාවිතය මගින් දත්ත රැස් කිරීම සඳහා අදාළ නාගරික කලාපවලට ගොස් ප්‍රධාන වීදි කිහිපයක් නියෝජනය වන පරිදි වීදි නාම පුවරු, වෙළෙඳ දැන්වීම් පුවරු, රජයේ ගොඩනැගිලිවල නාම පුවරුවල ඡායාරූප ලබා ගන්නා ලදි. ඒ අනුව භාෂා භූ දර්ශනය විෂය පාදක කොට ගනිමින් ඡායාරූපවලින් ලබා ගන්නා ලද දත්ත නියැදිය එහි අන්තර්ගත භාෂා අනුව වර්ග කර SPSS නමැති දත්ත විශ්ලේෂණ මෘදුකාංගය ඇසුරෙන් විශ්ලේෂණය කරනු ලැබිණි. එම විශ්ලේෂණයේ දත්ත මත පිහිටා මානව වංශ වාග්විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් සාකච්ඡාව සිදු කෙරේ.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

බහුවාර්ගික හා බහුසංස්කෘතික ඒකකයක් වන මහනුවර නාගරික කලාපයේ දෘශ්‍ය සංඥා පාදක කොට ගෙන එයින් නිරූපිත භාෂා භූ දර්ශනය අධ්‍යයනය කිරීම මෙහි මුඛ්‍යාධාශය යි. 1375382ක ජනගහනයක් වෙසෙන මහනුවර දිස්ත්‍රික්කයේ ජන සංයුතිය පහත දැක්වේ:

**වගුව 1:** මහනුවර දිස්ත්‍රික්කයේ ජන සංයුතිය (2011 සංගණනය)

| ජන වර්ගය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| සිංහල | 1023488 | 75% |
| ශ්‍රී ලංකා දෙමළ | 69210 | 5% |
| ඉන්දියානු දෙමළ | 85111 | 6% |
| ශ්‍රී ලංකා මුස්ලිම් | 191570 | 14% |
| බර්ගර් | 2384 | - |
| මැලේ | 2444 | - |
| ශ්‍රී ලංකා චෙට්ටි | 91 | - |
| භාරත | 33 | - |
| වෙනත් | 1051 | - |
| මුළු සංඛ්‍යාව | 1375382 | 100% |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2011

**ප්‍රස්තාරය 1:** මහනුවර දිස්ත්‍රික්කයේ ජන සංයුතිය (2011 සංගණනය)




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2011

මහනුවර දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 75%ක් සිංහල ජනයා බවත් ශ්‍රී ලංකා මුස්ලිම් ජනයා දෙවනුව වැඩි ම ප්‍රතිශතයක් බවත් ඉහත ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ. සිංහල ජනයා සිංහල භාෂාව ව්‍යවහාර කරන අතර ශ්‍රී ලංකා මුස්ලිම් හා ශ්‍රී ලංකා හා ඉන්දියානු දෙමළ ජනයා ව්‍යවහාර කරන්නේ දෙමළ භාෂාව යි. තව ද මේ කලාපයෙහි ශ්‍රී ලංකා චෙට්ටි, භාරත, මැලේ බර්ගර් ආදි ජන වර්ග වාසය කළ ද එය ප්‍රතිශතයක් ලෙස 1%කට වඩා අඩු

ප්‍රමාණයක් බව පැහැදිලි ය. මේ සියලු ජන වාර්ගික පුරවැසියන්ගෙන් වැඩි ප්‍රතිශතයක් දෛනික භාෂාමය ආචරණවල දී සිංහල ව්‍යවහාර කරන බව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු සංඛ්‍යා ලේඛනවලින් සනාථ වෙයි. මේ දත්ත මහනුවර නාගරික කලාපයේ දෘශ්‍ය සංඥා හා තුලනාත්මක ව අධ්‍යයනය කොට කරන ලද දත්ත විශ්ලේෂණය පහත දැක්වේ.

**වගුව 2:** මහනුවර නාගරික කලාපයේ දෘශ්‍ය සංඥා

| භාෂාව | දෘශ්‍ය සංඥා සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| සිංහල | 16 | 4% |
| දෙමළ | 0 | - |
| ඉංග්‍රිසි | 269 | 66% |
| සිංහල - දෙමළ | 1 | - |
| සිංහල - ඉංග්‍රිසි | 66 | 16% |
| ඉංග්‍රිසි - දෙමළ | 0 | - |
| සිංහල - දෙමළ-ඉංග්‍රිසි | 59 | 14% |
| එකතුව | 411 | 100% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**ප්‍රස්තාරය 2:** මහනුවර නාගරික කලාපයේ දෘශ්‍ය සංඥා




මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

වගු අංක 2හි දක්වා ඇති පරිදි මහනුවර නාගරික කලාපයෙන් දෘශ්‍ය සංඥා 411ක් ලබා ගත් අතර එයින් ඉහළ ම ප්‍රතිශතයක් නියෝජනය කරන භාෂාව වන්නේ ඉංග්‍රිසි භාෂාව යි. එය 66%කි. දෙවනු ව ප්‍රමුඛතාව හිමිව

ඇත්තේ සිංහල හා ඉංග්‍රිසි මිශ්‍ර දෘශ්‍ය සංඥා සඳහා ය. එය 16%කි. සිංහල-දෙමළ-ඉංග්‍රිසි යන භාෂා තුන ම අන්තර්ගත දෘශ්‍ය සංඥා 14%ක ප්‍රමාණයක් දක්නට ලැබේ. ඒ අනුව වැඩි ම දෘශ්‍ය සංඥා ප්‍රමාණයක් ඒකභාෂක වන අතර ඉංග්‍රිසි භාෂාව ඒ සඳහා භාවිත කරනු ලැබ ඇත.

**ඒකභාෂක දෘශ්‍ය සංඥා (Monolingual Visual Signs)**

මහනුවර නාගරික අවකාශයේ ප්‍රදර්ශිත දෘශ්‍ය සංඥාවල ඉංග්‍රිසි භාෂාවට ප්‍රමුඛත්වය හිමි ව ඇත. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සිංහල හා දෙමළ භාෂාව රාජ්‍ය භාෂා වන අතර ඉංග්‍රිසිය සම්බන්ධීකරණ භාෂාව ලෙස නම් කර ඇත. එසේ වුව ද මේ නියැදිය පරික්ෂා කොට බැලීමේ දී ඉංග්‍රිසි භාෂාව ප්‍රමුඛ හෙවත් ‘රාජ්‍ය භාෂා තත්ත්වයට පත්ව ඇති බව විශද වේ. ප්‍රතිශතයක් ලෙස දෘශ්‍ය සංඥාවලින් 66%ක ප්‍රතිශතයක් ඉංග්‍රිසි පමණක් ප්‍රධන භාෂාව ලෙස භාවිත කරනු ලැබුව ද මේ අවකාශයේ බහුතර ජනවර්ගය වන්නේ සිංහල ජනයා බව වගු අංක 1 පිරික්සීමේ දී පැහැදිලි වේ. එසේ ම ක්ෂේත්‍ර පරික්ෂාවේ දී දෙමළ හා මුස්ලිම් බහුතරයක් ජනයා සම්බන්ධීකරණ භාෂාව ලෙස එදිනෙදා ව්‍යවහාර කරනුයේ ද සිංහල භාෂාව බවත් එකී සුළුජන වර්ග බොහෝ දෙනා අවම වශයෙන් ද්විභාෂකයන් බවත් නිරීක්ෂණය කෙරිණි. එසේ වුව ද පහත දෘශ්‍ය සංඥා දෙස බැලීමේ දී ඉංග්‍රිසිය ප්‍රමුඛස්ථානයට පත් ව ඇති බව ප්‍රකට වෙයි.

**ඡායාරූප 1, 2 සහ 3:** ව්‍යාපාරික ස්ථාන දෘශ්‍ය සංඥා




මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

ඉහත ඡායාරූප ත්‍රයය ම ඉංග්‍රිසි ඒකභාෂක දෘශ්‍ය සංඥා වන අතර ඒවා සියල්ල ඉංග්‍රිසි හෝ යුරෝපීය සම්භවයක් සහිත සංඥා නාම භාවිත කර ඇති බවත් ලිපිනය දැක්වීමේ දී පමණක් සිංහල නම් ඉංග්‍රිසි (රෝමන්) අක්ෂර භාවිත කොට ලියා ඇති බවත් නිරීක්ෂණය කළ හැකි ය.

**ඡායාරූප 4:** රජයේ පාසලක දෘශ්‍ය සංඥා




මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

ඡායාරූප අංක 4 දක්වා ඇත්තේ මහනුවර නාගරික කලාපයේ රජයේ ප්‍රසිද්ධ සිංහල මාධ්‍ය බෞද්ධ පාසලකි. එබැවින් රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක විය යුතු ස්ථානයක් වුව ද එහි ප්‍රධාන නාම පුවරුව ඉංග්‍රිසි භාෂාවෙන් පමණක් ප්‍රදර්ශනය කිරීමෙන් පාසලේ සමාජ පංති තත්ත්වය විද්‍යමාන කිරීමට උත්සාහ ගන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

මහනුවර නාගරික අවකාශයේ ඒකභාෂක දෘශ්‍ය සංඥාවලින් නිරූපිත දෙවන භාෂාව වන්නේ සිංහල භාෂාව යි. එය දෘශ්‍ය සංඥා 411න් 16කි. ප්‍රතිශතයක් ලෙස 4%කි. සිංහල පමණක් යොදා ගනු ලැබූ දෘශ්‍ය සංඥා දක්නට ලැබෙන්නේ බෞද්ධ ආගමික ස්ථාන කිහිපයක හා ව්‍යාපාර ස්ථාන කිහිපයක පමණි.

**ඡායාරූප 5 සහ 6:** බෞද්ධ ආගමික ස්ථාන දෘශ්‍ය සංඥා




මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

ඉහත ඡායාරූපවලට අමතර ව වාණිජ දෘශ්‍ය සංඥා කිහිපයක් ද පහත දැක්වේ.

**ඡායාරූප 7, 8 සහ 9:** වාණිජ දෘශ්‍ය සංඥා








මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**ද්විභාෂක දෘශ්‍ය සංඥා (Bilingual Visual Signs)**

මහනුවර නාගරික කලාපයෙන් එකතු කර ගන්නා ලද දෘශ්‍ය සංඥා 411 ද්විභාෂක නියැදි ලෙස වර්ග කිරීමේ දී සිංහල-දෙමළ, දෙමළ-ඉංග්‍රිසි, සිංහල-ඉංග්‍රිසි ලෙස වර්ග කරනු ලැබ ඇත. මේ කලාපය සිංහල-දෙමළ භාෂක සමාජයක් වුව ද නියැදියෙහි දක්නට ලැබෙනුයේ සිංහල-දෙමළ දෘශ්‍ය සංඥා 1ක් පමණි. එය සමස්ත නියෝජනයෙන් 1%ට වඩා අඩු ය. දෙමළ-ඉංග්‍රිසි දෘශ්‍ය සංඥා 1ක් වත් නියැදියෙහි දක්නට නොලැබේ. සිංහල-ඉංග්‍රිසි දෘශ්‍ය සංඥා 16%ක නියෝජනයක් දක්නට ලැබේ.

**ඡායාරූප 10:** සිංහල-ඉංග්‍රිසි භාෂා භාවිත දෘශ්‍ය සංඥා




මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

ඡායාරූප අංක 10 සිංහල-ඉංග්‍රීසි භාෂා භාවිත දෘශ්‍ය සංඥා සඳහා විශේෂ නිදර්ශනයක් සේ සැලකිය හැකි ය. එහි "රෙපයාර් සෙන්ටර් ඇන්ඩ් පවර්ටූල්" යන්න සිංහල අක්ෂර භාවිතයෙන් කරන ලද ශබ්ද ප්‍රතිලේඛනයකි ('Transliteration'). මෙය ශ්‍රී ලංකාවේ බොහෝ දෘශ්‍ය සංඥාවල දැකිය හැකි ලක්ෂණයකි. මහනුවර නාගරික අවකාශයේ මෙවැනි ද්විභාෂක සංඥා බහුල ව දැකිය හැකි ය.

**ඡායාරූප 11:** සිංහල-ඉංග්‍රීසි භාෂා භාවිත දෘශ්‍ය සංඥා




මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

ඉහත අංක 11 ඡායාරූපයෙහි නිරූපිත දෘශ්‍ය සංඥාවෙහි සිංහල හා ඉංග්‍රීසි භාෂා භාවිත වුව ද ඉංග්‍රීසි අක්ෂර කැපී පෙනෙන සේ විශාල ප්‍රමාණයෙන් යොදා ඇත. සිංහල අක්ෂර ඊට වඩා බොහෝ කුඩා ලෙස යොදා ඇත. එවැනි දෘශ්‍ය සංඥා ද බොහෝමයක් මෙහි දී නිරීක්ෂණය කළ හැකි විය. මෙසේ ඉංග්‍රීසි භාෂාවේ වචන හා අක්ෂර තත්සම ව යෙදීමත් ඉංග්‍රීසි වචන සිංහල අක්ෂරවලින් යෙදීමත් ඉංග්‍රීසි භාෂාව ඉස්මතු ව පෙනෙන සේ යෙදීමත් පරීක්ෂා කර බැලීමේ පැහැදිලි වන්නේ එය හුදෙක් සමාජීය සන්දර්භයේ භාෂකයන් ඉලක්ක කරමින් යොදන ලද අලෙවිකරණ උපක්‍රමයකට වඩා ඉංග්‍රීසි භාෂාව නිල නොලත් අයුරින් ප්‍රමුඛ වෙමින් රාජ්‍ය භාෂාවේ ස්වභාවයට පත් වෙමින් පවතින බවත් ය. අනෙක් අතට ස්වභාෂාවට වඩා ඉංග්‍රීසිය උසස් සමාජ තත්ත්වයක් පෙන්නුම් කරනු ඇතැයි දරන දෘෂ්ටිය විය හැකි ය.

**බහුභාෂක දෘශ්‍ය සංඥා (Multilingual Visual Signs)**

බහුභාෂකත්වය යනුවෙන් අදහස් කෙරෙන්නේ භාෂා දෙකකට වැඩියෙන් හැසිරවීමේ හැකියාව යි. මහනුවර දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහනයෙන් 75%ක් සිංහල ජනයා වන අතර ඉතිරි 25%ට දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ, භාරත, ශ්‍රී ලංකා චෙට්ටි යන ජනවර්ග අයත් වේ. මෙයින් බොහෝ භාෂකයන් ව්‍යවහාර කරන්නේ සිංහල හෝ දෙමළ භාෂාව යි. ඉහත වගු අංක 2ට අනුව සිංහල-දෙමළ-ඉංග්‍රීසි යන භාෂා ත්‍රයයෙන් ම යෙදුණු දෘශ්‍ය සංඥා ඇත්තේ 59ක් පමණි. එය 14%කි. එම දෘශ්‍ය සංඥා අධ්‍යයනය කිරීමේ දී එකී පුවරුවල භාෂා ප්‍රමුඛ වී ඇති ආකාරය අධ්‍යයනය කිරීමේ දී සාපේක්ෂ වශයෙන් වැඩි දෘශ්‍ය සංඥා ප්‍රමාණයක ඉංග්‍රීසි භාෂාවට ප්‍රමුඛතාව ලබා දී ඇති බව පෙනී යයි.

**ඡායාරූප 12, 13 සහ 14:** රන් ආභරණ වෙළෙඳසැලක සහ රාජ්‍ය බැංකු නාම පුවරු දෘශ්‍ය සංඥා










මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

අංක 12 ඡායාරූපය රන් ආභරණ වෙළෙඳසලක් වන අතර 13 වන ඡායාරූපය රාජ්‍ය බැංකුවක් වන ලංකා බැංකුව යි. බැංකුව පිහිටි ගොඩනැගිල්ලේ ඉහළින් ම විශාල අකුරින් BOC යනුවෙන් යොදා දෙවනුව ඊට වඩා තරමක් කුඩා සිංහල අක්ෂරවලින් ලංකා බැංකුව ලෙස යොදා ඇත. 14 වන ඡායාරූපයේ දැක්වෙන මහජන බැංකුව ද ඉංග්‍රීසි ප්‍රමුඛ කොට ගෙන ඇති බව නිරීක්ෂණය වේ. රාජ්‍ය ආයතනවල අනිවාර්යයෙන් රාජ්‍ය භාෂා පනතට අනුව ක්‍රියාත්මක විය යුතු වුව ද ඒවායේ ද නාම පුවරු පවා ඉංග්‍රීසි ප්‍රමුඛ කොට ගන්නා ආකාරය විද්‍යමාන වේ.

පෞද්ගලික බැංකු කිහිපයක නාම පුවරු කිහිපයක් පහත දැක්වේ.

**ඡායාරූප 15 සහ 16:** පෞද්ගලික බැංකු නාම පුවරු දෘශ්‍ය සංඥා







මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

ඉහත පෞද්ගලික බැංකු නාම පුවරු (15-16 ඡායාරූප) සිංහල භාෂාව ප්‍රමුඛ කොට යොදා ඇත. කෙසේ වුවත් මහනුවර නාගරික අවකාශයේ බහුභාෂක දෘශ්‍ය සංඥා තුලනාත්මකව අධ්‍යයනය කිරීමේ දී සමස්ත නියැදියෙන් 14%ක් වැනි අඩු අගයක් නියෝජනය වීම බහුවාර්ගිකත්වයට හා බහුසංස්කෘතිකතාවට බාධාවක් බව පෙන්වා දීම යුක්ති යුක්ත ය.

**මාර්ග නාම පුවරු හා රාජ්‍ය ආයතනවල නාම පුවරු**

මේ නාගරික අවකාශයේ තැපැල් කාර්යාලය, ජාතික රෝහල, පොලිස් ස්ථානය, මහජන පුස්තකාලය, උසස් තාක්ෂණ ආයතනය, විදුලිබල මණ්ඩලය, දුම්රිය පොළ, පාසල් ආදි රාජ්‍ය ආයතන පිහිටා ඇත. එම රාජ්‍ය ආයතනවල නාම පුවරු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව සිංහල-දෙමළ-ඉංග්‍රිසි යන භාෂා ත්‍රයයෙන් යොදනු ලැබ ඇති බව පෙනී යයි.

**ඡායාරූප 17, 18 සහ 19:** මාර්ග නාම පුවරු දෘශ්‍ය සංඥා




මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

මහනුවර පිහිටි රාජ්‍ය අයතනවලට අමතර ව මාර්ග නාම පුවරු නිරීක්ෂණය කිරීමේ දී එක් මාර්ග නාම පුවරුවක් හැර අනෙක් සියලු මාර්ග නාම පුවරුවක ම සිංහල-දෙමළ-ඉංග්‍රිසි යන භාෂා භාවිත කර ඇති බව පැහැදිලි විය. ඒ අනුව මාර්ග නාම පුවරු ද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුගත ව යොදා ඇති බව නිගමනය කළ හැකි ය. 411ක් වූ නියැදියෙහි මාර්ග නාම පුවරු 8ක් ඇතුළත් වන අතර ඉන් 1ක් පමණක් සිංහල පමණක් යොදා ඇති අතර ඊට නිශ්චිත හේතුවක් හඳුනා ගත නොහැකි ය. ඒ මාර්ග නාම පුවරුව පහත 20 වන ඡායාරූපයේ දැක්වේ. 21 ඡායාරූපය භාෂා ත්‍රයය ම යෙදුණු සංඥාවලට නිදසුනකි.

**ඡායාරූප 20:** එක භාෂක දෘශ්‍ය සංඥා




මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**ඡායාරූප 21:** භාෂාත්‍රයය ම යෙදුණු දෘශ්‍ය සංඥා




මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

මේ අධ්‍යයනය කේන්ද්‍රගත වන්නේ මහනුවර නාගරික කලාපයේ දෘශ්‍ය සංඥා මඟින් නිරූපිත භාෂා භූ දර්ශනය කෙරෙහි ය. මේ නාගරික කලාපය බහුවාර්ගික හා බහුසංස්කෘතික සමාජයක් වන නමුත් දෘශ්‍ය සංඥා අධ්‍යයනයේ දී සිංහල-දෙමළ යන බහුතර ව්‍යවහාර භාෂා වෙනුවට ඉංග්‍රීසි භාෂාව ප්‍රමුඛ වී ඇති බව පැහැදිලි ය. එය එක්තරා අතකින් ඉංග්‍රීසි භාෂාව කෙරෙහි එම කලාපයේ ජනයා දක්වන යහපත් ධනාත්මක ආකල්පයක් විය හැකි ය. එසේත් නැති නම් එය ඉහළ සමාජ තත්ත්වයක් ප්‍රකට කරන බවට සමාජයෙහි පවතින දෘෂ්ටිවාදී ආකල්පයක් විය හැකි ය. කෙසේ වුවත් ඉංග්‍රීසි භාෂාව ප්‍රමුඛ වීමට බල පානු ඇතැයි උපකල්පනය කළ හැකි තවත් ප්‍රධාන සාධකයක් ඇත. එනම් මහනුවර ශ්‍රී ලංකාවේ අවසාන රාජධානියේ අගනුවර වීමත් එය ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාපයක් බවට පත් ව තිබීමත් ය. වසරකට විශාල සංචාරකයන් ප්‍රමාණයක් මේ

නාගරික කලාපයේ සංචාරය කරන බැවින් ව්‍යාපාරිකයන් සංචාරකයන් ඉලක්ක කිරීමේ අරමුණෙන් ස්වකීය ව්‍යාපාරයේ නාම පුවරු සඳහා ඉංග්‍රිසි භාෂාව හා රෝමන් අක්ෂර යොදා ඇතැයි උපකල්පනය කළ හැකි ය.

**නිගමනය**

භාෂා භූ දර්ශන අධ්‍යයනය යනු දෘශ්‍ය සංඥා මත පිහිටා භාෂා සම්බන්ධතා හා ලක්ෂණ අධ්‍යයනය යි. මේ අධ්‍යයනයේ දී මහනුවර නාගරික කලාපයේ දෘශ්‍ය සංඥා කෙරෙහි යොමු විය. දිස්ත්‍රික්කයේ බහුතර ජන වර්ගය සිංහල වන අතර එය 75%කි. ශ්‍රී ලංකා මුස්ලිම් ජනයා දෙවනුව වැඩි ම ප්‍රතිශතයකි. සිංහල ජාතිය සිංහල භාෂාව ව්‍යවහාර කරන අතර ශ්‍රී ලංකා මුස්ලිම් හා ශ්‍රී ලංකා හා ඉන්දියානු දෙමළ ජනයා ව්‍යවහාර කරන්නේ ද දෙමළ භාෂාව යි. තව ද මේ කලාපයෙහි ශ්‍රී ලංකා චෙට්ටි, භාරත, මැලේ බර්ගර් ආදි ජන වර්ග වාසය කළ ද එය ප්‍රතිශතයක් ලෙස 1%කට වඩා අඩු ප්‍රමාණයකි. මේ සියලු ජන වර්ග සමාජීය කටයුතුවල ව්‍යවහාර කරනුයේ සිංහල භාෂාව වුව ද දෘශ්‍ය සංඥා නියැදිය සඳහා දෘශ්‍ය සංඥා 411ක් යොදා ගැනුණු අතර එයින් 66%ක ප්‍රතිශතයක් ඉංග්‍රිසි-රෝමන් අක්ෂර සහිත ඒකභාෂක දෘශ්‍ය සංඥා වේ. සිංහල පමණක් යෙදූ දෘශ්‍ය සංඥා 4%ක් තරම් අවම ප්‍රමාණයක් දක්නට ලැබිණි. ද්විභාෂක (ද්ව්‍යක්ෂර) දෘශ්‍ය සංඥා ප්‍රමාණය ද 16%ක (සිංහල-ඉංග්‍රිසි) වැනි අවම ප්‍රමාණයකි. මේ කලාපය බහුභාෂක කලාපයක් වුව ද ත්‍රෛභාෂක (සිංහල-දෙමළ-ඉංග්‍රිසි) දෘශ්‍ය සංඥා දක්නට ලැබුණේ 14%ක අවම ප්‍රමාණයකි. ඒ අනුව මහනුවර නාගරික කලාපයේ නිරූපණය වන භාෂා භූ දර්ශනයෙන් ඉංග්‍රිසි භාෂාව හා රෝමන් අක්ෂර ප්‍රමුඛ වී ඇති බව නිගමනය කළ හැකි ය. එමෙන් ම මහනුවර සංචාරක කලාපයක් වන බැවින් ඉංග්‍රිසි බස හා රෝමන් අක්ෂර ප්‍රමුඛ දෘශ්‍ය සංඥා යොදන්නට ඇති බවත් දේශීය ජනයා ඉංග්‍රිසිය (බස හා අක්ෂර රූප) ඉහළ සමාජ තත්ත්වයක් නිරූපණය කරන්නකැයි දරන දෘෂ්ටිවාදාත්මක ආකල්පය හේතුවෙන් ඉංග්‍රිසි භාෂාව නිල රාජ්‍ය භාෂාවේ ස්වභාවයට පත් වෙමින් සිටින බවත් නිගමනය කළ හැකි ය.

**සමුද්දේශ**


Backhaus, P. (2005) *Signs of Multilingualism in Tokyo: A Linguistic Landscape Approach*. PhD thesis, University of Duisburg-Essen.

Ben-Rafael, E., *et.al.,* (2001) *Linguistic Landscape and Multiculturalism: A Jewish-Arab Comparative Study (Final report)*. Tel Aviv: The Tami Steinmetz Center for Peace Research.

Ben-Rafael, E., *et.al.,* (2006) Linguistic landscape as symbolic construction of the public space: The case of Israel. *International Journal of Multilingualism* 3 (1), 7–30.

Cenoz, J. and D. Gurter, (2006) Linguistic landscape and minority languages, *International Journal of Multilingualism*3 (1), 67–80

Gorter, D. (2006) Introduction: The study of the linguistic landscape as a new approach to multilingualism. *International Journal of Multilingualism* 3 (1), 1–6.Gottlieb, N. (1995) Kanji

Politics: Language Policy and Japanese Script. London and New York: Kegan Paul International.

Kutlay Yagmur , K.,et.al (1999) Language Attrition, Language Shift and Ethnolinguistic Vitality of Turkish in Australia, *Journal of Multilingual and Multicultural Development*, 20:1, 51-69, DOI: 10.1080/01434639908666369

Landry, R. and R.Y. Bourhis, (1997) Linguistic landscape and ethnolinguistic vitality, *Journal of Language and Social Psychology* 16 (1), 23–49.

Saussure, F. de (1916) *Course in General Linguistics* (C. Bally, A. Sechehaye, andA. Riedlinger (eds); W. Baskin, English trans., 1966). London: McGraw-Hill.

Shukla, Samhitha Bharadwaj Priyanka, 'Linguistic Landscaping in North-East India: A Case Study of Tezpur Town in Assam', *Indian Journal of Applied Linguistics*, Vol. 44, Nos. 1-2, Jan-Dec 2018.

Spolsky, B. and R. L. Cooper, (1983) The languages of Jerusalem: Arab–Jewish relations in the Old City. Research report to the Ford Foundation, Bar-IlanUniversity.

Spolsky, B. and R. L. Cooper, (1991) *The Languages of Jerusalem*. Oxford: Clarendon Press.

Spolsky, B. and E. Shohamy, (1999) *The Languages of Israel: Policy, Ideology and Practice*, Clevedon: Multilingual Matters.

https://www.britannica.com/science/ethnolinguistics

*https://www.lexico.com/definition/sign*

ධර්මදාස, කේ. එන්. ඕ., (1972) 2009, භාෂාව හා සමාජය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ.

ආඛ්‍යාන narrations
**Volume 08 | Issue 01 | January-June 2023 | Article 03**
**ISSN 2478-0642**

On-line Refereed Biannual Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියෙහි සාර්ථකත්වයට ආයතනික ධාරිතාවයේ බලපෑම

**ඩබ්ලිව්. එච්. එස්. එල්. විරාජිනි,** සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,
lak.sanduni97@gmail.com

**ජී. සී. එල්. පතිරණ,** සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,
pathiranaakash@gmail.com

**සාරසංක්ෂේපය**

තොරතුරු තාක්ෂණය දැනටමත් බොහෝ කර්මාන්තවල විප්ලවීය වෙනසක් සිදුකර ඇත. පසුගිය දශක දෙක තුළ එය බොහෝ අංශවල සංවර්ධනයේ කොඳු නාරටිය බවට ද පත් වූ අතර, ඉ-රාජ්‍ය යනු එහි එක් අංශයකි. රාජ්‍ය පරිපාලනයේ කාර්යක්ෂමතාවය සහ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ඉ-රාජ්‍ය සංකල්පය යොදා ගනු ලබයි. ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියේ සාර්ථකත්වය සඳහා ආයතනික ධාරිතාවයේ බලපෑම කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම මුඛ්‍ය අරමුණ කර ගනිමින් පරීක්ෂණය සිදු කරන ලදී. මෙම අධ්‍යයනය ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත මත පදනම්ව සිදු කර තිබේ. ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී. නියැදි ප්‍රමාණය සියයක් වන අතර එය, දකුණු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ හා ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල සේවක තිස් දෙනකු හා මහජනතාව හැත්තෑදෙනකුගෙන් සමන්විත විය. එසේම පොත්, සඟරා,ලිපි ලේඛන, අන්තර්ජාලය හරහා ද්වීතීයික දත්ත ලබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේදී තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය, සන්දර්භීය විශ්ලේෂණ ක්‍රමය හා ආඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමය භාවිතා කරන ලද අතර දත්ත ඉදිරිපත් කිරීම ප්‍රස්තාර, වගු, රූප සටහන් මත පදනම්ව සිදු කරන ලදී. මෙම අධ්‍යයනය තුළ දී ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන්හි සාර්ථකත්වය සඳහා ආයතනික ධාරිතාවය බලපාන බව සොයාගන්නා ලදී. විශේෂයෙන් පුහුණු මානව සම්පත, ප්‍රමාණවත් යටිතල පහසුකම්, අන්තර්සබඳතාවය, කාර්ය සාධනය යන සාධක ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන්හි සාර්ථකත්වයට බලපෑම් කරනු ලබයි. මෙම සොයාගැනීම් මත පදනම්ව අධ්‍යයනය ඇසුරෙන් නිගමනය කරනු ලැබුයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ආයතනික යන්ත්‍රණයෙහි ශක්තීන් හා හැකියාවන් නොමැතිව නිර්දිෂ්ට ප්‍රතිපත්තියෙහි අපේක්ෂිත අරමුණු

සාධනය අභියෝගාත්මක වන බවයි. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියෙහි සාර්ථක ක්‍රියාත්මකවීමක් සඳහා නම්‍යශීලී, ස්ථාපිත, නෛතික පදනමක් සහිත ශක්‍යතාවයකින් යුත් ආයතනික ව්‍යුහයක් පැවතිය යුතුය.

**ප්‍රමුඛ පද:** *ඉ-රාජ්‍ය, ආයතනික ධාරිතාවය, ප්‍රතිපත්ති, කාර්යක්ෂමතාවය*

**හැඳින්වීම**

ගෝලීයකරණයේ ඍජු හා වක්‍ර බලපෑම් රාජ්‍යයන්හි පාලනයට බලපෑම් කිරීමක් දැකගත හැකි අතර, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ (Information and Communication Technology) දියුණුව පාලන ක්ෂේත්‍රයට සහ විද්‍යුත් පාලන සංකල්පයට නව මානයක් එක් කර ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වෙන කවරදාටත් වඩා වේගයෙන් සංවර්ධනය වෙමින් පවතින අතර මේවා සංවර්ධන ක්‍රියාවලියට උපකාරී වේ. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල අකාර්යක්ෂමතාව සහ අඩු ඵලදායිතාව හේතුවෙන් සම්ප්‍රදායිකව විවේචනයට ලක්වන පරිපාලන සේවය විප්ලවීය වෙනසක් සිදු කරමින් රාජ්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ඉ-රාජ්‍ය පිළිගෙන ඇත. තව ද වැඩි වන ඩිජිටල් සාක්ෂරතා අනුපාතය සහ අන්තර්ජාලය විනිවිද යාමත් සමඟ පහසු උපාංග නිර්මාණය වීමත් සමඟ වැඩි කාලයක් ගත වන මිල අධික කඩදාසිමත පදනම් වූ සේවාවන් වෙනුවට මාර්ගගත සේවාවන් තෝරාගනියි. එහි ප්‍රතිඵලයක් ලෙස ගුණාත්මකභාවය ඉහළ නැංවීම, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, විනිවිදභාවය සහ වැඩි සාධාරණත්වය සඳහා දායක වන ඉ-රාජ්‍ය සංකල්පය ඉදිරිපත් වී ඇත. ඒ අනුව ඉ-රාජ්‍ය යනු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නවතම තාක්ෂණික අංශ සමඟ අත්වැල් බැඳ ගනිමින් සාමාන්‍ය ජනතාවට සපයනු ලබන රාජ්‍ය සේවාවන්හි කාර්යක්ෂමතාවය හා සඵලතාව ඉහළ නැංවීම අරමුණු කරගත් ලොව පුරා ඉතා ඉහළින් ක්‍රියාත්මක වන විද්‍යුත් සංකල්පයකි.

වර්තමානය වන විට තොරතුරු සන්නිවේදන තාක්ෂණය සමාජයේ සියලුම ක්‍රියාකාරකම් තීරණය කරන ප්‍රධාන සාධකයක් වී ඇත. ඒ අනුව රාජ්‍ය පරිපාලනය සඳහා වු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විද්‍යුත් රාජ්‍යයකට මඟ පෑදී ඇත.එමගින් තොරතුරු ඵලදායි ලෙස යොදා ගැනීමට පුරවැසියන්ට පහසු වේදිකාවක් බවට පත් කරනු ලබයි.තාක්ෂණික වශයෙන්, විද්‍යුත් ආණ්ඩුකරණය පුරවැසියන්ට බොහෝ වාසි ලබා දෙයි. එය රජයේ සේවාවන් පිළිබඳ තොරතුරු සපයනු ලබයි. එසේම රජය සහ පුරවැසියන් අතර තොරතුරු හුවමාරු කර ගැනීමට උපකාරි වන අතර රජය සමඟ පහසුවෙන් සන්නිවේදනය කිරීමට සහ ගනුදෙනු කිරීමට පුරවැසියන්ට සහාය වේ. ඉ-රාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක කිරීමේ දී එය ක්‍රම කිහිපයකට සිදුකරනු ලබයි. එනම්,G2C රජයෙන් පුරවැසියන්ට, G2B රජයෙන් ව්‍යාපාරවලට, G2G රජයෙන් වෙනත් රාජ්‍යයන්ට, G2E රජයෙන් සේවා නියුක්තිකයන්ට. ඉ-රාජ්‍ය සේවාවන්ගේ බහුතරය මෙම රජය සිට පුරවැසියන් (G2C) වර්ගීකරණයට අයත් වේ (Dilinika, 2020). මහජන සේවාවන් කාර්යක්ෂමව, ඵලදායීව සහ සාධාරණව සැපයීමේ උත්සාහයක් ලෙස රජයට නව තාක්ෂණයන් හඳුන්වාදීම 1990 ගණන්වල සිට ලොව පුරා බොහෝ රටවල සිදු විය. ඩිජිටල් තාක්‍ෂණය භාවිත කිරීමෙන් රාජ්‍ය සේවා බෙදා හැරීමේ පිරිවැය අඩු කළ හැකි බැවින් මහජන සේවා බෙදා

හැරීමේ කාර්යක්ෂමතාව, සමානාත්මතාවය සහ සඵලතාවය වැඩි දියුණු කිරීම සඳහා ඉ-ආණ්ඩුව භාවිතා වේ. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන තුළත් බොහෝ ප්‍රතිපත්ති, උපායමාර්ග හඳුන්වාදී ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය ලංකාව තුළ ක්‍රියාවට නැංවීමට කටයුතු කර තිබේ. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් පුරවැසියන්ට කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයෙන් සේවාවක් ලබාදීම පිළිබඳව සැලකිලිමත් වන අතරම, රජය ක්‍රියා කළ යුතු ආකාරය සහ ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට හැකි වන බැවින් රජයට වඩාත් විනිවිදභාවයක් ලබාදීමට ද හැකියාව ලැබේ. ඩිජිටල් තාක්‍ෂණය භාවිතා කිරීමෙන් රාජ්‍ය සේවා බෙදා හැරීමේ පිරිවැය අඩු කළ හැකි බැවින් මහජන සේවා බෙදා හැරීමේදී කාර්යක්ෂමතාව, සමානාත්මතාවය සහ සඵලතාවය වැඩි දියුණු කිරීම සඳහා ඉ-රාජ්‍ය භාවිතා වේ. තාක්‍ෂණය මත පදනම් වූ සේවා බෙදා හැරීමේ පද්ධතියක් ලෙස, ආයතනයක් තුළ ඉ-රාජ්‍ය භාවිතා කිරීමෙන් සැලකිය යුතු ප්‍රතිලාභ රැසක් හඳුනාගෙන ඇත. එනම්, කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ අඩු පිරිවැය සමඟ රජයේ සේවාවන්හි සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීමට විද්‍යුත් රජය නැඹුරු වේ. විශේෂයෙන් ලංකාවේ රාජ්‍ය සේවයේ ඇති ගැටලුවක් වනුයේ දූෂණය හා අකාර්යක්ෂමතාවයයි. මෙවැනි ගැටලු මගහරවා ගැනීමට ලංකාව තුළ විශාල සාකච්ඡාවක් ගොඩනැගී තිබේ. ඒ අනුව විද්‍යුත් ආණ්ඩුකරණය අද වන විට ලංකාව තුළ වැඩි වැදගත්කමක් ඇති වී තිබේ. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේදී ආයතනික ධාරිතාව ඉතාමත් වැදගත් සාධකයක් වේ. ආයතනික ධාරිතාව යනු සංවිධානයකට හෝ ආයතනයකට තම කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීමට ඇති හැකියාවයි. එයට මානව සම්පත්, යටිතල පහසුකම්, මූල්‍ය සම්පත්, ආයතනික ව්‍යුහය සහ නීතිමය රාමු ඇතුළු විවිධ සාධක ඇතුළත් වේ. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට ආයතනික ධාරිතාව ඉතා වැදගත් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියේ සාර්ථකත්වය සඳහා ආයතනික ධාරිතාවයේ බලපෑම කෙසේ ද? යන්න අධ්‍යනය කිරීම අරමුණු කරගනිමින් මෙම අධ්‍යනය සිදු කෙරිණි.

**සාහිත්‍ය විමර්ශනය**

ඉ-රාජ්‍ය යන්න රාජ්‍ය ආයතන තුළ තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම ලෙස අර්ථ දැක්විය හැකිය. ඒ අනුව ඉ-රාජ්‍ය පිළිබඳ විවිධ නිර්වචන පහත ආකාරයට ගෙනහැර දැක්විය හැකිය.

ඉ-ආණ්ඩුව යනු රාජ්‍ය පරිපාලනය තුළ තොරතුරු තාක්‍ෂණ මෙවලම් භාවිතා කරමින් රාජ්‍ය සේවා බෙදාහැරීම වැඩිදියුණු කිරීම, බහුකාර්ය සන්නිවේදන මාර්ග භාවිතා කරමින් ජනතාව සම්බන්ධ කර ගැනීම සහ ඔවුන් සවිබල ගැන්වීම සඳහා ඵලදායී ආකාරයෙන් දත්ත සහ තොරතුරු පරිපාලනය කිරීමේ ක්‍රියාවලීන් සරල කිරීමට සහ ඒකාබද්ධ කිරීමට අදහස් කරයි (Zoysa, 2014).

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් දක්වන ආකාරයට ඉ-රාජ්‍ය යනු පුරවැසියන්ට සේවා සැපයීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යෙදවීම සඳහා රාජ්‍ය අංශය තුළ ඇති ධාරිතාව සහ කැමැත්තයි. එසේම යටිතල පහසුකම්, මානව ප්‍රාග්ධනය, පරිපාලනමය සහ පද්ධතිමය හැකියාවන් අන්තර්ගත කර ගනිමින්

පුරවැසියන් සවිබල ගැන්වීම සඳහා තොරතුරු සහ දැනුම ලබාදීම සඳහා ආණ්ඩුවේ කැපවීම ලෙස ද හැඳින්විය හැකිය (UN, n.d.).

වීරක්කොඩි යෝෂේස්, කුරුනානන්ද විසින් රචිත "ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය ක්‍රියාත්මක කිරීම එක්සත් රාජධානියේ පාඩම්" (Implementing E-Government in Sri Lanka Lessons from the UK) යන ලිපිය හරහා එක්සත් රාජධානියෙහි සහ ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍යය ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටලු සංසන්දනය කිරීම සඳහා සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කර ඇත. සංවර්ධිත රටක් වන එක්සත් රාජධානිය හා සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව තුළ ඉ-රාජ්‍යය ක්‍රියාත්මක කිරීමට අදාළ ගැටලු විශ්ලේෂණය කර සංසන්දනය කිරීමක් මෙහි දී සිදු කොට තිබේ.එක්සත් රාජධානිය ඇතුළු බොහෝ සංවර්ධිත රටවල් ඉ-රාජ්‍ය සංකල්පයේ පුරෝගාමී වීමට සාර්ථක උපාය මාර්ග හඳුනා ගෙන බාධක ජය ගෙන ඇතත් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල මෙම සන්දර්භය තුළ ඉගෙන ගැනීමට බොහෝ දේ ඇත. බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් මෙන්ම ශ්‍රී ලංකාවද ඉ-රාජ්‍ය පූර්ණ පරිමාණයෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර ඇත. මෙම අධ්‍යයනයට අනුව ලංකාව මුහුණදෙන ගැටලු වනුයේ, විද්‍යුත් සේවා සඳහා ප්‍රවේශයෙහි ඇති ගැටලු, දැනුවත්භාවය නොමැතිවීම, දත්ත ආරක්ෂණ නීති සහ උපාය මාර්ග සහ රාමු නොමැති වීම ආදී ගැටලු දැකගත හැකිය. ශ්‍රී ලංකාව වැනි ආර්ථික වශයෙන් සංවර්ධනය වෙමින් පවතින රටකට ප්‍රමාණවත් යටිතල පහසුකම් ලබා ගත හැක්කේ විදේශීය ආධාර සපයන ආයතනවල සහාය ඇතිව පමණක් යැයි යෝජනා කරනු ලබයි. එසේ වුව ද, ප්‍රධාන ICT කොඳු නාරටිය වන LakGovNet ශක්තිමත් කිරීම, ඉ-රාජ්‍යයේ සහ සමස්ත ඉ-ශ්‍රී ලංකාවේ මුලපිරීමේ සාර්ථකත්වය සඳහා ප්‍රධාන වැදගත්කමක් දරයි. මෙම පර්යේෂණයේ වැදගත්ම නිගමනය වනුයේ ශ්‍රී ලංකාව සිය විද්‍යුත් සේවා දේශීය භාෂාවලින් ලබා ගැනීමට නිසි සැලකිල්ලක් දැක්විය යුතු බවයි (Weerakkody et al, 2009).

දයාරත්න බණ්ඩා සහ නිපුනි දිසානායක විසින් සිදු කරන ලද "ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා සැපයීමේදී විද්‍යුත් රජයේ කාර්යභාරය: සමාලෝචනයක්" (Role of E-Government in Public Services Delivery in Sri Lanka: A Review) යන අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා සැපයීමේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය කෙරෙහි විද්‍යුත් රාජ්‍යයෙහි බලපෑම සහ විද්‍යුත් පාලනය ක්‍රියාත්මක කිරීමට පවතින ආයතනික, සමාජීය සහ සංස්කෘතික බාධාවන් ඇගයීමට ලක් කොට ඇත. මෙහි දී 1990 ගණන්වල මුල් භාගයේ සිට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා සැපයීමේ දී විද්‍යුත් රාජ්‍යයේ විකාශනය හා ප්‍රගතිය පිළිබඳව අවධානය යොමු කර ඇත. මෙම අධ්‍යයනය තුළ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාව මුහුණ දෙන වඩාත්ම කැපී පෙනෙන බාධක වනුයේ ඩිජිටල්කරණය සඳහා ආයෝජනය කිරීමට අරමුදල් නොමැතිවීම, තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව ඇති සේවකයන්ගේ හිඟය, දැඩි ධූරාවලිය සහ රතු පටි ආරක්ෂා කරන අහිතකර ආයතනික සංස්කෘතීන්, දැඩි ක්‍රියා පටිපාටි සහ නොගැළපෙන නීතිමය සහ නියාමන රාමු, වෘත්තීය සමිතිවල අඛණ්ඩ දූෂණය සහ ප්‍රතිරෝධය සැලකිය යුතු බාධාවන් බව මෙහි දී දක්වා තිබේ. සාම්ප්‍රදායික රාජ්‍ය පාලනය ඉ-රාජ්‍ය බවට පරිවර්තනය කිරීම සඳහා රජය විසින් ගත යුතු ක්‍රියාමාර්ග කිහිපයක් මෙහි දක්වා තිබේ. එනම්, සමස්ත රාජ්‍ය පරිපාලන පද්ධතියම ඩිජිටල් යුගයට ගැළපෙන පරිදි ප්‍රතිසංස්කරණය කර ප්‍රතිව්‍යුහගත කළ යුතුය. රාජ්‍ය අංශයේ සේවකයින්ට

ඩිජිටල්කරණය වූ රජයක් තුළ වැඩ කිරීම සඳහා වැඩ සම්මතයන් සහ වැඩ ආචාර ධර්ම ප්‍රතිනිර්මාණය කර නැවත සකස් කළ යුතු බවට මෙම අධ්‍යනය තුළින් දක්වා තිබේ (Banda & Dissanayake, 2022).

කණිෂ්ක කරුණාසේන විසින් රචිත "ශ්‍රී ලංකාවේ විද්‍යුත් රාජ්‍යයේ පොදු වටිනාකම පිළිබඳ විමර්ශනයක්" (An Investigation of the Public Value of E-Government in Sri Lanka) යන නිබන්ධනය හරහා පුරවැසියන්ගේ දෘෂ්ටිකෝණයෙන් ඉ-රාජ්‍යයන්හි ඇති වැදගත්කම හා විද්‍යුත් රාජ්‍යයේ පොදු වටිනාකම ඇගයීම සඳහා පවතින ක්‍රමවේදයන් පිළිබඳව විමර්ශනයට ලක් කොට තිබේ. මෙම අධ්‍යයනය තුළින් අරමුණුකොට ඇත්තේ, ඉ-රාජ්‍යයේ පොදු වටිනාකම තක්සේරු කිරීම සඳහා තීරණාත්මක සාධක හඳුනා ගැනීම, ඉ-රජයේ පොදු වටිනාකම තක්සේරු කිරීම සඳහා රාමුවක් සකස් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සුදුසු නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කිරීමයි. ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍යයේ පොදු වටිනාකම ඇගයීම සඳහා නව රාමුවක් සකස් කෙරෙන අතර නව රාමුව වනුයේ ගුණාත්මක රාජ්‍ය සේවා සැපයීම, රාජ්‍ය සංවිධානවල සඵලතාවය සහ සමාජීය වශයෙන් අවශ්‍ය ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම ඇතුළු ප්‍රධාන මානයන් තුනකින් සමන්විත යන්ත්‍රණයයි. යෝජිත රාමුව භාවිත කරමින්, ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය සංවර්ධනයේ වත්මන් තත්ත්වය මෙම අධ්‍යයනය තුළින් තක්සේරු කෙරේ. ඉ-රාජ්‍ය සිරස් ඒකාබද්ධතා සහ තිරස් ඒකාබද්ධතා අදියර හරහා පරිණාමය වේ. ඉ-ආණ්ඩුවේ සිරස් ඒකාබද්ධ කිරීමේ අදියරේ දී, ප්‍රාදේශීය ඉ-රාජ්‍ය පද්ධති පොදු තොරතුරු මූලාශ්‍රය බෙදා ගැනීම සඳහා ක්ෂණික ඉහළ මට්ටමේ ඉ-රාජ්‍ය පද්ධති වෙත බාධාවකින් තොරව සම්බන්ධ වේ. උදාහරණයක් ලෙස, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාලවල ඇති ඉ-රාජ්‍ය පද්ධති ඒකාබද්ධ සේවා සැපයීම සඳහා ජාතික මට්ටමින් ඉ-රාජ්‍ය පද්ධතිවලට සම්බන්ධ කර ඇත (Karunasena, 2012).

මොරොටේ සහ තවතත් අය විසින් රචනා කරන ලද "යුරෝපීය රටවල විද්‍යුත් රාජ්‍ය භාවිතයේ මට්ටම්වල ඉ-රාජ්‍ය ඇගයීම, විශ්වාසය සහ ඩිජිටල් බෙදීමේ බලපෑම්" (The Effects of E-Government Evaluation, Trust and the Digital Divide in the Levels of E-Government use in European Countries) යන ලිපිය හරහා යුරෝපීය සන්දර්භය තුළ විද්‍යුත් රාජ්‍ය භාවිතයේ නිර්ණායක හා පුරවැසියන්ගේ ඉ-රාජ්‍ය භාවිතය පිළිබඳ කරුණු ඉදිරිපත් කරනු ලබයි. මෙම අධ්‍යනයේ ප්‍රතිඵලවලට අනුව, යුරෝපීය පුරවැසියන්ගේ ඉ-රාජ්‍ය සේවා භාවිතයේ මට්ටම ඉහළ නැංවීම කෙරෙහි ජාතික සේවාවන් පිරිනැමීමේ ගුණාත්මකභාවය, රජයන් කෙරෙහි පුරවැසියන්ගේ විශ්වාසයේ මට්ටම්, ජනගහනයේ ඒක පුද්ගල ආදායම සහ පුරවැසියන්ගේ අධ්‍යාපන මට්ටම බලපාන බව අනාවරණය කොට තිබේ (Morote et al, 2020).

දිල්හානි සහ ප්‍රියශාන්ත විසින් සිදු කරන ලද "ශ්‍රී ලංකාවේ විද්‍යුත් රාජ්‍ය සේවා භාවිතා කිරීමේ අභිප්‍රාය නිර්ණය කිරීම" (Determinants of Intention to Use E-Government Services in Sri Lanka) යන අධ්‍යයනය තුළින් ශ්‍රී ලාංකික පුරවැසියන් අතර ඉ-රාජ්‍ය භාවිතයේ අභිප්‍රාය වේගවත් කිරීම සඳහා විද්‍යුත් රාජ්‍ය සේවා භාවිත කිරීමේ අභිප්‍රායට බලපාන සාධක අධ්‍යයනයට ලක් කොට ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ විද්‍යුත් රාජ්‍ය සේවාව භාවිතා කිරීමේ අභිප්‍රාය මත සාපේක්ෂ වාසිය, අන්තර්ජාලය කෙරෙහි

විශ්වාසය සහ රජය කෙරෙහි විශ්වාසය, අන්තර්ජාල ප්‍රවේශය, අන්තර්ජාල කුසලතා සහ ඩිජිටල් බෙදීමේ බලපෑම කුමක් ද යන්න අධ්‍යනය කිරීමයි. ශ්‍රී ලංකාවේ විද්‍යුත් රාජ්‍ය සේවාවන් භාවිත කිරීමට ඉ-රාජ්‍ය අභිප්‍රාය කෙරෙහි බලපාන සාධක හතර අතරින් වඩාත් වැදගත් වනුයේ සාපේක්ෂ වාසිය, ඉන් පසුව පිළිවෙළින් අන්තර්ජාල කුසලතා, විශ්වාසය සහ අන්තර්ජාල ප්‍රවේශයයි. මෙම අධ්‍යයනයේ අවසාන නිර්දේශ වනුයේ, ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සඳහා රජයට ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවය සහ දේශපාලන සහයෝගය ලබා දිය යුතු බවත් විද්‍යුත් රාජ්‍ය සංකල්පය විශ්වවිද්‍යාල විෂයමාලාවට සහ රාජ්‍ය නිලධාරීන්ට දැනුමක් ලබා දීම සඳහා බඳවා ගැනීමේ පුහුණුව ඇතුළත් විය යුතු බවත්‍ය. එසේම රජය සමඟ අන්තර්ක්‍රියා කිරීමේ දී අන්තර්ජාලය භාවිතා කිරීමට හැකියාවක් නොමැති සාමාන්‍ය ජනතාව අතර අන්තර්ජාල කුසලතා වර්ධනය කිරීමටත්, පහසුව අනුව විද්‍යුත් සේවාව භාවිතා කිරීමේ වාසි සහ ප්‍රතිලාභ විදහා දැක්වෙන දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව මෙහි දී දක්වා තිබේ (Priyashantha & Dilhani, 2021).

මොහොමඩ් අබ්දුල් සලාම් (Mohammad Abdul Salam) විසින් සිදු කරන ලද "රාජ්‍ය සේවා සැපයීම තුළින් යහපාලනය සඳහා විද්‍යුත් පාලනය" (E- Governance for Good Governance through Public Service Delivery) යන අධ්‍යයනය තුළින් විද්‍යුත් රාජ්‍යයේ කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම සහ බංග්ලාදේශයේ පුරවැසියන්ට ඉ-රාජ්‍ය සේවා බෙදා හැරීමේ බලපෑම් ඇගයීමට භාජනය කොට ඇත. බංග්ලාදේශයේ රජය විසින් දිස්ත්‍රික් ඉ-සේවා මධ්‍යස්ථාන පිහිටුවා ඇත. ඒ හරහා මහජනතාවට රජය කෙරෙහි විශ්වාසයක් ඇති කොට යහපාලනය ඇති කිරීමට බලාපොරොත්තු වේ. නමුත් විදුලි බල සැපයීමේ හිඟකම, තොරතුරු තාක්ෂණ කුසලතා ඇති ශ්‍රම බලකායේ ඌනතාවය සහ නිලධාරිවාදී පාලන ක්‍රමයේ පැවැත්ම නිසා මහජන සේවාවන් කාර්යක්ෂමව සැපයීමේ අභියෝගයකට මධ්‍යස්ථාන මුහුණ පා සිටියි. මෙම අධ්‍යයනය මූලික වශයෙන් සැලකිලිමත් වන්නේ ඉ-සේවා මධ්‍යස්ථානයන්හි මහජන සේවා සැපයීම සඳහා බංග්ලාදේශයේ කාර්ය සාධනය ඇගයීමයි. රජයේ ඉ-සේවා ග්‍රාමීය ප්‍රදේශවල විශේෂයෙන් වැදගත් වන අතර ග්‍රාමීය ප්‍රදේශවල විද්‍යුත් රාජ්‍ය සඳහා වේදිකාවක් සකස් කිරීමට අපොහොසත්වීම බංග්ලාදේශය වැනි සංවර්ධනය වෙමින් පවතින රටක ඉ-සේවා ලබා ගැනීමට ප්‍රධාන බාධාවක් ලෙස හඳුනාගෙන ඇත. මෙම අධ්‍යයනයට අනුව බංග්ලාදේශයේ ඉ-සේවා මධ්‍යස්ථාන මහජන සේවාවන් කාර්යක්ෂමව සපයන බවත්, විද්‍යුත් සේවා සැපයීම මගින් පුරවැසි තෘප්තියට ධනාත්මක බලපෑමක් ඇති කරන බවත් හෙළි වී ඇත. අවසානයේ විද්‍යුත් පාලනය යහපාලනයට මග පෙන්වන බව අධ්‍යයනයෙන් ඔප්පු වී තිබේ (Salam, 2013).

රෙජී ඩේවිඩ්‍රජු (Reggie Davidrajuh) විසින් රචනා කරන ලද "ඉ-රාජ්‍ය ආරම්භය සැලසුම් කිරීම:ශ්‍රී ලංකාව පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්" (Planning E-Government Start up: A Case Study on E-Sri Lanka) යන නිබන්ධනය හරහා ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් රාජ්‍යය ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග ඉදිරිපත් කොට ඒවා විශ්ලේෂණය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ විද්‍යුත් රාජ්‍ය ක්‍රමය නිසාවෙන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් විවිධ කාණ්ඩ තුනක් යටතේ දක්වා ඇත. මෙම පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ වන්නේ 2003 ඉදිරිපත් කරන ලද "ඉ-රාජ්‍ය පිළිබඳ ප්‍රතිපත්තිය" විශ්ලේෂණය කිරීමයි. විශ්ලේෂණ ප්‍රතිඵලවලින් පෙනී යන්නේ ප්‍රතිපත්ති සම්පාදකයින් කුඩා හා

මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා අඩු සැලකිල්ලක් ලබා දී ඇති බවත්,ඔවුන් විද්‍යුත් සූදානම වැඩිදියුණු කිරීමට ප්‍රමුඛත්වය ලබා දී නොමැති බවත්ය. මෙම අධ්‍යයනය තුළින් උපායමාර්ග දියුණු කිරීම සඳහා යෝජනා කිහිපයක් ඉදිරිපත් කර තිබේ. එනම්,කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වෙනම වැඩසටහනක් නිර්මාණය කිරීම, සැම ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනකදීම විද්‍යුත් සූදානම වැඩි දියුණු කිරීමට පියවර ඇතුළත් කිරීම, වැඩසටහන් අදියර වශයෙන් සැලසුම් කිරීම ආදිය දැක්විය හැකිය (Davidrajuh, 2004).

ලියනගේ, ගුණතුංග සහ වික්‍රමසිංහ යන අය විසින් රචිත "ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය ජාත්‍යන්තර සංජානනයෙන් බාධක සහ අභියෝග; සාහිත්‍ය සමාලෝචනයක්" (E-Government Adaption in Sri Lanka -Barriers and Challenges from International Perception; A Literature Review) යන ලිපිය හරහා ශ්‍රී ලංකාව තුළ ඉ-රාජ්‍යය ක්‍රියාත්මක කිරීමේ දී ඇති බාධක පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක් සිදු කරයි. මෙහි දී ඉන්දියාව,නේපාලය,නයිජීරියාව,රුමේනියාව එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවල් තුළ විද්‍යුත් රාජ්‍යයේ භූමිකාව පිළිබඳව ද විශ්ලේෂණය කරනු ලබයි.මෙම ලිපිය තුළදී ප්‍රථමයෙන්ම සාහිත්‍යය තුළින් ලෝකයේ විවිධ රටවල අභියෝග සහ බාධක හඳුනාගෙන ඒවා ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ ආරෝපණය කිරීමට උත්සාහ කර ඇති අතර වෙනත් රටවල් සමඟ සංසන්දනය කිරීමේදී සමාන තත්වයන් බොහෝමයක් තිබුණ ද, ඒවා සැම විටම ශ්‍රී ලංකාවේ තත්ත්වයට අදාළ නොවේ. උදාහරණයක් ලෙස, ඉන්දියාව වැනි රටකට බෙහෙවින් බලපාන ජනගහනය වැනි සාධක ශ්‍රී ලංකාවේ තත්ත්වය තුළ සලකා බලනු නොලැබේ. ශ්‍රී ලාංකීය සන්දර්භය සම්බන්ධයෙන් ඇති බාධක සහ අභියෝග සාකච්ඡා කිරීමේදී ප්‍රවේශ ස්තරය, ඉ-රාජ්‍ය ස්ථරය, ඉ-ව්‍යාපාර ස්ථරය සහ යටිතල පහසුකම් ස්තරය යන ස්තර හතරකට බෙදා මෙම අධ්‍යයනයේ දී සාකච්ඡා කර තිබේ (Liyanage et al, 2020).

නිරංජලා තෙන්නකෝන් විසින් රචනා කරන ලද "ඉ-පාලනය ඉදිරි මාවත: සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා අභියෝග සහ අවස්ථා. ශ්‍රී ලංකාවෙන් සාක්ෂි" (E-Governance Way Forward: Challenges and Opportunities for Developing Countries. Evidences from Sri Lanka) යන අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වී ඇත්තේ ශ්‍රී ලංකාවේ විද්‍යුත් පාලනයේ විභව අභියෝග සහ අවස්ථා හඳුනා ගැනීමයි. මෙහි දී පිළිවෙලින් ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය සංකල්පයේ විකාසනය පිළිබඳවත් ඉ-පාලන අවස්ථා පිළිබඳව හා අවසානයේ දී ඉ-රාජ්‍යන්හි අභියෝග දක්වා තිබේ. මෙම අධ්‍යයනයේ අවසාන ප්‍රතිඵලයන් ලෙස ග්‍රාමීය සහ වතු අංශවල පරිගණක සාක්ෂරතාව අඩු වීම, නීතිමය හා නියාමන බාධාවන්, රට පුරා අන්තර්ජාල ප්‍රවේශය අසමාන ලෙස බෙදා හැරීම, ආරක්ෂාව, දැඩි පරිපාලන ක්‍රියා පටිපාටි සහ අනවශ්‍ය දේශපාලන බලපෑම් ඉහළම අභියෝග ලෙස හඳුනා ගෙන ඇත (Tennakoon, 2020).

පරිපාලන ආයතනවල නිසි ක්‍රියාකාරීත්වය මත විද්‍යුත් රාජ්‍යයේ සාර්ථකත්වය රඳා පවතින රජයේ මෙහෙයුම්වල වැදගත්ම කොටසක් ලෙස පරිපාලනය සැලකේ. ශ්‍රී ලංකා රජය ඉ-රාජ්‍යයේ සාර්ථකත්වය සඳහා ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ගෙන ඇත. කෙසේ වෙතත්, සැලකිය යුතු පරිපාලන වෙනස්කම් නොමැතිව ඉ-රාජ්‍ය සාර්ථක කළ නොහැකිය. මේ ආකාරයට විවිධ රටවල ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇති අතර ඒ

අනුව ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියේ සාර්ථකත්වයට ආයතනික ධාරිතාවයේ බලපෑම කෙසේ ද යන්න පිළිබඳ විමසා බැලීම සඳහා සිදු කර ඇති ආනුභවික අධ්‍යයනයන් විරල බැවින්, ඒ සම්බන්ධව ඉලක්ක කොට ගෙන මෙම පර්යේෂණය සිදු කර තිබේ.

**පර්යේෂණ අරමුණු**

මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ බවට පත් වූයේ ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියේ සාර්ථකත්වය සඳහා ආයතනික ධාරිතාවයේ බලපෑම කෙසේ ද? යන්න විමර්ශනය කිරීමයි. ප්‍රධාන අරමුණ වඩාත් පැහැදිලිව සාධනය කර ගැනීම සඳහා අධ්‍යයනය තුළින් අනු අරමුණු කිහිපයක් හඳුනා ගනු ලැබිය. ඉ-රාජ්‍ය ක්‍රියාත්මක කිරීමේ දී නව තාක්ෂණය සම්බන්ධයෙන් රාජ්‍ය සේවකයන්ගේ සාක්ෂරතාවය ඉහළ මට්ටමක පවතී ද යන්න විශ්ලේෂණය කිරීම එක් ප්‍රධාන අනු අරමුණක් බවට පත්විය. අධ්‍යයනයෙහි අනු අරමුණක් බවට ඉ-රාජ්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකාව තුළ ප්‍රමාණවත් යටිතල පහසුකම් පවතී ද යන්න අධ්‍යයනය කිරීම හඳුනා ගැනුණි. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී පරිපාලන ආයතනයන්හි සේවකයින් හා සේවාලාභීන් අතර ඉහළ සන්නිවේදනයක් තිබේ ද යන්න විශ්ලේෂණය කිරීම පර්යේෂණය තුළ හඳුනාගත් තවත් අනු අරමුණකි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය මිශ්‍ර ක්‍රමවේදය යටතේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත යොදා ගනිමින් සිදු කර තිබේ. පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය වන භූගෝලීය පිහිටීම එම පර්යේෂණයේ අධ්‍යයන ප්‍රදේශය වේ. පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කය තෝරාගෙන තිබේ. මෙම ඉ-සේවාවන් භාවිතා කරන ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාව මූලික කොටගෙන මෙම අධ්‍යයනය සිදු කෙරේ. එහි දී ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා දකුණු පළාතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මූලික කොට ගෙන මෙම අධ්‍යයනය සිදු කරනු ලැබීය. එහී දී කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ක්‍රියාත්මක වන මාර්ගගත ලෙස අවශ්‍ය සහතික පිටපත් ලබා ගැනීමේ සේවාව (උප්පැන්න සහතික,විවාහ සහතික) යන වැඩසටහන හා දකුණු පළාතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන මාර්ගගත වාහන ආදායම් බලපත්‍ර සේවාව යන වැඩසටහන් ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියේ සාර්ථකත්වය සඳහා ආයතනික ධාරිතාවයේ බලපෑම කෙසේ ද යන්න අධ්‍යයනයට භාජනය කරනු ලැබීය.

දකුණු පළාතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන මාර්ගගත වාහන ආදායම් බලපත්‍ර සේවාව 2014දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ දී දකුණු පළාතේ ආරම්භ කොට තිබේ. 2009 වසරේ දී අනුමත කරන ලද රාජ්‍ය අංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ ප්‍රතිපත්තියට අනුකූලව මෙම වැඩසටහන මෙහි දී හඳුන්වා දී තිබේ. එසේම කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ක්‍රියාත්මක වන මාර්ගගත ලෙස අවශ්‍ය සහතික පිටපත් ලබා ගැනීමේ සේවාව එම ආයතනය තුළ 2021 වසරේ අගෝස්තු මාසයේ දී ක්‍රියාත්මක කර තිබේ. කොවිඩ් වසංගත තත්ත්වය තුළ උප්පැන්න, විවාහ

සහ මරණ සහතිකවල පිටපත් ඉල්ලීමේ දුෂ්කරතා අවම කිරීම සඳහා මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය නියැදිය තෝරා ගැනීමේ දී පහසු නියැදි ක්‍රමය භාවිත කරන ලදී. මෙහි දී මුළු පර්යේෂණ නියැදිය 100 කි. කාර්ය මණ්ඩල සේවක තිස් දෙනකු හා මහජනතාව හැත්තෑදෙනකුගෙන් නියැදිය වර්ගීකරණයට ලක් කරන ලදී. අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමේ දී ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත භාවිත කරන ලදී. ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී පර්යේෂකයා ක්‍රම දෙකක් භාවිත කරනු ලබයි. එනම් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රමයන්ට අනුව දත්ත රැස් කරනු ලබයි. ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීම සඳහා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලි ක්‍රමය ද, ගුණාත්මක දත්ත රැස් කිරීම සඳහා ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද භාවිත කරනු ලබයි. ප්‍රශ්නාවලිය සහිත සමීක්ෂණ 90 ක් සහ සම්මුඛ සාකච්ඡා 10 ක් මේ සඳහා සම්බන්ධ කර ගන්නා ලදී. එසේම පර්යේෂණය සඳහා ද්විතීයික දත්ත ලෙස පිළිගත් විද්‍යුත් මාධ්‍ය පළවන ලිපි, අධ්‍යාපන සඟරා, වාර්තා, දත්ත සහිත ලේඛන, පර්යේෂණ ලිපි, පර්යේෂණ ග්‍රන්ථ, ආදිය භාවිත කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීමේ දී තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය, කථන විශ්ලේෂණය, ප්‍රත්‍යයක විශ්ලේෂණය යන ක්‍රමවේද භාවිත කරනු ලැබීය.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ලෝකය තාක්ෂණය සමඟ සම්පූර්ණයෙන්ම මුසු වූ කුඩා සමාජයක් බවට පත් වෙමින් පවතින බැවින් එහි ඉල්ලීම් සපුරාලීම සඳහා කඩිනම් සේවා තාක්ෂණය සමාජය තුළ ක්‍රියාත්මක කළ යුතුය. ඒ අනුව ශ්‍රී ලංකාව තුළත් ඉ-රාජ්‍ය සේවාවන් විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක කොට තිබේ. ශ්‍රී ලංකා රජය විසින් තොරතුරු තාක්ෂණ සංවර්ධනය සඳහා 1983 දී ජාතික පරිගණක ප්‍රතිපත්ති නිර්මාණය කරන ලදී. එම ප්‍රතිපත්තිය මගින් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වර්ධනය කිරීම, තොරතුරු තාක්ෂණය පිළිබඳ මානව සම්පත් වැඩි දියුණු කිරීම, පුරවැසි සේවා වැඩිදියුණු කිරීම සමස්ත සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් තොරතුරු තාක්ෂණය සහිත නවීන රාජ්‍යයක් නිර්මාණය කිරීම අරමුණු කරන ලදී. එසේම 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත හඳුන්වා දෙන අතර ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) රජය විසින් පිහිටුවන ලද්දේ රටේ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය නිර්වචනය කිරීම, උත්ප්‍රේරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය දීම සඳහාය.

2004 දී තොරතුරු යටිතල පහසුකම් ගොඩනැගීම, තොරතුරු තාක්ෂණ මානව සම්පත් වැඩි දියුණු කිරීම, පුරවැසියන්ට විශේෂිත වූ සේවා සැපයීම, සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කරන නවීන රජයක් නිර්මාණය කිරීම සහ ශ්‍රී ලංකාව අනුමත කිරීම ඇතුළත් 'ඉ-ශ්‍රී ලංකා සංවර්ධන ව්‍යාපෘතිය' ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය සංවර්ධනය සඳහා යොදාගනු ලබන ඒකාබද්ධ ප්‍රයත්නයක් ලෙසින් නිර්වචනය කළ හැකිය. එය ජාතික මට්ටමෙන් මෙන්ම ප්‍රාදේශීය මට්ටමෙන් ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් පිරිපුන් වැඩසටහන් ක්‍රියාවෙහි යොදවයි. රාජ්‍ය පාලනයේ දී තොරතුරු සන්නිවේදන තාක්ෂණ භාවිතය සඳහා සහ ඉ-රාජ්‍ය සේවා ස්ථාපිත කිරීම පිණිස වඩාත්ම අදාළ වන්නා වූ නීතිකරණය වන්නේ 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතයි. මෙම පනත මගින් රාජ්‍ය ආයතනවල සේවා සැපයීමේ දී

මෙන්ම සිදු කරනු ලබන කාර්යයන්වල දී තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම සඳහා වඩාත්ම අදාළ වන නීතිය මෙය බවට පත් වී ඇත. මෙම නීතිය මත පදනම් රාජ්‍ය ආයතනවලට තම සේවා සැපයීමට මෙන්ම ඉලෙක්ට්‍රොනික ක්‍රමවේද භාවිත කිරීමට ද තම දත්ත සහ තොරතුරු ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් තබා ගැනීමට ද හැකියාව පවතී. එසේම 2007 අංක 27 දරණ පරිගණක අපරාධ පනතේ මූලික අරමුණ වනුයේ පරිගණකයට, පරිගණක වැඩසටහනකට දත්තවලට හෝ තොරතුරුවලට අනවසරයෙන් ඇතුළු වීම හෝ අනවසරෙන් භාවිත කිරීම අපරාධයක් ලෙස සැලකීමයි. 2009 වසරේ දී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තිය ඉදිරිපත් කර ඇත. එය රජයේ ආයතන තුළ තොරතුරු හා සන්නිවේදන කටයුතු ක්‍රියාත්මක කිරීමත්, කළමනාකරණයත් සඳහා ප්‍රමිති සකස් කිරීම සඳහා වූ රජයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තියයි. එසේම 2011 වසරේ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ජාතික තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරි සැලැස්ම සමඟින් විද්‍යුත් රාජ්‍ය මුලපිරීම් තවදුරටත් වැඩි දියුණු කරන ලදී. මීට අමතරව 'One Government 2020' උපාය මාර්ග සමඟින් 'Smart Sri Lanka' නමින් ඩිජිටල් උපායමාර්ග හඳුන්වා දී ඇත. එසේම ශ්‍රී ලංකාව සඳහා ජාතික ඩිජිටල් ප්‍රතිපත්තය 2020-2025 කාලය තුළ ක්‍රියාත්මක කිරීම අරමුණු කර තිබේ. මේ ආකාරයට තවත් බොහෝ ප්‍රතිපත්ති, උපායමාර්ග හඳුන්වාදී ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය ලංකාව තුළ ක්‍රියාවට නැංවීමට කටයුතු කර තිබේ (Dayaratna & Dissanayake, n.d). මේ ආකාරයට ශ්‍රී ලංකාව තුළ ඉ-රාජ්‍යයන්හි පරිණාමය දැක්විය හැකිය.

එසේම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ඉ-රාජ්‍ය සමීක්ෂණය පිළිබඳ දත්ත අනුව 2003 වසරේ සිට ශ්‍රී ලංකාව විද්‍යුත් රාජ්‍ය හඳුන්වා දීමේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති බව පෙන්වා දෙයි. ඉ-රාජ්‍ය සංවර්ධන දර්ශක අගය, විද්‍යුත් සහභාගිත්ව දර්ශක ශ්‍රේණිගත කිරීම, ඉ-සහභාගිත්ව දර්ශක අගය, මාර්ගගත සේවා දර්ශක අගය සහ විදුලි සංදේශ යටිතල පහසුකම් දර්ශකවල සැලකිය යුතු ප්‍රගතියක් ඇත. කෙසේ වෙතත්, 2022 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය සංවර්ධන දර්ශකය 95ක අගයක් හිමි විය (UN, 2022). යම් යම් ඉහළ යෑම් ඇති වුව ද, ඉ-රාජ්‍ය සංවර්ධන දර්ශකය සහ මානව ප්‍රාග්ධන දර්ශකය වසර කිහිපයක් තුළ අවම අගයක් පෙන්නුම් කරනු ලබයි. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යක් ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය මෙන්ම වඩාත් විනිවිදභාවයෙන් යුක්ත රජයක් නිර්මාණය කිරීමට ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය වැදගත් වේ. නමුත් මෙය ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ දී විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදු වී තිබේ.

ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියේ සාර්ථකත්වය කෙරෙහි ආයතනික ධාරිතාවයේ බලපෑම සැලකිය යුතු ය. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහ පුරවැසියන්ට කාර්යක්ෂම හා ඵලදායී ඩිජිටල් සේවා සැපයීම සඳහා ශක්තිමත් ආයතනික ධාරිතාවක් තිබීම ඉතා වැදගත් වේ. ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා ආයතන තුළින් ලැබෙන සහයෝගය ඉතාමත් වැදගත් වන අතර, එමගින් එම ප්‍රතිපත්තියේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය තීරණය වේ. විශේෂයෙන් මෙම ඉ-රාජ්‍ය සේවාවන්හි බලාපොරොත්තු වන ආකාරයේ ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ආයතනයේ අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය බලපානු ලබයි. එසේම ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ශක්තිමත් ආයතනික ධාරිතාවක් තිබීම ඉතා වැදගත් වේ. ශක්තිමත් ධාරිතාවක් ඇති ආයතනවලට ප්‍රතිපත්ති, රෙගුලාසි සහ වැඩසටහන් කාර්යක්ෂමව සංවර්ධනය කර ක්‍රියාත්මක කළ හැකි

අතර, ඒවා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඒ හරහා අපේක්ෂිත ප්‍රතිඵල සහතික කෙරේ. ප්‍රමාණවත් ආයතනික ධාරිතාවක් නොමැති විට ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට බාධා ඇති විය හැකි අතර ප්‍රමාදයන්, අකාර්යක්ෂමතාවන් සහ ප්‍රතිපත්ති අසාර්ථක වීමට පවා එය හේතු විය හැකිය. ශක්තිමත් ආයතනික ධාරිතාවක් ඇති ආයතනවලට වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස සේවා සැපයිය හැකි අතර පුරවැසියන්ට ගුණාත්මක සේවාවන් සැපයීමට අවශ්‍ය මානව සම්පත්, තාක්ෂණික හැකියාවන් සහ යටිතල පහසුකම් ආයතනය සතුව තිබීම හරහා ශක්තිමත් ආයතනික ධාරිතාවක් ගොඩනැගේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියේ සාර්ථකත්වය සඳහා ආයතනික ධාරිතාවයේ බලපෑම අධ්‍යයනය කිරීමේදී පහත සාධක හරහා විශ්ලේෂණය කරනු ලබයි.එනම්,

- කාර්යසාධනය
- අන්තර්සම්බන්ධතාවය
- සම්පත් කළමනාකරණය
- කාලය කළමනාකරණය
- කාර්යසාධනය

ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ සේවකයන්ගේ කාර්යසාධනය ඉතා වැදගත් වේ. විශේෂයෙන් කාර්යසාධනය තුළ දී අරමුණු කරනුයේ, කාර්යක්ෂම සේවාවකට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම සහ ඉලක්කගත අරමුණු  ලබාදීම මගින් ආර්ථිකමය වශයෙන් වාසි ලබා ගැනීමය. ඒ අනුව කාර්යයන් විධිමත් ලෙස බෙදා පැවතීම, සේවක ඇගයීම, ඉලක්කගත කාර්යයන් ලබා දීම සහ සේවක අභිප්‍රේරණය, තම කාර්යය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා තිබීම ආදී කරුණු පිළිබඳව අවධානය යොමු කරනු ලබයි. ඒ අනුව තෝරාගත් ආයතනයන්හි ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ තාක්ෂණය සමඟ කටයුතු කිරීමට ඔවුන්ට පුහුණුවක් ලබාදී තිබේ ද යන්න විමසා බැලිණි.

**සේවකයන්ගේ පුහුණුව**

ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ක්‍රියාත්මක වන මාර්ගගත ලෙස අවශ්‍ය සහතික පිටපත් ලබා ගැනීමේ සේවාව (උප්පැන්න සහතික,විවාහ සහතික) යන වැඩසටහන හා දකුණු පළාතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන මාර්ගගත වාහන ආදායම් බලපත්‍ර සේවාව යන වැසටහන් ආශ්‍රයෙන් එම ආයතන තුළ සේවයේ නියුතු සේවකයින්ගේ පුහුණුව පිළිබඳ සැලකීමේ දී පෙනී යනුයේ ඔවුන් එම ව්‍යාපෘතීන් සම්බන්ධව විශේෂ පුහුණුවක් ලබා ඇති බවයි. ඒ අනුව එම කාර්යයන්හි නිරත වන සියලුම සේවකයන් සඳහා විශේෂිත පුහුණුවක් ලබා දේ. විශේෂයෙන්ම කාර්යක්ෂම පරිපාලනයක් යටතේ කාර්යක්ෂම සේවාවන් සැපයීම උදෙසා පුහුණුව වැදගත් සාධකයක් වේ. නුපුහුණු නිලධාරීන් තනතුරුවලට පත් වීමෙන් ඒ යටතේ පවතින අංශ අකාර්යක්ෂම වේ.

**ප්‍රස්තාරය 1:** විශේෂිත පුහුණුවේ ස්වරූපය




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2023

ආයතනයක සංවර්ධනය සහ කාර්යක්ෂමතාවය සඳහා පුහුණුව ඉතා වැදගත් වේ.ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් හරහා ආයතනික සේවාවන් සිදු කිරීම සඳහා සේවකයන්ට නිසි දැනුමක් තිබිය යුතුය. ඉ-රාජ්‍ය සේවාවන් තාක්ෂණය මත පදනම් වී ඇති නිසා ඒ සම්බන්ධව විශේෂිත පුහුණුවක් අවශ්‍ය වන අතර ඒ මගින් කාර්යක්ෂමතාවය ද වර්ධනය වේ. නියැදියට අදාළව ලබාගත් දත්තවලට අනුව සේවකයන් වැඩි වශයෙන් පුහුණුවක් ලබා ඇත්තේ ආයතනය හරහා වේ. එය 84%කි. වෙනත් ඊකියාවක් මගින් 8%ක් ද, බාහිර පාඨමාලාවක් මගින් 4%ක් ද, වෙනත් 4%ක් ලෙස විශේෂිත පුහුණුවක් ලබා තිබේ. ඒ අනුව ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක කර ගැනීම සඳහා අනිවාර්ය අංගයක් ලෙස සේවක පුහුණුව වැදගත් වේ. විශේෂයෙන් ආයතනික හැකියාවන් ඉහළ වූ විට වඩා හොඳ සේවාවක් සැපයීමට හැකි වේ.

අන්තර්ජාලය හරහා විධිමත් සේවා සැපයීම මගින් සේවාවේ ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම ඉ-රාජ්‍ය මුල පිරීම්වල අරමුණයි. ඉ-රාජ්‍යයේ ඉලක්ක සහ අරමුණු මෙන්ම වැඩිදියුණු කළ සේවාවන් සැපයීමේ දී ඔවුන්ගේ කාර්යභාරය රජයේ කාර්ය මණ්ඩලය අවබෝධ කර ගැනීම සහතික කිරීමට සේවක පුහුණුව උපකාරී වේ. පුහුණුව මගින් සේවා-නැඹුරු මූලධර්ම, පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය සහ ඵලදායී සන්නිවේදන කුසලතා කෙරෙහි අවධානය යොමු කළ හැකිය. හොඳ පුහුණුව ලත් සේවකයින් කාර්යක්ෂම සහ උසස් තත්ත්වයේ සේවාවන් සැපයීමට වඩා හොඳින් සන්නද්ධව සිටින අතර, එමගින් පුරවැසි තෘප්තිය සහ ඉ-රාජ්‍ය කෙරෙහි විශ්වාසය වැඩි කරනු ලබයි. ඉ-රාජ්‍ය සේවාවන් හරහා සේවා සැපයීමේ දී තාක්ෂණය පිළිබඳ නිසි දැනුමක් තිබීම අනිවාර්ය වේ. එවිට කාර්යක්ශම සේවා සැපයීමට හැකි වේ. එසේම

ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් ලංකාව තුළ අද වන විට විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක වේ. නමුත් බොහෝ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී විවිධ ගැටලුවලට තවමත් රජය මුහුණ දෙමින් පවතී. එහි එක් ගැටලුවක් ලෙස පුහුණු සේවකයන් නොමැතිකම ද දැක්විය හැකිය. විශේෂයෙන් තාක්ෂණික කටයුතු පිළිබඳව මනා පළපුරුද්දක් සහිත සේවකයන් බඳවා ගත යුතුය. අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා තරග විභාග වැනි මාර්ග හරහා සේවකයන් බඳවා ගැනීම හරහා නිපුණතාවයකින් යුතු සේවකයින් බඳවා ගත හැකි වේ. නමුත් ඇතැම් අවස්ථාවල සුදුසුකම් නොමැති පුද්ගලයන් දේශපාලන හිතවත්කම් මත සේවයට බඳවා ගනියි. එවිට එය ප්‍රබල ලෙස ආයතනික ධාරිතාවට බලපෑම් කරනු ලබයි. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රධාන කාර්යයක් ආයතනයට හිමිවන නිසාවෙන් සුදුසුකම් සහිත දක්ෂ පුද්ගලයින් නියමිත තනතුරුවලට බඳවා ගැනීම කාර්යක්ෂම පාලනයකට පසුබිම නිර්මාණය වේ.

එසේම කාර්යසාධනයේ දී සේවකයන් සඳහා ඉලක්ක ලබාදීම ප්‍රමුඛ සාධකයක් වේ. ඒ අනුව නිශ්චිතව දක්වන ලද කිසියම් ඉලක්කයන් සඵල කිරීම සඳහා සේවකයන් කැප වීම සිදුවන අතර, චක්‍රාකාරව එය ආයතනයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ සහ ආර්ථික වාසි ලබා ගැනීමේ ප්‍රබල සාධකයක් වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය හඳුනාගත හැකිය.ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මෙසේ සේවකයන්ට ඉලක්ක ලබා දීම වැදගත් වේ.

> "මෙම ඔන්ලයින් සේවාව සිදු කිරීම සඳහා සේවකයන්ව දින අනුව වෙන් කර තිබෙනවා. තමන්ට අදාළ දින තුළ තමන්ට ලබාදෙන ඉලක්කයන් සේවකයන් විසින් සපුරාලිය යුතුයි".

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ඉහත දත්තයන්ට අනුව පැහැදිලි වනුයේ එම ආයතනය තුළ සේවකයන්ට පැහැදිලි ඉලක්ක ලබා දී ඇති ආකාරයයි. මෙම ක්‍රියාවන් හරහා ආයතනික ධාරිතාව ශක්තිමත් වේ.

**අන්තර්සම්බන්ධතාවය**

ආයතනය තුළ ඇති අන්තර්සම්බන්ධතා යනු විවිධ පුද්ගලයන්, දෙපාර්තමේන්තු, කණ්ඩායම් සහ ආයතනික ව්‍යුහය තුළ ඇති කාර්යයන් අතර පවතින සම්බන්ධතාය. සාමූහිකව වැඩ සම්බන්ධීකරණය, තීරණ ගැනීම සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම තීරණය කිරීමේ දී මෙම අන්තර්සම්බන්ධතා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ආයතනයක් තුළ ඇති අන්තර්සබඳතාවයේ ප්‍රධාන අංග කිහිපයක් දැකිය හැකිය. ඉන් වඩාත් වැදගත් වන්නේ සන්නිවේදනයයි. මෙහි දී සංවිධානයක් තුළ ධනාත්මක අන්තර්සබඳතාවයන් පෝෂණය කිරීම සඳහා ඵලදායී සන්නිවේදනය අත්‍යවශ්‍යය වේ. පැහැදිලි සහ විවෘත සන්නිවේදන මාර්ග පුද්ගලයන් සහ කණ්ඩායම් අතර තොරතුරු සහ අදහස් ගලායාම සක්‍රිය කරයි. එසේම සහයෝගීතාවය ද මෙහි දී වැදගත් වේ. අන්තර්සම්බන්ධතාවය, සහයෝගිතාවය සහ කණ්ඩායම් වැඩ කිරීම දිරිමත් කරයි. එහි දී පුද්ගලයන් හවුල් ඉලක්ක කරා එකට වැඩ කරයි. කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් ගැටලු විසඳීමට, තීරණ ගැනීමට සහ කාර්යයන්

වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස ඉටු කිරීමට ඔවුන්ගේ කුසලතා, දැනුම සහ ප්‍රවීණත්වය එකතු කර ගැනීමට ඉඩ සලසයි. ඒ අනුව ආයතනික ධාරිතාවය තීරණය කිරීමේ දී අන්තර්සබදතාව ඉතාමත් වැදගත් වේ.

ආයතනයක් තුළ ක්‍රියාත්මක වන ක්‍රියාපටිපාටීන් සේවාලාභීන් වෙත ගෙන යාමේ කාර්යය හා වගකීම පවතිනුයේ සේවකයන් සහ එම ආයතනය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති මතය. ප්‍රතිපත්තියක සාර්ථකත්වය එය සමාජගත වන ප්‍රමාණය මත රඳා පවතින අතර, ජනතාවගේ දැනුවත්භාවය එයට වැදගත් වේ. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් ද සාර්ථක වීම සඳහා ජනතාවගේ දැනුවත්භාවය ඉතාමත් වැදගත් වේ. මෙම දැනුවත්භාවය යන සාධකය තුළ දී සන්නිවේදනය අවශ්‍ය වන අතර එහි දී, කාර්ය මණ්ඩලය අතර ද ආයතනය හා සේවාලාභීන් අතර ඇති අන්තර්සබඳතාව ඉතාමත් වැදගත් වේ. රජය විසින් රටක් තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් හෝ ප්‍රතිපත්ති පිළිබඳව මහජනතාව සහ එම වැඩසටහන් ක්‍රියාත්මක කරන්නන් අතර ඉහළ දැනුවත්භාවයක් තිබිය යුතුය. ප්‍රතිපත්ති නිර්මාණය වන්නේ තීරණ රැසක එකතුවක් වශයෙනි. ඒ අනුව ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් මහජනතාවගේ ගැටලුවක් හෝ ගැටලු කිහිපයක් සඳහා ලබාදෙන විවිධ සංවර්ධන ව්‍යාපෘති හා තීරණ රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස දැක්විය හැකිය. එම ව්‍යාපෘතීන් පිළිබඳ නිසි දැනුවත්භාවයක් නොමැති වූ විට එම වැඩසටහන් සාර්ථක ලෙස සිදුකිරීම අභියෝගයක් වේ. මෙම අධ්‍යයන පත්‍රිකාව සඳහා තෝරාගත් ව්‍යාපෘතීන් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ වැඩසටහන් එම ආයතන විසින් ක්‍රියාත්මක කර තිබේ.

> “ආයතනයට පැමිණෙන සෑම පුද්ගලයකුටම මෙම ඔන්ලයින් සේවාව පිළිබඳව අත්පත්‍රිකාවක් මගින් දැනුවත් කරනවා. ඊට අමතරව අපගේ 'Department of Motor Traffic Southern Province' යන අපගේ ෆේස්බුක් ගිණුම හරහා දැනුවත් කිරීම් සිදු කරනවා. ඒ වගේම අපගේ වෙබ් අඩවිය තුළින් ද තොරතුරු ලබාගත හැකිය. එසේම අප සිදුකරන ජංගම සේවා හරහාත් මිනිසුන්ව දැනුවත් කරනවා. එසේම මුල් කාලීනව පත්තර, බැනර් ආශ්‍රිතවද දැනුවත් කිරීම් සිදු කරා".

- කාර්ය මණ්ඩලය අතර පවතින අන්තර්සම්බන්ධතාවය

**ප්‍රස්තාරය 2:** කාර්ය මණ්ඩලය අතර පවතින අන්තර්සම්බන්ධතාවය




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2023

- සේවාලාභීන් සහ ආයතනය අතර පවතින සම්බන්ධතාවය

**ප්‍රස්තාරය 3:** සේවාලාභීන් සහ ආයතනය අතර පවතින සම්බන්ධතාවය




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2023

කාර්යක්ෂම සේවාවන් ලබාදීමට නම් සේවාලාභීන් සහ ආයතන අතර යහපත් සම්බන්ධතාවයක් පැවතිය යුතුය. සේවාවන් ලබාදීම පුරාවටම පැහැදිලි සහ ස්ථාවර ලෙස සන්නිවේදනය කිරීම වැදගත් වන්නේ එබැවිනි. කිසියම් පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් විසින් තවත් කෙනෙකු හෝ කණ්ඩායමකට යම්කිසි තොරතුරක් සම්ප්‍රේෂණය කිරීම සන්නිවේදනය ලෙස දැක්විය හැකිය. සන්නිවේදනය සෑම ආයතනයකම තීරණාත්මක අංගයක් වන අතර, එහි කාර්යක්ෂමතාවය සමස්තයෙන් ආයතනික සාර්ථකත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා වැදගත් වේ. සන්නිවේදනය සෑම පරිපාලන කටයුත්තක් සඳහාම යම් ආකාරයකට සම්බන්ධ වීම මත පරිපාලන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම මෙන්ම ඉ-සේවාවන් සාර්ථක කර ගැනීම සඳහා සන්නිවේදනය වැදගත් වේ. කාර්ය මණ්ඩලය අතර පවතින අන්තර්සම්බන්ධතාවය හා සේවාලාභීන් සහ ආයතනය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ කාර්යමණ්ඩලයේ අදහස් ඉහත ප්‍රස්තාරවලින් දක්වා තිබේ. ඒ අනුව කාර්ය මණ්ඩලය අතර පවතින අන්තර්සම්බන්ධතාවය ඉතා හොඳයි ලෙස 16%ක් ද, හොඳයි ලෙස 60%ක් ද, මධ්‍යස්ථයි ලෙස 24%ක් ද අයහපත් ලෙස 0%ක් ද අදහස් දක්වා තිබේ. එසේම සේවාලාභීන් සහ ආයතනය අතර පවතින සම්බන්ධතාවය ඉතා හොඳයි ලෙස 20%ක් ද,හොඳයි ලෙස 52%ක් ද,මධ්‍යස්ථයි ලෙස 28%ක් ද අයහපත් ලෙස 0%ක් ද අදහස් දක්වා තිබේ.

**සම්පත් කළමනාකරණය**

- සම්පත්වල ප්‍රමාණාත්මකභාවය

**ප්‍රස්තාරය 4:** සම්පත්වල ප්‍රමාණාත්මකභාවය




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2023

ඕනෑම ආයතනයක කාර්යයන් වඩාත් කාර්යක්ෂමව නිම කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස සම්පත් තිබිය යුතුය. ප්‍රමාණවත් සම්පත් යන්නෙන් අදහස් කරන්නේ සංවිධානයේ මෙහෙයුම් සඳහා සහාය වීම සඳහා මූල්‍ය, මානව, තාක්ෂණික සහ භෞතික සම්පත් වැනි අවශ්‍ය යෙදවුම් තිබීමයි. ප්‍රමාණවත් සම්පත් සමගින්, සම්පත් හිඟය නිසා ඇතිවන ප්‍රමාදයන් සහ අකාර්යක්ෂමතාවන් වළක්වා ගැනීමට ආයතනවලට හැකිය. ව්‍යාපෘති ප්‍රමාදයන් සහ ඒ ආශ්‍රිත වියදම් අවම කරමින් සැලසුම් කළ කාලරාමුව තුළ කාර්යයන් සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් ලෙස සම්පත් අවශ්‍ය වේ. ප්‍රතිපත්ති සහ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය, මානව සහ තාක්ෂණික සම්පත් ඇතුළු ප්‍රමාණවත් සම්පත් අවශ්‍ය වේ. ශක්තිමත් ආයතනික ධාරිතාව සහ ප්‍රමාණවත් සම්පත් එකිනෙක මත රඳා පවතී. එසේම මෙම ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක කර ගැනීම සඳහා ප්‍රමාණවත් ලෙස සම්පත් පැවතීම ඉතාමත් වැදගත් සාධකයක් වේ. මෙම පරීක්ෂණය සඳහා භාවිතා කරන ලද ආයතනවල කාර්ය මණ්ඩලයේ දැක්වූ තොරතුරුවලට අනුව 51%ක් සම්පත් ප්‍රමාණවත් වන බව ද 48%ක් සම්පත් ප්‍රමාණවත් නොවේ ලෙස දක්වා තිබේ. මෙහි දී, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ ප්‍රමාණවත් සම්පත් පැවතිය ද කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ මෙම මාර්ගගත සේවාවන් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස සම්පත් නොමැති බවට ලබාගත් දත්තවලින් පැහැදිලි වේ.

> “මෙම සේවාවන් ලබා දීම සම්බන්ධයෙන් ඇති ප්‍රධානතම ගැටලුවක් වනුයේ ප්‍රමාණවත් ලෙස පරිගණක නොමැති වීමයි. ප්‍රමාණවත් ලෙස පරිගණක පහසුකම් නොමැති වීම නිසාවෙන් ඇතැම් විට යම් වේලාවක් මේ සඳහා ගත වෙනවා. කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කියන්නේ ගොඩක් කාර්යබහුල තැනක් මිනිසුන් ආයතනයට පැමිණීමෙන් ද මෙම සහතික ලබා ගන්නවා. ඒ නිසා එම

සේවාවන් ද සිදුකරන නිසා පරිගණක පහසුකම් ප්‍රමාණවත් නැහැ.ආයතනයේ ඇති කාර්යබහුලත්වය නිසාවෙන් තිබෙන පරිගණක ප්‍රමාණවත් නැහැ. අපට record room එක ලබා ගන්නත් බොහෝ වෙලාවක් ගත වෙනවා".

එසේම කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ක්‍රියාත්මක වන මෙම මාර්ගගත සේවාවන් සිදුකිරීමේ දී එක් තාක්ෂණික නිලධාරියකු පමණක් පත් කර ඇති අතර, එය සම්පත් කළමනාකරණයේ පවතින දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය. නමුත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ සෑම සේවකයෙකුටම මෙම මාර්ගගත සේවාවන් සිදු කිරීම සඳහා පුහුණුවක් ලබා දේ. එසේම කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ මාර්ගගත සේවාවන් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස සම්පත් නොමැතිකමද දුර්වලතාවයකි. එම නිසාවෙන් ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී එයට අදාළ තාක්ෂණික උපකරණ, මානව සම්පත් අනුයුක්ත කිරීම් අත්‍යවශ්‍ය වේ. එසේම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ ප්‍රමාණවත් යටිතල පහසුකම් හා මානව සම්පත් පවතින බව එහි සේවකයින්ගේ ලබාගත් දත්තවලින් පැහැදිලි වේ. එබැවින් මෙම ආයතන දෙකෙහි ආයතනික ධාරිතාව සංසන්දනය කිරීමේ දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සඳහා ශක්තිමත් ආයතනික ධාරිතාවක් පවතින බව දැකගත හැකිය.

ආයතනික වශයෙන් ප්‍රමාණවත් සම්පත් පැවතිය ද, ලබාගත් දත්තවලට අනුව සේවාලාභීන් හා කාර්ය මණ්ඩලය මුහුණ දෙනු ලබන ගැටලුවක් ලෙස මෘදුකාංග දෝෂ හඳුනා ගත හැකිය. මෙසේ මෘදුකාංග දෝෂ පැන නැගුණ විට ඒවා විසඳා ගැනීමට ආයතනික වශයෙන් හැකියාවක් නොමැති අතර එය තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය විසින් සිදු කළ යුතුය. මෙය ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දෙනු ලබන අභියෝගයක් ලෙස හඳුනාගත හැකි වේ.

"මම ඔන්ලයින් ආදායම් බලපත්‍ර ඉල්ලුම් කරා. ඒ වෙලේම මට තාවකාලික ආදායම් බලපත්‍රයක් ලැබුණා. හැබැයි ඉල්ලුම් කරලා මාස එකහමාරකට වැඩියි. ඒත් මට ආදායම් බලපත්‍රය හම්බුනේ නැහැ. ඊට පස්සේ මම තාවකාලික ආදායම් බලපත්‍රය අරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියත් එතනින් ආදායම් බලපත්‍රය ගන්න බැරි වුණා. ඉන් පසු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගිහිල්ලයි මම නැවත හදා ගත්තේ".

"මම ඔන්ලයින් මගේ උප්පැන්න සහතිකේ ඉල්ලුම් කරා සල්ලිත් කැපුණා. හැබැයි දැන් මාස දෙකකටත් වැඩියි තවම ආවේ නැහැ. කඩවත්සතරෙන් ඇහුවහම කිව්වේ ඔයා හරියට තොරතුරු දාලා නැහැ කියලා. නිවැරදි තොරතුරු දැම්මනම් සතියකින් එනවා කිවුවා".

“ඇතැම් අවස්ථාවල ක්‍රමවේද දෝෂ (System error) නිසා පැමිණිලි එනවා. ඒ තමයි මුදල් කැපිලත් ක්‍රියාවලිය හරියට වෙලා නැහැ. එහෙම අවස්ථාවල අපි එම සල්ලි නැවත එම සේවාලාභියාගේ ගිණුමට බැර කරනවා. ඇතැම් විට ඒක සිදු වෙන්න සතියක් පමණ යනවා. මොකද ඒක බැංකුවේ

ක්‍රියාවලියක් නිසා. ඒ වගේම, ආදායම් බලපත්‍රය නොලැබීම, තාවකාලික ආදායම් බලපත්‍රය නොලැබීම වැනි ගැටලු ඇති වෙනවා. පද්ධතියෙහි සිදුවන දෝෂ සහගත ක්‍රියාවන් නිසාවෙන් තමයි මෙවැනි දේවල් සිදු වන්නේ. මෙම ගැටලු නිසාවෙන් ඇතැම් අය මෙම සේවාවන් භාවිත කිරීමට පැකිළෙනවා. මෙයත් එක් අභියෝගයක් ලෙස දක්වන්න පුළුවන්".

"මෙම සේවාවන් සිදු කිරීම සඳහා ආයතනය සතු පුහුණු මානව සම්පත් හා පරිගණක ප්‍රමාණවත් වුව ද මෘදුකාංගයේ දෝෂයක් සිදු වුවහොත් ඒවා නිරාකරණය කරන්න අපගේ සේවකයන්ට හැකියාවක් නැහැ. එය සංකීර්ණ ක්‍රියාවලියක් එය සිදු කරන්නේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසිනි. නමුත් පරිගණකයක දෝෂයක් සිදු වුවහොත් ඒවා නිරාකරණය කරන්න තාක්ෂණික නිලධාරීන් ඉන්නවා".

**කාලය කළමනාකරණය**

- කාර්යයන් සිදු කිරීමට ගතවන කාලය

**ප්‍රස්තාරය 5:** කාර්යයන් සිදු කිරීමට ගතවන කාලය පිළිබඳ කාර්ය මණ්ඩලයේ අදහස




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2023

ඉ-රාජ්‍ය ව්‍යාපෘතීන්හි එක් ප්‍රධානතම අරමුණක් වනුයේ කාලය කළමනාකරණය කිරීමයි. කාලය කළමනාකරණය කිරීම හරහා කාර්ය සාධනය හා ඵලදායිතාවය ඉහළ නැංවෙයි. ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහ පුරවැසියන්ට සහ ව්‍යාපාරවලට නියමිත වේලාවට සේවා සැපයීමට ඩිජිටල් තාක්ෂණයන් උපයෝගී කර ගත හැකි වේ. රජයේ කාර්යාල වෙත භෞතිකව පැමිණීමේ අවශ්‍යතාවය ඉවත් කරමින් රජයේ සේවාවන් අන්තර්ජාලය හරහා සැපයීමට ඉ-රාජ්‍ය ව්‍යාපෘති පහසුකම් සපයයි. පුරවැසියන්ට සහ ව්‍යාපාරවලට සේවාවන් වෙත ප්‍රවේශ වීමට සහ ඉලෙක්ට්‍රොනිකව ඉල්ලීම් ඉදිරිපත් කිරීමට හැකි වීමෙන් කාලය ඉතිරි කර ගැනීමට හැකි වේ. ආයතනය තුළ ඉ-සේවාවන් නිසාවෙන් සේවකයන්ට තම කාර්යයන් කිරීම පහසු වන අතර කාලය ඉතිරි වීම නිසාවෙන් උපරිම ඵලදායිතාවක් ළඟා කර ගත හැකිය. තෝරාගත් ආයතන දෙකෙහිම සේවකයන්ට එම සේවාවන් සිදු කර ගැනීමට ගතවන කාලය පිළිබඳ විමසා බැලීමේදී බහුතර මතය වූයේ අඩු

කාලයක් ගත වන බවයි. විශේෂයෙන් ඉ-සේවාවන් හඳුන්වා දී තිබෙනුයේ කාලය අවම කර ගැනීම සඳහාය. ඒ ඔස්සේ කාර්යක්ෂමතාවය ඇති කිරීම අරමුණු කරනු ලබයි. සාම්ප්‍රදායික ක්‍රමය හරහා සේවාවන් සිදු කර ගැනීමේදී සේවාලාභීන්ට ආයතනයට පැමිණීම අනිවාර්ය වන අතර එහි දී දීර්ඝ වේලාවක් පෝලිම් තුළ රැඳී සිටීම, ලිපි ගොනු හුවමාරු කිරීම්, කඩදාසි මත දීර්ඝ ලෙස සටහන් කිරීම ආදියට මුහුණ දීමට සිදු වේ. නමුත් ඉ-රාජ්‍ය සේවාවන් හරහා කාර්ය මණ්ඩලයට පමණක් නොව සේවාලාභීන්ට ද තම කාර්යන් සිදු කිරීමට අවම කාලයක් ගත වේ. ඒ හරහා තෘප්තිමත් සේවාලාභීන් පිරිසක් බිහි වේ.

**පරිපාලන කාර්යක්ෂමතාවය**

ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ශක්තිමත් ආයතනික ධාරිතාවක් අවශ්‍ය වන බව ඉහත කරුණුවලින් සාකච්ඡා කරන ලදී. එසේම ආයතනය තුළ කාර්යක්ෂමතාවය ඇති වූ විට සේවාවන් ගුණාත්මකව, ඵලදායිව හා කාර්යක්ෂම ලෙස ලබාදිය හැකි වේ. ලංකාවේ රාජ්‍ය සේවය ගත් විට එයට එල්ල වන ප්‍රබලම චෝදනාවක් වනුයේ අකාර්යක්ෂම බව යි. සම්ප්‍රදායික කඩදාසි මත පදනම්ව සේවා සැපයීම හරහා වැඩි කාලයක් ගත වේ. මෙයට විසඳුමක් ලෙස තාක්ෂණය මත පදනම් වූ ඉ-සේවාවන් හඳුන්වා දී තිබේ. ඒ අනුව ඉ-සේවාවන් හරහා ආයතනයන්හි පරිපාලන කාර්යක්ෂමතාවය සිදුවනවා ද යන්න දත්තදායකයන්ගෙන් විමසන ලදී.

**ප්‍රස්තාරය 6:** පරිපාලන කාර්යක්ෂමතාවය පිළිබඳ කාර්ය මණ්ඩලයේ අදහස




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2023

පරිපාලන කාර්යක්ෂමතාව යනු සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් කාලෝචිත හා ලාභදායී ලෙස තම අරමුණු සාක්ෂාත් කර ගැනීමට සංවිධානයකට හෝ ආයතනයකට ඇති හැකියාවයි. පරිපාලන ක්‍රියාවලීන් විධිමත් කිරීම, නාස්තිය අවම කිරීම සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම ඊට ඇතුළත් වේ. සෑම පරිපාලන ක්‍රියාවලියකම ප්‍රමුඛ අරමුණ වනුයේ කාර්යක්ෂමතාවයෙන් යුතුව කටයුතු කිරීමයි. සේවක මණ්ඩල

කළමනාකරණය කිරීම හරහා අවම සම්පත් භාවිතය තුළින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට ඇති හැකියාව පරිපාලන කාර්යක්ෂමතාවය වේ. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් හරහා පරිපාලන කාර්යක්ෂමතාවය වර්ධනය වේ. ඒ අනුව යෝජිත නියැදිය වෙත යොමු කරන ලද ප්‍රශ්නාවලිය යටතේ ඉ-රාජ්‍ය සේවාවන් හරහා පරිපාලන කාර්යක්ෂමතාවය වර්ධනය වේ. මෙම ප්‍රකාශය සමඟ එකඟ වනවා ද යන්න විමසන ලදී. ඒ අනුව කාර්ය මණ්ඩලයේ බහුතරයක් මෙම ප්‍රකාශය සමඟ එකඟ වේ.

ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් පිළිබඳ මහජනතාවගේ විශ්වාසය මත ඔවුන් එය භාවිත කිරීමට පෙළඹේ. විශේෂයෙන් දත්තවල පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය ආරක්ෂා විය යුතුය. ජනතාව තුළ මෙම සේවාවන් පිළිබඳ විශ්වාසයක් ඇති කිරීමේ වගකීම හිමි වනුයේ ආයතනයටයි. ඔවුහු මෙම ඉ-සේවාවන් ලබා ගැනීමේ දී නිසියාකාරව එම සේවාවන් ලබා ගැනීමට නොහැකි වුවහොත් විශ්වාස අඩු වෙයි. ඒ අනුව දත්තවල රහස්‍යභාවය හා පෞද්ගලිකත්වය හා ඉ-රාජ්‍ය පිළිබඳ විශ්වාසනීයත්වය පිළිබඳවත් දත්තදායකයින්ගෙන් ලබාගත් අදහස් පහත දක්වා තිබේ.

**දත්තවල රහස්‍යභාවය හා පෞද්ගලිකත්වය ආරක්ෂා වීම**

මාර්ගගත සේවාවන් ලබා ගැනීමේ දී දත්තවල රහස්‍යතාවය හා පෞද්ගලිකත්වය ආරක්ෂා වීම ඉතාම වැදගත් වේ. අන්තර්ජාල භාවිතය වැඩිවීමත් සමඟ දත්තවල රහස්‍යභාවේ වැදගත්කම කාලයත් සමඟ වර්ධනය වී ඇත. විශේෂයෙන් තමාගේ පෞද්ගලික තොරතුරු සේම බැංකු විස්තර ද මෙම සේවාවන් ලබා ගැනීමේ දී ඉදිරිපත් කරන නිසා එම තොරතුරුවල රහස්‍යභාවය හා පෞද්ගලිකත්වය ආරක්ෂා විය යුතුය. මාර්ගගත ලෙස සේවාවන් ලබා ගැනීමේ දී මිනිසුන්ගේ පෞද්ගලික තොරතුරු ආරක්ෂා වන බව ඔවුන්ට විශ්වාසයක් තිබිය යුතුය.

**ප්‍රස්ථාරය 7:** දත්තවල රහස්‍යභාවය හා පෞද්ගලිකත්වය පිළිබඳ අදහස




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2023

මෙම පර්යේෂණය සඳහා භාවිතා කරන ලද දත්ත නියැදිය තුළින් මෙසේ දත්තවල රහස්‍යභාවය හා පෞද්ගලිකත්වය ආරක්ෂාවනවා ද යන්න පිළිබඳ විමසා බැලීමේ දී 49% ක් ඒ පිළිබඳව සෑහීමකට පත්වන බව ද 43% ක් මධ්‍යස්ථ බව ද, 2% ක් දැඩි ලෙස සෑහීමට පත්වන බව ද, 6% ක් සෑහීමට පත් නොවන බව දක්වා තිබේ. එම දත්තවලට අනුව ඇතැම් පිරිසක් මාර්ගගත ලෙස සේවාවන් ලබා ගැනීමේදී ඒ සඳහා ඉදිරිපත් කරන තමාගේ පෞද්ගලික තොරතුරුවල රහස්‍යභාවය හා පෞද්ගලිකත්වය පිළිබඳ සෑහීමකට පත් වන බව ද තවත් පිරිසක් මධ්‍යස්ථ මතයක් දරන බවට අදහස් දක්වා තිබේ.

**ඉ-රාජ්‍ය ව්‍යාපෘතීන් පිළිබඳ විශ්වසනීයත්වය**

**ප්‍රස්තාරය 8:** ඉ-රාජ්‍ය ව්‍යාපෘතීන් පිළිබඳ විශ්වසනීයත්වය




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2023

පරිපාලන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා භාවිතා කරන ඉ-සේවාවන් පිළිබඳ මිනිසුන්ගේ දැනුවත්භාවය මැනීමේ දී මිනිසුන් තුළ ඉ-සේවාවන් පිළිබඳ ඇති විශ්වාසය ද ඒ සඳහා බලපානු ලබයි. විශේෂයෙන් ඉ-සේවාවන් පිළිගැනීම, සම්මත කිරීම සහ භාවිතය සඳහා විශ්වසනීයත්වය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. යම් වෙබ් අඩවියකින් පරිශීලකයා අපේක්ෂා කරන දේ ඉටු කිරීමට හැකි විය යුතුය. එසේම සේවාවන්හි ගුණාත්මකභාවය ද ඉහළ යාම හරහා පරිශීලකයා තෘප්තිමත් වේ. ඒ අනුව මෙම සේවාවන් හරහා ගුණාත්මක තොරතුරු ලබා ගත හැකි බව ජනතාවට හැඟෙන්නේ නම් ජනතාවගේ විශ්වාසය ගොඩනැගීමට එය හේතු වේ.

නියැදි සමීක්ෂණ දත්තවලට අනුව 32% ක් විශ්වාස කරනු ලබයි ලෙස ද 2% ක් දැඩි ලෙස විශ්වාස කරනු ලබයි ලෙස ද, 38% ක් මධ්‍යස්ථයි ලෙස ද,28% ක් විශ්වාස නොකරයි ලෙස දක්වා තිබේ. ඒ අනුව වැඩි පිරිසක් මෙම සේවාවන් විශ්වාස කිරීම පිළිබඳ මධ්‍යස්ථ මතයක් දරනු ලබයි. එසේම 28% ක පිරිසක් විශ්වාස නොකරයි ලෙස ද දක්වා තිබේ. ඒ අනුව පැහැදිලි වනුයේ මෙම ඉ-සේවාවන් පිළිබඳ ජනතාව අතර වැඩි විශ්වාසයක් නොමැති බවයි. එසේම 32% ක පමණ පිරිසක් විශ්වාස කරයි ලෙස දැක්වුව ද වැඩි පිරිසක් මධ්‍යස්ථ මතයක් දැරීම හා විශ්වාස නොකරයි ලෙස දැක්වීම මත මෙම සේවාවන් පිළිබඳ දැඩි විශ්වාසයක් ඔවුන් තුළ නොමැති බව

පෙනේ. ඇතැම් විට ඉ-සේවාවන් පිළිබඳ දැනුවත්භාවයක් තිබුණත් ඒවා භාවිත නොකිරීමට මෙය ද හේතුවක් විය හැකිය.

විශේෂයෙන් දත්තදායකයින්ගෙන් ලබාගත් දත්තවලට අනුව මෙම සේවාවන් ලබා ගැනීමේ දී විවිධ ගැටලුවලට ඔවුන් මුහුණ දී තිබේ. නිදසුනක් ලෙස තම මුදල් අය කෙරුණ ද බලපත්‍ර නොලැබීම වැනි ගැටලුවලට මහජනතාව මුහුණ දී තිබේ. මෙවැනි හේතුන් මත ඔවුන් තුළ ඉ-සේවාවන් පිළිබඳ විශ්වාසය අඩු වේ. එවිට ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් තුළින් බලාපොරොත්තු වන ප්‍රතිලාභ ලබාගත නොහැකි වේ. එම නිසා මහජනතාව තුළ විශ්වාසය වැඩෙන අයුරින් සේවාවන් සැපයීම ආයතනය සතු වගකීමකි. එම නිසාවෙන් ඒ සඳහා ආයතනික ධාරිතාවය ශක්තිමත් කළ යුතුය.

**නිගමනය**

රජයේ මෙහෙයුම් සහ සේවා සැපයීම වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ භාවිත කිරීම සඳහා යොමු වන විද්‍යුත් රජය, ලොව පුරා සැලකිය යුතු අවධානයක් දිනා ගෙන ඇත. ඉ-රාජ්‍ය මුල පිරීම්වල සාර්ථකත්වය විවිධ සාධක මත රඳා පවතින අතර, එක් තීරණාත්මක අංගයක් වන්නේ ආයතනික ධාරිතාවයි. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කොට බලාපොරොත්තු වන ආකාරයේ ප්‍රතිඵල ලබා ගැනීමට නම් ආයතනික ක්‍රියාකාරිත්වය ශක්තිමත් විය යුතුය. ඒ අනුව ඉහත විශ්ලේෂණය කළ දත්තයන්ට අනුව ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීමට නම් පුහුණු සේවක පිරිසක් ආයතනය තුළ සිටිය යුතුය. ඉ-රාජ්‍ය පිළිබඳ නිවැරදි දැනුමක් සහ නිවැරදි මග පෙන්වීමක් යටතේ දක්ෂ කාර්ය මණ්ඩලයක් පත් කළ යුතුය. විශේෂයෙන් තාක්ෂණික දැනුමක් ඇති සේවකයන් ආයතනය තුළ සේවය කිරීම හරහා ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කළ හැකි අතර පුහුණුවක් සහිත සේවකයන් සිටීම හරහා ඉ-රාජ්‍ය සේවාවන් කාර්යක්ෂමව සිදු කළ හැකිය. එසේම ප්‍රමාණවත් යටිතල පහසුකම් පැවතීම හරහාද ඉ-රාජ්‍ය සේවාවන් සාර්ථක කර ගත හැකි වේ. දත්තදායකයන්ගෙන් ලබා ගත් දත්තවලට අනුව පැහැදිලි වනුයේ ප්‍රමාණවත් පහසුකම් නොමැති වූ විට එම සේවාවන් සිදු කිරීමට වැඩි වේලාවක් ගතවන බවයි. එම නිසාවෙන් පැහැදිලි වනුයේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක වීම සඳහා නිසැකයෙන්ම ප්‍රමාණවත් ලෙස සම්පත් තිබිය යුතු බවයි. ඒ අනුව ආයතනික ක්‍රියාකාරිත්වය ශක්තිමත් නොවුණහොත් එය ඉ-රාජ්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පානු ලබන අභියෝගයක් වේ.
ඉ-රාජ්‍ය පිළිබඳව පාර්ශවකරුවන්ට පවතින අඩු දැනුම් මට්ටම හේතුවෙන් නිසි ප්‍රතිලාභ ලබා ගැනීමට අපහසු වේ. විශේෂයෙන් ඉ-රාජ්‍ය සේවාවන් ක්‍රියාත්මක කරන කාර්ය මණ්ඩලය සතුව ඒ පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

නැතිනම් ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කළ නොහැකි වේ. එයින් පැහැදිලි වනුයේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික ධාරිතාවය වැදගත් වන බවයි. එසේම ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක වීම සඳහා මහජන දැනුවත්භාවය ඉතාමත් වැදගත් වේ. ෆේස්බුක්, නිල වෙබ් අඩවිය, අත් පත්‍රිකා මාර්ගයෙන් එම සේවාවන් පිළිබඳ දැනුවත් කිරීම් සිදු කර තිබේ. එම ක්‍රියාමාර්ගයන් හරහා සේවාලාභීන් හා ආයතනික නිලධාරීන් අතර සබඳතාවය ගොඩනගාගත හැකි ය. මෙසේ යහපත් සබඳතාවයක් තිබීම හරහා

ප්‍රතිපත්තියක් සාර්ථක කරගත හැකිවේ. ඒ අනුව පැහැදිලි වනුයේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන්හි සාර්ථකත්වය සඳහා ආයතනික ධාරිතාවය ඉතාමත් වැදගත් සාධකයක් බවයි.

එසේම ඉ-රාජ්‍ය ප්‍රතිපත්තීන් සාර්ථක කර ගැනීම සඳහා ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීමේ දී ඉ-රාජ්‍ය සේවා සපයනු ලබන පරිපාලන ආයතනවලට සැලකිය යුතු තාක්ෂණික යටිතල පහසුකම් හා මානව සම්පත් වර්ධනය කළ යුතුය. එනම්, විද්‍යුත් රාජ්‍ය සේවා ඵලදායි ලෙස සැපයීම සඳහා පරිපාලන ආයතනවලට සැලකිය යුතු තාක්ෂණික යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනය අත්‍යවශ්‍ය වේ. එහි දී ශක්තිමත් තොරතුරු තාක්ෂණ පද්ධතියක් පැවතීම අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් ඉ-සේවාවන් සඳහා අවශ්‍ය දෘඪාංග සහ මෘදුකාංග පහසුකම් නිසි ලෙස ස්ථාපිත කළ යුතුය. වැඩිවන පරිශීලක ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්විය හැකි පරිදි යටිතල පහසුකම් වර්ධනය කළ යුතුවේ. එසේම පුරවැසියන්ගේ දත්ත ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් සයිබර් ආරක්ෂණ පියවරයන් ක්‍රියාත්මක කල යුතු අතර තොරතුරුවල ආරක්ෂාව හා රහස්‍යභාවය තහවුරු කිරීම වැදගත් වේ. එසේම ආයතනවල ඉ-සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය ද අත්‍යවශ්‍ය වේ. විද්‍යුත් රාජ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය නිශ්චිත නිපුණතා හඳුනා ගැනීම සඳහා සේවකයන්ගේ පුළුල් කුසලතා ඇගයීමක් සිදු කිරීම කළ හැකිය. එසේම දැනට සිටින සේවකයන්ගේ කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ස්ථාපිත කිරීම ද කළ හැකිවේ. මෙහි දී අභ්‍යන්තර පුහුණු, වැඩමුළු, මාර්ගගත පාඨමාලා සහ පුහුණු ආයතන හෝ විශේෂඥයන් සමඟ ක්‍රියා කිරීමෙන් පුහුණු මානව සම්පත් නිර්මාණය කළ හැකි වේ.

රාජ්‍ය සේවකයින්ගේ තොරතුරු සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්තියක් සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම හරහා ද ආයතනික ධාරිතාවය ශක්තිමත් කළ හැකි වේ. මේ ආකාරයට ප්‍රතිපත්තියක් ඉදිරිපත් කිරීමෙන් අරමුණු කරනු ලබන්නේ රාජ්‍ය සේවකයන්ගේ තොරතුරු සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා මාර්ගෝපදේශ සහ ක්‍රියාපටිපාටි ස්ථාපිත කිරීමයි. සම්පත් වෙත ඵලදායී ලෙස ප්‍රවේශ වීමට, ඇගයීමට සහ භාවිත කිරීමට අවශ්‍ය කුසලතා සහ දැනුම රාජ්‍ය සේවකයින් සතු බව සහතික කළ යුතුය. එවිට කාර්යක්ෂම රාජ්‍ය සේවයක් නිර්මාණය කළ හැකි වේ. විශේෂයෙන් රාජ්‍ය අංශයේ සෑම තරාතිරකම තොරතුරු සාක්ෂරතාවය තීරණාත්මක නිපුණතාවයක් ලෙස ප්‍රවර්ධනය කළ යුතුය. රාජ්‍ය අංශයේ සියලුම ආකාරයේ බඳවා ගැනීම්වල දී තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය සුදුසුකමක් ලෙස සැලකීම මගින් රාජ්‍ය සේවකයින්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නංවා නංවාගත හැකිය.

එසේම වෙනස් වන තාක්ෂණයත් සමඟ සේවකයින්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම අරමුණු කොට ගත් පුහුණු යන්ත්‍රණයක් ආයතනික මට්ටමින් ක්‍රියාත්මක කිරීම ද වැදගත් වේ. තාක්ෂණය ශීඝ්‍රයෙන් පරිණාමය වෙමින් පවතින අතර තරගකාරීව සිටීමට ආයතන මෙම වෙනස්කම් සමඟ වේගයෙන් ගමන් කළ යුතුය. පුහුණු යන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමෙන්, නව තාක්‍ෂණයන්ට අනුවර්තනය වීමට සහ ඔවුන්ගේ කාර්යභාරයන් සඳහා ඔවුන්ව ඵලදායී ලෙස භාවිතා කිරීමට අවශ්‍ය කුසලතා සහ දැනුම තම සේවකයින්ට ඇති බව ආයතනවලට සහතික කළ හැකිය. තාක්‍ෂණය භාවිතා කිරීමේ දී සේවකයින් හොඳින් පුහුණු වූ විට, එය ක්‍රියාවලීන් විධිමත්

කිරීමට, කාර්යයන් ස්වයංක්‍රීය කිරීමට සහ සමස්ත ආයතනික කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට හැකිය. සේවකයින්ට ඔවුන්ගේ කාර්යයන් වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට, දෝෂ අවම කිරීමට සහ සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීමට තාක්ෂණික මෙවලම් භාවිත කළ හැකිය.

දත්තදායකයින්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව ඇතැම් පුරවැසියන්ට මෙම සේවාවන් ලබා ගැනීමේ දී ගැටලු ඇති වී තිබේ. එයට හේතු වනුයේ වෙබ් අඩවියේ ඇති දෝෂ නිසාවෙනි. එම දෝෂ නිරාකරණය කිරීමට පියවර ගත යුතුය. මෙසේ වෙබ් අඩවිවල ඇති දෝෂ හෝ ගැටලු නිසාවෙන් පරිශීලකයින් අපහසුතාවයට පත්වන අතර ඒ කෙරෙහි විශ්වාසය නැතිවීම ඇතුළු සෘණාත්මක ප්‍රතිවිපාක ඇති කළ හැක. ආයතන විසින් වෙබ් අඩවි නඩත්තු කිරීමට ප්‍රමුඛත්වයක් දිය යුතුය. සමස්තයක් වශයෙන්, ඉ-සේවා වෙබ් අඩවිවල පවතින දෝෂ වහා හඳුනාගෙන ඒවා විසඳීමෙන්, ආයතනවලට ඔවුන්ගේ පරිශීලකයින්ට බාධාවකින් තොරව සහ ආරක්ෂිතව ඉ-සේවා පහසුකම් ලබා ගැනීමට හැකිවේ. ඒ අනුව මෙවැනි ක්‍රියාදාමයන් හරහා ආයතනික ධාරිතාවය ශක්තිමත් කර ගත හැකි වේ.

**සමුද්දේශ**


Banda, D. and Dissanayake, N. (2022). Role of e-Government in Public Services Delivery in Sri Lanka: A Review. Retrieved from http://pgihs.ac.lk/downloads/books/8%20chapter.pdf

Davidrajuh, R. (2004). Planning e-Government Start-up: A Case Study on e-Sri Lanka. Retrieved from https://www.researchgate.net/publication/220082676_Planning_e-government_start-up_a_case_study_on_e-Sri_Lanka

Dilinika, S. (2020). Evaluate the Usage of e-Government Services in Sri Lanka: A Citizen's Perspective. Retrieved from http://repository.kln.ac.lk/jspui/handle/123456789/22153

Priyashantha, K. G. and Dilhani, V. I. (2021). Determinants of Intention to Use e-Government Services in Sri Lanka. Retrieved from https://www.researchgate.net/publication/356790159_Determinants_of_Intention_to_Use_e-Government_Services_in_Sri_Lanka

Karunasena, K. (2012). An Investigation of the Public Value of e-Government in Sri Lanka. Retrieved from https://www.academia.edu/30220391/An_Investigation_of_the_Public_Value_of_e_Government_in_Sri_Lanka

Morote, R., Rosa, C. and Chicharro, M. (2020). The effects of e-government evaluation, trust and the digital divide in the levels of e-government use in European countries. Retrieved from https://www.sciencedirect.com/science/article/pii/S0040162519313150

Dayaratna, O. G. and Dissanayake, N. (n.d.). Role of E-Government in Public Services Delivery in. Human Rights and Reconciliation in the Post-Conflict Multicultural Society in Sri Lanka. http://pgihs.ac.lk/downloads/books/8%20chapter.pdf

Liyanage, P. M. T. S. K. Gunatunga, G. P. P. and Wickramasinghe, P. D. D. M. (2020). e-Government Adoption in Sri Lanka: Barriers. Retrieved from https://www.nsbm.ac.lk/wp-content/uploads/2021/08/ICOBI_2020_E-Government-Adoption-in-Sri-Lanka-Barriers-and-Challenges-from-International-Perception-A-Literature-Review.pdf

Salam, M. A. (2013). e-Governance for Good Governance. Retrieved from https://core.ac.uk/download/pdf/61804691.pdf

Tennakoon, N. (2020). e-Governance Way Forward: Challenges and Opportunities for Developing Countries. Evidence from Sri Lanka. Retrieved from https://www.researchgate.net/publication/343206701_E-Governance_Way_Forward_Challenges_and_Opportunities_for_Developing_Countries_Evidence_from_Sri_Lanka

UN. (2022). UN e-Government Survey 2022. Retrieved from un.org: https://publicadministration.un.org/egovkb/en-us/Data-Center

UN. (n.d.). e-Government. Retrieved from UN: https://publicadministration.un.org/egovkb/en-us/Overview

Weerakkody, V. Yogesh K. D. and Asoka K. (2009). Implementing e-government in Sri Lanka: Lessons from the UK. *academia.edu*, 23. Retrieved from https://www.academia.edu/13371521/Implementing_e-government_in_Sri_Lanka_Lessons_from_the_UK

Zoysa, I. (2014). The Rise of Sri Lanka's E-Government Services. Retrieved from https://www.icta.lk/news/the-rise-of-sri-lankas-e-government-services/#:~:text=E%2Dgovernment%20is%20'the%20use,%2DGovernment%20Readiness%20Report%202004

ආඛ්‍යාන narrations
**Volume 08 | Issue 01 | January-June 2023 | Article 04**
**ISSN 2478-0642**

On-line Refereed Biannual Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# යක්ෂාවේශය සඳහා වන සුව කිරීමේ ප්‍රතිකර්මය ලෙස තොවිලය: සමාජ මානව විද්‍යාත්මක කියැවීමක්

**චමීෂා ශ්‍යාමලී,** සමාජ විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය,
chameeshashyamali0411@gmail.com

**දිනුෂිකා යාපා අබේවර්ධන,** සමාජ විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
dinushikay@arts.pdn.ac.lk

**සාරසංක්ෂේපය**

යාතුකර්ම යනු ලාංකේය සමාජයේ සිංහල සංස්කෘතිය සමඟ ඉතා සමීපව බැඳී ඇති සුව කිරීමේ ප්‍රතිකර්මයක් ලෙස හඳුනාගත හැකිය. මෙම ප්‍රතිකර්මය තොවිලය යන ලාංකේය ස්වදේශීය යාතුකර්මය සමඟ නිතැතින්ම බැඳී පවතින අතර, ඒ සම්බන්ධ සමාජ මානව විද්‍යාත්මක කතිකාව ප්‍රබල සමාජ අවධානයක් සහ වටිනාකමක් සහිත වේ. මෙම පර්යේෂණය යක්ෂාවේශය සඳහා වන සුව කිරීමේ ප්‍රතිකාර ක්‍රමයක් ලෙස තොවිලය සම්බන්ධයෙන් එම තොවිලයේ ප්‍රධානම කාර්යයභාරයක් ඉටු කරන්නා වූ යකැදුරන් සහ ඔවුන්ගේ ආවතේවකරුවන් පරිකල්පනය කරනුයේ කෙසේ ද යන ගැටලුව කේන්ද්‍ර කරගනිමින් කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත, මීගහතැන්න ග්‍රාම නිලධාරී වසම තුළ අරමුණු සහගත ලෙස තෝරාගත් යකැදුරන් පස් දෙනෙකුගෙන් (05) සහ ආවතේවකරුවන් පස් දෙනෙකුගෙන් (05) සමන්විත නියැදියක් මඟින් ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා හරහා ලබාගත් ගුණාත්මක දත්ත ඔස්සේ සිදු කරන ලද්දකි. ප්‍රධාන වශයෙන්ම ක්ෂේත්‍රයේ ප්‍රකටව පවතින යාතුකර්ම කිහිපයක් තෝරා ගනිමින්, ඒවා අදාළ ප්‍රතිචාරකයින්ගේ පර්යාවලෝකයෙන් විමසීම මෙහි දී සිදු කර ඇත. අවට සමාජයේ පවත්නා නිරවද්‍යතාවය, විද්‍යාත්මකව සහ තාර්කිකව විමසීමට වර්තමානය වන විට විද්‍යාව පූර්ණ වශයෙන් සමර්ථ වී නැත. එයින් ගම්‍යමාන වන්නේ විද්‍යාවේ සත්‍යතාවය රැඳී ඇත්තේ නව මතයක් එළිදැක්වීම තුළ පමණක් වන බවයි. නමුත් සාම්ප්‍රදායික චින්තනය එසේ නොවේ. එය භාවයන් ප්‍රධානව ගොඩ නැඟී ඇත. එහෙයින් එය ස්ථිරසාරය. එහෙත් සාම්ප්‍රදායික චින්තනය වෙනස් නොවෙතැයි කිව නොහැකිය. කිව හැක්කේ එම චින්තනය වෙනස් වන්නේ ඉතා දීර්ඝ කාලයක් ගත වීමෙන් පසුව බවයි. සිංහල සමාජයේ යාතුකර්ම ඔස්සේ එකී ස්වභාවය ඉතා යෝග්‍ය ලෙස විද්‍යමාන වේ.

**මූල පද:** *තොවිලය, යාතුකර්ම, යකැදුරන්, සමාජ මානව විද්‍යාව, සුවකිරීම*

**හැඳින්වීම**

යක්ෂයින් සම්බන්ධව සාකච්ඡා කිරීමේ දී ලාංකික සමාජය තුළ විවිධාකාර පුරාවෘත හා ජනප්‍රවාද රාශියක් ඇති බව දැකගත හැකිය. එමෙන්ම බුදු සමය ලක්දිව ජාතික ආගම බවට පත්ව තිබිය දීත් පෙර පැවති යක්ෂ ඇදහිලි පොදු ජනතාව අතර පැවතී ඇත. විශේෂයෙන් වර්තමානය වනවිටත් මෙරට ග්‍රාමීය ප්‍රදේශවල යක්ෂයින් උදෙසා දොළ පිදේනි දීම් සහ තොවිල් නැටීම් ආදිය සිදු වෙමින් පවතී. මේ ආකාරයට විමසා බැලීමේ දී යක්ෂයින් යනු සංස්කෘතියේ කොටසක් බවත් එය ජන සාහිත්‍යයක් පහළ වීමට හේතු වූ බවත් දැක්වීම නිවැරදිය.

ලංකාවේ පමණක් නොව ලෝකයේ වෙනත් රටවල් රාශියක ද යක්ෂයින් පිළිබඳව සඳහන් වේ. උදාහරණ වශයෙන් "ලාමියා යක්ෂණිය ග්‍රීක පුරාවෘත්තයෙන් උත්පාදනය වී පසුව යුරෝපයේ වෙනත් ප්‍රදේශවල ව්‍යාප්ත වූවකි. මෙම දෙවඟන කෙරෙහි සියුස් දෙවියා විශේෂ ඇල්මක් දැක්වූ බැවින් ඔහුගේ අග මෙහෙසිය වූ හේරාට තදබල වෛරයක් ඇතිව ලාමියාගේ දරුවන් සියලු දෙනා ඝාතනය කරවන ලදි. ඉන්පසුව ලාමියා වෙනත් මව්වරුන්ගේ දරුවන් කා දමන යක්ෂණියක් බවට රූපාන්තරණය කරවා ගැමි සමාජයට පිටත් කර එව්වා ය" (සමරසිංහ, 2016: 150). සමරසිංහ (2016) තවදුරටත් දක්වන ආකාරයට, වෙනිසියුලාවේ අතිශයින්ම ජනප්‍රිය මෙවැනිම කතාවස්තුවක් ලෙසින් සයොනා පුරාවෘත්තය හඳුන්වා දීමට හැකිය. මෙය ලංකාවේ අතිශයින්ම ජනප්‍රිය මෝහිනී අවතාරයට සමාන කතා වස්තුවකි. ඒ අනුව යක්ෂයින් සම්බන්ධ පුරාවෘත නිර්මාණය වීමෙහිලා අදාළ රටවල වෙසෙන විවිධ ජන කොට්ඨාසයන්හි සංස්කෘතික පසුබිම, සමාජ පසුබිම හා ආගමික විශ්වාසයන් ද බොහෝ දුරට බලපානු ලබන බැව් කිව හැකිය.

ග්‍රාමීය ප්‍රදේශයන්හි පුද්ගලයෝ තමන් වෙත යම්කිසි උපද්‍රවයක් පැමිණි විට 'යකෙක් ගහලා', 'යකෙක් ආවේශ වෙලාලු', 'භාරෙ ඔප්පු කරේ නැති නිසාලු' යන ආකාරයේ වදන් ප්‍රකාශ කිරීමට පුරුදුව සිටිති. තමන්ට යම්කිසි උපද්‍රවයක් සිදු වන්නේ නම් එය යක්ෂාවේශයක් නිසා සිදු වූවක් බව ගැමියෝ තරයේ විශ්වාස කරති. වර්තමානය වන විටත් පවතින සමාජ, ආර්ථික, දේශපාලන යනාදී සමාජ සංස්ථා මත ගැටෙන මිනිසාගේ මානසික තත්ත්වයන්ගේ අසාමාන්‍ය ස්වරූපයක් දැක්වූ විට, එනම් යමෙක් කටහඬ වෙනස් කර කතා කරන්නේ නම්, බෙර පදයක් කන වැකෙත්ම යමෙක් නටන්නේ නම්, ඒවා යක්ෂාවේශය නිසා වූ බව දක්වන අවස්ථා සමකාලීන ග්‍රාමීය සමාජයේ ද හඳුනාගත හැකි අවස්ථා පවතී. මේ සඳහා පිළියම් වශයෙන් යක්ෂයින් සතුටු වන පරිදි බලි, බිලි, පිදේනි, පූජා ඔප්පු කළහොත් සෙත් ශාන්තියක් ලැබෙන බව විශ්වාස කරන්නට විශේෂයෙන් බෞද්ධයන් පුරුදු ව සිටී.

"බොහෝ දේවභූත යක්ෂ ප්‍රේතකාය සතුටු කරවන ශාන්තිකර්මවලට තොවිල් යයි කියනු ලැබේ. මේ යක් තොවිල් ශත වර්ෂ ගණනාවක් තිස්සේ විකාශනය වී සාහිත්‍යයක් බවට ද පත් වී තිබේ. මෙකී සාහිත්‍යය වටා ඇති පූජා රටාවන් ඉටු කරන පූජකයන්ට යක් දෙස්සෝ, ඇදුරෝ හා ගුරුන්නාන්සේලා යන නම් ව්‍යවහාරිකය. මෙහි දී පහතරට බලපවත්වන ප්‍රධාන යක් තොවිල් හතරක් තිබේ. එනම් සූනියම් කැපිල්ල, රට යකුම, මහ සොහොන් සමයම සහ සන්නි යකුමයි" (කාරියවසම්, 1998: 21). යක් තොවිල් යනු ආතුරයාට බලපා ඇති දිෂ්ටිය ඉවත්

කිරීම සඳහා සිදු කරන ප්‍රධාන ක්‍රියාවක් බව තවදුරටත් ඩේවිඩ් ස්කොට් තම Formation of Ritual (1994) කෘතියේ දක්වා තිබේ. "දිෂ්ටිය යනුවෙන් ඔහු දක්වන්නේ යක්ෂයින්ගේ බැල්මේ ඇති ශක්තියයි" (Scott, 1994: 280). එම බැල්ම ආතුරයා වෙත යළි ලැබීම වැළැක්වීම සඳහා යක් තොවිල් සිදු කරන බව මෙයින් පැහැදිලි වේ.

"ලංකාවේ යක්ෂ යන සංකල්පය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය වන්නේ 'demon' ලෙස වන අතර, එය අදාළ ආසන්නතම අර්ථයෙන් බටහිර අඳුරු බලවේග සමග ආදේශ කරන නමුත්, සංකල්පීය වශයෙන් එය පුළුල් වශයෙන් නොගැළපෙන තැන් බොහෝ පවතී" (Kapferer, 1991). කෙසේ නමුත් අතීතයේ පටන්ම ලාංකේය ජනයා තුළ යක්ෂයින් කෙරෙහි ඇල්මකට වඩා බියක් පැවති බව ජන සාහිත්‍යයෙන් පිළිබිඹු වේ. යක්ෂාවේශය යනු සරලව අර්ථ දැක්වුවහොත් ජන සාහිත්‍යයේ එන යක්ෂයින්ගේ ලක්ෂණ පුද්ගලයෙකුට ආරෝපණය වීමක් යනුවෙන් සැකෙවින් හැඳින්විය හැකිය. එනම් යක් තොවිල්වල දී අප දැක ඇති පරිදි අසාමාන්‍ය ලෙසින් දත්කුරු කෑම, හිස කරකැවීම, වියරුව හා ප්‍රචණ්ඩ බව ආතුරයෙකුගෙන් දැකීමට හැකි වීමයි. ඩේවිඩ් ස්කොට් දක්වන්නේ "යක්ෂාවේශය යනු යකුන්ගේ දුෂ්ට බලපෑමට යටත්ව වෙව්ලීම හා අවසිහියෙන් කටයුතු කරන තත්ත්වයට පත් වීමක් බවයි" (Scott, 1994: 279). තවදුරටත් ඔහු පවසන්නේ යක් තොවිලයක දී යක් ඇදුරා විසින් පීඩාවට පත් වූ පුද්ගලයා යම් භාෂාවක් වෙත පොළඹවා සිදු වී ඇති තත්ත්වය වටහා ගන්නා බවයි. ආවේශයක දී යකැදුරා හා ආතුරයා අතර සංවාදය සාමාන්‍යයෙන් සිංහලෙන් සිදු වුවත් ඇතැම් විටෙක යක්ෂයෙකුට ආරූඪ වූ ආතුරයෙක් විවිධාකාර සංකේත මගින් භාෂාව භාවිත කරන බව යක් තොවිල්වල දී දැක ගත හැකිය. ආවේශ වීම් යක්ෂයින්, ප්‍රේතයින්, පිසාචයින්ගෙන් ලැබෙන්නක් බව ජනප්‍රවාදයේ දැක්වෙන අතර එය දිගු අතීතයකට උරුමකම් පවසයි. අතීතයේ පටන්ම සමාජයේ ඔවුන්ට ද නිශ්චිත ස්ථානයක් විය. විශේෂයෙන් බෞද්ධයන්ට අනුව බෞද්ධ දේව ධුරාවලියක් තුළින් යක්ෂයින් මෙහෙයවීම සිදු වී ඇත. ඒ අනුව එකී බෞද්ධ දේව ධුරාවලිය තුළ යක්ෂයින් ස්ථානගත වී ඇති ආකාරය පිළිබඳව අවධානය යොමු කිරීම වත්මන් සාකච්ඡාව සඳහා ද වැදගත් වේ.

**රූප සටහන 1:** බෞද්ධ දේව ධුරාවලිය




මූලාශ්‍රය: කාරියවසම්, 1998: 137

උක්ත ධූරාවලියේ පහළම ස්තරයේ සිටින ප්‍රේතයන් වූ කලී ඉතාම අවාසනාවන්ත පිරිසකි. තමන්ගේ ඥාතීන් විසින් පිංකම් කරවා පිං අනුමෝදනා කරවන තෙක් ඔවුහු බලා සිටිති. මොවුන් පලවා හැරීමට නම් ප්‍රේත තටුවක් ඔප්පු කිරීමෙන් අනතුරුව පිං අනුමෝදනා කිරීම හෝ ප්‍රේතයා බැඳ මුහුදට දැමීම සිදු කරයි. යක්ෂයින් ප්‍රේතයින්ට වඩා බලවත්ය. මේ සියල්ලන්ටම වඩා බුදුන් වහන්සේ ධූරාවලියේ ඉහළම හිඳිති.

මේ ආකාරයෙන් විමසන විට හඳුනාගත හැකි පරිදි මිනිසා අදෘශ්‍යමාන බලවේගයන්ට පුද පූජා කරන ලද්දේ අරමුණු දෙකක් ඉලක්ක කොටගෙන බැව් කිව හැකිය. එනම්, එක් අතෙකින් ස්වභාවිකව ඇතිවන විපත් වළක්වා සැමට ශාන්තිය අත්කර ගැනීමටත්, අනෙක් අතින් පෞද්ගලික අපේක්ෂාවන් ඉටුකර ගැනීමට සහ සතුරු කරදර ඉවත් කිරීමටත් මිනිසුන් මෙවන් අදෘශමාන බලවේග සමඟ කටයුතු කිරීම සිදුවන බව කිව හැකිය. මෙහි දී මුල් අරමුණ සඳහා පුද්ගලයා වන්දනාමාන කරනුයේ දෙවියන්ටය. දෙවැනි අරමුණ සඳහා පුද්ගලයා පුද පූජා පැවැත්වූයේ යක්‍ෂයින්ටය. එහෙයින් පැහැදිලි වන්නේ අතීතයේ පටන් යක්‍ෂයින් යනු අයහපතට වැඩ සලසන කොට්ඨාසයක් ලෙස පුද්ගලයින් විසින් හඳුනා ගෙන සිටි බවකි. එබැවින් යක්‍ෂ සංකල්පය කළු අභිචාර සමඟ සම්බන්ධ වන, අයහපත සඳහා මුඛ්‍ය වශයෙන් ව්‍යවහාර කරන ලද්දක් බැව් පෙනී යන්නකි.

මේ ආකාරයට පුද්ගලයා උපතේ සිට මරණය දක්වා ජීවිතය පවත්වා ගැනීමේ දී කායික මානසික හා සමාජයීය වශයෙන් මුහුණ දෙන්නා වූ අවස්ථාවන්හි ඇතිවන උපද්‍රවයන්ට හේතුව ලෙස යක්‍ෂාවේශය බලපෑම් කරන බව බොහෝ අවස්ථාවන්හි පැහැදිලි වන කරුණකි (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017). යක්‍ෂාවේශවූවන් එය සුව කර ගැනීම සඳහා බටහිර වෛද්‍ය විද්‍යාව වෙත යොමු වීම ද වර්තමානයේ තරමක් දුරට දැක ගත හැකිය. නමුත් මෙම යක්‍ෂාවේශය යන්නත්, යක් තොවිල් යන්නත් අද වන විටත් නොනැසී පවතින්නේ ඒ තුළින් ද යම් කිසි සුවයක් පුද්ගලයාට හිමි වීම නිසාවෙන් බව පැවසීම යුක්ති සහගත වේ. යාතුකර්ම පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වාම විවිධ අදියරයන්හි සැලකිය යුතු භූමිකාවන් රඟ දක්වන්නා වූ තත්ත්ව වේ (Bell, 1997). අනෙක් අතට සිංහල සංස්කෘතිය තුළ මුල්බැස ඇති සංස්කෘතික අංග වනාහී භෞතික සේම අභෞතික වශයෙන් පුද්ගල ජීවිත සමඟ බැඳී පවතින තත්ත්ව වේ. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික යාතුකර්ම බොහොමයක් පශ්චාත් යටත් විජිත ලංකාවේ සිංහල ජාතිකත්වය නිරූපණය වන ආකාරයෙන් ප්‍රති-සකස් වී ඇති අංග වන බව ද සිල්වා (2000) විසින් ද ප්‍රකාශ කර තිබෙන බැවින් සංස්කෘතික වශයෙන් මේවා සමාජය තුළ නිරූපිත ආකාරය වෙනස් වෙමින් නව්‍ය ආරක් ගනිමින් පවතින බව හඳුනාගත හැකි වේ.

මෙලෙස සාකච්ඡාවට ලක්වන යක්‍ෂාවේශය සම්බන්ධ කරගනිමින් බොහෝ පර්යේෂණ ඇති මුත් තොවිලය සම්බන්ධයෙන් යකැදුරන් සහ ඔවුන්ගේ ආවතේවකරුවන්ගේ පරිකල්පනයන් පිළිබඳ සිදු කර ඇති අධ්‍යයන අවම වී ඇත. එහෙයින් එම රික්තකය ආමන්ත්‍රණය කිරීම උදෙසා යක්‍ෂාවේශය සඳහා වන සුව කිරීමේ ප්‍රතිකාර ක්‍රමයක් ලෙස තොවිලය සම්බන්ධයෙන් එම තොවිලයේ ප්‍රධානම කාර්යයභාරයක් ඉටු කරන්නා වූ යකැදුරන් සහ ඔවුන්ගේ ආවතේවකරුවන් ඒ පිළිබඳ දරන්නා වූ පරිකල්පනය යන පර්යේෂණ ගැටලුව කේන්ද්‍ර කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී.

**සාහිත්‍ය විමර්ශනය**

අධිභෞතික (supernatural) බලවේග සම්බන්ධ විශ්වාසයන් ලාංකේය සමාජයේ මෙන්ම ලොව බොහෝ සමාජයන්හි අඩු වැඩි වශයෙන් පවතී. එම සෑම විශ්වාසයකටම අදාළ සමාජයන්හි ප්‍රජාව විසින් ලබාදෙන අර්ථකථනීය ආකෘතීන් බලපෑම් කරන ලදුව පරම්පරාවෙන් පරම්පරාවට මුඛ වහර ඔස්සේ හෝ ලිඛිත මූලාශ්‍රය ඔස්සේ සම්ප්‍රේෂණය වීම සිදු වේ. රොබට් රෙඩ්ෆීල්ඩ් දක්වන චූල සම්ප්‍රදානුගත දැනුම අතර බොහෝ දුරට මෙම අධිභෞතික බලවේග සම්බන්ධ අර්ථකථනීක සමාජ ආකෘතීන් ස්ථානගත කිරීමේ ශක්‍යතාවය පවතී. එනම්, භාෂාත්මක අර්ථකනයන් ලිඛිතව ඉස්මතු කිරීමට ශක්‍ය නොවන නමුත්, පරම්පරානුගතව උගත් විශ්වාස සම්බන්ධ දැනුම බොහෝ සමාජයන්හි දැඩි ලෙස මුල්බැසගෙන තිබේ. ඒ අතර ලාංකේය සමාජය තුළ, යක්ෂාවේශය වැනි සමාජගත සංසිද්ධීන්ට හිමිවන්නේ බිය පක්ෂපාතීත්වය සහිත වැදගත් ස්ථානයක් යැයි පැවසීම යුක්ති සහගත වේ.

ස්කොට් (1994) යක්‍ෂාවේශය හඳුන්වන්නේ "යකුන්ගේ දුෂ්ට බලපෑමට යටත්ව වෙව්ලීම සහ අවසිහියෙන් කටයුතු කරන තත්ත්වයට පත් වීමක් වශයෙනි" (Scott, 1994: 279). එනම් පුද්ගලයා එදිනෙදා සාමාන්‍ය ක්‍රියා රටාවෙන් මිදී ජන සාහිත්‍යයේ දැක්වෙන යක්‍ෂයින්ගේ ලක්ෂණ තමන්ට ආරෝපණය කර ගනිමින් අසාමාන්‍ය ක්‍රියාවන්වල නිරත වීමයි. උදාහරණ වශයෙන් ආවේශ වූ පුද්ගලයන් සිදු කරන බිය වීම හා බිය ගැන්වීම, වෙව්ලීම, අවසිහියෙන් කටයුතු කිරීම යනාදියයි.

යක්‍ෂාවේශය සම්බන්ධයෙන් ලාංකිකයන්ගේ අදහස් ආරම්භ වීමෙහිලා යටත්විජිත කාල සීමාව ඉතා වැදගත් බව කිව හැකිය. මක්නිසාද යත් බ්‍රිතාන්‍යයන්ට ලංකාව යටත් වීමත් සමඟම ලංකාවේ දැනුම නිෂ්පාදනය වූයේ ද ඔවුන්ට අවශ්‍ය වූ ආකාරයටය. එනම් බ්‍රිතාන්‍ය මිෂනාරීන් විසින් ලංකාව සම්බන්ධයෙන් දැනුම නිෂ්පාදනය කරන ලදි. මෙහිදී ඩේවිඩ් ස්කොට් සිය යටත්විජිත න්‍යාය තුළින් පෙන්වා දෙන්නේ, යක් තොවිල් හා යක්‍ෂාවේශය සම්බන්ධව බ්‍රිතාන්‍යයින්ගේ අදහස් ලාංකික ජනතාව වෙත හඳුන්වා දුන් ආකාරයයි. එහි දී මොහු සංකල්ප කිහිපයක් හඳුන්වා දේ. ඒවා නම්, 'Demonism' (යක්‍ෂාවේශය), 'Possession' (ආරූඪ වීම) සහ 'Exorcism' (සමනය කිරීම) ය" (Scott, 1994: 112). මෙම සංකල්ප මඟින් ලංකාවේ සාමාන්‍ය මිනිසුන් සිදු කරන යක් තොවිල් වෙනත් ආකාරයකින් අර්ථ ගැන්වීම තුළ විශාල ලෙස විකෘති කරන ලද අදහසක් ගෙන ඒමට උත්සාහ කර තිබෙන බව ස්කොට්ගේ කෘතිය ඔස්සේ පැහැදිලි වේ. එනම් මොහු දක්වන්නේ පූර්වක්‍රිස්තියානි බටහිර සමාජය තුළ පැවති මිෂනාරී අදහසක් වන මිත්‍යාදෘෂ්ටිය (Paganism) යන අදහස සම්පූර්ණයෙන්ම යටපත් කර බටහිර සමාජයේ ක්‍රිස්තියානි දහම ව්‍යාප්ත කර වූ බවයි. නමුත් ලංකාවේ සිදු කරන ලද යක් තොවිල් සඳහා Paganism යන අර්ථය මුසුකර, ලංකාවේ මිනිසුන් ද මායාකාරී අදහස් ඇත්තන් බව ප්‍රචලිත කිරීමට උත්සාහ කර තිබේ. එහෙයින් බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය වූයේ ලංකාව තුළ යක්‍ෂයින් ඇති බවත් ඒ සඳහා යාගහෝම කිරීමක් සිදු වන බවත්, ඊට හොඳම පිළියම වන්නේ තම ක්‍රිස්තියානි දහම ලංකාව තුළ ව්‍යාප්ත කිරීම බවට වන මතය ව්‍යාප්ත කිරීම යටත්විජිතවාදීන් විසින් සිදුකළ බව ස්කොට්ගේ උක්ත කෘතියේ සඳහන්ය.

යක්ෂාවේශය, ආරූඪ වීම, සමනය කිරීම යන උක්ත සංකල්ප තුන හරහා ස්කොට් (1994) උනන්දු වී ඇත්තේ ප්‍රධාන යටත්විජිතවාදී දැනුම ගොඩනගා ගැනීමට ප්‍රවේණි විද්‍යාව සොයා යාමයි. විශේෂයෙන් ක්‍රිස්තියානි සංකල්පයක් වන යක්ෂාවේශය බටහිර නොවන විශ්වාස හා භාවිතාවන් තේරුම් ගැනීම සඳහා යොදා ගන්නේ කෙසේ ද යන්න ප්‍රවේණි විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීමයි. ස්කොට් පෙන්වා දීමට උත්සාහ කරන්නේ යටත්විජිත ශ්‍රී ලංකාවේ සිංහලයන්ගේ හා ඔවුන්ගේ සමාජයේ ඇති විවිධ මත, ප්‍රතිරූප, තේමා බටහිර දැනුම නිෂ්පාදනයට අදාළ ස්ථාවර සංකල්ප ලෙස තේරුම් ගැනීමයි. බ්‍රිතාන්‍ය යටත්විජිත බලය ලංකාව තුළ වඩාත් ප්‍රබල යක්ෂවේදාත්මක කතිකා මතුකර ඇති අතර ඒ හරහා සිංහලයන්ගේ ආගම පිළිබඳ නව අර්ථකථන හා සංකල්ප හඳුන්වා දෙනු ලබයි. මේ ආකාරයට යටත්විජිත න්‍යාය හරහා සිංහලයන්ගේ ආගමික භාවිතාව තුළ බ්‍රිතාන්‍ය යටත්විජිත දැනුම් නිෂ්පාදනයෙන් ඇති කළ යක්ෂාවේශය යන්න පුද්ගලයා වටහා ගන්නා ආකාරය පැහැදිලි කර ගැනීම වැදගත් වේ.

යාතුකර්ම සිංහල සමාජයේ සෑම පුද්ගලයෙකුගේම උපතේ සිට මරණය දක්වා බැඳී ඇති පිළිවෙත් ගණනාවකින් සමන්විත වේ. ජීවන චක්‍රයේ යාතුකර්ම (life cycle rituals) ලෙස සංකල්පගත වී ඇති අධිභෞතික බලවේග සහ සමාජගත සංස්කෘතික විශ්වාස සමග සම්බන්ධ වී ඇති යාතුකර්ම පුද්ගල ජීවිතය සමග බද්ධ වී ඇත්තේ එහෙයිනි. එවන් වූ, සංස්කෘතිය සමග විවිධ ආකාරයන්ගෙන් බද්ධ වන යාතුකර්ම ලෙස අත්තගහ මැතිරීම වැනි සරල සමාජගත යාතුකර්මයන්හි සිට තොවිලය වැනි මහා පරිමාණය සංස්කෘතික අංශයන්ගෙන් සමුච්ජිත වූ යාතුකර්ම දක්වා වර්ධනය වී තිබේ.

යකැදුරෙක් ලෙස හඳුන්වන්නේ යක්ෂාවේශ වූ රෝගියාට සුවය ලබා දෙන්නාය. එනම් ආවේශ වූ යක්ෂයා පලවා හරින්නේ යකැදුරා විසිනි. "යක් තොවිල් ශත වර්ෂ ගණනාවක් ඔස්සේ විකාසනය වී සාහිත්‍යයක් බවට ද පත් වී තිබේ. මෙකී සාහිත්‍යය වටා ඇති පූජා රටාව ඉටු කරන පූජකයින්ට යක් දෙස්සෝ, යකැදුරෝ හෙවත් ගුරුන්නාන්සේලා යන නම ව්‍යවහාරිතය" (කාරියවසම්, 1998: 21). ගමක පුද්ගලයෙකු හදිසියේ රෝගාතුර වූ විට ගැමියාට එකවර සිහියට නැගෙන්නේ යකැදුරෙකි. ගැමි සමාජගත විශ්වාසයන්ට අනුව, මරණයට පත් වීමට ළංව සිටින රෝගීන්ට පවා නැවත ප්‍රාණය ලබා දීමේ බලයෙන් හෙබි යකැදුරන් පිළිබඳව විවිධාකාරයේ කථා පවතී. එමෙන්ම යකැදුරන් සහ ආවතේවකරුවන් අතර පවතින්නේ අවියෝජනීය සම්බන්ධයක් යැයි අර්ථ දැක්වීම සාවද්‍ය නොවේ. මෙම දෙපාර්ශ්වයෙන් වැඩි පිරිසක් මෙම ශාස්ත්‍රය පාරම්පරිකව ලබා ගත් දැනුමෙන් යුක්තව සිදු කරනු ලැබේ.

ආවේශ වීම අපගාමීත්වයක් ලෙස වටහා ගන්නා පිරිසක් ද සමාජයේ සිටින බව යක්ෂාවේශය හා සම්බන්ධ අධ්‍යයනයන් ඔස්සේ ඉස්මතු කෙරෙන අතර, වත්මන් අධ්‍යයනය හරහා තවදුරටත් තහවුරු වූ කරුණකි. එනම් ආවේශ වීම සංස්කෘතික වශයෙන් ස්ථාපිතව පවතින ප්‍රතිමාන හා යහපත් සෞඛ්‍ය තත්ත්වයන්ගෙන් අපගමනය වීමක් බැව් එම පිරිස් පිළිගනිති. "ෆ්‍රෑන්ක් ටැනෙන්බවුම් හා එඩ්වින් ලෙමාර්ට් දක්වන්නේ සමාජය පුද්ගලයෙකු ලේබල් කළ පසු, එම පුද්ගලයා ලේබල් කිරීමට අනුව කටයුතු කරන බවයි" (රත්නපාල, 1990: 129-131). මේ ආකාරයෙන් යක්ෂාවේශය නිසා යක්ෂාවේශ වූවන්ගේ අන්තර්සබඳතා බිඳවැටීමට ලක්ව තිබේ.

එමෙන්ම සමාජයෙන් කොන් වීමට ද ලක්ව ඇති බැව් අනාවරණය විය. නමුත් පාසන්ස් (1951) දක්වන පරිදි "රෝගී වීම නිසා පුද්ගලයාට යම් යම් අයිතිවාසිකම් හිමිවීම මෙන්ම යුතුකම් හා බැඳීම් ද ඇති වේ. එමෙන්ම තමාගේ රෝගය සුවපත් කිරීමේ වගකීම ඇති වෙයි" (පිණිකහන, 2012: 165). ඒ අනුව, එම වගකීම හා සම්බන්ධව අත්‍යන්තයෙන්ම යක්‍ෂාවේශ වූවෙක්ව සුවපත් කිරීමේ වගවීම ඇත්තේ යකැදුරන්ට බවත් යක්‍ෂාවේශ වූවන් තමන්ගේ රෝගය සුව කිරීමට සමාජ සහාය ලබා ගන්නේ යකැදුරාගෙන් බවත් මෙයින් පැහැදිලිය.

මෙහි දී කුලය යන සමාජ සාධකයේ දායකත්වය ද සාකච්ඡාවට ලක් කළ හැකිය. E.R. Leach දක්වන්නේ කුලය යනු "ශ්‍රම විභජන පද්ධතියක් ලෙසත් කුලයක් අන් කුලයකින් වෙනස්ව හඳුනාගත හැක්කේ ආර්ථික, දේශපාලනමය හා චාරිත්‍රමය සබඳතාවන් ජාලයන් සමඟ එම සාමාජිකයන් ආසන්න සබඳතාවකට පත්වී ඇති ආකාරය අනුව බවත්ය" (Leach, 1960: 1-10). ඒ අනුව පැහැදිලි වන්නේ කුල ක්‍රමය ජන්මගත තත්ත්ව සමූහ ධුරාවලියක් මාර්ගයෙන් ක්‍රියාත්මක වන සමාජ සංවිධානයක් වශයෙන් සමාජයේ පවතින විවිධ ස්තර හරහා ව්‍යාප්ත වී ඇති බවයි. නමුත් කුලය යන සමාජ සාධකය ශාන්තිකර්ම හා බැඳී පවතින ආකාරය විද්‍යාමාන කරවීම උදෙසා ඇති අධ්‍යයනයන්ගේ අවම සහභාගිත්වය තුළ මෙම අධ්‍යයනය මගින් එම සම්බන්ධතාවය ද හඳුනා ගැනීමට හැකි විය.

යක්ෂාවේශය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවයන්හි බලපැවැත්වීම ද වැදගත් කාරණාවකි. "ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු ලිංගභේදයට සමාන ජීව ප්‍රභේදයක් නොවේ. එය සමාජ සම්බන්ධතා නිසා සකස් වී ඇති සමාජ ලක්ෂණයක් වේ. මේ සංකල්පය ඇති වීම තුළ මිනිසුන් යම් යම් චර්යාවන් පුරුෂමය හා කාන්තාමය ලෙස වර්ග කර දැක්වීමට පුරුදු විය" (CIDA, 1993: 11). මේ තුළ පිරිමියා සහ ගැහැනිය අතර පවතින්නා වූ ජීව විද්‍යාත්මක වෙනස සංස්කෘතිය මඟින් විශාල කොට පුරුෂ මූලික සමාජයක් නිර්මාණය කර ඇති බව On Human Nature (1976) කෘතියේ Edward Wilson විසින් ද පෙන්වා දී ඇත. එම කරුණ මෙම පර්යේෂණය තුළ වූ ශාන්තිකර්මයන් මඟින් මනාව පිළිඹිබු වූ අතර තොවිලය යන්න ප්‍රධානවම පුරුෂකරණය වූ ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගත හැකි විය.

මේ අනුව යක්ෂාවේශය යනු හුදු අර්ථ සංගත නොවන සමාජ සංසිද්ධියක් නොවන නමුත්, සමාජයේ යථාර්ථවත් අන්තර්ක්‍රියාවන් පිළිබිඹු කරන්නාවූත්, සමාජය තුළ අඩු වැඩි වශයෙන් නිමග්නව පවතින සමාජ යථාර්ථයන් ඉස්මතු කරන්නාවූත්, ස්වදේශීය අව්‍යාජ දැනුම් සම්භාරයක් සහිත සමාජගත නිර්මාණයක් බව හඳුනාගත හැකි වේ. එනයින් මෙම අධ්‍යයනය ඔස්සේ එම යක්ෂාවේශය සම්බන්ධව එහි ප්‍රධාන පාර්ශවකරුවන්ගේ ඇසින් විමසීම සහ එම අර්ථයන් සමාජ-මානව විද්‍යාත්මක පදනමක් ඔස්සේ විමසීමත් සිදු කර තිබේ.

**පර්යේෂණ අරමුණු**

වත්මන් පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ, 'යකැදුරන් සහ ආවතේවකරුවන් යක්ෂාවේශය වටහා ගන්නා ආකාරය හඳුනා ගැනීම හා විග්‍රහ කිරීම' යි. මෙකී මුඛ්‍ය අරමුණ සපුරා ගැනීමෙහි ලා සෙසු අරමුණු කිහිපයක් කෙරෙහි ද අවධානය නතු කළ අතර එම උප අරමුණු වන්නේ,

1) යක්ෂාවේශය ඇති වීමට බලපාන හේතු අවබෝධ කර ගැනීම හා විග්‍රහ කිරීම.
2) යක්ෂාවේශය සම්බන්ධව පවතින ප්‍රතිකාර ක්‍රම අවබෝධ කර ගැනීම හා විග්‍රහ කිරීම යන ඒවාය.

**පර්යේෂණ ක්‍රමවේදය**

විස්තරාත්මක පර්යේෂණ සැලැස්ම (descriptive research design) මත ගුණාත්මක දත්ත ඔස්සේ සිදු කළ මෙම පර්යේෂණයේ ක්ෂේත්‍රය වන්නේ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ආසනයේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මීගහතැන්න ග්‍රාමයයි. පර්යේෂණය සඳහා මෙම ග්‍රාමය තෝරා ගැනීමට හේතුව වූයේ කළුතර දිස්ත්‍රික්කය පිහිටා ඇති උක්ත ග්‍රාමය යකැදුරන් සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් ඉසිලීමත්, එබැවින් විවිධ ප්‍රදේශවලින් පැමිණෙන යක්ෂාවේශවූවන් එම යකැදුරන් ලවා ප්‍රතිකාර කරවා ගැනීමට මෙම ගම්මානයට පැමිණීමත් නිසාවෙන්ය. පර්යේෂණය සඳහා දත්තදායකයින් තෝරා ගනු ලැබුවේ සසම්භාවී නොවන නියදිය යටතේ එන අරමුණුගත නියැදි ක්‍රමය යටතේය. "ලබා ගැනීමට අපේක්ෂිත දැනුමට ඉතාම ආසන්න ලක්ෂණ ඇති කණ්ඩායමක් හෝ පුද්ගලයෙක් තෝරා ගැනීම අරමුණු සහිත නියදිය වේ" (Gupta, 1995: 111). ඔහුගේ අදහස අනුව අරමුණු සහගත නියැදිකරණයේ දී පළමුවම නියැදියක තුළ තිබිය යුතු ලක්ෂණ පර්යේෂකයා තීරණය කරන අතර එම නිර්ණායකවලට ගැළපෙන දත්තදායකයන් පමණක් නියදියට ඇතුළත් කර ගන්නා බැවින් මෙම පර්යේෂණයට අරමුණුගත නියැදි ක්‍රමය භාවිතා කිරීම ප්‍රායෝගික කරුණක් වේ.

දත්තදායකයන් ලෙස යක්දෙස්සන් පස් දෙනෙක් සහ තොවිල් සඳහා සහභාගි වන ආවතේවකරුවන් පස් දෙනෙක් තෝරා ගන්නා ලදී. තොවිල් සිදු කිරීමේදී යකැදුරන් සහ යක්ෂාවේශවූවන් යන පාර්ශ්වයන් ක්‍රියා කරන ආකාරය බාහිර පාර්ශ්වයක් ලෙස ආවතේවකරුවන් විසින් දැකගැනීම තුළ සිදුවන සියල්ල පැහැදිලිව නිරවුල්ව දැන ගැනීමට හැකි වීම ආවතේවකරුවන් පර්යේෂණය සඳහා තෝරා ගැනීමේදී සලකා බැලූ නිර්ණායකය සහ පදනම විය. පර්යේෂණය සඳහා ප්‍රාථමික දත්ත රැස් කිරීමට ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා ක්‍රමය තෝරාගැනීම කෙරෙහි අවධානය යොමු කෙරිණි. මූලික වශයෙන්ම "සමාජ අන්තර්ක්‍රියාකරණය කෙරෙහි ප්‍රබල වශයෙන්ම බලපානුයේ භාෂාව හෙයින් සමාජ නියෝජිතයන්ගේ පර්යාලෝකය යථාවාදී ලෙස ලබා ගැනීමට මෙම ක්‍රමය ඉවහල් වේ" (ජයසේන සහ ඇම්බැක්ක, 2015: 55). එහෙයින් ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා ක්‍රමයෙන් කිසියම් ආකෘතියකට යටත් නොවී පුද්ගලයා හමුවට ගොස් ඒ අවස්ථාව අනුව සොයා බලා ඊට ගැළපෙන අයුරින් සම්මුඛ සාකච්ඡාව පැවැත්වීමේ දී, ලබා ගන්නා තොරතුරුවල වලංගු බව පවතින අතර විශ්වසනීයත්වයෙන් යුත් තොරතුරු ලබා ගැනීමට හැකි වේ. එබැවින් මෙම ක්‍රමය අනුගමනය කළ අතර

තවදුරටත් ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ දී වක්‍ර නිරීක්ෂණ යොදා ගන්නා ලදි. වක්‍ර නිරීක්ෂණයේ දී ග්‍රාහකයන්ට නොපෙනෙන සේ නිරීක්ෂණය කිරීමක් සිදු වේ. එනම් පර්යේෂකයන් තමන්ව නිරීක්ෂණය කරන බව ප්‍රතිග්‍රාහකයාට නොදැනේ. එයින් ලබා ගන්නා තොරතුරුවල වලංගු බව වැඩි වීම මෙම ක්‍රමය තෝරා ගැනීමට හේතුවයි. ද්විතීයික දත්ත ලෙස සඟරා, ග්‍රන්ථ, පුවත්පත්, රූපවාහිනී වැඩසටහන් සහ ශාස්ත්‍රීය ලිපි භාවිතා කරන ලදී.

පර්යේෂණය සඳහා එක්රැස් කළ ගුණාත්මක දත්ත, ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමයක් වන තේමා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය යටතේ සිදු කරන ලදි. තේමා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමයේ දී පර්යේෂණ ගැටලුව හා අදාළ වන දත්ත තුළ අන්තර්ගත පුනරාවර්තන හා සුලබ තේමා පදනම් කරගෙන අධ්‍යනයට ලක් කරන සංසිද්ධිය පිළිබඳව න්‍යායාත්මක අර්ථකථන ඉදිරිපත් කිරීමට හැකි වීම" (ලලිතධීර, 2008) එම විශ්ලේෂණ ක්‍රමය අධ්‍යයනය සඳහා තෝරා ගැනීමට හේතු විය.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

**යක්ෂාවේශය සඳහා බලපෑම් කරන හේතු සහ යක්ෂ කොට්ඨාස**

යක්ෂයින් සම්බන්ධ තොරතුරු යකැදුරන් ආවර්ජනය කරනුයේ ඒ ආශ්‍රිත කාව්‍යයන්ගෙන් බැව් අධ්‍යයනයේ දී පැහැදිලි විය. පුළුටු කෑම, තෙලෙහි බදින ලද මස් කෑම යක්ෂාවේශයක් ඇති වීමට මඟ පාදන සාධකයන් වන බවත් යක්ෂාවේශයකට මං පාදන්නා වූ පරිසරය ස්වභාවිකවම පිහිටා ඇත්තේ වනාන්තර, කුඹුර, නාන තොටුපළ, ඇළ දොළ, පාළු මංමාවත් සහිත ග්‍රාමීය සමාජය තුළ බව ද හෙළි විය.

යක්ෂ සංකල්පයේ විකාශය ගත් කල්හි මොවුන් අමනුෂ්‍ය කොට්ඨාසයක් වුව ද මොවුන් දේවත්වයේලා සැලකූ එක්තරා ජන කොට්ඨාසයක් ඉන්දියාවේ වාසය කර තිබේ. එකල ඉන්දියාවේ ධනවත් සමාජ පන්තිවල ප්‍රජාව පමණක් දෙවියන් උදෙසා පූජා පවත්වා ඇත. සාමාන්‍ය පොදු ජනතාව අසුර, රාක්ෂ, පිසාච, යක්ෂයින්, දෙවියන් සේ සලකා වන්දනාමාන කළ බවත් ක්‍රිස්තුපූර්ව පළවෙනි සියවස වන විට ඉන්දියාවේ ජීවත් වූ බොහෝ දෙනෙකුගේ ආගම යක්ෂ වන්දනාව වූ බවත්, ඉන්දීය ආභාසයෙන් ලාංකික ජනතාව අතර යක්ෂ වන්දනාව තවදුරටත් ප්‍රචලිත වූ බවත් සාහිත්‍යයේ සඳහන්ය. මානව සමාජයේ තවත් එක් සිද්ධියක් වූයේ මියගිය ඇතැමුන් දේවත්වයට පත් කිරීම හා යක්ෂයින් ප්‍රේතයින් බවට පත් වූවා යැයි සඳහන් කිරීමය. නමුත් වැදි ජනයා අතර යක්ෂයින් පවා දේවත්වයේලා සැලකේ. උදාහරණ ලෙස වැදි ජනතාව අතර නෑ යකුන් පිදීමේ චාරිත්‍රය දැක්විය හැකිය. "වැදි ජනතාව නෑ යකුන් පිනවීම පිණිස කිරි කොරහ නම් ශාන්තිකර්මය සිදු කරනු ලැබේ. කිරි කොරහ සිදුකරන අවස්ථාවේ දී ඊට සහභාගී වන නෑ යක්කු වැද්දන්ට ආවේශ වෙති. මෙය ශාන්තිකර්මයේ සාර්ථකත්වයයි" (ධර්මදාස හා තුන්දෙණිය, 1994: 46).

ඉහත කරුණු සාක්ෂාත් කරමින් ලාංකික ඉතිහාසය පුරා පැවත එන යක්ෂයින් පිළිබඳ යකැදුරන් සහ ආවතේවකරුවන්ගේ විශ්වාස කෙරෙහි අවධානය යොමු කිරීම, අදාළ විෂය සම්බන්ධයෙන් ඔවුන්ගේ පූර්ණ

පරිකල්පනය වටහාගැනීමෙහි ලා ඉතා වැදගත් බැව් පර්යේෂණයේ දී හඳුනාගත හැකි විය. ඒ බැව් පහත සම්මුඛ සාකච්ඡා දත්ත ඔස්සේ විශද වේ:

> "වෙසමුනි රජ්ජුරුවො තමයි නායකයා. යක්ෂයින් කරන කුමන ආකාරයේ වරදකට උණත් දඬුවම් කරන්න බලයක් තියෙනවා වෙසමුනි රජ්ජුරුවන්ට. ඒ වගේම තමයි මහසෝනා. මහසෝනා දෙවෙනි වෙන්නේ වෙසමුනි රජ්ජුරුවන්ට විතරයි. වළහෙකුගෙ ඔළුවක් තීන්නෙ. අවතාර දහයක් තියෙනවා. රීරි යක්ෂයා විවිධ අවස්ථාවලදි දළ රීරි, මරු රීරි, අටමඟලේ රීරි, ඉර මුදුන් රීරි කියලා විවිධ නම්වලින් හඳුන්වනවා. රීරි යක්ෂයාගෙ උපත සම්බන්ධයෙන් විවිධ කථා දැක්වෙනවා. ලේ මල් විලේ වාසය කරන්නෙ".

> "කළු කුමාරයාගෙ බැල්ම වැටෙන්නෙ කාන්තාවන්ට. තරුණියන්ට, ගැබිණි මව්වරුන්ට විශේෂයි. ගැබිණි කාන්තාවන්ගෙ දරුවන් නැති කරනවා වගේම කාන්තාවන් වඳභාවයට පත් කරනවා. නාන තොටේ, වෙල් එළියෙ තමයි ඉන්නවා කියන්නෙ. සවස් යාමයේ තරුණියන්ට තනියම නාන්න යන්න එපා කියන්නෙ ඒකනෙ".

> "සූනියම් යකාගෙ උත්පත්තියට මුල් උණේ මහා සම්මත රාජ පරම්පරාව තුළ සිදු වූ පොරොන්දු කඩ කිරීමක්. හොඳට කාලා බීලා සැපසේ ඉන්න අයට වින කරලා විනාශ කරන්න තමයි මේ යක්ෂයා බලන්නේ. ඒ වගේම තමයි සඳෙහි පුර පක්ෂයේ දී දෙවියෙක් විදියටත් අව පක්ෂයේ දී යක්ෂයෙක් විදියටත් වෙස් මාරු කරගන්නවලු" (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

මොවුන් ආවේශ වීමෙන් පුද්ගලයින් මානසික වශයෙන් ව්‍යාකූල තත්ත්වයට, යම් ආකාරයක රෝගී තත්ත්වයන්ට ලක්වන බැව් දැක්විය හැකිය. "යන තැනක දී, එන තැනක දී, පාළු අම්බලමක දී, එක් මංසලක දී, සිව් සමයන් වෙලාවක දී, බෙර සද්දයක දී මෙකී නොකී ස්ථානයක දී සැඟවී සිටින ඒ ඒ තැනට අරක් ගෙන සිටිනා යක්කු මනුෂ්‍ය ප්‍රාණීන් වෙත ඇල්ම බැල්ම හෙළති. ඒ ඇල්ම බැල්ම වැටුණු පසු ඔවුහු ලෙඩ වෙති" (කාරියවසම්, 1998: 141). ඉන්පසුව මෙවන් තත්ත්ව මත මෙසේ ලෙඩ දුකින් අසරණභාවයටත්, රෝගීභාවයටත් පත්වන ගැමියන් තම ජීවිතය යකැදුරන් වෙත භාර කරන්නේ ජනප්‍රවාදයෙහි එන යක් තොවිල් මත වන ස්වකීය විශ්වාසය හේතුවෙන් යම්කිසි ප්‍රතිඵලයක් යකැදුරන් මූලික වූ මැදිහත්වීමෙන් ලබාගැනීමේ අපේක්ෂාවෙනි.

**යකැදුරන්, ආවතේවකරුවන් සහ ප්‍රතිකාර**

පුද්ගලයා උපතේ සිට මරණය දක්වා වන ජීවිතයේ විවිධ අවස්ථාවන්හි දී රෝගී තත්ත්වයන්ට මුහුණ දීමේදී ප්‍රතිකාර ගනියි. ඒ සඳහා බටහිර වෛද්‍ය විද්‍යාව, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ආදී විවිධ වෛද්‍ය ක්‍රම පවතී. බටහිර වෛද්‍ය විද්‍යාව අනුව එදිනෙදා සාමාන්‍ය ජීවිතයෙන් මිදී අසාමාන්‍ය රෝගී ගති ලක්ෂණ ඇති පුද්ගලයෙක් හඳුන්වන්නේ මානසික රෝගියෙක් ලෙසින්ය. "මානසික රෝග මුලින්ම හැඳින්වූයේ උන්මාදය ලෙස වන අතර,

පුද්ගලයෙක් ස්වකීය සමාජයේ නෛතික හා සමාජ සම්මතයට පටහැණිව ක්‍රියාත්මක වේ ද, ඔහුට හෝ ඇයට පවතින්නේ මානසික ආබාධයකි" (මූර්ති, 2005: 62). එහි දී පුද්ගලයාගේ මනස යහපත් තත්ත්වයට ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය මානසික චිකිත්සක ක්‍රම යොදා ගනී. එමෙන්ම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළ ඉහත ලක්ෂණ පුද්ගලයන්ට ඇති වන්නේ තුන්දොස් අසමතුලිත වීම නිසාවෙන් බව අධ්‍යයනයේ දී යකැදුරන්ගෙන් තුළින් ඉස්මතු වූ කරුණක් විය. එනම් තුන්දොස් සම්බන්ධයෙන් ආයුර්වේද සහ දේශීය වෛද්‍ය කතිකාව තුළ කැපී පෙනෙන සාකච්ඡා ඇත. "වාත, පිත, සෙම් යනු එකී තුන් දොස් වන අතර ශරීරයේ ජීව-රසායන සහ භෞතවේදීමය ක්‍රියාකාරිත්වය තුන් දොස් අසමතුලිත වීමට බලපානු ලැබේ" (පිනිකහණ, 2014). මෙවැනි රෝග ලක්ෂණ ඇති අය සඳහා ඉසකුඩිච්චි දමන බවත් ආයුර්වේදය මගින් යකැදුරන්ට යක්ෂ භූතාදී තෛලය සහ නාරායනය ලබා දෙන බවත් දත්තදායකයන් විසින් ප්‍රකාශ කරන ලද විශේෂිත කරුණකි.

"ඕනෑම සංකීර්ණ සමාජයක සෞඛ්‍ය සංරක්ෂණ පද්ධතිය එකිනෙක මත අතිච්ඡාදනය වූ අංශ තුනකින් සමන්විත වේ. එනම් ජනප්‍රිය අංශය, ජන වෛද්‍ය (Folk Medicine) අංශය හා වෘත්තීමය අංශය වශයෙනි. මේ එක් එක් අංශයනට ඒවාටම ආවේණික වූ සෞඛ්‍ය රෝග හා රෝගීත්වය පැහැදිලි කිරීමේ අර්ථකථනීය ආකෘති හා න්‍යායාත්මක ප්‍රවේශ ඇත" (Kleinman, 1980: 50). ක්ලයින්මන් (1980) තවදුරටත් දක්වන්නේ ජන වෛද්‍ය අංශය සකස් වන්නේ සුව කිරීමේ ක්‍රමවේද පිළිබඳ විශේෂඥතාවක් සහිත පුද්ගලයන්ගෙන් බවයි. මොහුට අනුව ශුද්ධ හා ලෞකික යන දෙඅංශයම හෝ එම දෙඅංශයේ සම්මිශ්‍රණයකින් ජන වෛද්‍ය අංශය ක්‍රියාත්මක වේ. ඒ අනුව ජන වෛද්‍ය ක්‍රමය අනුව එදිනෙදා ජීවිතය සාමාන්‍ය පරිදි පවත්වා ගෙන නොයන ක්ෂණිකව අසාමාන්‍ය ගති ලක්ෂණ පෙන්නුම් කරන පුද්ගලයන් ලෙස ආවේශයක් ඇති වූ පිරිස් හඳුනාගත හැකිය. එහි දී සෞඛ්‍ය සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා පුද්ගලයන් ජන වෛද්‍ය අංශය හා සහසම්බන්ධතාවයක් දක්වන තොවිලය යන සුව කිරීමේ ක්‍රමවේදයන් භාවිතාවට ගන්නා බව හඳුනාගත හැකි විය.

යකුන් සඳහා කරනු ලබන ශාන්තිකර්ම පොදු ව්‍යවහාරයේ දී යක් තොවිල් ලෙස හැඳින්වේ. මේ සඳහා පහතරට වාද්‍ය භාණ්ඩ අතුර ප්‍රචලිත යක් බෙරය භාවිතා කෙරෙන අතර, මෙහි ලක්ෂණ නිසාවෙන් දික් බෙරය, සෝෂක බෙරය යනාදී නම්වලින් ද එය හැඳින්වේ. යක් තොවිල් අතරින් පහතරට ප්‍රමුඛ ශාන්තිකර්ම ලෙස රට යකුම, මහ සොහොන් සමයම, සූනියන් කැපිල්ල හා සන්නි යකුම යන ඒවා පර්යේෂණයේ දී හඳුනාගත හැකි විය. අනෙකුත් ශාන්තිකර්ම බොහෝ අවස්ථාවල දී මෙකී ප්‍රධාන ශාන්තිකර්ම හා සම්බන්ධ වී එහි කොටසක් වශයෙන් පවත්වාගෙන යනු ලබන බව දත්ත ඔස්සේ ඉදිරිපත් විය. උදාහරණයක් ලෙස ගතහොත් කළු කුමාර සමයම බොහෝ අවස්ථාවල දී රට යකුම සමඟත් ඉර මුදුන් සමයම මහ සොහොන් සමයම සමඟත් එක්ව පවතී. එක් එක් රෝගියාගේ රෝග ස්වභාවය අනුව මෙම තොවිලය එක්ව කිරීම හෝ ස්වාධීනව කිරීම තීරණය වනු ඇත. එසේ වූ විට එකී ප්‍රධාන යාගයට අනෙකුත් යාගයන්හි අතුරු කොටස් එකතු කර ගැනේ. එහි තීරකයා වන්නේ යකැදුරු පක්ෂයයි.

යකුන් මුල් කරගෙන කරනු ලබන තොවිල් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී මන්ත්‍ර පාඨ සජ්ඣායනය විශේෂිතය[5]. එමෙන්ම යක්ෂාවේශ වූ අයෙකුට අනෙකුත් සියලු කටයුතුවලට ප්‍රථමයෙන් ඇප නූලක් බැඳීම යක් දෙස්සන් සිදු කරන ක්ෂණික පිළියමක් වේ. ආතුරයෙක්ට මෙවැනි ආවේශයක් ඇති වී තිබෙන අවස්ථාවක යකැදුරන් රෝගයේ නිධානය සොයා පසුව රෝගයට අවශ්‍ය ප්‍රතිකාරය සිදු කරන බවත්, ඇප නූලක් මාස තුනකට බැඳ ඒ යක්ෂයා වෙනුවෙන් පූජාවන් ලබා දෙන බව පවසා තාවකාලික සුවයක් ලබා දෙන බවත් පර්යේෂණය ඔස්සේ හඳුනාගත හැකි වූ කාරණයකි. ඒ අනුව, මේ ආකාර වූ තොවිල් ශාස්ත්‍රය මාතර, බෙන්තර සහ රයිගම් සම්ප්‍රදාය ලෙස සම්ප්‍රදාය තුනකට බෙදී යන බවත් මෙම යකැදුරන් සහ ආවතේවකරුවන්ට අනුව ඔවුන් බෙන්තර සම්ප්‍රදාය අනුගමනය කරන ලබන අතර, මහසොහොන් සමයම, ඉර මුදුන් පිදේනිය, කළු කුමාර සමයම හා සූනියම් කැපිල්ල සම්බන්ධයෙන් ඔවුන්ගේ පරිකල්පනය ඔස්සේ පර්යේෂණය සඳහා දත්ත ලබාදීම ඔවුන් විසින් සිදු කරන ලදි.

බෞද්ධ දේව ධුරාවලියක් තුළ ඉහළම ස්තරය බුදුන්වහන්සේ වන හෙයින් සියලුම යහපත් කටයුතු බුදුන්වහන්සේගේ ආශිර්වාදයෙන් ඉටු කිරීමෙන් යහපත් ප්‍රතිඵල අත්වන බව ගැමි විශ්වාසය වී ඇත. ඒ ආකාරයෙන් ලෝකෝත්තර සුවය මූලික කර ගනිමින් සකස් වූ දහමක් වූ බුදුදහම මෙරට ස්ථාපිතව වසර ගණනාවක් ගතවන්නට ප්‍රථම මෙරට පැවති විවිධ ඇදහිලි හා සම්බන්ධ වෙමින් ථෙරවාදී හා මහායාන බුදුදහම වශයෙන් කොටස් දෙකකට වෙන් විය. විශේෂයෙන් මහායාන බුදුදහම ගැමියාගේ ලෞකික ජීවිතය හා නිරන්තරයෙන් සම්බන්ධ විය. එසේ වීමෙන් යක්ෂයින්, දෙවියන් සහ ග්‍රහයින් පිළිබඳව පවත්නා ඇදහීම්වලට ද බුදුදහම ඇතුළත් වෙමින් විවිධ යන්ත්‍ර මන්ත්‍ර බිහි වීම සිදු වූ බැව් අනාවරණය කළ හැකි වේ. ඔබේසේකර සහ ගොම්බ්‍රිච් (1990) මෙය හඳුන්වන්නේ සිංහල බුදුදහම වශයෙනි. කෙසේ නමුත් යක්ෂාවේශය හා සම්බන්ධ යාතුකර්ම අංශයක් වන තොවිලය ලෝකෝත්තර අංශයට වඩා ලෞකිකත්වයට ළඟා වන්නක් ලෙස හඳුනාගැනීම වඩාත් උචිත වේ. මේ ආකාර වූ බෞද්ධ ආගම මූලික වී ගොඩනැගී ඇති තොවිලය යන ප්‍රතිකාර ක්‍රමය වටිනාකමකින් යුක්තව වර්තමානය වන විටත් පවතින්නේ එය බෞද්ධාගමික පදනමේ සිට ලෞකික අරමුණු සාක්ෂාත් කරගැනීමට දරන උත්සාහය හේතුවෙන් යැයි දැක්වීම යුක්ති සහගත වේ. ඒ අනුව, තොවිලය ආරම්භ කිරීමේ දී ප්‍රථමයෙන්ම තෙරුවන්ට පහන් දැල්වීම සිදුකර, ආතුරයාත් යකැදුරා හා එක්ව තෙරුවන් සරණ යැමෙන් බව පර්යේෂණයේ දී නිරීක්ෂණය කිරීමට හැකි වීම එම කරුණ සාක්ෂාත් කරන්නක් වේ.

"බුද්ධං ත්‍රෛලෝක්‍යනාථං සුරනරනමිතං ඝෝර සංසාර තීර්ණං

ධීරං ගම්භීරවන්තං සකලගුණනිධිං ධර්මාරාජභිසේකං....

දයානන්දයා සුරින්දං ප්‍රණත සුරවරං ප්‍රාතභූතං ප්‍රමෝද්‍යං

වජ්‍රං වජ්ජේන්ද්‍ර සදෘශං හරිහරප්‍රභෘතං රීරිතං භ්‍රාජිතේජං....

සාදීසං සංසාර්ථසාධ ප්‍රගුණං නාගි නර්ගීතකාමා

බ්‍රහ්මං බ්‍රහ්මාභිභූතං අනලමෘදුගුණං ශීලවෘත්තාදිප්‍රේමං...." (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

[5] මෙම පර්යේෂණ පත්‍රිකාවේදි එවන් මන්ත්‍ර පාඨ කිහිපයක් විශ්ලේෂණය සඳහා භාවිත කර ඇත. එදිනෙදා ජීවිතයේදී එම වින කිරීම හා සම්බන්ධ මන්ත්‍ර පාඨ එකිනෙක සම්බන්ධ කර කියැවීම අයෝග්‍ය බව යකැදුරන්ගේ විශ්වාසයයි (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

බෞද්ධ දේව ධුරාවලිය තුළ පෙන්වා දෙන පරිදි පිළිවෙලින් බුදුන් වහන්සේ ප්‍රමුඛ කර ගනිමින් විෂ්ණු දෙවියන්, කතරගම දෙවියන්, සමන් දෙවියන් හා පත්තිනි දේවතාවියට ද පසුව යකුන් යක්ෂණියන්ගේ නාමයට ද පහන පත්තු කිරීමෙන් අනතුරුව තොවිලයේ වැඩ කටයුතු ආරම්භ වේ. දෙවි දේවතාවුන්ගෙන් පසුව යකුන් යක්ෂණියන්ට පහන පත්තු කිරීමේ දී ආතුරයාට කුමන යක්ෂයා ආවේශ වී තිබුව ද ආතුරයා ගැහැනු අයෙක් නම් පළමුව කළු යක්ෂයාටත්, ආතුරයා පිරිමි අයෙක් නම් රීරි යක්ෂයාටත් පහන පත්තු කරන බව දත්තදායකයන් දක්වන ලද සුවිශේෂ කරුණකි. ඉන්පසුව අනෙකුත් යකුන් යක්ෂණියන්ට පහන් දල්වන අතර ඕනෑම තොවිලයක දී පෙරේත පිදේනියක් ද සෑදීම අනිවාර්ය කාරණාවකි. යකැදුරා විසින් ආතුරයා අතට දලුමුර ලබා දීම හෙවත් බුලත් කොළයක දවටන ලද පුවක් මල් කිනිත්තක් ලබා දීම ද සිදු කරන අතර යළිත් බුදුගුණ වැනුමක් මෙන්ම සන්න අටක් මඟින් බුදුන් වහන්සේ ඉපදුණ ආකාරය, බුදු වූ ආකාරය, ධර්මය දේශනා කළ ආකාරය ද කියා පෑමක් සිදු කරයි. එසේම, තොවිලයක දී ආතුරයාට කහ දියර ඉසීම සිදු කරයි. කහ දියර ඉසීම සිදු කරන්නේ උපත් කථාවක් ආශ්‍රයෙනි. මෙහි සියලුම පිළිවෙත් සඳහා උපත් කථා පැවතීමෙන් පිළිබිඹු වන්නේ ලංකාවේ පුදපූජා රටා සඳහා විවිධාකාරයේ ඉතිහාසයක් ඇති බවයි.

> “වතුර පෙරනවා. ඒකට කහ කෑල්ලක් දාලා සුදු හඳුන් කුඩු ටිකක් දාලා පුවක් කිණිත්තක් දාලා තියා ගන්නවා. ඒකට හේතුව සුමන සාමණේරයන් වහන්සේ බුදුන් වහන්සේ ලෙඩ වෙලා ඉන්නකොට අනෝතත්ත විලෙන් පැන් ගෙනාපු සිදුවීම” (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

තොවිල් ශාස්ත්‍රයේ දැක්වෙන්නේ සුමන සාමණේරයන් පැන් ගෙන ගොස් බුදුහාමුදුරුවන්ට ලබා දී ඉතුරු පැන් අන් අයට ද බෙදා නිරෝගී සුවය ලබා ගත් බවයි. ඒ ආනුභාවයෙන් අද කහ දියර ඉස ආතුරයාට ආවැඩීම කරන බව යකැදුරෝ පැවසූහ. කහ යනු සිංහල වෙදකමේ දීත් එදිනෙදා ජීවිතයේදී ලෙඩ රෝග ආදියටත් යොදා ගන්නා විෂබීජනාශක ගුණයෙන් පිරි ඖෂධයකි. තොවිලය මඟින් දේශීය වෛද්‍ය ශාස්ත්‍රය උපයුක්ත කරගැනීම සිදුවන බව පැහැදිලිව පෙනී යන්නේ මෙනයිනි. ඉන්පසු අවස්ථාව වන්නේ සියලුම දෙවි දේවතාවුන් සඳහා කවි කෝල්මුර කීමයි. යකැදුරන්ට අනුව, කවි කෝල්මුර යනු දෙවියන් වෙනුවෙන් ගායනා කරන කවි වේ. එහි දී බෙන්තර පළාතේ දී පළමුව නාථ දෙවියන්ටත්, පසුව විෂ්ණු දෙවියන්ටත්, කවි කොල්මුර තබන අතර වෙනත් පළාත්වල මෙය පළමුව විෂ්ණු දෙවියන්ට ලෙස වෙනස් වන බව කියවේ. මෙහි දී විෂ්ණු දෙවියන්ට ගුරුළු පදයක් ද, කතරගම දෙවියන්ට රාග පදයක් ද, පත්තිනි දෙවියන්ට පත්තිනි පදයක්, කරඬු පදයක් හෝ සලඹ පදයක් නටන බව ද, එයින් දෙවියන් මල් යහන් මස්තකයට වැඩම කර සතුටු වන බව මොවුන්ගේ මතයයි. එමෙන්ම තොවිලයේ දී ගායනා කරන මෙම කවි මඟින් ආතුරයාට බලපෑමක් වන බැව් හඳුනාගත හැකි වූ පොදු කාරණයකි. මක්නිසාද යත් බුදුන් උදෙසා දෙවියන් උදෙසා ගායනා කරන කවි හා එක්ව මතුවන ධ්වනිය ද බෙර හඬ ද මඟින් ප්‍රථමයෙන් සිත පහන් කිරීමක් සිදු කරන බැව් විශද කෙරේ.

“සෑම යකෙක්ම බුදුන්ගෙන් වරම් ලබා ගෙන ඇති අයයි. ඒ මිනී මරන්නට නොව නරයින්ට වද නොදී දෙන කෙළි පිදේනි ගෙන නරයින් සුවපත් කරවන්නටය. පිටින් එන යකෙකුටවත් මෙහි දී කෙළි පිදේනි ගන්නට නම් බුදුන්ගෙන් වරම් ලබා ගන්නට සිදු වෙයි. කෝල සන්නි යකාට එන්ට ඉඩ නොදී කඩවතක් බඳිති. එය බුදුන්

වහන්සේ ධරමානව වසද්දී යකුන් එළවා දැමූ වෙලාවේ නාථ හා සමන් දෙවිවරුන් ලක අරක් කරනු පිණිස බඳින ලද කඩවතයි. බුදුන් වහන්සේගෙන් සන්නස් පත්‍රයක් ගෙන එන තුරු කෝල සන්නි යකාට මෙතරට එන්නට ඉඩ නොලැබෙයි" (කාරියවසම්, 1998: 139). බුදුන්වහන්සේ වෙනුවෙන් තොවිලයේ දී ඉහත ආකාරයට මල් පහන් පූජා කර පන්සිල්හි පිහිටුවයි. දෙවිවරුන්ට ද එසේ පුද පූජා ඉටු කරනු ලැබේ. බෞද්ධාගමේ දැක්වෙන හා පිළිගත් පුදපූජා රටාවන් එහි දී අනුගමනය කළ ද පසුව තොවිලය තුළ දී සිදු කරන කුකුල් බිලි, ඌරු බිලි, රා කංසා භාවිතය සැබැවින්ම බෞද්ධාගමික වත්පිළිවෙත්වල පවිත්‍රත්වයට පූර්ණ වශයෙන්ම ප්‍රතිවිරුද්ධ වන්නා වූ ලෞකිකත්වය හා සම්බන්ධ තත්ත්ව වේ. කෙසේ නමුත් තොවිලය හා බැඳි සංස්කෘතික සන්දර්භය ඔස්සේ, යක්‍ෂයින් අතිශය සංකීර්ණවත් හා භයානක ලෙස දක්වමින්, එසේ අර්ථකථනයක් සිදු කරමින් තම පුදපූජා රටාවන්ට ඒවා ඇතුළත් කර ගෙන ඇති නිසා මෙම ප්‍රතිකාර ක්‍රමය අද වන විටත් ලෞකික සමාජයේ නොනැසී පැවැත්ම සඳහා තත්ත්ව සම්පාදනය කරගෙන තිබේ. සෑම තොවිලයකම මූලාරම්භය සහ ක්‍රියාකාරිත්වය මෙසේ වන බව අධ්‍යයනයේ දී හඳුනා ගැනීමට හැකි විය.

මහ සොහොන් යක්‍ෂයා ආතුරයෙකුට වැසී ඇති අවස්ථාවක නම් ඊළඟට සිදු වන්නේ හැන්දෑ ජාමයේ දෙවැනි පූජා කොටස ලෙස පිදේනි දීමයි. ඒ සඳහා යක්‍ෂයින්ට කතා කිරීමේ දී හැන්දෑ සමයම නැටීම සිදු කරයි.

**ඡායාරූප 1:** නියැදියේ රුදිගු යකැදුරු මහතා හැන්දෑ සමයම නටන අවස්ථාවක්



මූලාශ්‍රය: ප්‍රතිචාරිකයාගේ අවසර සහිතව සංරක්ෂිත මූලාශ්‍රය ඔස්සේ ලබාගන්නා ලද්දකි

උක්ත ශාන්තිකර්මය සඳහා විශේෂම සැරසිල්ලක් ලෙස ගොක් කොළ කැබලි තිස් දෙකකින් සැකසූ කිරුළු තොප්පියක් නිර්මාණය කරන බව යකැදුරන් පවසන ලදි. ඒ ඒ යක්‍ෂයා වෙනුවෙන් පිදේනි දීමට පෙර ආතුරයා හා පිදේනි වෙන් කොට තබන බවත් ඒ සඳහා කඩතුරාව නමින් සුදු රෙද්දක් අද්දවන බවත් අධ්‍යයනයේ දී තහවුරු විය. පිදවිලි කැප කිරීමේදී කළු යකා විශේෂිතව සලකනු ලබන අතර එකී යක්‍ෂයා වෙනුවෙන් පුළුටු පිදීමක් නොකරන බවට ද මතයක් පවතී. යකැදුරෝ බත්, පලා, රොටී, විළඳ, සඳුන්, මල් බුලත් ආදී දේවලින් පමණක් කළු යකු පිදීමෙන් ඔහු අනෙක් යකුන්ට වඩා උසස් ගණයක සලකනු ලබයි. එකී යක්‍ෂයාට අමතරව අනෙක් යක්‍ෂයින්ගෙන් පුළුටු වර්ග ලබා දී අදාළ දිෂ්ටි මන්ත්‍ර, සන්න, සැහැලි ආදියත් උපත් කවි ගායනා කොට සිරස පාද ගායනයෙන් ආතුරයාට සෙත් පතා ආතුරයාගේ දොස් දුරු කරවීම සිදු කරයි. මේ සම්බන්ධයෙන් සාහිත්‍යය විමර්ශනය කිරීමේ දී සමහර ශබ්ද දිගින් දිගට ඇසීමෙන් මිනිසුන් රෝගී වන බවත්, සමහර ශබ්ද ඇසීමෙන් රෝගීන් සුවපත් වන බවත් පර්යේෂණ මඟින් අනාවරණය කර ඇති බව දැන ගත හැකි විය. පරිසරයේ ඇති මේ ආකාරයේ විවිධ ශබ්ද තරංග මිනිසා කෙරෙහි බලපාන බව පිළිගත් සත්‍යයක් නම්, මන්ත්‍ර, සන්න, කවි සහ ගාථාවන් තුළින් උත්පාදනය වන තරංග මඟින් ආතුරයකු සුවපත් කළ නොහැකි වන්නේ ද යන්න සිතිය යුතු කාරණාවකි.

රීරි යක්‍ෂයා වෙනුවෙන් කරනු ලබන අවමංගල්ලේ පිදේනිය කැප කිරීමේ දී පැදුරේ දැපවිල්ල කරනු ලැබේ.

**ඡායාරූප 2:** පැදුරේ දැපවිල්ල



මූලාශ්‍රය: ප්‍රතිචාරිකයාගේ අවසර සහිතව සංරක්ෂිත මූලාශ්‍රය ඔස්සේ ලබාගන්නා ලද්දකි.

මෙම ක්‍රියාවලියේ දී යකැදුරා පොල්ලක් ගෙන සභාවට පැමිණෙන අතර එය 'මරු පොල්ල' ලෙස හඳුන්වන බව ප්‍රතිචාරිකයින් දක්වන ලදී. මීට අමතරව, පැදුරේ උපත කවියෙන් ගායනා කිරීම ද තොවිලයක සිරිතක් ලෙස පවත්වන බව යකැදුරන්ගේ අදහස විය.

"පැදුරේ දැපවිල්ල කරනකොට රීරි යක්ෂයාට අටකොනේ කවි කියලා ආරාධනා කරනවා...

ඉන්ද්‍ර දිගේ යකුනි එන්න - මතුර දහම් කවි අසන්න

විත කළ ඇදුරට වඳින්න - එලම් පැදුර මට දපන්න

අගින් දිගේ සිටිනා මරු සොහොන් යකා පෙර

අග්නි දිගේ ගියදා දැන දැකලා ලෙඩ කර

අග්නි දිගේදී දැකලා මරු දිෂ්ටිය කර

අග්නි දිගින් මළ සොහොන් මළ පැදුරට වර" (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

පැදුරේ දැපීමේ දී පැදුර සමයම් කිරීම විශේෂ ලක්ෂණයකි. පැදුරේ දිගාවෙන ඇදුරා අටකොනට දුම්මල ගසමින් සමයන් පද අනුව පන්දම් කරකැවීම සිදු කරයි. කඩතුරා රෙද්දෙන් හිසේ සිට පාදාන්තය දක්වා සියොළඟ වසා ගන්නා යකැදුරා, උඩුකුරුව වැතිර සිට දිෂ්ටි මන්ත්‍ර කියයි. යකැදුරාගේ පපුව මත අයිල තුනක් එක් අතකට, ඊ ගස හා අනෙක් අතට, වස් දණ්ඩ ගෙන කුකුළා පාමුල තබා ගෙන දිෂ්ටි මන්ත්‍ර කියා, මරු රීරි යකාගේ උපත් කවි ගායනා කරන අතර රීරි යකාගේ සිරස පාද ගායනයෙන් අනතුරුව ඊ ගස යොදා ගෙන ආතුරයා ශාන්ති කරවන බව දත්තදායකයන් විසින් ප්‍රකාශ කරන ලදී. ආතුරයාගේ හිස සිට දෙපතුළ තෙක් පිරිමැද, ඊ ගසෙන් කුකුළාට තට්ටු කරන්නේ දොස කුකුළාට යාමට බව ද අධ්‍යයනයේ දී හෙළි විය. සූනියම් පිදෙන්න දිෂ්ටි කරවා සූනියම් වීදිය උඩ තැබීමෙන් අනතුරුව රීරි යක් පිදෙන්නට නමස්කාර කරවා පුරාලපලට යවනවා සේම දරහැව සොහොන්පළට ගෙන යැමද යකැදුරෝ සිදු කරති. මේ අනුව සලකන විට, තොවිලයේ දී ඉතාම වැදගත් භාණ්ඩයක් ලෙස ඊ ගස හැඳින්විය හැකිය. මෙම ඊ ගස නිර්මාණය කර ඇත්තේ වියත් හතරක් දිග ලීයක් ගොක් කොළවලින් සරසා මුදුනේ යකඩ ඇණයක් ගැසීමෙනි. ඊ ගසට ඉනාවකින් නූලක් මතුරා ගැට ගසා ඇති බවත් ඊට, ආවේශ වූ යක්ෂයා අවනත වන බවත් ආතුරයා ආවේශයෙන් ඊ ගස යන සෑම තැනකම යන බවත් සාහිත්‍යයේ දැක්වේ.

යකැදුරන්ට අනුව තොවිලයේ භයානක අදියර මහසොහොන් සමයම නැටීමයි. එය හොඳින් ශාස්ත්‍රය දන්නා ඇදුරෙක් මිස අන් අයෙකු නටන්නේ නැත. මහසොහොන් සමයම සඳහා යොදා ගන්නා සැරසිලි පිළිබඳව සාකච්ඡා කරන විට ඉන් ප්‍රධාන වන්නේ මහසොහොන් වීදියයි.

**ඡායාරූප 3:** සන්නි වීදිය



මූලාශ්‍රය: ප්‍රතිචාරිකයාගේ අවසර සහිතව සංරක්ෂිත මූලාශ්‍රය ඔස්සේ ලබාගන්නා ලද්දකි.

වීදිය අයිල හතරක්, තොරණ හතරක් හා දොරටු හතරකින් යුක්ත විය යුතු අතර වීදිය සකස් කිරීමට පෙර සඳුන්, කහ ඉස බිම පිරිසිදු කර ගැනීම කළ යුතු වන්නේ ආරක්ෂාවත් පවිත්‍රතාවයත් තොවිලයක දී අවශ්‍ය බව යකැදුරන්ගේ අදහස වන හෙයිනි. ඒ සඳහා ආතුරයා ද කැප වී ක්‍රියා කරනු ලැබේ. තොරණ හතර සතරවරම් දෙවිවරුන්ට වන අතර, අයිල හතර ඇත්තේ මහසොහොන්, අමු සොහොන්, ලේ සොහොන්, ජය සොහොන්, මිනී සොහොන්, කඩවර සොහොන්, ගොපළු සොහොන්, පුළුටු සොහොන් යන යක්ෂයින්ටය. මැද මංගර දෙවියන්ට පූජා කරන අතර එහි මංගර හැලිය එල්ලා තබන බවත් එය මාතර ප්‍රදේශයේ බහුලව සිදු කරන බවත් හඳුනාගත හැකි වූ කරුණකි.

අවමංගල්ල පිදේන්න හා දරහැව සැරසිල්ල ද මෙහිදී විශේෂිතය. දරහැව සැරසිල්ල කෙසෙල් කඳන් දෙකකට ශක්තිමත් ලී යොදා අමුණා ගොක් තෝඩු යෙදීමෙන් සකස් කර ගන්නා අතර මහසොහොන් බලිය ද වලස් මුහුණකින් යුක්තව නිර්මාණය කර ගැනීම මෙහි දී සිදු කරන ආකාරයත් මිනිස් හිසට උඩින් සිටින සේ පොල් පරාල වැනි ශක්තිමත් ලී යොදා පුරාලයක් බැඳීම අවශ්‍ය බවත් ආවතේවකරුවන් විසින් හඳුන්වා දෙන ලදි. මෙම යොදා ගනු ලබන සැරසිලි සඳහා යොදා ගන්නා උපකරණ හා භාණ්ඩ සම්ප්‍රදායෙන් සම්ප්‍රදායට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. නමුත් ඒ සියල්ල නිර්මාණය කිරීමට යොදා ගන්නේ ගොක් කොළ, කෙසෙල් පතුරු, කෙසෙල් බඩ, ඉරටු ආදී ස්වභාවික ද්‍රව්‍යයන්ය. එයින් වටහා ගත හැක්කේ එකී සැරසිලි ගැමි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාවන් මෙන්ම සංස්කෘතිකව කලා මාධ්‍යය වර්ධනය කිරීමට ප්‍රබල උපකාරයක් වන බවයි.

ඉන්පසුව වීදිය කැප කිරීම සිදු කරනු ලබයි. එහි දී තොරන් හතරට මහසොහොන් වීදියේ සිව් කොනට හා මැදට මල් බුලත් සහිත අයිල නමයක් පුදා විලක්කු නමයක් දල්වා සිව්වරම් දෙවියන්ගේ තොරන හතරට වීදියේ වට අයිල හතරට මහසොහොන් බලියටත් විලක්කු ගසා මල් සඳුන් පුදා යක් නලාව සහ ඊ ගස අතට ගෙන දිෂ්ටි

මන්තර කීමේ දී යක් නලාව පිඹීම නිසාත් යක් බෙරයේ හඬත් නිසා මේ සියල්ල එක් වූ කල පරිසරය ඉතාම අද්භූත හා අභිමානයකින් අනූන වන බව තොවිලය සඳහා සහභාගිවන්නන්ට උපදෙස් ලබා දෙන ආවතේවකරුවන් සහ යකැදුරන් ප්‍රකාශ කරන ලදි.

මහසොහොන් උපත සම්බන්ධයෙන් ද විවිධ පුරාවෘත පවතී. එක් කවකට අනුව සෝමල රජුට දාව ගජ කුම්භකාරියගේ ළමැද පලාගෙන ඉරිදා අඬේ නැකතින් උපන් බව කියවේ. මෙහි දී ද උපත් කවි ගායනාව සිදු වෙයි. වලස් මුහුණක් හා දිග කෙස් වැටියකින් යුක්තව සබයට පැමිණෙන මහසොහොන් සමයම දෙකොන විලක්කු බැඳ නටන බව යකැදුරෝ දක්වති. ගින්දරට යක්ෂයින් බිය වන බව ජන සාහිත්‍යයේ ද දක්වා ඇත. එහෙයින් ගින්දර අවශ්‍ය වන්නේ යක්ෂයින් පලවා හැරීමට බව පැහැදිලි විය. මාතර ප්‍රදේශයේ ශාන්තිකර්මවල දී, මහසොහොන් සමයමක දී මංගර දෙවියන් පිදීම සිදු කරනු ලැබේ. "යකුන් අරඹයා පවත්වනු ලබන ශාන්තිකර්මයක දෙවි කෙනෙකු වීදි මණ්ඩපයට කැඳවා පුද දෙන එකම ශාන්තිකර්මය මහසොහොන් සමයම බව කිව හැකිය" (කෝට්ටෙගොඩ, 1995: 122). නමුත් බෙන්තර ප්‍රදේශයේ මේ අවස්ථාව සම්බන්ධයෙන් විශේෂත්වයක් නොමැත. මංගර දෙවියන්ගේ පෙළපාලිය නාට්‍යමය ලක්ෂණවලින් පරිපූර්ණ වූ අවස්ථාවක් වී තිබේ. "මෙම අවස්ථාව ඇතැම් පොත්වල දොළහ පෙළපාලිය ලෙස හඳුන්වා ඇත. එය වූ කලී මංගර දෙවියන් වෙනුවෙන් වස්තු දොළහක් පූජා කිරීමක් ලෙස එහි දී විස්තර කරයි" (දිසානායක, 1993: 155). දෙවොල් මඩුවේ දොළහ පෙළපාලියේ දැක්වෙන ඇතැම් අවස්ථා (ඇත් බන්ධනය, මී බන්ධනය) මෙහි දී යොදා ගනු ලබන බව දක්නට ඇතත් එකී දොළහ පෙළපාලියත් මහසොහොන් සමයමේ දොළහ පෙළපාලිය යයි හඳුන්වන පෙළපාලි කොටස් එකක් නොවන බව සාහිත්‍යය අධ්‍යයනයේ දී පැහැදිලි විය. මෙම පෙළපාලිවල ප්‍රමාණය සම්බන්ධයෙන්ද විවිධ මතිමතාන්තර පවතී.

මහසොහොන් සමයමේ දී අලුයම් යාමයේ පුද ලබන යකුන් සඳහා පිදවිලි දිය යුතු අතර මීළඟට අවතාර ඉගිලුම් සිදු කිරීම ආරම්භ වන බව ප්‍රකට වූ කරුණකි. එහි දී දෙකොන විලක්කු සහිතව ආවේශයෙන් යුක්තව දුම්මල වරම් ගෙන රාක්ෂ පද හා සමයන් පදවලට නැටීමත්, නිවසේ අහුමුළු සොයා දුම්මල ගසමින් නිවසේ යම් අවතාර ඇත්තේ ද ඔවුන්ව පන්නා දමන බවත් ඉන් නොනැවතී එසේ පිට කළ අවතාර උළුවස්සට තබා දෙහි කපා හිර කරන බව ද යකැදුරන්ගේ අදහසයි. අවතාර ඉගිලුම් කිරීමෙන් පසු ආතුරයා ආරක්ෂා කර පුරාලයට ගොස් කුකුළාව බිලි දීමක් කරන බව මොවුන් පවසන ලදි.

සන්නි යක්ෂයා වෙනුවෙන් ගොටු වට්ටිය කැප කර දීම සිදු කිරීමෙන් අනතුරුව මහසොහොන් බලිය පාවා දෙන්නේ ආතුරයා ඉදිරියට වඩම්මවා අදාළ දොළ පුදා විලක්කු දල්වා දුම්මල ගැසීමෙනි. ආතුරයා අතින් මල් බුලත් ගෙන ආතුරයාට සෙත් කොට සිරස පාද කවි කියා දොස් නිවාරණය කොට බලියේ වැඩ අවසන් කරන බවත් පසුව ආතුරයාගේ ආරක්ෂාවට යන්ත්‍රයක් දමා ගේ හතර කොන ආරක්ෂා මුට්ටි වළ දමා ආතුරයා අතට ඊ ගස දී දෙවියන්ට පිං දී පිං බෙර ගසා,

නළලෙ තුනයි බැම සඟලේ එක ලකුණ යි

බඩමැද තුනයි පය කලවේ උදා හඳ යි

සුරත පන්දමයි මෙවුලයි බෙඳහි මල යි

මහසෝනට අධිපති දෙවිඳු ආවඩ යි" (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

යනුවෙන් කවි ගායනා කොට මහසොහොන් සමයම නිමා කරන බව නියැදියේ යකැදුරන්ගෙන් සාක්ෂාත් කර ගත හැකි විය.

ඉර මුදුන් සමයම සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට, ඉර මුදුනේ රීරි යක්ෂයා ප්‍රධාන කොට ගෙන පවත්වනු ලබන්නා වූ තොවිලයක් ලෙස ඉර මුදුන් සමයම හඳුන්වා දිය හැකිය. මෙම සමයම මහසොහොන් සමයම හා එක්ව යෙදෙන අවස්ථාවල එය ඉර මුදුන් පිදේන්න ලෙස හඳුන්වනු ලබන අතර සමයම් හතරක පුදපෙත් ලබමින් සිටින රීරි යක්ෂයා වෙනුවෙන් පැවැත්වෙන හෙයින් කුටක සමයම ලෙසත් හඳුන්වන බව සාහිත්‍යයේ දක්වා ඇත. එනම් තවදුරටත් සාහිත්‍යය කෘති අධ්‍යයනයේ දී පැහැදිලි වූයේ කුටකය යනු ඉර මුදුනට පැමිණීම බවයි.

බලසම්පන්න යක්ෂයෙකු ලෙස රීරි යක්ෂයා පෙන්වා දිය හැකි අතර රීරි යක්ෂයාගේ උපත සම්බන්ධයෙන් විවිධ මත පවතී. රීරි යක්ෂයාට ඇත්තේ වාලි (වඳුරු) මුහුණක් බව යකැදුරෝ පැවසූහ. රීරි යක්ෂයා උපන් අවස්ථාවේ තම මව් මරා පියයුරු කඩා ලේ උරා බිව් බව රීරි යකාගේ අටකොන කවිවලින් විස්තර වන බව දත්තදායකයන් පවසන ලදි.

"උපන් පළමු එකවර ඇති කරපු මව් මරා

ගොසින් පෙනේ යමයකු හට භූත බය කරා

අතින් කඩා ගෙන පියයුරු බොමින් ලේ උරා

ඉතින් වරෙන් අග්නි දිගින් යකුන් පිරිවරා" (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

කවියෙන් රීරි යක්ෂයාගේ භයංකාර ස්වභාවය පෙන්වා දී ඇති අතර ලයනල් බෙන්තරගේ මහතා රචිත 'රීරි යක් සංකල්පය හා සමාජය' කෘතියේ දැක්වන්නේ "රක්ත වර්ණ සිරුරකින් යුක්ත වූ ඔහු ලේවලට අධිපති යක්ෂයා යි. රීරි යකා ලේ මුහුදේ ගිලී ස්නානය කර ලේ කඩක් ඇඳ, ලේ වතක් පොරවා ගෙන ලේ විලක් ඉස පිට දරා ගෙන රීරි ගල් කෝවිලේ වාසය කරයි" (බෙන්තරගේ, 2009: 51-52). එමෙන්ම රීරි යක්ෂයාගේ දස අවතාරයන් සම්බන්ධයෙන් ද අදහස් හඳුනා ගත හැකි විය. රීරි යක්ෂයා සඳහා මල් මඩුව ඉදි කිරීමත්, පිදේනි තටු හා සූනියම් වීදිය ඉදිකර සැරසීමත් කරනු ලැබේ. පුරාලය ඉදි කරන්නේ ජලය ඇති ස්ථානයක වීම විශේෂ වන අතර ඊට හේතුව නම් මෙම යක්ෂයා ඇළ දොළ ආශ්‍රිතව වෙසෙන බව ප්‍රමුඛ කොට ගෙන බව යකැදුරන් දැක්වූ අතර මූලික වතාවත්වලින් අනතුරුව මෙහිදී හත්පද පාලියක්, දළුමුර පාලියක්, කුකුළු පාලියක්, විලක්කු පද, ඊ ගසේ

පදයක්, වට පදයක් සහ අයිලෙ පදයක් නටන බව පවසන ලදි. පර්යේෂණයේ දී යකැදුරන්ගෙන් තවදුරටත් ලබා ගත් තොරතුරු අනුව මෙම සමයමේ දී ද අනෙක් යක් තොවිල්වල දී පුද ලබන්නා වූ ප්‍රධාන යකුන් යක්ෂණියන් සඳහා කවි කීම, අටකොන කවි, පිදේනි කැප කිරීම, දිෂ්ටි මන්ත්‍ර, සිරස පද ගායනා යනාදිය සිදු වේ. රීරි යක්ෂයාට පිදේන්න සාදවන්නේ ගැබ හතරකටය. ඕනෑම යක්ෂයෙක් කැප කර දිය හැකි නිසාවෙන් සමාගම් පිදේන්නක් ද මෙහි ඇත.

**රූප සටහන 2:** රීරි යක් පිදේන්න




මූලාශ්‍රය: පර්යේෂණ දත්ත, 2017

**රූප සටහන 3:** සමාගම් පිදේන්න




මූලාශ්‍රය: පර්යේෂණ දත්ත, 2017

එසේම, රීරි යක් යාදින්න ගායනා කොට දිෂ්ටි මන්තර කියා මෙම පිදවිලි කැපකර දීමේ දී වස්දණ්ඩ පිඹීම සිරිතකි. "අවමංගල්ල පිදේන්න කැප කිරීමට සොහොනට යාමට පෙර කළු යකා, රීරි යකා, සූනියම් දේවතාවා නමින් සියලු දෝස, දස මහා දෝස, අසූ මහා දෝස නිවාරණයි කියලා ආවඩා ලේවලට ලේ ගලවා මස්වලට මස් ගලවා ප්‍රාණයට ප්‍රාණය ගලවා හතර ගාත් බිඳී දෝස උගුළුවා ආවඩයි යනුවෙන් පවසයි" (කාරියවසම්,2011: 115). පසුව අවමංගල්ල පිදේන්න කැපකර දීමේ දී දරහැවේ යකැදුරා දපවා පුරාලයට ගෙන යන බව

දත්තදායකයන් පවසන ලදි. ඉන්පසු තොවිලයේ අවසාන අදියර වෙත පැමිණෙන බව තොරතුරුවලින් හඳුනා ගත හැකිය.

> “දවල් දොළහ වෙද්දි ඉර මුදුන් යකාගෙ උපත් කවි කියනවා. මෙයින් පසුව පුරාලපලේදී දරහැව පිදේනි හතර කොනින් ලණුවලින් බැඳ ඉහළට ඔසවා පුරාලය මුදුනේ මන්ත්‍ර කියා ආතුර නූල් මතුරා, දෙහි කපා පුරාලයෙන් බිමට පැන ආතුරයාට සෙත් පතා සිරස පාද ගායනා කර දෙවියන්ට පිං දී පිං බෙර වාදනය කරනවා” (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

මීට අමතරව රීරි යක්ෂයා වෙනුවෙන් සිදු කරන විශේෂම වූත් භයානක වූත් පිළිවෙතක් සම්බන්ධයෙන් අදහස් දැන ගැනීමට හැකියාව ලැබුණි. එනම් ලේ තාලි තීන්දුව කැපීමයි. ඒ සම්බන්ධයෙන් ලයනල් බෙන්තරගේ දක්වනුයේ, “ලේ තාලි තීන්දුව කැපීම සඳහා යොදා ගන්නා පුහුල් ගෙඩියට අමතරව අළු කෙසෙල් බඩයෙන් සකස් කර ගත් කුඩා ඔරුවක් හොඬල අලයෙන් කපා ගත් මිනිස් රුවක් ද යොදා ගැනේ” (බෙන්තරගේ, 2009: 148) යනුවෙන් දක්වයි. මේ සම්බන්ධයෙන් යකැදුරන් දැක්වූ අදහස් පහත පරිදි වේ.

> “දරුණු විදියට රීරි යකාව වැහුණම මේක කරනවා. මගේ තාත්තගෙ කාලෙදි ලේ තාලි දෙකක් කැපුවා. සොහොන් පළකට ගිහින් උඩ රතු කුකුළෙක් එල්ලනවා. ඊට යටිං පුහුල් ගෙඩියක් බඩ උඩ තියං යකැදුරා දපනවා. කුකුළට දුම් අල්ලලා මැතිරුවම ඌ මැරෙනවා. ඒකෙන් ඔප්පු වෙන්නෙ කුකුළගෙ ප්‍රාණය යක්ෂයා ගත්තා කියන එක. කුකුළගෙ කටිං පුහුලට ලේ වැක්කෙරෙද්දි කඩුවෙන් ලේ තාලි තීන්දුව කපනවා” (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

මෙවැනි ලේ තාලි කැපීමක් හේතුවෙන් අළුත්ගම රූමන් කට්ටඩි මහතා මිය ගිය බවට ක්ෂේත්‍ර අධ්‍යයන තොරතුරුවලින් අනාවරණය විය. තොවිලයකින් පුද්ගල සිත මෙහෙයවා පාලනයකට ලක් කරමින් යම් කෘත්‍යයක් කළ ද එයින් මේ ආකාර දුෂ්කෘත්‍යයන් සිදුවන්නේ නම් එය සමාජ පද්ධතියට සෘජුව බලපෑම් කරන බව කිව යුතුය. සමාජ පද්ධතියේ පැවැත්මට අවශ්‍යව පවතින්නේ රෝග සුව කිරීම පමණක් නොව පුද්ගල ජීවිතවල පැවැත්මයි. එමෙන්ම ප්‍රතිකාර ක්‍රමයකින් විය යුත්තේ පුද්ගලයා සුව කිරීම මිස මරණයට පත් කිරීම නොවන බවද කිව යුතුය.

**කළු කුමාර සමයම**

බෙන්තර සාම්ප්‍රදායික පහතරට ශාන්තිකර්මයක් වන කළු කුමාර සමයම බහුලව පවතින්නේ රට යකුම් යාගය හා එහි එක් අංගයක් වශයෙන් බව දැක්විය හැකිය. එයට හේතු වී ඇත්තේ කාන්තාවන්ගේ වන්ධ්‍යාභාවය හා දරු උපත් වැළැක්වීම කෙරෙහි රට යකුන් තරමටම කළු කුමාරයාගේ බලපෑමත් ඇති බවට ඇති විශ්වාසයයි. මෙම යාගය ස්වාධීන ශාන්තිකර්මයක් ලෙස පවත්වනු ලබන අවස්ථාවන් ඇත. එවැනි අවස්ථාවලදී මෙය “කළු යකුම් භාගය” ලෙස හඳුන්වන බව සාහිත්‍යයේ ව්‍යවහාර වී ඇත. කළු යකුම් භාගය යනුවෙන් හඳුන්වන්නේ අත්‍යවශ්‍ය

මූලික පුදපූජා පමණක් ඉටු කර යාගය සුළුවෙන් කර අවසන් කරනු ලබන අවස්ථාවල දීය. කළු කුමාරයා ස්ත්‍රීන්ට විනා කරන යක්ෂයෙක් බවත් එසේ වීමට හේතුව අධ්‍යයනයෙන් ලබා ගත් දත්තවලට අනුව,

"එදා ගොසින් ස්ත්‍රී පුරට මදන විකාරෙන්

බදා ගතිය ළඳ ඇවිදින් කුමරුට පිරියෙන්

බෙදා ගතිය කුමරුගෙ මස් ඇඟ අත ගාමින්

එදා මැරී ගොස් උපනිය ළඳුනට වෛරෙන්" (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

මේ හේතු නිසාවෙන් මිය ගිය කළු කුමාරයා දරු උපත් නැති කිරීමට කටයුතු කරන බව අධ්‍යයන තොරතුරු මගින් තවදුරටත් පැහැදිලි විය.

"හිටපු කෙල්ල මගදී ගබ්සා වෙනවා

එමැද අල්ල දුටුවම මාලේ යනවා

අංගවිකල ඇති බිළිඳුන් බිහි වෙනවා

මේ හැම දෝස කළු කුමරුන් දුරලනවා" (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

එහෙයින් කළු කුමාරයාගේ ඇල්ම බැල්ම හේතු කොට ගෙන ඇතිවන රෝගාපදාවන්ගෙන් මුදා ගැනීම කළු කුමාර සමයම නැටීමේ මුඛ්‍ය පරමාර්ථයයි. මෙම ශාන්තිකර්මය සඳහා ඇප වීම ආකාර දෙකකින් සිදු වේ. එක් ආකාරයක් නම් ඇප නූලක් බැඳීම වන අතර, අනෙක් ආකාරය වන්නේ ඇප කළසක් වෙන් කර තැබීමයි.

> "මේ නූල දාන්නෙ කළු කුමාර බන්ධනවලින් 108 වාරයක් ජීවම් කරලා ඇප කළස් මාලාවක් අතින් අත ගස්සලා. අලුත් කළසකට ගොක් කොළ පහක් ගෙනල්ලා බැඳලා ඇතුළට පොල් මලක් දාලා ගොක් කොළ අග එක් කරලා බාඳුරා වැල් පටකින් ගැට ගහලා කළසට බුලත්, පඬුරු පහක්, ඇට ඇටි, මල්, බාඳුරා වැල් කැල්ලක් දානවා. ඒක ආතුරයා නිදා ගන්න ඉසව්වෙ පේන තැනක වහලෙ එල්ලනවා" (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

මෙසේ සිදු කරන්නේ තොවිලයේ නියමිත දවසට මේ කළස කැපකර දීමේ බලාපොරොත්තුවෙනි. එය නිතර පෙනෙන්නට තිබීමෙන් කළු කුමාරයා වෙනුවෙන් බාරහාර වී ඇති බවත් දරු ප්‍රසූතියක දී කිසිදු උපද්‍රවයක් ඇති නොවේය යන විශ්වාසය ආතුරයාගේ සිතේ ඇති කිරීමේ පරමාර්ථයෙන් බව ලබා ගත් තොරතුරු මඟින් අවබෝධ කර ගත හැකි විය. කළු කුමාරයා වෙනුවෙන් කරනු ලබන කළස වෙන් කිරීමේ කටයුත්තේ දී ආතුර කාන්තාවගේ සිතට ආත්ම ධෛර්ය හා ශක්තිය ඇති කිරීමට එකී පොරොන්දුව කොතරම් දුරට දායක වනවා ද යන්න සිතිය යුතු කාරණාවක් වන්නේ යැයි පර්යේෂකයන් වන අපගේ ආකල්පයි. එනම් තමා සුවපත්වනවා යන ආරක්ෂාකාරී හැඟීම සිතට ලබා ගැනීමටත් ඉන් තමාගේ රෝගය සුවපත් කර ගනිමින් සමාජ වගකීම්වල නියැළීමටත් එය පැහැදිලිවම උපකාරී වනු ඇත. මෙම තොවිලය ආරම්භ කරන්නේ ඉහත දැක්වූ තොවිල්වල

මෙන්ම මල් යහන්වලට පහන් පත්තු කර නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි යන සිව්වරම් දෙවිවරුන්ට ආරාධනා කර මල් යහන් නැටීමෙන්ය. ත්‍රිවිධ රත්නයට සහ දෙවිවරුන්ට පහන් දැල්වීම සඳහා නිර්මාණය කරන යහන 'මල් යහන' ලෙස හඳුන්වන්නේ අතර බෙන්තර සම්ප්‍රදායට අනුව යකැදුරන් ඊට ආචාර කිරීමෙන් අනතුරුව පද සුරල් තබා නර්තනයේ යෙදීම 'මල් යහන් නැටීම' ලෙස හඳුන්වන බව අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. පසුව හැන්දෑ සමයම පුද ලබන කළු යකා, රීරි යකා, සූනියම් යකා හා සන්නි යකා වෙත පිදවිලි ඔප්පු කර දීම සිදු කරයි. ඒ එක් එක් පිදේනිවලට අයත් දිෂ්ටි මන්ත්‍ර, උපත් කවි, අටකොන කවි කියා ආරාධනා කොට තටුව ආතුරයාගේ හිස මත කරකවා ආවැඩීම සිදු කරයි.

ඉන්පසු ආරම්භ කරන කළු කුමාර සමයමේ දී කළු කුමාරයාට ඇඳගෙන ඒමට පෙර වෙනත් යකැදුරෙක් පැමිණ කුමාරයාට සාදවා නිම කළ පිදේනි මාලාවට උපතේ සිට කවි මන්ත්‍ර, ශ්ලෝක ගායනා කොට, තබා තිබෙන කළස පිළිබඳව ආවර්ජනය කරන බව යකැදුරෝ ප්‍රකාශ කළහ. මෙයින් පසුව ශ්ලෝක ගායනා කර කළු කුමාර යාදින්න කියවා ඊට අදාළ උචිත ආකාරයේ නර්තනයන්හි යෙදෙන බවත් කළු කුමාර නැට්ටුවා කළු කුමාරයා ලෙස වෙස් මුහුණ පැළඳ අලංකාර ඇඳුමෙන් සැරසී වීදියෙන් එළියට පැමිණ පාලි දොළසක් නටන බවත් යකැදුරන් දැක්වූ අදහස් විය.

**ඡායාරූප 4:** කළු කුමාරයාට අයත් වෙස් මුහුණ



මූලාශ්‍රය: පර්යේෂණ දත්ත, 2017

එම පාළි දොළස ලෙස අඟුරු දුම්මල පාලිය, කොතල පදේ, තැඹිලි ගෙඩිය, කළස් පදය, සළු පදය, කුකුළු පදය, චාමර පදය, කඩුව, දුන්න, මුගුරු පාලිය, ඊ ගසේ පාලිය සහ පන්දම් පාලිය දැක්විය හැකිය. මේ භාණ්ඩ දොළහටම වෙන වෙනම පද නටමින් කළු කුමාරයා සතුටු වන ලෙස රංගනයේ යෙදෙයි. නමුත් මේ තොරතුරු අනුව පර්යේෂකයාගේ අදහස වන්නේ මෙහි දී කළු කුමාරයා සතුටු වීමක් පමණක් නොව ආතුරයාගේ සිතට යම්කිසි චිත්ත ශක්තියක් ලැබෙන බවයි. මක්නිසාද යත් මේ ආයුධ සියල්ලන්ගෙන් බොහොමයක් කතරගම දෙවියන්ට අයත් ආයුධ හෙයින් එයින් තමාට දේව ආරක්ෂාව, පිහිට ලැබෙන බව ආතුරයාගේ සිතට ශාන්තියක් ලැබීමට තුඩු දෙන කරුණක් නිසාවෙනි.

පවිත්‍රතාවය මෙහි දී මනාව පිළිබිඹු වන බව අවබෝධ විය. එමෙන්ම කිල්ල යන්න අපිරිසිදු තත්ත්වය තුළ තොවිල් ශාස්ත්‍රය සිදු කළ නොහැකි බවද පෙනුණි. අප එදිනෙදා ජීවිතයේ වුවද බුදුන් නමදින්නේ පිරිසිදු වීය.

පන්සල වෙත යන්නේ පිරිසිදු වීමෙන් පසුවය. ස්ත්‍රීන්ට ඔසප් වී ඇත්නම් දේවාලවලට නොයාමට ඔවුන් වග බලා ගන්නේ කිලි හසුවන බැවින් යැයි ගැමියෝ අදහති. සැබැවින්ම හැගෙනුයේ පවිත්‍රතාවය තුළ රෝගයක් සුවපත් කිරීමේ හැකියාවක් පවතින බවයි. එය බටහිර වෛද්‍ය විද්‍යාව තුළ ද පිළිගන්නා කරුණක් වන අතර බටහිර ක්‍රමයට අනුව විෂබීජ යනු රෝග සෑදීමට මූලික වන ප්‍රධානම හේතු කාරකයකි. නමුත් මෙහි දී ශුද්ධ-අශුද්ධ භේදයක් බල පවත්වන බව අප දරන අදහසයි. එනම් අමු මස්, මත්ද්‍රව්‍ය යනාදිය අශුද්ධ බැවින් ඒවා දෙවියන්ට පුදන්නේ නැත. යකුන් අශුද්ධ හෙයින් ඒවා පුදන්නේ යකුන්ටය. එමෙන්ම අශුද්ධ යක්ෂයෙකු පුද්ගලයාට ආවේශ වී ඇති විටෙක ශුද්ධත්වයට පත් කර ගැනීම සඳහා අශුද්ධ වස්තු උපකාරයට ගනියි. එනම් අශුද්ධ වූ ආතුරයාව ශුද්ධත්වයට ලක් කරන්නේ අශුද්ධ යැයි සලකන යක්ෂයින්මය. මේ පිළිබඳව තිස්ස කාරියවසම් ද අදහස් දක්වා ඇත. "සිංහල සමාජයේ ශුද්ධ-අශුද්ධ භේදය මේ ආකාරයට පැවතීම තුළ ඒ දෙක අතර අන්තර් ප්‍රතිකාර්යාත්මක න්‍යායක් ඇතැයි සිතේ" (කාරියවසම්, 1998: 135) යනුවෙන් ඔහු පවසා ඇත.

කළු කුමාර සමයම නටා කුමාර පිදෙන්න ගෞරවයෙන් යුක්තව උඩුවියන් යටින් කුමාර වීදිය වෙත වඩම්මවා ගෙන විත් වීදිය වටේ තෙවරක් පැදකුණු කොට මගුල් බෙර වාදනය මැද කළු කුමාර වීදියෙන් පිටපත් කරවයි. පිටපත් කරවීම යනු පිළිකන්නෙන් ඉවත්ව යන්නට කීමක් වැනි බව යකැදුරන්ගේ මතයයි. කළු කුමාර පිදේන්න සඳහා පොළොස් මාළුවක් තැබීම සිදු කළ යුතුම කරුණක් වී ඇත. මැංගුස්, පොල් වළලු, කළු රෙද්දක්, පිරිසිදු කැවිලි පළතුරු ආදිය පිදේන්නේ අඩංගු විය යුතු අතර කළු කුමාර පිදේන්න කැප කරන්නේ,

"ඉන්නට කැත නැද්ද නුඹට මේ ළඟ වෙත දැන්

ගන්නට හොඳ තරුණ ලියෝ රටේ නැද්ද බන්

යන්නට අවසරයි නුඹට පසේ බුදු අණින්...." (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

යනුවෙන් පවසමිනි. මෙහිදී දුෂ්කෘත්‍යයක් වන බව කවියෙන් පෙන්නුම් වේ. එනම් තොවිලය තුළින් උත්සාහ දරන්නේ ආතුරයන් සුවපත් කිරීමයි. නමුත් මෙහිදී වෙනත් තරුණ ළඳුන් වෙත යන්නට පැවසීම කොතරම් දුරට සමාජ පද්ධතියේ පැවැත්මට බලපෑම් කරනවාද යන්න අප සිතිය යුතුය. මෙයින් පසු කළු කුමාර ඉගිලුම් මඟින් එක නැට්ටේ දෙහි තුනක් කපා ආතුරයාට සෙත් කරවා ගේ නිවීමක් කරන බව යකැදුරන්ගෙන් දැන ගත හැකි විය. ගේ නිවීම යනු ගෙට මතුරා මන්ත්‍ර ශ්ලෝක පවසා දුම්මල ගසා ගෙයි ඇති දොස් ඉවත් කිරීමයි. කළු කුමාර බලිය පාවා දීම විශේෂ වන අතර මෙහිදී ඇඹුම් කවි ගායනා කරන බව පවසන ලදි. ඉන්පසුව කළු කුමාරයාට සෙත් කවි කියා බලිය පාවා දී පිං බෙර වයා පිං කවි කියා ආතුරයාට ශාන්ති කර තොවිලය අවසන් කරයි.

**සූනියම් ශාන්තිකර්මය**

පොදුවේ ලාංකිකයන් අතර දක්නට ලැබෙන සූනියම් කිරීමේ හා සූනියම් කැපීමේ චාරිත්‍ර විධි දෙයාකාරයකින් සිදු වේ. කිසියම් තැනැත්තෙකුගේ හෝ පවුලේ ඉඩකඩම්, දේපළ, වස්තු, යානවාහන ආදිය විනාශ වන පරිදි මන්ත්‍ර කියා බලයෙන් අහිතකර බලපෑම් සිදු කිරීම සූනියම් කිරීම වන අතර එවැනි සූනියමක් සිදු කර ඇත්නම්

ඒවා ඉවත් කර ශාන්තියක් ළඟා කරවීම සූනියම් කැපීම ලෙස භාවිතයේ පවතී. මෙම ක්‍රියාවලීන් දෙක අපරදිග වැසියන් අතර පවතින්නේ Black Magic හා White Magic යනුවෙන් බව සාහිත්‍යය අධ්‍යයනයේ දී පැහැදිලි කර ගන්නා ලදි. සූනියම් කිරීමේ ක්‍රම පිළිබඳව විමසා බලන විට ඒවා ප්‍රධාන වශයෙන් අංගම්, පිල්ලි, ජීවම්, බන්ධන යනුවෙන් කොටස් හතරක් ඇති බව පැහැදිලි වූ කාරණාවක් වේ. "තවත් සමහරෙක් ඊට කොඩිවින යන අංගය ද එක්කොට සූනියම් කිරීමේ ක්‍රම පහක් දක්වා ඇත" (විජේසේකර, 1955: 201). මෙම සූනියම් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී එය ගැටුම්වාදී පර්යාවලෝකය හරහා විමසීමට ලක් කළ හැකිය. "ගැටුම යනු සමාජයේ ස්වරූපයකි. එනම්, සෑම ජන සමූහයකම දැකිය හැකි අන්තර්ක්‍රියාවකි" (කරුණාතිලක, 1998: 57). සමාජයේ පුද්ගලයින් අතර ගැටුම් නිර්මාණය වීම විවිධ හේතු පදනම් කර ගනිමින් සිදුවන අතර එම ගැටුම් සූනියම් කිරීම දක්වා බලපෑමක් සිදු කරන බව කිව හැකිය.

රිචඩ් ගොම්බ්‍රිච් සහ ගණනාත් ඔබේසේකර විසින් රචනා කරන ලද Buddhist Transformed: Religious Change in Sri Lanka (1990) කෘතියේ මනස හා සම්බන්ධ කරුණක් අනාවරණය කරනු ලැබේ: "කාන්තාවන් සූනියම් දේවාලයට පැමිණීමට පවුල් ගැටලු හේතු වන අතර සැමියා තමන්ව අතරමං කර යෑම, අයුක්ති සහගත ලෙස හැර යෑම හෝ වෙනත් කාන්තාවක් වෙනුවෙන් අතහැර දැමීම ඒ අතර ප්‍රධාන වේ" (Gombrich and Obeysekeare, 1988: 126). මේ තත්ත්වය ගැටුම් න්‍යාය ඔස්සේ තවදුරටත් පැහැදිලි කර ගත හැකිය. එනම් සෑම සමාජයකම ගොඩ නැගෙන අත්දැකීම් සමාජ ගැටුමකට තුඩු දෙන බව කිව හැකිය. ඒ අනුව සමාජ ගැටුම සර්වර්තී බව ගැටුම්වාදීන් පවසන අතර ඉහත දැක්වූ අගනාකම් පිළිබඳ ගැටුම එම කාන්තාව සූනියම් කිරීම සඳහා පොළඹවා ඇති බව කිව හැකිය.

ඉහත ආකාරයේ සූනියමක් කැපීමේ දී ඒ සඳහා මාතර හා බෙන්තර සම්ප්‍රදායේ සිදුවන ශාන්තිකර්මයන්හි විවිධ වෙනස්කම් පවතින බවට තොරතුරු අධ්‍යනයේ දී අනාවරණය විය. එය තහවරු කර ගනිමින් 'සූනියමේ බෙන්තර සම්ප්‍රදාය' කෘතියේ සිරිල් මීගම සඳහන් කරන්නේ මාතර හා බෙන්තර වශයෙන් සූනියමේ ද්විත්ව සම්ප්‍රදායක් ගොඩ නැගී ඇත්තේ පූජා විධි රටාවේ විසමතා නිසාම නොවන බවයි. ගායන වාදන හා නර්තන අංගවල මෙන්ම රංග වස්ත්‍රාභරණ හා රංග භූමි සැරසිලි තුළින් සුළු වශයෙන් හෝ විද්‍යමාන වන යම් යම් විවිධතා ඒ සඳහා බලපා තිබෙන බවයි. රංග වස්ත්‍රාභරණ හා රංග භූමි සැරසිලි සලකා බැලීමේ දී බෙන්තර සම්ප්‍රදායට ආවේණිකව පවතින සමහර විශේෂතා ඇති බව මෙතුමා තවදුරටත් සඳහන් කරයි (සූනියමක් කැපීමේ ශාන්තිකර්මයකදී සූනියම් යක්ෂණියගේ සන්නි තුනක් ද නිරූපණය කිරීමක් සිදු කරන බව යකැදුරන් පවසන ලදි. ඒවා නම්, පළමු සන්නියේදී ළදරුවෙක් නොමැතිව, දෙවන සන්නියේ දී ගර්භණී කාන්තාවක් ලෙස සහ තෙවන සන්නියේ දී ළදරුවෙක් අතැතිව සූනියම් යක්ෂණිය සබයට පැමිණීමයි.

සූනියමක් ඉවත් කිරීම සම්බන්ධයෙන් ලබා ගත් තොරතුරුවලට අනුව එය සිදු කරන ක්‍රම තුනකි.

> "රහසිගතව වින කැපීම කරන්න පුළුවං. මොකද නැත්නම් වින කළ පුද්ගලයා ඌරු තෙල් දාලා වින කැපීමට අවහිර කරනවා. එහෙම නැත්නම් සූනියම් යාගය කරන ක්‍රම දෙකයි. එකක් සූනියම් භාගය.

ගොඩක් වෙලාවට යකැදුරෝ කරන්නේ මේක. අනිත් එක තමයි අංග සම්පූර්ණ සූනියම් යාගයක් කරන එක. ගොඩක් වෙලාවට ඒක කරන්නෙ ගමකට ශාන්තියක් කරන්න ඕන උනාම" (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

දත්තවලට අනුව සූනියම් භාගයේ දී අත්‍යවශ්‍ය වත්පිළිවෙත් සිදුකර මූලික අවශ්‍යතා පිරිමසා ගැනීමට ප්‍රමාණවත් වන සැරසිලිවලට ද සීමා වීමක් සිදු වෙයි. පුද්ගලයාගේ වත්පොහොසත්කම් මත මෙය තීරණය වන බව සිතිය හැකිය. සම්පූර්ණ සූනියම් ශාන්තිකර්මයකට අධික මුදලක් වැය වන බැවින් සූනියම් භාගයක් කිරීමෙන් තම අවශ්‍යතාවය පූර්ණ කර ගැනීමට ගැමියා පුරුදු වී ඇති බව මෙහිදී විමසිය හැකි කරුණකි.

සූනියම් යාගයේ උපත් කථාව දක්වන්නේ නම්, මහා සම්මත රජුගේ බිසව වූ මැණික්පාල බිසවගේ රෝගයක් සුව කිරීම හේතු කොට ගෙන සූනියම් යාගය නිර්මාණය වී තිබේ. මැණික්පාල දේවිය විෂ්ණු දෙවියන්ගේ නැගණියයි. වසවර්ති මාරයා මැණික්පාල බිසවට කැමති වී එයට බිසවගෙන් ආ විරෝධය හේතුවෙන් හටගත් වෛරය නිසා වසවර්ති මාරයා මැණික්පාල බිසවට වින පොළඟෙක් දමා ගැසීම නිසා එය සුව කිරීමට සූනියම් ශාන්තිකර්මය සිදු කර ඇත.

"විෂ්ණු දෙවියන්ගෙ නැගණිය උනේ මැණික්පාල බිසව. වසවර්ති මාරයා විනයක් කරපු හින්දා තමන්ගෙ නැගණිය බේරගන්න විෂ්ණු දෙවියො බඹර වේශයක් මවා ගෙන අජාකූඨ පර්වතයේ හිටපු ඔඩ්ඩිස ඍෂිවරයාට කරුණු දක්වලා තමන්ගේ නැගණිය හොඳ කරන්න කියලා ඉල්ලලා. ඒ නිසා තමයි මේ ශාන්තිකර්මය ගොඩ නැගිලා තියෙන්නෙ" (සම්මුඛ සාකච්ඡා දත්ත, 2017).

මිනිස් ජීවිතයේ වැදගත්ම සංසිද්ධිය ලෙස 'උපත' හඳුනා ගත හැකිය. සැබැවින්ම උපත තුළින් පුද්ගලයාගේ පැවැත්ම තීරණය වේ. ඒ ආකාරයෙන්ම තොවිලය යන සුව කිරීමේ මාධ්‍යය තුළ ද එක් එක් අංගයන්ට වෙන් වෙන් වූ උපත් කථා පවතින බැව් මෙම අධ්‍යයනය හරහා දැක ගත හැකි විය. ඒ තුළ විද්‍යාවෙන් තර්කනයෙන් පොහොසත් වී සිටින අද්‍යතන යුගයේ දී වුව ද මනුෂ්‍යයා මෙම සුව කිරීමේ මාධ්‍යය උදෙසා ඇති කර ගත්තා වූ බැඳීම සහ විශ්වාසය අත් නොහැරීම හේතුවෙන් ශාස්ත්‍රයේ පැවැත්ම යම්තාක් දුරකට හෝ තහවුරු කර ගැනීමේ හැකියාවක් ද පවතින බැව් කිව යුතුය.

සූනියම් යාගයේ දී තුනුරුවන් ප්‍රධාන සතරවරම් දෙවියන් වෙනුවෙන් මල් අස්නක් මෙන්ම කළු යකා, රීරි යකා, සූනියම් යකා, අභිමාන යකා සහ මහසෝනා යන යක්ෂයින් සඳහා පිදේනි සකස් කර ප්‍රධාන වීදිය වන අටමගල වීදිය ද නිර්මාණය කරයි. සූනියම් යාගයේ සැරසිලි අතර ප්‍රධාන ස්ථානය හිමි වන්නේ අටමගල වීදිය ඉදි කිරීමට බව අධ්‍යයනයෙන් හෙළි විය. ඒ සඳහා කෙසෙල් පතුරු, හබරල කොළ, ගොක් කොළ ආදියෙන් ද සඳලු තල, බිම්මාල, උස්මාල, වඩිම්බු ආදියෙන් ද මල්කම් ලියකම් ආදී සැරසිලිවලින් ද ඇත්, අස්, හංස, නයිපෙන රූප ආදියෙන් ද සරසන ලද විසිතුරු නිර්මාණයකි. මෙම අටමගල වීදියේ හැඩය සම්බන්ධයෙන් කිසිදු විද්‍යාත්මක විමසුමක් සිදු කර නොමැති බැව් අධ්‍යයනයේ දී පැහැදිලි විය. මිසරයේ පාරාවෝ සොහොන් කොත් නිර්මාණය කර ඇත්තේ විද්‍යාත්මක පදනමක් මත බවත් ඒ තුළ උෂ්ණත්වය පාලනය වීමක් වන බැවින් බෙහෙත් ගල්වන

> "I studied for up to 2 years. My parents then stopped funding my studies. I had to look after my younger siblings. When I was 13 years old, I started to work in the estate sector".

Because of poverty, not only that they had to lose their formal education, but they also had to sacrifice their desires in order to contribute to their families' income. Although they do not contribute to the family's income in a direct way, indirectly they had contribute to it. This is the pioneering reason and first step of the domestication of women in the estate sector. Mainly, the eldest daughter of a family has to face this condition. The following statement from the interview indicates this scenario:

"Though I worked the whole day, I got less salary than my husband. My older daughter looked after her younger siblings. Otherwise, I can't go to work. She sacrificed her life on behalf of her siblings".

The liberal perspective is also concerned with women's liberation. Whatever the case, their aim is for women to have equal positions as men in education, be liberated from men's suppression, and be involved in decision-making and activities that will be in favour of their work choice. However, these women have no equal right to education. Many factors have contributed to the low education level of these women. Among them, external factors are the main causes, such as poverty, a lack of resources, and shortcomings in the school. Interview number 4 further explains how these external factors contribute to the lack of education in this sector.

"In the school, there were many shortcomings. Teachers came, and within a short period, they transferred. So they couldn't continue their education. Then they also engaged in estate work. My daughters help me with household chores. My daughter got married when she was 15 years old".

**Poor Health Condition**

Being healthy is very important for everyone who engages in hard work. Health is not only about physical well-being but also mental well-being. The World Health Organization (WHO) defines health as 'An idyllic blend of mental, physical, social and spiritual well-being'. According to this definition, it could be identified that these women have a low level of well-being. The following chart depicts the health condition of women workers.

**Figure 5**: Health Condition of the Respondents




Source: Survey Data, 2022

According to the above chat, we can identify that many women among the respondents are suffering from at least one of the health issues. Respondents who had mentioned that they are suffering from health issues were 38%. Some of them are suffering from cancer, some of them are suffering from diabetes, and some of them are suffering from low blood pressure or high blood pressure. All of these are non-communicable diseases. A significant number of women respondents were patients of non-communicable diseases. Because they have no good dietary system. And they also can't access good health facilities. Even when they are suffering from serious health issues, they are unable to access proper treatment because of their economic condition. Though they use government hospitals for health facilities, they finally have to buy medicine from the private sector. It had been difficult for them to spend money due to the lack of income. The poor health condition of these women paved the way for their domestication, and they are not actively participating in work either.

These patients should go to medical clinics weekly or monthly. Though they participate in the medical clinic of the government hospital, those are rural hospitals. And they also have to buy medicine prescribed by doctors. They must have money in hand to buy medicine from pharmacies. Due to this, they normally don't participate in medical clinics. So they have to work despite serious health issues. This condition could further be identified by the following statement: In this way, they had to struggled to survive and continue their lives.

> "I am a cancer patient. Though I am suffering from cancer, we can't stay at home. If we stay at home, where can we find money or who will give us money? I must participate in the medical clinic. But how can I participate in it? If I participate in the medical clinic, I can't find money to spend tomorrow. Though I participate in clinics, they ask us to buy medicine from private pharmacies. How can I buy medicine from it?".

**Lack of Land and House Ownership**

In this society, men and women have to struggle to live without separation. On the estate, the Tamil female community faces many problems in relation to basic needs. They should have basic needs such as food, water, sanitation, shelter, and protection, If they need to survive. However, they are at a low level of fulfilment of basic needs. If they want to fulfil their basic needs, they have to struggle for them. As an example, they have no proper shelters. They are living in separate rooms. If the estate authority forces them to leave those line rooms, they

have no option in relation to shelters. To build a new house, they have no extra land or ownership of land.

**Land Ownership**

The land is the most valuable natural resource for the people. Although these women had lived on this estate for several generations, there is no ownership of the land. It is a very tragic situation for them. Because they do not have ownership, they had been unable to built their homes in a sustainable way. Still, they live in small-scale line rooms that are owned by the estate authority. Though authority is given to them, the authority of the line room is inherited only by men. The following chart depicts the nature of land and housing ownership.

**Figure 6**: Nature of Women Land Ownership




Source: Survey Data, 2022

Only 5% of respondents own a house or property. The ownership had inherited by their husband. After the death of their husbands, these women had been taken ownership, and when their sons are grown, they had to delegate their lineage to the son. The ownership of the line rooms belong to men as the head of the home, and they keep authority over the women. Even these women cannot raise their voices, at home. According to some respondents, when they raised their voices on behalf of their rights in the home, the man who owns the house retaliated against them and used physical power to control them.

**Community and Society Participation and Representation**

Community participation means participation in common, community, or social organisations. In other words, community participation is the involvement of people in a community in projects or associations to solve their own problems. Women in many patriarchal societies have to live in subordination, and due to the subordination, their social participation is also subordinate. Women in minority groups face the same scenario when they engage with the community and participate in social activities. According to their responses, the following information could emerge regarding social and community participation: According to them, it could be identified that they are not much interested in the participation of community associations for various reasons. The following chart shows how they participate in the workers association in the estate. It could be depicted that although membership in the workers association is compulsory for workers of the estate, many women do not participate in the workers association, or at least they have no desire to join those associations. Among these respondents, 21% of women have membership in the community (workers) association. 72% of women respondents have no membership in the workers association.

**Figure 7**: Participation in Workers Association




Source: Survey Data, 2022

Though there are no community organisations on the estate, there are worker organisations. According to their statements, it can be shown how the situation can be faced with difficulties without the participation of workers organisations.

Collective representation is very important when the particular group is a minority community or marginalized group. Though it is very important, collective representation is very low among these women. It has been discouraged by the estate authority. If these people are collectively represented, it might be an issue for authority when they are going to win their rights in the working field and also in the domestic field. Due to this reason, they had to become passive communities in both the public and domestic domains.

Although the women participate in the workers association of the estate, they are unable to get leadership even at the grass-roots level. The plantation social structure is completely patriarchal. Lack of inclusion of women in decision-making is a big challenge in the estate sector. This situation has paved the way for women to become part of this voiceless community.

**Figure 8**: Status of Having Positions in Workers Organization or Community Organizations




Source: Constructed by Researcher, 2022

The table has shown that these women have a considerable position in the organization. In fact, they have no positions in the associations. The answer of "no" was no from everybody. It means even one woman has no considerable position. When the researcher asked about participation in the decision-making process in the association, they said that the majority of Sinhala people make the decisions, and they are supposed to accept those decisions.

> *"We don't participate in community organisations." There are no community organisations among us. But it is compulsory to participate in the workers organisation. Once a month, it is conducted".*

Though there are no community organisations on the estate, there are worker organisations. According to their statements, it can be shown how vulnerable situations can be without the participation of workers organisations.

> *"Without participation from the organization, we can't go or work the next day. Though we participated continuously, we didn't get any benefit from it".*

Participation in decision-making is very important to overcome vulnerable conditions. In the majority and minority contexts, the majority community plays a powerful role in the common ground. This condition is the same for these women. Sinhala and Tamil workers work together on the estate. And also, the workers association also gathered with those two communities. According to their statements, we can identify the nature of their positions within the workers organization.

> *"They forced us to participate in that meeting and discuss some difficulties, but we never solved those problems and couldn't find answers for those difficulties. Without that association, we would not have participated in or engaged with other associations. Sinhala workers are leaders of these associations; they only hope for our participation"*.

**Decision Making**

Decision-making and Power Relations within the Family

Participation in decision-making is very important to overcome vulnerable conditions and gather voices. Being an active member in society or in-house makes that particular member a strong member and well aware of those decisions. In the minority context, the majority community plays a powerful role in the common ground, and the minority community has to follow and adhere to their decisions. This condition is the same for these women. Sinhala and Tamil workers work together on the estate. And also, the workers association also gathered with those two communities. According to their statements, there are no opportunities to get a position in the association of women or workers. According to the following statement, it can be understood how this condition prevails in this estate.

> "They forced us to participate in that meeting and discuss some difficulties, but we never solved those problems and couldn't find answers for those difficulties. Without

> that association, we would not have participated in other associations. Sinhala workers are leaders of these associations; “they expect our participation only”.

The constitution has set the minimum legal age of marriage in Sri Lanka at 18 years. Sexual relations with a girl under 18 years of age, known as ‘defilement’, are illegal and punishable by law, whether or not the sexual union was consensual. Nevertheless, despite national legislation that would seem to protect girls and women from structural gender-based violence, sexual violence occurs at an alarming rate in Sri Lanka. In fact, decisions regarding their lives cannot be taken by these women. Many of the respondents revealed that they were unable to make decisions regarding life events such as marriage and the partner they selected to marry. The following statement has revealed the real scenario for them regarding decision-making in their private spheres.

> “My husband was drunker. And he was also a gambler. He used to spend every cent on alcohol and gambling. I had to face many difficulties to raise my children. My husband always disturbed me and hit me. We got married when I was 14 years old. Now I realise that it is a very small time period in our lives. Many girls get married when they are in their teens. Though it is prohibited, they do it secretly”.

In The Woman in the Body (1989), Emily Martin documented the alienation that many women experience when confronted with their own bodies. Menstruation is seen as something that happens to women and not as something that is a part of them. The feeling of not being in control of the body was a traumatic experience for some women. The radical feminist theories have a good argument against the marginalization and suppression of women by male-dominated society and cultural norms. They thought that women were suppressed by a male-dominated culture. These women also have to depend on a male-dominated culture.

Widowers have restrictions on going to Kovil, and widows don’t have any restrictions on it. And they also can’t wear ornaments after the death of the husband. But they should wear "thali" to symbolize whether she has gotten married.

Marriage is a personal phenomenon. For several centuries, the marriage of a woman has been decided by her parents or an outsider in her life. In the estate sector, this condition has become common among many women. If a woman gets married according to her opinion,

she has to face many difficulties. If not, she leaves home, giving up every relationship with family members. Sometimes her husband, who is found out by her parents, is a strange person for her. When they do not understand each other properly, family problems will arise.

> "That was a proposed marriage. When they proposed me, I opposed it. But my parents forced me to get married. Until I got married to him, I hadn't seen him. He was 14 years older than me".

Normally, women depend on men in the South Asian region. When they are in childhood, they depend on their father. When they are growing up, they become lovers, and at that time, they depend on their male partner. After getting married, they have to depend on their husbands, and when they are getting old, women depend on their elder son or sons. In this way, women depend on the superiority of men in their lives. Male dominance is crucial in Tamil culture. Many women in this field have been alienated from their daily activities and from what they had. Because of this alienation, they have been unable to control their money and what they earn. Due to this, they are domesticated and become voiceless.

> "He controlled and used money at home and even money that I earned; when I wanted money, I had to request it from him. Sometimes he hits me at that time. Although I think that I don't give money that I earn, he took money forcefully in the evening".

Every person has a right to education. It has been certified by the Universal Declaration of Human Rights of the United Nations. Though it is a universal right, the rights of women have been violated by outsiders. The right to education for girls is controlled and decided by their father or brothers. These two people have decided whether she wants to get an education or not. According to interview number 4, she has explained her experience with regard to her education. Many girls have sacrificed their desire for an education in order to support their families and their income. Whether it is liked or disliked, she stopped her education on the wellbeing of the family. Finally, she had to have obeyed these decisions.

> "Though I had a desire to go to school, my father said that there was no need to go to school, and when you are in 8 or 9 years, you can go to earn money".

The working environment of these women and their working conditions are also decided by men or estate authorities. They have to obey the decisions they make. Though there is freedom to get working decisions for people outside the estate, these women have been unable to get working decisions. Although they face financial and other problems when they are working on the estate, they have to adapt to and survive this condition. Interview number 02 explains this in the following way:

> "When we worked on the estate, we couldn't work anywhere outside of the estate. We had to survive our lives using that small amount of money".

**Figure 9**: Money Controlling Power in the Family




Source: Survey Data, 2022

The above chart shows the person who controls family finances. Father, husband, and brother control money in many families. According to the questionnaire survey, it could be identified that money is controlled by the husband in a large number of families in the study sample. As a percentage, it was 38% of the total respondent families. The second highest percentage was held by fathers, and the percentage was 36%. Income was controlled by the mother or a particular woman who held the financial power in only 28 families out of the total households, and as a percentage, it was 22%.

According to the above data, it has shown how family finance is controlled. It shows how financial power is distributed in a male-dominated society. The priority revolves around male members of the family. Accordingly, father and husband always lead the list, and then it goes to brother and son.

**Findings**

According to data, estate workers face prejudice in accessing assets and resources and are more likely to be involved in unpaid family-related tasks or low-paying work. They continue to rank near the bottom of every economic, social, and political indicator, from income, education, and health to political involvement. Domestication of women in the estate sector was discovered to be committed for a variety of reasons, including poverty, a lack of skills and competence to represent them and continue proper livestock, poor decision-making, and a lack of representation in society or the community. It was discovered that poverty prevailed in this study for their upbringing, family, age of marriage, education and schooling, and age of employment. These factors have had a significant impact on household mobility.

Issues about a family member's illness were substantially more important at the household level than at the community level. More precisely, the study discovered that women in the estate sector perform the majority of unpaid and low-wage housework, unskilled labour, and care labour in rural areas. Domestication was primarily facilitated by these women's lack of property and house ownership rights, as well as access to health care and education. Raising voices is critical for social and communal representation. When a group is a minority community or a marginalized group, collective representation is critical. Collective representation will help to raise voices, and if they do not have collective representation, they will remain voiceless.

Despite the fact that it is critical, these women have no opportunity to express their individuality in public. Furthermore, women in the estate sector continue to be underrepresented in decision-making in all domains, both at home and in the public realm. For some women, the struggle to raise their voices began at home. In other cases, women were fairly direct about their feelings about becoming involved in social and community associations and societal initiatives.

The cultural devaluation of females follows, with males having greater status, power, and independence than females. Women have accepted their inherent inadequacy as well as the low value placed on them. Gender was more prominent in female domestication and their exclusion from voices.

Marital status was supposed to be more prominent in the context of women's domestication and voiceless condition. Despite progress, failure to marry or failure in marriage is a total failure for many women, and this circumstance has opened the path to being domestic and mute. Parental status is another important motivation for being domestic, and motherhood allows depressed women to speak out against unfair family or public-sector conditions. Children are the mother's special responsibility in this community.

In comparison to men, women are not socially protected in their daily activities. In any case, the woman has engaged in several activities that may have outweighed her personal interests, yet the guy is the one who obtains statutory social support. The lack of social protection for daily activities also contributes to these women's domestication.

The plantation structure, as well as the limits imposed by the industry as a whole, all have a direct impact on the domestication of women, and poverty has become a critical factor for exclusion from voices.

The customary authority of male dominancy and the cult of domesticity of estate sector women are primarily responsible for the domestication of these women. Poverty and a lack of skills and aptitude, as well as a lack of decision-making power, have caused these women to be excluded from the public and private spheres, as well as from communal and social representation. Meanwhile, discriminatory practices towards women, such as inheritance laws that give land ownership primarily to men or the prioritization of boys over girls in education, may also contribute to women's lower status, which is influenced by domestication. Women in the estate sector are seen as a voiceless pillar of the Sri Lankan economy.

**Conclusion**

The lack of adequate social protection for women in the estate sector had made them vulnerable. Their frailty had been restricted their creative output to the domestic sphere. The community in the estate sector was consistently associated women's roles with those who are in the home. All the activities that are considered as work and performed by the women are connoted as part of the domestic role. In certain situations, women may undertake public activities, but this activity is still perceived as a domestic role. They are still waiting to speak out against domestication because of their domestication. The women in the estate sector understand and accept domestication as an obligation without any

rejection because it is fundamentally established based on norms and culture. Later by the administrative structure.

**Reference**


Adger, W.N., Winkels, A., (2006). Vulnerability, poverty, and sustaining well-being. In: Atkinson, G., Dietz, S., Neumayer, E. (Eds.), *Handbook of Sustainable Development.* Elgar, Cheltenham.

Biyanwila, J. (2007). *Ethnicity and women worker struggles in the Sri Lankan tea plantations. Annual Conference on Feminist Economics.* Bangkok, Thailand.

Blood, R., & Wolfe, D. (1960). Husband and Wives: T*he Dynamics of Married Living.* New York: Macmillan.

Brants C (1998). The fine art of regulated tolerance: Prostitution in Amsterdam. *Journal of Law and Society.*

Brock-Uten, B. (1989). *Feminist perspectives on Peace and Peace Education.* New York: Pergamum Press.

Broussard, A. & Joseph, A. L. (Eds.). (2009). *Family Poverty in Diverse Contexts.* New York / London: Routledge

Brumer, A. (2008). Gender Relations in Family-Farm Agriculture and Rural-Urban Migration in Brazil. *Latin American Perspectives,* 35(163), 11-28.

Centre for Poverty Analysis. (2005). *Moving Out of Poverty in the Estate Sector in Sri Lanka.* Colombo: CEPA.

Davis, Y (1997). Citizenship: Pushing the Boundaries, *Feminist Review*, pp. 4-27 (24 pages) Sage Publications.

Department of Census and Statistics (2002). *Bulletin of Labour Force Statistics of Northern and Eastern Provinces – 2002. Colombo,* Sri Lanka: Department of Census and Statistics.

Department of Census and Statistics (2002). *Sri Lanka Demographic and Health Survey 2000 (DHS 2000)*. Colombo: Department of Census and Statistics in collaboration with Ministry of Health Nutrition and Welfare

Dominelli, L. (2002). *Feminist Theory and Practice*. Basingstoke; Palgrave Macmillan.

Emily Martin (1989) The Woman in the Body: A Cultural Analysis of Reproduction., From Research Gate

Kanapathypillai, A.P. (2011). *The epic of Tea: Politics in the Plantation of Sri Lanka*. Colombo: Social Scientists' Association

Khotidjah, & Madkur, A. (2018). Domestication of Salafi Women: Social Construction of Salafi Women in Metro City, Lampung. *Kafa'ah Journal,* 8(2), 197-212

Kurian, R. (1998). Tamil Women on Sri Lankan Tea Plantations: Labour Control and Patriarchy. In S. Jain, & R. Reddock, *Women Plantation Workers.* Oxford and New York: Berg.

Kurian, R. (1998). Tamil Women on Sri Lankan Tea Plantations: Labour Control and Patriarchy. In S. Jain, & R. Reddock, *Women Plantation Workers.* Oxford and New York: Berg.

Philips, A. (2003). Rethinking Culture and Development: Marriage and Gender among the Tea Plantation Workers in Sri Lanka, *Online Journal on Gender and Development,* Rutledge retrieved from https://www.tandfonline.com/doi/abs/10.1080/741954313.

Philips, A. (2005). The kinship, marriage and gender experiences of Tamil women in Sri Lanka's tea plantations. *Contributions to Indian sociology*, *39*(1), 107-142.

Pudjiwati, S. (1983). *Women in Food, Animal and Plant Production in Indonesian Rural Development.* Bogor: Sajogjo Library Archives: (Expert Consultation on Women in Food Production, 7 – 14 October 1983, Rome, Italy, Conducted By FAO).

Ramesh, R., Rasnayake, S., & Kamalrathne, T. (2013). Women's Rights in Sri Lanka: An inquiry into the Rights of Plantation Women, *International Journal of Arts and Commerce,* 2(7), 11-24.

Ritzer, G (2000). Sociological Theory (8th ed). e McGraw-Hill Companies.

Tedesa, Y., Mengistu, U., Kesari, P., Mohammed, K., Kebede, K., & Abegaz, S. (2015). Socioeconomic Profile and Gender Characteristics in Relation to Camel Management Practices in the Pastoral Communities of Ethiopia. *Journal of Economics and Sustainable Development,* 6(1).

United Nations (2005). Review of the implementation of the Beijing Platform for Action and the outcome documents of the special session of the General Assembly entitled "Women 2000: gender equality, development and peace for the twenty-first century." *Report of the Secretary-General.* E/CN.6/2005/2, para. 102.

United Nations Development Programme (2005), "Dollar a day: How much does it say." In *Focus*, September 2005, International Poverty Centre. Available at: http://www.undp.org/povertycentre/newsletters/infocus4sep04eng.pdf.

Women's Labor force Participation in Sri Lanka: An Inquiry into the Factors Influencing Women's Participation in the Labor Market, *International Journal of Social Science and Humanity,* Vol. 7, No. 3, March 2017

World Bank, 2007, *Malnutrition in Sri Lanka: Scale, Scope, Causes, and Potential Response*, Human Development Network, Report No. 40906-LK

ආඛ්‍යාන *narrations*
**Volume 08 | Issue 01 | January-June 2023 | Article 06**
**ISSN 2478-0642**

On-line Refereed Biannual Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka
Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# නාග සංකල්පය චිත්‍රණය විෂයෙහි කලාත්මක ඇගයීම් හා දෘශ්‍යමය ආඛ්‍යාන: වසම්මලේ, ගිරා පොකුණු හෙල හා කුඩුම්බිගල යන ස්ථානවල බිතු සිතුවම් ඇසුරෙනි

**අයි. එම්. ටී. ඉලංගසිංහ,** චිත්‍ර කලා අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,
sathsarailangasinghe@gmail.com

**සාරසංක්ෂේපය**

චිත්‍ර ශිල්පියා සිතුවම් පින්තාරු කිරීමේ දී බිතු සිතුවම්වල ප්‍රස්තුතයනට අදාළව දෘශ්‍යමය සාධක (චරිත, ද්‍රව්‍ය, පරිසරය) රාශියක් සංඥාවන් ලෙස භාවිත කර ඇත. නාග සංකල්පය චිත්‍රණය කිරීම විෂයෙහි කලාත්මක ඇගයීම් හා දෘශ්‍යමය ආඛ්‍යාන පිළිබඳව හඳුනාගැනීම පර්යේෂණයේ අරමුණ විය. “නාග සංකල්පය චිත්‍රණය කිරීමේ දී  කලාත්මක ශක්‍යතාවන් හා දෘශ්‍යමය ආඛ්‍යාන විශද කෙරෙන අංගයන් මොනවාද ? ”යන්න පර්යේෂණයේ ගැටලුව ය. ස්ථානීය නිරීක්ෂණ මගින් ලබාගත් බිතු සිතුවම් ඡායාරූප, දළ සටහන් ,තොරතුරු ආදී දත්ත, බිතු සිතුවම් පිළිබඳ ප්‍රකාශිත ග්‍රන්ථ, ලිපි ලේඛනවල විස්තෘත දත්ත හා තොරතුරු, විධිමත් ක්‍රමයකට ගොනු කෙරිණි. ඒවා නිරීක්ෂණයෙන් හා පරිකල්පනයෙන් දෘශ්‍යමය රූ සංඥා බිතු සිතුවම්වල ඇති සංකේත, රූපක, තේමා ආදියෙහි ඓතිහාසික පැවැත්ම, ඒවාගේ සංස්කෘතික නිරූපණ විලාශයන් කාලය හා අවකාශය හරහා ඒවා විචල්‍යයන්ට භාජනය වූ ආකාරය අධ්‍යයනය කරමින් බිතු සිතුවම් නිර්මාණ සතු ශිල්පීය ශඛ්‍යතා හා සංස්කෘතික අනන්‍යතාවන් පිළිබඳව කථන ගෙතීමේ දී රූපාර්ථවේදය (Iconography) පර්යේෂණයේ ක්‍රමවේදය ලෙස භාවිත කෙරිණි. බිතු සිතුවමක් මත සංඛේත, රූපක, තේමා හා ප්‍රස්තුත, නිර්මාණ විලාශය, මාධ්‍යමය විචල්‍යතා (වර්ණ රේඛා හැඩතල), දෘශ්‍යරූප ස්ථානගත කිරීම, ශිල්පීය ශඛ්‍යතාවය, කේවල චිත්‍ර ශිල්පීන් හා ගුරුකුලවල දෘශ්‍යමය ශිල්පීය න්‍යායන්ත විශ්ලේෂණය කිරීමේ ප්‍රවේශයක් ලෙස රූපාර්ථවේදී ක්‍රමවේදය භාවිත විය. ප්‍රමුඛ ලෙස බිතු සිතුවම්හි ප්‍රස්තුත පිළිබඳ කථන ගෙතීම, ඒවාගෙන් නිරූපිත දෘශ්‍ය රූපයන්හි නිර්මාණ ශඛ්‍යතාවන් හඳුනාගැනීම ආදී දෘශ්‍යමය විශ්ලේෂණයක් සඳහා රූපාර්ථවේදී ක්‍රමය භාවිත විය. වසම්මලේ, ගිරා පොකුණු හෙල හා කුඩුම්බිගල යන බිතු සිතුවම් ස්ථානවල නාග රුව චිත්‍රණය කිරීමේදී, පෙන ගොබ රාශියක් යොදාගැනීම, ස්වාභාවිකත්වය නිර්මාණශීලීව යොදාගත් ආකාරය, නිදහස් රේඛාව, ඝනත්වය ගොඩනැගීම ආදිය චිත්‍ර ශිල්පියා විසින් යොදාගත් දෘශ්‍යමය ආඛ්‍යානයන් ලෙස හඳුනාගත හැකි ය. ඒවා දෘශ්‍යමය විශ්ලේෂණයකට ලක්කිරීමේ දී චිත්‍ර ශිල්පියා සතු නිර්මාණ ශක්‍යතාවන් විශද කෙරෙන බව ද නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** *බිතු සිතුවම්, නාග රුව, දෘශ්‍යමය සංඥාර්ථ, කලාත්මක ඇගයීම්, දෘශ්‍යමය ආඛ්‍යාන*

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ බිතු සිතුවම් යන ගණයට ගැනෙන නිර්මාණ ශේෂ බොහෝ ස්ථානවලින් හමුවේ. මේවා බහුතරය සඳහා පදනම් වී ඇත්තේ බෞද්ධ ප්‍රස්තුතයන් ය. බෞද්ධ ධර්මයේ ආදි කර්තෘවරයා ක්‍රි.පූ. 486-473 කාලයේ දිවිගෙවූ සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේ ය (බෂාම්, 1995). බුදුන් වහන්සේ ස්වකීය ධර්මය ග්‍රන්ථාරූඪ නොකළ බැවින් බෞද්ධ දර්ශනයට අදාළ මූලික කරුණු ග්‍රන්ථාරූඪ කෙරෙනුයේ බුද්ධ පරිනිර්වාණයෙන් බොහෝ කලකට පසුව පාලි භාෂාවෙනි (හිරියන්න, 2014 සහ බෂාම්, 1995). මේවා මූලික ලෙස ව්‍යාඛ්‍යාන සූත්‍ර හෙවත් බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛ ප්‍රකාශ, විනය හෙවත් ශ්‍රාවකයින්ගේ ශික්ෂාව සඳහා පැනවූ ප්‍රඥප්ති, අභිධර්ම හෙවත් දාර්ශනික සාකච්ඡා ලෙස වෙන් කෙරේ. බුදුදහමේ ප්‍රමුඛතාවය ලැබී ඇත්තේ විචාර බුද්ධිය, බුද්ධිවාදී චින්තනය හා ප්‍රත්‍යක්ෂ ඥානයට ය.

මුල් බුදු සමය විස්තර කළ විශ්වයේ සත්‍ය පිළිබඳ නිරපේක්ෂ සනාතන ධර්මය බිතු සිතුවම් මගින් චිත්‍රණය කර ඉදිරිපත් කිරීමට නොහැකිය. මුල් බුදු සමයට අයත් දාර්ශනික සංකථන කාලානුරූපීව, සමාජානුරූපීව හා නිර්මාණාත්මකව යොදාගනිමින් බෞද්ධ සාහිත්‍ය හා බිතු සිතුවම් ලෙස භාවිත කර ඇත. කලාව මගින් තීව්‍ර කෙරෙන වින්දනය ආධ්‍යාත්මිකත්වය පරයා ලෞකිකත්වයට පරාරෝපණය කෙරෙයි. එබැවින් බිතු සිතුවම් යනු බෞද්ධ දර්ශනයේ ආනුභාවයෙන් ප්‍රභවය ලද, බෞද්ධාගමෙන් සුපෝෂිත සමාජානුරූපීව විචල්‍යවූ රසාස්වාදනීය නිර්මාණ කාර්යයකි.

බිතු සිතුවමක ස්වභාවය ද්‍රව්‍යාත්මක අංශයෙන් සලකා බැලූ විට; ලෙනක හෝ ගුහාවක පාෂාණ පෘෂ්ඨයක, බදාම ස්තරයක, ගඩොල් බිත්තියක, ලී පෘෂ්ඨයක, ගොඩනැගිල්ලක හෝ සීලිමක් සේ යොදා ගැනෙන වරිච්චි බැම්මක් වැනි ආධාරයක සැකසූ යෝග්‍ය පදනමක නිමකළ නිර්මාණ කාර්යයක් බිතු සිතුවම් ලෙස හඳුනා ගත හැකි ය (සිල්වා, 1990). මෙම බිතු සිතුවම් ගල්, ලෙන්, ගුහා, පිළිම ගෙවල්, ධාතු මන්දිර, උද්‍යාන හා පොකුණු ආදී ස්ථාන වල ශේෂ වී ඇත.

ශ්‍රී ලාංකේය බිතු සිතුවම් කලාව ස්ථාපිතව ඇත්තේ මහින්දාගමනයෙන් ලද ආගමික ශික්ෂණය ද සමගිනි. මුල් කාලීන විදර්ශනාධූර දැරූ භික්ෂූන් වහන්සේලා භාවනා කටයුතු සිදු කළ ගල් ලෙන්වල නොයෙක් ශ්‍රද්ධාවත් ධනවත්තු, රජවරු එම ලෙන්, කටාරම් කොටා ශිලාලේඛන පිහිටුවා ලෙන් පෘෂ්ඨ මත බදාම ස්තරයක් අතුරා මටසිලිටු කර ඒ මත නොයෙක් මල්කම් හා ලියකමින් හෙබි චිත්‍රකර්මයන් කරවා සඟසතු කොට පූජා කළහ. දේවානම්පියතිස්ස රජ (ක්‍රි.පු. 250 -210) සමයේද' මෙම කටාරම් ලෙන් සංස්කෘතිය වඩාත් ව්‍යාප්තව ඇත (සන්නස්ගල, 1994).

වර්තමානයේ මෙම ලෙන්වල බිතු සිතුවම් ශේෂ හඳුනාගත හැකි ය. මෙම බිතු සිතුවම් අඳින ලද බදාම ස්තරය; දහයියා සමග ඉරූ ශාඛ කෙඳි, ශාඛ මැලියම්, වියලීමේ තෙල් වර්ගයක් මිශ්‍ර කිරීමෙන් සාදාගත් මැටි තලය මත ස්වාභාවික හා දේශීය අමුද්‍රව්‍ය වලින් සකසාගත් බදාම ස්තරයක් අතුරා මටසිලිටු කර ඒ මත ඉතා තුනී හුණු පිළියමක් අතුරා සකස් කළ තලයක් බව රාජා ද සිල්වා පෙන්වා දෙයි (සිල්වා, 1990).

අනුරාධපුර හා පොළොන්නරු අවධිවල බිතු සිතුවම් ස්ථාන අතර අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් මිහින්තලය ආශ්‍රිතව පිහිටි වසම්මලේ, අම්පාර දිස්ත්‍රික්කයට අයත් පානම ආශ්‍රිතව පිහිටි අප්‍රකට පුදබිමක් වූ ගිරා පොකුණු හෙල, අම්පාර දිස්ත්‍රික්කයටම අයත් පානම ආශ්‍රිතව පිහිටි කුඩුම්බිගල යන බිතු සිතුවම් ස්ථාන විශේෂත්වයක් ළඟාකර ගනී. මෙම ස්ථාන ත්‍රයෙහිම පෙන ගොබ රාශියකින් යුතු නාග රූව චිත්‍රණය කළ බිතු සිතුවම් ශේෂ හඳුනාගත හැකි ය.

## සාහිත්‍ය විමර්ශනය

### නාග සංකල්පය

#### *ප්‍රාග් ඓතිහාසික යුගයේ නාග වන්දනය*

ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම නාග වන්දනය ව්‍යාප්තව තිබී ඇත. ඓතිහාසික සාධක අනුව මධ්‍යධරණී මුහුදේ ක්‍රීට දූපත් ආශ්‍රිතව මෙම සංකල්පය බිහිව ඇත (ජානගේ, 2000). සිරියාවේ, කාම්බෝජයේ, මෙක්සිකෝවේ නාග වන්දනය තිබූ බවට සාධක හමුවේ. ග්‍රීසියේ ඉපැරණි ගොඩනැගිලිවල නාග රුව දැක්වූ කැටයම් හමුව තිබේ.

#### *නාග වන්දනය*

නාග වන්දනය වඩාත් ප්‍රකට ඉන්දියානු සංස්කෘතිය තුළ ය. නාගයා හින්දු සංස්කෘතිය නියෝජනය කෙරෙන අංගයකි. ඊශ්වරගේ ගෙල වටා නාගයකු සිටින අතර විෂ්ණුගේ පිටුපස සිටිනුයේ අනන්ත නම් සප්ත පෙණ ගොබ සහිත නාගරාජයා ය.

#### *නාග සංකේත*

නාග සංකේත සහිත කාසි, නාග දේවාල, නාග රුව සහිත ශෛලමය ස්තම්භ, කැටයම් මූර්ති ඉන්දියාවේ බොහෝ ප්‍රදේශවලින් හඳුනාගත හැකි ය.

### පර්යේෂණයේ අරමුණ

චිත්‍ර ශිල්පීන් බිතු සිතුවම් සඳහා ප්‍රස්තුත සපයාගෙන ඇත්තේ  බෞද්ධ සාහිත්‍යයෙනි. චිත්‍ර ශිල්පියා  සිතුවම් පින්තාරු කිරීමේදී බිතු සිතුවම්වල ප්‍රස්තුතයනට අදාළව දෘශ්‍යමය සාධක (චරිත, ද්‍රව්‍ය, පරිසරය) රාශියක් සංඥාවන් ලෙස භාවිත කර ඇත. මෙකී සංඥා ලෙස වසම්මලේ, අප්‍රකට පුදබිමක් වූ ගිරා පොකුණු හෙල හා කුඩුම්බිගල යන බිතු සිතුවම් ස්ථානවල නාග රුව චිත්‍රණය කිරීමේ දී ඒවාගේ කලාත්මක ඇගයීම් හා දෘශ්‍යමය ආඛ්‍යානයන් හඳුනාගැනීම පර්යේෂණයේ අරමුණ විය

### පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ නාග සංකල්පය චිත්‍රණය කිරීමේ දී කලාත්මක ශබ්‍යතාවන් හා දෘශ්‍යමය ආඛ්‍යාන විශද කෙරෙන අංගයන් මොනවාද යන්නයි. ඒ අනුව මෙම පර්යේෂණයේ උපන්‍යාසය ලෙස නාග රුව චිත්‍රණය කිරීමේ දී, ස්වාභාවිකත්වය නිර්මාණශීලීව යොදාගැනීම, නිදහස් රේඛා භාවිතය, ඝනත්වය ගොඩනැගීම ආදිය චිත්‍ර ශිල්පියා විසින් යොදාගත් දෘශ්‍යමය ආඛ්‍යානයන් විශද කෙරෙන අංග ලෙස හඳුනාගත හැකි ය යන්නයි. ස්ථානීය නිරීක්ෂණ මගින් සාකල්‍යයෙන්ම අත්විඳ ලබාගත් බිතු සිතුවම් ඡායාරූප, දල සටහන්, තොරතුරු  ආදී දත්ත, බිතු සිතුවම් පිළිබඳ ප්‍රකාශිත ග්‍රන්ථ, ලිපි ලේඛනවල විස්තෘත දත්ත හා තොරතුරු, විධිමත් ක්‍රමයකට ගොනු කෙරිණි. මෙම පර්යේෂණයේ විශ්ලේෂණ ක්‍රමවේදය ලෙස රූපාර්ථවේදය (Iconography) ලෙස භාවිත කෙරිණි. රූපාර්ථවේදී ක්‍රමවේදය අනුව, බිතු සිතුවමෙන් නිරූපිත ප්‍රමුඛ ප්‍රස්තුතය කුමක් වුවද එහි එක් දෘශ්‍ය රූපයක් (නාග රුව) කේවල ලෙස ගෙන එහිදී චිත්‍ර ශිල්පියා විශද කළ නිර්මාණ ශබ්‍යතාව පිළිබඳව දෘශ්‍යමය විශ්ලේෂණයක් සිදු කෙරිනි. ප්‍රමුඛ ලෙස බිතු සිතුවම්හි ප්‍රස්තුත පිළිබඳ කථන ගෙතීම, ඒවාගෙන් නිරූපිත දෘශ්‍ය රූපයන්හි නිර්මාණ ශබ්‍යතාවන් හඳුනාගැනීම ආදී දෘශ්‍යමය විශ්ලේෂණයක් සඳහා රූපාර්ථවේදී ක්‍රමය භාවිත විය.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

***නාග රූව පිළිබඳ බෞද්ධ සංකල්ප***

බෞද්ධ සංකල්පයන්හි ද නාග රුව පිළිබඳ විස්තර සඳහන් වේ. බිජු වලින් ප්‍රභවය ලබන පරිසරයේ නාගයා (Cobra) නම් සර්ප විශේෂය නාග සංකල්පයේදී ප්‍රමුඛ ලෙස සාකච්ඡාවට බඳුන් කෙරේ. නාගයාගේ හිස ආශ්‍රිතව පිහිටි හැකිලිය හැකි සහ විස්තාරණය කළ හැකි පෙණය නම් අංගය නිසා අනෙක් සර්පයන් ගෙන් වෙන්ව සුවිශේෂත්වයක් ලබාදෙයි.

***"නාග" යටතට ගැනෙන කාණ්ඩ***

සර්පයින් පමණක් නොව "නාග" යටතට ගැනෙන කාණ්ඩ ගණනාවක් වෙසෙන අතර චිත්‍ර ශිල්පීන් එම සියලුම කාණ්ඩ නාගයා නම් සර්පයාගේ හැඩය අනුව ගොඩනගා තිබේ. සාගරයේ හා ජලය ආශ්‍රිතව වෙසෙන විශාල නාගයින් පිළිබඳව බෞද්ධ සාහිත්‍යයේ විස්තර කෙරෙයි. තථාගතයන් වහන්සේට සත්වන සතියේ දී මුචලින්ද නාගරාජයා කළ සත්කාර පිළිබඳව මුල් බුදුසමය විස්තර කරයි. උන්වහන්සේ අජපාල නම් නුගරුක් මූලයෙහි සමවත් සුවයෙන් වැඩ වසන කල්හි සවන සතිය එළඹෙත්ම මුචලින්ද විල් තෙරට වැඩ එහි මිදෙල්ලගහක් මුල වැඩ හුන්හ. එකල්හි මුළු සක්වලටම වසනා අකල් වැස්සක් ආරම්භ වූයේ ය.

> ඒ වැස්ස පටන්ගත් කල්හි ඒ විල ඇසුරුකොට වෙසෙන මුචලින්ද නම් නාග රාජයා "තථාගතයන් වහන්සේ මාගේ භවනට පැමිණි හැටියේම වසින්නට පටන්ගත්තේ ය. මා විසින් උන්වහන්සේට විසීමට ගෙයක් පිළිවෙල කළයුතු'යි සිතා ,ඔහුට සත් රුවන් පායක් මවා දිය හැකි ඍද්ධ්‍යානුභාවයක් ඇතද එසේ කළ කල්හි එය මහත් ඵල නොවන්නේය. මහත්ඵල වීම සඳහා මා විසින්ම මාගේ කයින්ම උන්වහන්සේට සත්කාර කළ යුතුය 'යි මහා ශරීරයක් මවාගෙන බුදුරදුන් වට සත් වළල්ලක් දරණගසා උඩින් පෙණයෙන් වසාගත්තේය.ඔහුගේ දරණයේ ඇතුළ අනුරාධපුරයේ ලෝවාමහාපායේ යට මාලය පමණ ඉඩ ඇති විය. එහි තථාගතයන් වහන්සේට වැඩ සිටීම සඳහා සත් රුවන් පළගක් පනවන ලද්දේය. එහි මත රන් තරු වලින් මල් දම් වලින් සැරසූ වියනක් විය සතර කොනෙහි සුවඳ තෙලින් පහන් දල්වන ලද්දේ ය" (චන්දවිමල, 2015: 235-236).

රේරුකානේ චන්දවිමල හිමි දක්වන ආකාරයට පාසරාසී සූත්‍ර අටුවාවට අනුව මුචලින්ද යනු ආධ්‍යාත්මික ගුණාංග සහිත ඍද්ධි බල සහිත නාගයෙකි. අනවතප්ත විල හරහා පීනා යන නාග කන්‍යාවන් මාමල්පුරම් කැටයම් වල නිරූපණය කර ඇත (Bahl, 2012: 72). දීඝ නිකායේ මහා සමය සූත්‍රයේ භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර අසල මහා වනයෙහි රහතුන් වහන්සේලා 500 නමක් සමඟ වැඩ වසන කල එහි පැමිණි දෙවිබඹුන් අතර නාගයින් ද වූ බව සඳහන්ය.

> ....නාගයන්ට අධිපති උතුරු දිශාව පාලනය කරන විරූපාක්ෂ දෙව්රජ සහ පිරිස...විශාලා නුවර අහසෙහි වසන නාගයෝ, තච්ඡක නාගයා, කම්බල ආස්තර යන කුල දෙකේ නාගයෝ, ප්‍රයාගවාසී නාගයෝ සහ ඓරාවණ නාගරාජයා.." (දීඝ නිකාය, මහා සමය සූත්‍රය).

ඒ අනුව මහා සමය සූත්‍රයේ ද විස්තර කෙරෙනුයේ ඍද්ධි බල සහිත නාගයින් පිළිබඳව ය. තථාගතයන් වහන්සේ පෙරුම්දම් පුරන බෝධිසත්ව අවධියේ දී අතුල නම් නාරජව ඉපිද සුමන නම් බුදුන් සමයේ දී බුදුනට දානය හා සිවුරු ද පැමිණි අයට සංගීත භාණ්ඩ ද පූජා කළ බව විස්තර වෙයි. විපස්සී බුදුන් සමයේ දී ද අතුල නම් නා රජෙක් ව ඉපිද රන් ආසනයක් පිදූ බව බෞද්ධ ඉතිහාසයේ විස්තර කෙරෙයි (ස්ට්‍රෝං, 2008: 51-52). සිදුහත් බෝසතාණන් කිරිපිඬු අනුභව කොට පාත්‍රය සෝදා එය නේරංජනා ගඟෙහි පා කර හරින ලදුව එය නාගයින් විසින් අල්ලාගත් බවත් එය දුටු දෙවියනට අධිපති වූ ඉන්ද්‍ර දේවතාවා ගුරුලෙකුගේ වේශයෙන් බිමට බටුව නේරංජනා ගඟේ වසා සිටි බවත්, නාගයින් බියපත්ව පලාගිය බවත් විස්තර කෙරෙයි (ස්ට්‍රෝං, 2008:

126). ඒ අනුව නාගයාට ප්‍රබල අභියෝගයක් වූ අනෙකා හෙවත් එදිරිවාදියා වනුයේ ගුරුළා නම් පක්ෂියා බව විස්තර කෙරෙයි. බෝධිසත්වයින් වහන්සේ සුජාතාවගේ කිරිපිඬු දානය ලැබීමට ප්‍රථම ස්නානය කළ බවද ස්නානයෙන් පසු නාග කුමාරිකාවක විසින් බෝසතුනට වැඩ හිඳීමට තණ පලසක් සාදා දුන් බව ද ආහාර අනුභව කළ පසු ඇය එම තණ පලස දිව්‍ය ලෝකයට රැගෙනගිය බවද, ඉවත දමන ලද පාත්‍රය නාගයන් හා දෙවියන් අතර සටනකින් පසුව දිව්‍ය ලෝකයට රැගෙනගිය බවද විස්තර කෙරෙයි (ස්ට්‍රෝං, 2008, 128පි). වෙනත් කතා පුවතක සඳහන්ව ඇත්තේ බුදුන් වහන්සේ විසින් ගඟේ පා කර හරින ලද පාත්‍රය උඩුගං බලා ගොස් ගං පතුලේ තැන්පත් වූ බවත් බෝධිසත්වයන් බුදු වන බවට අනාවැකි කියන මෙකී ගඟෙහි කාලයක් මුළුල්ලේ ම "කාල"නම් නා රජු ගඟෙහි පතුලේ මෙම පාත්‍රයේ ගැටෙන හඬ ඇසීමෙන් එය ඊළඟ බුදුවරයා පහළවන කාලය ලෙස වටහාගන්නා බවද විස්තර කෙරෙයි (ස්ට්‍රෝං, 2008: 129). මහබෝසතාණෝ පැවිදිව අනුපිය අඹ වනයට වැද පැවිදි සුවයෙන් සතියක් එහි කල් ගෙවා ඉක්බිති එයින් තිස් යොදුන් දුර ඇති රජගහ නුවරට වැද පිළිවෙලින් ගෙන් ගෙට ගොස් පිඬු සිඟන්නට විණි. රජු සිරි යහනේ සිට මෙම මහා පුරුෂයා දැක ඔහු පසුපස ගොස් එතුමන් පිළිබඳව නොදන්නා බැවින් ණී....නයෙක් වී නම් ,පොළෝ කිමිද යෙයි..." ලෙස පවසමින් බෝසතුන් පිළිබඳ ව තොරතුරු විමසන ලෙස දැන් වූ බව ගුරුළුගෝමීන් විසින් විරචිත අමාවතුරෙහි දක්වා තිබේ (අමාවතුර, 2017: 14).

බුදුන් වහන්සේ උරුවෙල් කාශ්‍යපගේ කුටිය තුළ සිටින ඉතා භයානක නාගයකු දමනය කිරීම සඳහා තම අධ්‍යාත්මික බලය යොදාගනිමින් දුම් වලාවක් මවා ලූ බවද සඳහන් වේ (ස්ට්‍රෝං, 2008: 161). ධ්‍යාන බලයෙන් නියගය නිමා කොට වර්ෂාව ඇති කිරීමට සමත් බ්‍රාහ්මණයකු ඔහු කළ සේවයට නොසලකා හැරීම නිසා අධිෂ්ඨාන බලයෙන් අපලාලා නම් බියකරු නාගයකු බවට පත්වී ප්‍රදේශයේ භෝග විනාශ කළ බවත් බුදුන් වහන්සේ හා වජ්‍රපානී මෙම ප්‍රදේශයට පැමිණි විට අපලාලා හිම කැට හා කුණු වර්ෂාවක් හෙලූ බවත්, බුදුන් වහන්සේ භාවනාවකට සමවැදී ඒවා සුවඳවත් වළාවන් බවට පත් කළ බවත්, ඉන් ඉක්බිති නාගයා වැවක් පතුලේ ඇති සිය වාසස්ථානයට පසු බැස්ස බවත් සඳහන් වේ (ස්ට්‍රෝං, 2008, 213). මේ අනුව නාගයින් දැඩි රෞද්‍ර ස්වභාවයකින් යුතු බව විස්තර වේ. ඔවුන් නිතරම ස්වකීය වාස භූමි කරගෙන ඇත්තේ ජලය ආශ්‍රිත භූමි ප්‍රදේශ ය. මහමේරු පර්වතයේ යට කොටස සාගරය තුළ නිමග්නව ඇති බවත්, නාග ලොව පිහිටි යේ මහාමේරුවට යට බවත් එය සංකේතවත් කිරීම පිණිස තෝපා වැව දාගැබෙන් හමු වූ ධාතුගර්භයේ අභ්‍යන්තරයේ පහළින් පිහිටුවා තිබුණු කොටස්වලට බෙදූ ගල් බඳුනෙහි හැම කොටසකම නාග රූප තැන්පත් කර තිබූ බව සෙනරත් පරණවිතාන සඳහන් කරයි (පරණවිතාන, 2009: 19). තථාගතයන් වහන්සේ බුද්ධත්වයෙන් සත්වන සතිය ගෙවා බරණැස වැඩ වසන කල ඒරකපත්‍ර නම් නා රජකු

> යමෙක් මැය ගයන ගීතයට සරිලන ප්‍රති ගීතයක් ගෙනේ නම් ඔහුට මැය මහත් සම්පත් සමඟ පාවාදෙමි යි "සිය දියණියට ගාථාවක් උගන්වා ගංගා නදිය මත්තෙහි සිට ඇය නටවන්නට විය. ඉක්බිති උත්තර නම් මානවකයාගේ මාර්ගයෙන් ඔවුන් බුදුන් හමුවී උන්වහන්සේ සරණගිය කතා පුවතක් බෞද්ධ සාහිත්‍යයේ විස්තර කෙරෙයි" (ආනන්ද මෛත්‍රෙය, 2008: 97-99).

බුදුන් වහන්සේ නර්මදා නදී තීරයට වැඩමකර නර්මදා නා රජුගේ ඇරයුමින් නර්මදා නදී තීරයෙහි පාද ලාංඡනය තැබූ බව සඳහන් වේ(ආනන්ද මෛත්‍රෙය, 2008: 163). ඓතිහාසික පුරාණෝක්ති වලට අනුව පෘථිවි භාරය උසුලන දිසා ආශ්‍රිත නාගයෝ 8 දෙනෙක් වෙති. අනන්ත, තුලිත, වාසුකී, සංඛපාල, තක්ෂක, මහා පද්ම, පද්ම, කර් කෝටක, යන මෙම කණ්ඩායම් අතුරින් අනන්ත හා තුලිත යන කාණ්ඩ බ්‍රාහ්මණ කුලයේ බව සඳහන් කෙරෙයි. ගිනි පැහැයෙන් යුක්ත ඔවුන්ගේ පෙණ දහසකි. වාසුකී හා සංඛපාල යන කාණ්ඩය ක්ෂත්‍රීය කුලයට අයත්ය. ඔවුන් ශ්වේත වර්ණයෙන් යුක්ත පෙණ ගොබ 700 කින් හෙබි නාගයෝ ය. නීල වර්ණයෙන් හා පෙන ගොබ 700කින් හෙබි තක්ෂක හා මහා පද්ම නාග කාණ්ඩය වෛශ්‍ය කුලයට අයත් ය. පද්ම හා කර්ටෝටක නාගයෝ ශුද්‍ර වංශිකයෝ වෙති (මල්දෙණිය, 2016: 189). විශ්ව සම්භවය පිළිබඳව හින්දු ආගමේ ඇති ප්‍රසිද්ධ දේව කතාවකට අනුව විෂ්ණු දිව්‍ය රාජයා නිදා ගනුයේ ආදි කාලීන මහා සාගරයේ දහසක් හිස් ඇති "ශේෂ"නාග

රාජයා මතය (බෂාම්, 1995: 384). විෂ්ණුගේ දස අවතාර වල එන දෙවන අවතාරය වන කූර්ම හෙවත් ඉදිබුවා සමුද්‍රය පතුලට කිමිදි කල්හි වාසුකී නාග රාජයා මන්දිර ගිරවටා වෙළා සමුදුර කලතා දැමීය. මෙසේ කලතන ලද සමුදුරු පත්ලෙන් ලක්ෂ්මී, අමෘතය, වැනි මහාර්ඝ වස්තූන් හමු වූ බව හින්දු සාහිත්‍යයේ සඳහන් වේ (බෂාම්, 1995: 386-387). තමා පිළිබඳව මහත් ගර්වයෙන්, අභිමානයෙන් විසූ නන්දෝපනන්ද නම් මහත් සෘද්ධි බල සහිත නාග රාජයාගේ මිථ්‍යාදෘෂ්ටිය බුදුන් වහන්සේ විසින් බිඳලූ ආකාරය විද්‍යාචක්‍රවර්තීන් විසින් විරචිත බුත්සරණෙහි විස්තර කෙරේ. නන්දෝපනන්ද නාග රාජයා සතුව තිබූ සෘද්ධිමත් භාවය හා අධික මානය පිළිබඳ ව බුත්සරණ කතු විස්තර කරනුයේ මෙලෙසිනි.

> ...එකල්හි සුරාපාන උත්සවයට සැරසූ අවන්බිම්හි රුවන් පළඟෙක්හි හිඳැ නොයෙක් සිය දහස්ගණින් නා පිරිස් පිරිවරා දිව්‍ය භාජනයෙන් ගෙනැ අන්‍ය පාන පරික්ෂා කෙරෙමින් හුන් නන්දෝපනන්ද නම් නාග රජ තෙම වඩනා බුදුන් වහන්සේ දැකැ තමාගේ අධික වූ දර්පයෙන් සිත පහදවාගත නොහී"මේ මුඩු මහණහු අනවරතයෙන් මා හිසැ පස් ඕමින් දෙව්ලොවට යෙමින් එමින් සිටිනාහැ. මිනිස් කෙනෙකුගේ පිය පස්මා හිසැවම්වන බව් දැකැ, විෂ වාත මාත්‍රයකින් මුළු සක්වල දවා හළු මිටක් කොට පියන්නට සමර්ථ මාසෙ වූ එකක්හට හිඳීම සුදුසු දෙයක් නොවෙයි..........පළඟින් නැඟී සෘද්ධි වේශයෙන් අසුරක්ගසාලන ඇසිල්ලෙන් මහමෙර කරා ගොස්, මවාගත් දිව්‍යය ශරීරය හැර පියා මහනා වෙසක් මවා ගෙනැ, එක්ලක්ෂ අටසැටදහසක් යොදුන් මහමෙර සත් දරණපටෙකින් සිසාරා ගෙනැ, මෙරගල් මුදුනෙහි මහත් පෙණය තබා සියලු තව්තිසා දෙව්ලොව කිබිසිනි කළ පෙණයෙන් වසා හෙවැගත..... (බුත්සරණ, 2011: 84-85).

අධික ද්වේශයෙන් පෙලෙන්නවුන් නාගව උපදෙන ආකාරය මෙතේ බුදු සිරිත නම් වූ අනාගත වංශය විස්තර කරයි.

> පියංගමු වෙහෙර වසන්නා වූ තෙර දෙදෙනෙකුන් වහන්සේ ඔවුනොවුන් වහන්සේ කෙරෙහි දොම්නස් ඇතිවූ සේක.....ඉන් එක් කෙනෙකුන් වහන්සේ කාලක්‍රියාවට වැදහෙව අනිත් තෙරුන් වහන්සේ ක්ෂමා කරවනු කැමතිව එන්ට කියා යැවූ සේක. ඒ තෙරුන් වහන්සේ ක්ෂමා කරවීමට නොලැබුණු සේක. ක්ෂමා කරවන්නට උත්සාහ කළ තෙරුන් වහන්සේ මියගොස් දඹදිව එක් විලෙක නා රජව උපන් සේක..."
>
> ...තෙරුන් වහන්සේ හුනස්නෙන් නැගී යන්ට වන් කල්හි මාණවක වේශය හැර සර්ප වේශය මවාගෙන නාග රාජයා තෙරුන් වහන්සේගේ පිටි පත්ලට පෙණයෙන් ගසාලූයේ ය. එවිගස තෙරුන් වහන්සේ මිය ඕපපාතික නාග රාජයන්ව ඉපිද ක්‍රෝධයෙන් දවා දිලිහී උනුන් කා ගොස් විලදියෙහි උපන්හ. මෙසේ ද්වේෂ කිරීමෙන් නාගව උපදනාහ.... (මෙතේ බුදු සිරිත නම් වූ අනාගත වංශය, 2009: 93).

මෙම කරුණු අනුව නාගව උපදිනුයේ අනිකාට ද්වේශ, ක්‍රෝධ කිරීම නිසාම බව පැහැදිලි ය. වීර පුරුෂයෙකු හා නාගිනියකගේ සංවාසයෙන් තම රාජ වංශය ආරම්භ වූයේ යැයි ගර්වයෙන් පවසන රජ පෙළපත් ගණනාවක් ඉන්දියාවේ පවතින බවද, වර්තමානය දක්වා ද "නාග"නම් නොදියුණු ගෝත්‍රයක් ඇසෑමයේ දිවිගෙවන බව ඒ.එල්. බෂාම් පෙන්වා දෙයි (බෂාම්, 1995: 405). ලක්දිව විසූ නාග ලෙසින් හැඳින්වෙන ගෝත්‍රික මනුෂ්‍ය කොට්ඨාසයක් පිළිබඳව කරුණු අනාවරණය කෙරෙයි. මහාවංශය, දීපවංශය, සද්ධර්මාලංකාරය, සමන්තපාසාදිකාව ආදී මූලාශ්‍ර වල මේ පිළිබඳව යම් කරුණු සඳහන්ව ඇත. මහත් සෘද්ධි ඇති චූලෝදර මහෝදර නා රජුන් පිළිබඳ කතා පුවතක් මහාවංශය විස්තර කරයි.

> ...එකල්හි, මහත් සෘද්ධි ඇති ඒ මහෝදර නම් නාග තෙමේ මුහුදෙහි පන්සියයක් යොදුන් පමණ වූ නාග භවනෙහි රජු විය. ඔහුගේ නැඟණිය කන්වඩමන් නම් පව්වෙහි නා රජුගේ භාර්යාව විය. ඇයගේ පුත්‍රයා චූලෝදර නම් විය. චූලෝදරගේ මවගේ පියා උතුම් වූ මාණික්‍යාලංකෘත අසුන චූලෝදර ගේ

> මැණියන්ට දී කාලක්‍රියා කළේය. එම නිසා චූලෝදරගේ මවගේ සොහොයුරා වූ මහෝදර නා රජු හා චූලෝදර අතර යුද්ධයක් හටගත්තේය. පර්වතවාසී නාගයෝ මහත් සෘද්ධිමත් වූහ...." (මහාවංශය 1 පරි, 48-52 කව).

තථාගතයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙක්හි බුද්ධත්වයෙන් අටවන වර්ෂයෙහි මණිඅක්ඛිත නම් නා රජුගේ ඇරයුමින් තථාගතයන් වහන්සේ දෙවන වර ලක්දිවට වැඩම කළ බව මහාවංශය විස්තර කරයි (මහාවංශය 1 පරි, 71-73 කව). බුදුන් වහන්සේ ඔවුනට ධර්මය දේශනා කළ ආකාරය පිළිබඳව සලකා බැලීමේදී ඔවුන් යමක් මැනවින් අවබෝධ කරගත හැකි ජන කොටසක් බව පැහැදිලිය.

"පින්වත් නාගයිනි, අසවු. සසර සත්වයෝ බුදුවරයකු ලබා ද පිහිට කොට නොගන්නෝ අනාථව දුකෙහිගැලෙති.....නාගයිනි, දුර්ලභ වූ බුද්ධෝත්පාද කාලය බොහෝ කලෙකින් ලබාගෙන සිටින තෙපි පමා නො වවු....."(ආනන්දමෛත්‍රෙය, 2008: 164). මහා සෘද්ධි ඇති ආරවාල නම් භයංකර නාග රාජයා මජ්ඣන්තික නම් මහා ස්ථවිරයන් විසින් දමනය කරනු ලැබ තිසරණ පන්සිල්හි පිහිටු වීම පිළිබඳව මහාවංශය විස්තර කරයි.

> ...එකල්හි මහා සෘද්ධි ඇති ආරවාල නම් භයංකාර නාග රාජයා පාණ වැසි වස්වා කාශ්මීර ගන්ධාර දෙසට පැසුණු සස්‍යවර්ග සියල්ල මුහුදට හෙලයි. මජ්ඣන්තික නම් මහා ස්ථවිර තෙම වහා අහසින් එහි වැඩ රවාල විල්හි දියපිට සක්මන් ආදිය කළ සේක. නාගයෝ ඒ දැක රොස් වූවෝ රජ හට දැන්වූහ. වැලි කිපුණු ඒ නාරජ තෙමේ අනේක ප්‍රකාර භයංකාර ක්‍රියා කළේය. මහා වාතයෝ හමති. මේඝයගර්ජනා කෙරෙයි. එසේම වසිති. ඉන් දාසනීහු පුපුරති. ඒ ඒ දිගින් විදුලිගසති. වෘක්ෂයෝ ද පර්වතයන් ගේ කූටයෝද ඇද වැටෙති. විකෘත රූප ඇති නාගයෝද හැම අතින් භයගන්වති. නා රජ තෙමේම විෂ දුම් පිට කරයි. නොයෙක් පරිද්දෙන් ආක්‍රෝශ කෙරෙමින් දිලිසෙයි... (මහාවංශය 1 පරි, 914 කව).

සැළලිහිණි සංදේශය කාව්‍ය අර්ථ විස්තරයේදී ගිරිදර සුමනජෝති හිමි නාගයින් පිලිබඳව විස්තර කරයි.

> මහමෙර පතුලෙහි පිහිටා ඇතැයි සලකන දිව්‍යය නාගයන්ගේ වාස භූමි යයි. මොවුන්ට කැමති විටෙක නොයෙක් වෙස් මවා ගැනීමේ සෘද්ධියක් හා රජ මැති ඇමැති ආදීන්ගේ වශයෙන් පාලන බලයකුදු ඇති සම්පත්තියෙන් ආඪ්‍ය වූ ශිෂ්ට සම්පන්නව වෙසෙන හිසෙහි පෙණ මඩුල්ලක් ඇති මනුෂ්‍ය කොටසක් (සැළලිහිණි සංදේශය, 5 කව).

අරිසෙන් අහුබුදුවන්ට අනුව නාග යනු නැව්වලින් ගමන්ගත් නාවුකයන් ය (ඇන්තනී, 2006: 15-16). නාගයා ගෝත්‍ර හැඟවීමේ සංකේතයක් ලෙස හා වන්දනා මාන කළ සංකේතයක් බවට සාධක හමුවේ. ශිලා ලේඛන වල ද නාග යන පදය හමුවෙයි. සිරිනාග, මහානාග, බල්ලාට නාග ආදී රජ නාමයන්ද, නාගදීප, නයිනතිවු, නාඔටුන්න, නයිවිල, නයිගල ආදී ප්‍රදේශයන් ද මගින් ශ්‍රී ලංකාවේ නාගයින් විසූ බවත් ඔවුන්ගෙන් පැවත එන එකී නාම එම කරුණු සනාථ කරගත හැකි මූලාශ්‍ර ලෙස ද හඳුනාගත හැකි ය.

චිත්‍ර හා මූර්ති ශිල්පියා නාග රුව ගොඩනැගීමේ දී සාහිත්‍යමය ප්‍රස්තුතයන් පිළිබඳ අවධානය යොමු කරමින් යම් දාර්ශනික අදහසක් ජනිත කිරීමට අපේක්ෂා කර තිබේ. නාග සංකේත තුළ ගුප්ත අර්ථයක් මෙන් ම ගෞරවයක් ද ජනිත කෙරෙයි. නාගලොව හා නාග ස්වරූපය පිළිබඳව විස්තර කළ වර්ණනා හා පුරාණෝක්ති වල ආභාසය ලබාගත් චිත්‍ර ශිල්පියා පරිසරයේ හමුවන නාගයාගේ දෘශ්‍ය රුව ප්‍රති නිර්මාණය කරමින් නාග යන හැඩය ගොඩනගා තිබේ. මහා කාල නම් නාග රාජයාට පෙණ ගොබ සියයක් තිබූ බව සඳහන් වේ (ජානගේ, 2000 දෙසැම්බර්: 67). නාගයාගේ අනන්‍යතාවය පෙන්වන ප්‍රබලම අංගය වනුයේ පෙණ ගොබයයි. පෙණ රාශියක් පෙන්වීම මගින් නාග රාජයාගේ ප්‍රබලත්වය සංකේතවත් කර තිබේ. නාග හා නාගිනී රූ මනුෂ්‍යය ස්වරූපයෙන්

දක්වා ඇති අතර හඳුනාගැනීම පිණිස හිස්වැසුමට හෝ පිටුපසින් නාග පෙණය සහිත හැඩයක් නිර්මාණය කරයි. කලාකරුවා නාගයා සංකේතය, දාර්ශනික ආධ්‍යාත්මික ගුණාංගයක් තීව්‍ර කිරීම පිණිස භාවිත කරයි. නාග සංකේතය මගින් බහු අර්ථ සංජානනය කරන අවස්ථාවන්ද හමුවේ. කාලය දැක්වීම පිණිස නාග රුව භාවිත කරයි. නාග ලොව වසන මහාකාල නම් නාග රාජයාට දීර්ඝායුෂ හිමි බව සඳහන් වේ (ජානගේ, 2000 දෙසැම්බර්: 67). බුද්ධ කල්පයක් නා ලොව එක් දිනයක් බව සඳහන් වේ. නාග සංකේතය මගින් දීර්ඝායුෂ අපේක්ෂා කිරීම ද සිදු වේ. ජලය හා සෞභාග්‍යයද හැඟවීමේ සංකේත ලෙසද නාග රුව භාවිතා කර ඇත. ගංගා, දිය ඇලි, ජල පොකුණු ආදි ස්ථානවල නාග රුව සහිත සංකේතයක් භාවිතා කර ඇත. නාගයා ජලයට අධිපති වන අතර වර්ෂාව ඇති කිරීමේ ශක්තියක්ද නාගය සතු බව කියවේ. ඌරු සිටාණ වැව, පොවන්කුලම, මහන්කණ්ඩි වැව, හොරොව්වල ආදී ස්ථානගණනාවක පෙණ කිහිපයක් සහිත නාග රුව නිරූපණය කළ කැටයම් එලක හමුවේ. මහකණ්ඩිය වැව් සොරොව්වේ පෙණ හතක නාග රුවක් සහ දෙපස නාග මානවිකාවන් දෙදෙනෙකුද නිරූපිත ය. මේවායේ ජලය හා එමගින් ලබාගන්නා සමෘද්ධිය පිළිබඳව හැඟවීම සංකේත ලෙස හඳුනාගත හැකි ය. නාග පොකුණේ හා කළුදිය පොකුණේ දියෙන් මතු වන ආකාරයේ නාග රූ ගොඩනගා ඇත. පුන් කලසක් අත දරා සිටින මුරගලේ කැටයම් කර ඇති නාග රාජයා අනෝතත්ත විලෙහි වසන ජලයට අධිගෘහිත අනන්ත නම් නාග රාජයා බව ටී.ඩී.දේවේන්ද්‍රගේ අදහසය (ජානගේ, 2000 දෙසැම්බර්: 70). සෞඛ්‍යය සනීපාරක්ෂාව හා ආරක්ෂාව වෙනුවෙන් ද නොයෙක් රෝග වලින් මිදීම සඳහා ද නාග රුව සංකේතයක් ලෙස භාවිත කර ඇත. දරණය සහිත නාග රුවෙන් ශරීරයේ මුළු ශක්තියම ඒකරාශි වන බව ගුණපාල සේනාධීරගේ පවසයි (ජානගේ, 2000 දෙසැම්බර්: 70). ශ්‍රේෂ්ඨ පුද්ගලයින් නිරූපණය කිරීමේ සංකේතයක් ලෙස ද නාග රුව භාවිත කර ඇත. ගුරුළුගෝමී පඬිතුමන් විසින් විරචිත අමාවතුරෙහි බුදුන් වහන්සේ හා නාලාගිරි ඇතුන් වෙනුවෙන් "අද මහා නාගයන් දෙදෙනාගේ සංග්‍රාම වෙයි. "ලෙස හඳුන්වා ඇත(අමාවතුර, 2017: 163). පෙණ හතක් සහිත නාග රුව කැටයම් වල දී බුදුරුව සමඟ ද භාවිත කර ඇත.

**වසම්මලේ**

වසම්මලේ බිතු සිතුවම් ස්ථානය අප්‍රකට වූවකි. මිහින්තලය යාපනය පාරේ මිහින්තලය හංදියේ සිට සැතපුම් දෙකක් පමණ පසු කල විට රජරට විශ්ව විද්‍යාලය ආසන්නයෙන් වම්පසට වැටුණු මාර්ගයේ තේක්ක වත්ත මැදින් මද දුරක් ඇවි ද ගිය විට විශාල වසම්මලේ පර්වතය හමු වේ. වසම්මලේ ඉපැරණි පුදබිමකි. මෙම ස්ථානය ප්‍රදේශවාසීහු වසුප්මලේ ලෙස ද හඳුන්වති. රාජ්‍ය පාලන අවධියට අයත් නටබුන් ප්‍රදේශය පුරා විසිරී ඇත. පොකුණක් ආශ්‍රිත විවෘත ලෙනක විශාල ප්‍රමාණයේ බිතු සිතුවමක ශේෂ හඳුනා ගත හැකි ය. 2019.11.24 දින පර්යේෂක විසින් වසම්මලේ බිතු සිතුවම් ගවේෂණය කෙරිණි. කටාරම කෙටූ ලෙනෙහි කටාරමට පහළින් දිය පහළට වෑහීම වලකනු පිණිස බදාමයෙන් කළ කුඩා ගැටියකි. පාෂාණ පෘෂ්ඨය මත ඉතා තුනී හුණු පිරියමක් ආලේපකර ඒ මත බිතු සිතුවම් නිර්මාණය කර ඇත.

වසම්මලේ පණ්ඩුකාභය කුමරු සැඟවී සිටි ස්ථානයක් ලෙස ද, ක්‍රි.ව. 5 සියවසේ 1 වන කාශ්‍යප රජතුමා ද මෙහි සැඟවී සිටි බව ද, ස්ථානයේ පිහිටි පුරාවිද්‍යා දැන්වීම් පුවරුවේ දක්වා ඇත. රාජා ද සිල්වා මෙම ස්ථානය මොණරාගල ලෙස හඳුන්වා ඇති අතර මෙම ගල්පංතිය හඳුන්වා ඇත්තේ මොණරගල නමිනි (සිල්වා, 1990: 37). මෙම බිතු සිතුවම් පුරාවිද්‍යා දෙපාර්තමේනතුව විසින් සංරක්ෂණය කර 1968 දී ලේඛනගත කර ඇති බව ද එහිම සඳහන්ව ඇත.

**වසම්මලේ බිතු සිතුවම්**

වසම්මලේ බිතු සිතුවෙමෙහි පෙණ ගොබ රාශියක් සහිත නාග රුවක් නිරූපණය කර ඇත. සිතුවමේ කොටස් විනාශ වී ගිය ද වම්පස පෙණ තුනක් හා මැද පෙණයෙහි දාරය ශේෂ වී තිබේ. වක්‍රව නැවී ඇති කඳ කොටස නාගරාජ මුරගලෙහි කඳ ප්‍රදේශය දක්වා ඇති ආකාරයට සමානය. රේඛාව ,තිත, කඩ රේඛාව මගින් මූලික හැඩය ගොඩනගා ඇති අතර රඹ, රතු, ලා කහ, පලාවන් නිල ආදී වර්ණ හා වර්ණයේ ස්වභාවයන් මගින් මූලික

හැඩතල දක්වා  ඇත. වෘත්තය හා කෙටි රේඛාව තිත සියුම්ව හැඩතල වෙන්කිරීම සඳහා භාවිත කර ඇත. පිටුපස වලාකුළු වල නිල් පැහැයෙන් නාග රුවෙහි හැඩය හොඳින් මතුකර දක්වා තිබේ. නාග රුවෙහි වම් පස නුහුරු ඉරියව්වක් අනුව වාඩි වී සිටින ස්ත්‍රී රුවකි. ඇය දකුණට බර වී වමත ඉහළට ගෙන නිදහස්ව තබාගෙන ඇත. පියයුරු වල හැඩ රේඛාවෙන් මතු කොට දක්වා ඇත. උඩුකය නග්න වන අතර නැබ විවෘතව දක්වා ඇත. යටිකය ඇඳුම මදක් තද පැහැයක් පදාස ලෙස අතුරා ඒ මත ඝන රේඛාවෙන් මතු කරමින් මෝස්තරාත්මක ස්වභාවයක් මතු කර ඇත. මුහුණ හා හිස කොටස විනාශ වී ඇත. විස්තරයක් සඳහන් නොකළ ද මෙම කාන්තා රූපයෙහි රේඛාසටහනක්  ණීමොණරාගල ලෙන් ගෙයි චිත්‍රයක් ” ලෙස නම්කර ඇස්. පී. චාර්ල්ස් ඉදිරිපත් කර ඇත (චාර්ල්ස්, 2000: 34).

**රූපය 1:** සිතුවම් සහිත ලෙන, වසම්මලේ



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 2:** චිත්‍ර සටහන, වසම්මලේ, කඩදාසි මත වර්ණ



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 3**: නාග රුව, වසම්මලේ, බදාම මත සායම, 5 සියවස



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 4**: නාග රුව, වසම්මලේ, බදාම මත සායම, 5 සියවස



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 5:** ලලනා රූ, වසම්මලේ, බදාම මත සායම, 5 සියවස



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන, 2022

**කුඩුම්බිගල**

අම්පාර දිස්ත්‍රික්කයේ කුමන අභය භූමිය ආශ්‍රිතව කුඩුම්බිගල පිහිටා ඇත. පානම ගම්මානයේ සිට කුමන අභයභූමිය දක්වා දිවෙන මාර්ගයේ මද දුරක් ගමන් කර දකුණු පසට වැටුණු මාර්ගයේ බොහෝ දුරකින් කුඩුම්බිගල ආරණ්‍ය සේනාසනය වෙත ප්‍රවේශ විය හැකිය. පර්යේෂක විසින් 2009.06.03, 2016.07.26 දෙදින කුඩුම්බිගල ගවේෂණය කෙරිණි.

ඓතිහාසික පුදබිමක් වන කුඩුම්බිගල කටාරම් කොටා සෙල්ලිපි පිහිට වූ ලෙන් ගණනාවක් පිහිටා ඇත. නටබුන් චෛත්‍ය, මුරගල්, සඳකඩ පහන්, පාත්‍ර කැබලි හා පොකුණු ආදී, බොහෝ නටබුන් වලින් ගහන ප්‍රදේශයකි. වර්තමානයේ භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලා දිවි ගෙවන ආරණ්‍යයකි. කුඩුම්බිගල ආරණ්‍යයේ මද දුරකින් වන ගතව පිහිටි තැනිතලා ප්‍රදේශයෙන් ඔබ්බෙහි විශාල ගල්තලාව කෙළවර ස්වභාවිකව ඉදි වූ ලෙනකි. ලෙන පහළින් පර්වතයෙම සකස් වූ පොකුණකි. වර්තමානයේ මෙය සීත පොකුණ ලෙස නම්කර ඇත.

**රූපය 6:** සිතුවම් සහිත ලෙන, කුඩුම්බිගල



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 7**: බිතු සිතුවම් ශේෂ , කුඩුම්බිගල,



මුලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 8**: බිතු සිතුවම් ශේෂ, කුඩුම්බිගල, බදාම මත සායම, 5-7 සියවස



මුලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 9**: බිතු සිතුවම් ශේෂ, කුඩුම්බිගල,  කඩදාසි මත සායම, 5-7 සියවස



මුලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

කුඩුම්බිගල තපෝවනය අතීතයේ දී හඳුන්වා ඇත්තේ ඍරෝහණ චේතිය පබ්බතය" යන නාමයෙන් බව එල්ලාවල මේධානන්ද හිමි සඳහන් කරයි (මේධානන්ද, 2005: 9).

**කුඩුම්බිගල බිතු සිතුවම්**

නොයෙක් චිත්‍රමය සංකේත සහිත සෙල්ලිපි හා ගිරිලිපි පුදබිම ආශ්‍රිතව විසිරී ඇත. ස්භාවික ජලය පිරුණු සීත පොකුණෙහි, පොකුණ වසා සිටින ලෙන් පෘෂ්ඨය මතුපිට බිතු සිතුවම් ශේෂ හඳුනාගත හැකි ය. තද කහ පැහැය හා තද රත් පැහැයෙන් අඳින ලද සිතුවම් ශේෂ වර්තමානයේ විනාශයට පත්ව ඇත. මැකී ගිය සිතුවම් ශේෂ අතර ලා කහ පැහැය මත රේඛාව තිත භාවිත කරමින් ගොඩනගන ලද හැඩ හඳුනා ගත හැකි ය. එම තිත හා පැහැයේ ස්වභාවය භාවිතා කර ගොඩ නගන ලද වසම්මලේ හා ගිරා පොකුණු හෙල නාග රූ වලට වෙසෙසින්ම සමාන ය. එම ස්ථාන ද්වයෙහිම නාගරූ අසල පොකුණු පිහිටා ඇත. කුඩුම්බිගල තිබූ සිතුවම් පිළිබඳ එල්ලාවල මේධානන්ද හිමි විස්තර කර ඇත.

> මේවා බොහෝ සෙයින් විනාශ වී ඇතත් ඉතා අපහසුවෙන් එහි සටහන් සලකා ගැනීමට හැකි තත්වයක පවතී. මොණර පිල් කළඹක් සේ විහිදී ඇති මුල් චිත්‍රයේ නාග රූපයක්, ලියවැල්, නෙළුම් මල් හා කැකුළු චිත්‍රකර ඇත. කහ, රතු තැඹිලි පාට වර්ණකර ඇත. මෙහි ඇති පොකුණත්, චිත්‍රත් අතර කිසියම් භාවමය සම්බන්ධයක් ඇති බව කල්පනා කළ හැකි ය" (මේධානන්ද, 2005: 74).

නිමැවුම අතින් සලකා බලන විට සීගිරි චිත්‍ර වලට වඩා පැරණි බවත්, මෙයින් ශක්‍රයාගේ නන්දා පොක්ඛරණිය නිරූපණය කෙරෙන බවත් එල්ලාවල මේධානන්ද හිමිගේ අදහසයි (මේධානන්ද, 2005: 74). වර්තමානයේ සිතුවම් තිබූ බවට වූ සලකුණු පවා විනාශ වී ඇත.

**ගිරා පොකුණු හෙල**

ගිරා පොකුණු හෙල මෙම පර්යේෂණයේ දී අභිනවයෙන් අනාවරණය කෙරෙන බිතු සිතුවම් ස්ථානයකි. නැගෙනහිර පලාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පානම ආශ්‍රිත වෙදගම ගිරා පොකුණු හෙල පිහිටා ඇත. පොතුවිල් පානම ප්‍රධාන මාර්ගයෙන් පානම දක්වා පැමිණිය හැකි ය. පානම සිට කුමන අභය භූමිය දක්වා දිවෙන මාර්ගයේ දකුණට හැරී මද දුරකින් පානම වැව හමුවේ. එම මාර්ගයේ දීර්ඝ දුරකින් නැවත වම්පසට හැරී වනය තුළට ප්‍රවේශ වී, වනයේ බොහෝ දුරක් ගමන් ගත් පසු ගිරා පොකුණු හෙල හමුවේ. ගිරා පොකුණු හෙල හමුවීමට පෙර ගිරා පොකුණ තරණය කර පර්වතය වෙත ප්‍රවේශ විය යුතු ය. ගිරා පොකුණ වර්තමානයේ ජරාජීර්ණව තෘණ වර්ග වැවී තිබුණ ද පොකුණක් තිබූ බව හඳුනා ගත හැකි ය.

**රූපය 10**: මානව රුව, ගිරා පොකුණු හෙල, බදාම මත සායම, 5-7 සියවස(?)



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 11**: නාග රුව, ගිරා පොකුණු හෙල, බදාම මත සායම, 5-7 සියවස(?)



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 12**: බිතු සිතුවම්, ගිරා පොකුණු හෙල, බදාම මත සායම, 7-9 සියවස(?)



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 13**: බිතු සිතුවම් සහිත ලෙන, ගිරා පොකුණු හෙල, සියවස (?)



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 14**: නාග රුව, ගිරා පොකුණු හෙල, කඩදාසි මත සායම



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 15:** තිත් රටා, ගිරා පොකුණු හෙල, 5-සියවස(?)



මුලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

2011.05.21 දින ගිරා පොකුණු හෙල පර්යේෂකයා විසින් ගවේෂණය කෙරිණි. එක් පසෙකින් වෙදගම මාර්ගයත් ,තවත් පසෙකින් සැලව වැවත්, තවත් පසෙකින් ආකාස චෛත්‍යයත් පිහිටා ඇත. ආකාස චේතිය පිලිබඳ මුල්වරට සඳහන් වනුයේ කාවන්තිස්ස රජ සමයේදීය. ආකාස චේතිය සමීපයෙහි, චිත්තලපබ්බතයට නුදුරුව කොටපබ්බත විහාරය තිබූ බවත් එයම කොටගල, කොටපවු, කොටදොර, කෙළපවි යන නාමයන්ගෙන් හැඳින් වූ බව සී.ඩබ්ලිව්. නිකලස් පෙන්වා දෙයි (නිකලස්, 1979: 74). නාගලෙණ ද මේ සමීපයේ වූ අතර එහි නටබුන් තවම සොයා ගෙන නොමැති බව ද සඳහන් ය (නිකලස්, 1979: 74). කිත්තිගාම හෙවත් කැතිගම, අච්ඡගල්ල විහාරය ආදී විහාර පිහිටා ඇත්තේ ද ආකාස චේතිය සමීපයේ ය. කෙසේ වුවද මේ සමීපයේ වන විහාරාරාම බොහොමයක් ගොඩනගා ඇත්තේ ක්‍රි.පූ. 2 දී පමණ විසූ ගෝඨාභය හා කාවන්තිස්ස යන රජවරුන් විසිනි. එබැවින් ගිරා පොකුණු හෙල පිහිටි කටාරම් ලෙන්, සෙල්ලිපි, බිතු සිතුවම් ඇතුළු නටබුන් සියල්ල ක්‍රි.පූ. 2 වන සියවසට පමන අයත් බව සැලකිය හැකි ය.

**ගිරා පොකුණු හෙල බිතු සිතුවම්**

ගිරා පොකුණු හෙල ආශ්‍රිතව ශෛලමය කුළුණු, ලෙන්, සෙල්ලිපි හා ගිරිලිපි, කෙම්, චෛත්‍ය නටබුන් ආදිවාසී සෙල් චිත්‍ර ආදී බොහෝ නටබුන් විසිර පවතී. පර්වතය පාමුල පොළොව මට්ටමේ සිට ඉහලින් දර්ශනය වන විවෘත ලෙනක බිතු සිතුවම් පිහිටා ඇත. විශාල ගල්තලාවට මත තවත් පර්වතයක් පිහිටා ගොඩනැගුණු ස්වභාවික ලෙනෙහි කටාරම් කොටා සෙල්ලිපි පිහිටුවා ඇත. විවෘත දිගු ලෙනෙහි දකුණු පස බිතු සිතුවම් ශේෂ හඳුනාගත හැකි ය.

සමස්ත සිතුවමේ බොහෝ ප්‍රමාණයක් විනාශ වූව ද පෙණ ගොබ කිහිපයකින් යුත් විශාල නාගරාජයෙක් හා එයට දකුණු පසින් දර්ශනය වන මානව රුවක් පැහැදිලිව හඳුනාගත හැකි ය. පාෂාණ පෘෂ්ඨය මත සුමට කර අතුරන ලද බදාම ස්ථරය මත බිතු සිතුවම් ගොඩනගා ඇත. චිත්‍රය පුරාම ලා රතට හුරු කහ පැහැය පදාස ලෙස අතුරා ඒ මත තද පැහැයේ රේඛා ලෙස මූලික හැඩතල ගොඩ නගා ඇත. නාගයාගේ පෙණ හා සිලින්ඩරාකාර දිගැටි ශරීරය රේඛාවලින් සියුම්ව වෙන්කර දක්වා ඇත. රේඛාව කෙළවර රඹ පැහැයේ සායම මදක් අඳුරු කර මූලික හැඩතල ගොඩ නගා ඇත. සමස්ත නාග ශරීරය පුරාම ඉතා සංයමයෙන් කළ තිත රටාවක් ලෙස භාවිත

කර ඇත. දකුණු පස සිටින මානව රුව ස්ත්‍රී රුවක් ද පිරිමි රුවක් ද යන්න පැහැදිලි නැත. වාඩි වී සිටින ඉරියව්ව පූජක රුවක් ලෙස හඳුනා ගත හැකි ය. එහෙත් විවෘත උඩුකය නග්න ශරීරයෙහි පියයුරු ලෙස සැලකිය හැකි වටකුරු රේඛා සමූහයකි. දකුණතෙහි අත දැරූ යම් උපකරණයකි. ආභරණ ආයිත්තම් ඉතා සියුම්ව ගොඩ නගා ඇත. ඉතා රිද්මයානුකූල රේඛා සටහන් පරිණත චිත්‍ර ශිල්පියකුගේ නිර්මාණ ශක්‍යතාවය තීව්‍ර කරයි. වාඩි වී පාද නවා සිටින ඉරියව්ව පුල්ලිගොඩ දේව රූ වලට බෙහෙවින්ම සමානත්වයක් දරයි. දකුණත සමීපයේ යම් විවෘත භාජනයක වැනි හැඩයක් හඳුනාගත හැකි ය. වම් පස ශේෂ වී ඇති බිතු සිතුවම් අතර ලා කහට හුරු රත් පැහැය මත තද පැහැයෙන් කළ තිත සහිත සිතුවම් කොටස් හමුවේ. ඒවා නාගයාගේ ශරීරයේ ශේෂ සිතුවම් කොටස් ය.

**කලාත්මක ඇගයීම් හා දෘශ්‍යමය ආඛ්‍යාන**

***දෘශ්‍යමය ආඛ්‍යාන - වසම්මලේ***

වසම්මලේ බිතු සිතුවම් ශේෂයන් අනුව විශාල ප්‍රමාණයේ පෙණ ගොබ රාශියකින් යුතු නාග රුවක් තිබූ බව පැහැදිලිව හඳුනාගත හැකි ය. නාගයාගේ දකුණු පස පෙණ ගොබ කිහිපයක් සහ දරණ ගැසුණු නාග ශරීරයෙහි කොටසක් ඉතිරිව ඇත. කහ පැහැය මුසු රඹ පැහැය දුඹුරු රත හා නිල් පැහැ පලාවන් කොළ වර්ණ භාවිත කළ බව දුර්වර්ණ වූ වර්ණ වලින් හඳුනාගත හැකි ය. නාගයාගේ දකුණු පසින් නාගයාගේ ශරීරයට සාපේක්ෂව ඉතා කුඩා ප්‍රමාණයේ කාන්තා රුවක් නිමවා ඇත. එය ප්‍රමාණාත්මකව නාගයාගේ එක් පෙණ ගොබයකටත් වඩා කුඩා ය. ඇය නුහුරු ඉරියව්වකින් වාඩි වී සිටිනුයේ සුරතට බරදී වමත නවා ඉහළට ඔසවා ගනිමිනි. ඉතා තුනී බදාම ස්තරයේ ලා පැහැයක් අතුරා ඒ මත තද පැහැයේ රේඛා ගොඩනගමින් මූලික හැඩතල ගොඩනගා ඇති පූර්ණ වට පියයුරු පැහැදිලිව දක්වා ඇති අතර දෑතේ හා ගෙල ආභරණ දක්වා ඇත. නාගයා ගිනි පැහැයෙන් හා පෙණ රාශියක් සහිත බැවින් අනන්ත හා තුලිත වර්ගයට අයත් බ්‍රාහ්මණ කුලයේ නාග රාජයකු බව හඳුනාගත හැකි ය.

**අනන්ත හා තුලිත වර්ගයට අයත් නාග**

අනන්ත හා තුලිත යන කාණ්ඩයට අයත් නාගයින් බ්‍රාහ්මණ කුලයේ බව සඳහන් කෙරෙයි. ගිනි පැහැයෙන් යුක්ත ඔවුන්ගේ පෙණ දහසකි. වසම්මලේ නාග රුව පෙන රාශියකින් හා රක්ත වර්ණයට හුරු ගිණි පැහැයෙන් නිර්මාණයකර ඇත.

නාගයාගේ වක්‍ර වූ දඟර ශරීරය පෙන්වා ඇති ආකාරය මුරගලේ පිහිටි සප්ත පෙණ සහිත නාගයාගේ ශරීරයට බෙහෙවින් සමාන ය. මෙය සංසන්දනය කිරීමෙන් ශ්‍රී ලාංකේය මූර්ති ශිල්පියා හා චිත්‍ර ශිල්පියා භාවිත කළ උපක්‍රම ඇසුරෙන් ශිල්පීය දෘශ්‍යමය ආඛ්‍යාන හඳුනාගත හැකි ය. බිතු සිතුවමට ඉදිරිපස වනුයේ ජලය පිරි විලකි. දුර සිට බලන්නකුට දර්ශනය වනුයේ ජලය පිරි පොකුණින් පර්වතය මතට පැමිණ පෙණ ගොබ විදාලමින් හිඳිනා නාගරාජයකු ලෙසිනි.

**රූපය 16**: නාග රුව, වසම්මලේ, බදාම මත සායම, 5 සියවස රූපය



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 17**: මුරගල ,අනුරාධපුර පූජා නගරය, 5 සියවස



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

මෙම නාග රාජ රුව ඓතිහාසික ප්‍රස්තුත හා සම්බන්ධ කළ හැකි ය. මුචලින්ද විලෙන් මතුව තථාගතයන් වහන්සේට වර්ෂාව සඳහා සෙවණ සලසා දුන් මුචලින්ද නාග රාජයා, බුත්සරණ විස්තර කරන එක් ලක්ෂ හැටදාහක් යොදුන් වූ මහමෙර දරණ සතකින් වසා තව්තිසා දෙව්ලොව ද වැසෙන සේ පෙණය තබාගත් නන්දෝපනන්ද නාගරාජයා, අනාගත වංශය විස්තර කරන පියංගමු වෙහෙර විසූ තෙර නමක ද්වේශය නිසා විලක් ආශ්‍රිතව උපන් නාග රාජයා, විෂ්ණු සැතපී සිටින "ශේෂ "හෙවත් අනන්ත නම් නාග රාජයා, විෂ්ණු ඉදිබු වෙස්ගත් කළ කිරි මුහුද කැලඹූ වාසුකී නම් නාගරාජයා, නේරංජනා ගං පතුලෙහි සැඟව සිටිනා කාල නම් නා රජු, අනෝතත්ත විලෙන් පැන් ලබාගැනීම වළක්වමින් අනවතප්ත විල වසාගත් නන්දෝපනන්ද නම් නාග රාජයා ආදී ඓතිහාසික ලෙස ජලාශ්‍රිතව විසූ නාගරාජයින්ගේ ප්‍රමුඛ හැඟවීමේ සංඥාර්ථය වනුයේ ප්‍රබලත්වය, බලපරාක්‍රමය, අභිමානය, තේජස, ගර්වය ආදී බලය පිළිබඳ අදහසයි. මෙකී ඓතිහාසික වශයෙන් නාගයා හිමිකරගත් සංකේතීය අනන්‍යතා හැඟවීම් මගින් අර්ථ සන්නිවේදනය කළ හැකි ය. විශාල පෙණ ගොබවලින් හා සාමාන්‍ය සැබෑ පුද්ගලයකුට වඩා විශාලව බිතු සිතුවම ගොඩනැගීම සුවිශේෂී ඉරියව්ව ආදිය නාග රාජයාගේ බල පරාක්‍රමය විදහා දක්වන දෘශ්‍ය සංඥාර්ථයන් ය. එම බලපරාක්‍රමය හා තේජස විදහා දැක්වීමට සිතුවමින් වෙන් කරගත් නාග රුවෙහි පිහිටීම දෘශ්‍යමය පරිමාණ ලෙස බෙදා දැක්වීමෙන් ජනිත වන හැඩය උපකාර කෙරෙනු ඇත. මූලික ලෙස නාග රුව පහළට (පොළවට) මූලික කේන්ද්‍රය ස්ථානගත වන ත්‍රිකෝණයක හැඩය මතු කරයි. පොළොවේ සිට බලය හෝ අයිතිය විශ්වයට මුදා හැරීමේ විශ්ව සංකේතය එයින් ගම්‍ය කරයි. ත්‍රිකෝණ රාශියක එකතුව වෘත්තයක් බවට පත් වී (මල්දෙණිය, 2016: 306) විශ්වයේ ශක්තිය මූල ලක්ෂ්‍යය වෙත කේන්ද්‍රගත කරගනී. හින්දු මතවාද වලට අනුව විශ්වයේ ශුන්‍ය කේන්ද්‍රය සිටින අනන්ත නම් නාග රාජයා මත සිටින විෂ්ණු විශ්වය වෙත ස්වකීය බල පරාක්‍රමය මුදාහරී.

**රූපය 18**: විශ්ව කේන්ද්‍රයේ සිටින අනන්ත නම් නාග හා විශ්වයේ පාලක විෂ්ණු ත්‍රිකෝණය තුළ, කඩදාසි මත රේඛා



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

වසම්මලේ නාගයා ගිනි පැහැයෙන් හා පෙණ ගොබ රාශියකින් යුතු නිසා අනන්ත හා තුලිත වර්ගයට අයත් බ්‍රාහ්මණ කුලයේ නාගයෙකි. එබැවින් මූලික ලෙස නාග රුව පෙනී සිටින දෘශ්‍යමය සංඥාර්ථය ලෙස වටහාගත හැකි වනුයේ "කවුරුන්ද" යන කරුණට වඩා පෙනී සිටින නාග රාජයා විශ්වයේ මධ්‍යයේ සිට විශ්වයේ සියලු අංශ පාලනය කරන බල පරාක්‍රමය විදහාලන ප්‍රමුඛයා බවයි. ඉදිරියෙහි වන පොකුණ ජලය හැඟවීමේ සංකේතය වන අතර ජලය හා සෞභාග්‍යය ළඟා කර දෙන රසෝඝය ලඟාකර දෙන්නා යන අදහසක් ගම්‍ය කරයි. පුරාණ දොරමඩලාව ප්‍රදේශය (වර්ථමාන වසම්මලේ ප්‍රදේශය) රජරටවාසීන්ගේ භවභෝග සශ්‍රීකත්වයට පත්කරන ලද ප්‍රදේශයක් වූ අතර ජලය හා වර්ෂාව දේවත්වයට පත් කර ඇත. පිටුපසින් ඇති වලාකුළු මගින් අහස, වර්ෂාව හා දිව්‍යමය තත්ත්වය ළඟා කරන දෘශ්‍යමය සංකේත ලෙස පෙනී සිටි. එබැවින් රජරට ගොවි ජනතාවගේ අටුකොටු සරු කරන පාලකයා වන රජුට ස්වයංපෝෂිත ආර්ථිකය මගින් ස්වකීය පාලන තන්ත්‍රය නිරවුල්ව පවත්වා ගෙන යා හැකි ලෙස; ආර්ථිකය නගා සිටුවාගත හැකි ලෙස පොදු ජනයාගේ ජවය හා බලය නගා නඟාසිටුවිය හැකි උත්තේජනය හා පෙළඹවීමේ චිත්‍ර ශිල්පීයා දේශපාලනික කාර්යභාරය බිතු සිතුවම මගින් ඉටු කර තිබේ. එබැවින් ඓතිහාසිකත්වය ස්පර්ශ කළ නාග රුව තත්කාලීන සමාජ කර්තව්‍යයක් ලෙස තීව්‍ර කිරීමට චිත්‍ර ශිල්පියා උත්සාහ කළ ආකාරය පැහැදිලිය.

නාග සංකේතය යම් ශ්‍රේෂ්ඨත්වයට පත් පුද්ගලයින් හැඟවීම පිණිස සංකේතයක් ලෙස ද භාවිත කරන බැවින් දිව්‍යමය තත්ත්වයට පත් ප්‍රභූත්වය හා ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ද නාගරාජ රුව පෙනී සිටින බව හඳුනාගත හැකි ය. ඓතිහාසික තොරතුරු වලට අනුව පණ්ඩුකාභය කුමරු ක්‍රි.ව.5 වන සියවසේ දී, කාශ්‍යප රජු ආදීන් විවිධ වකවානුවල ආරක්ෂාව පතා මෙම ස්ථානයේ සැඟව සිට ඇති බැවින් නාගරාජ රුව ආරක්ෂාවේ ප්‍රබල සංකේතයක් ලෙස සැලකීම උචිත ය. ප්‍රධාන නාගරුවේ වම් පසට වන්නට වන ස්ත්‍රී රුව මගින් ජලයෙන් මතු වූ නාග කන්‍යාවියක විශේෂිත නාගරාජයකු හෝ වලාහක හෝ දේව සංකල්පයක් සහිත ප්‍රස්තුතය තීව්‍ර කෙරෙන අතර විශාල නාගරාජ රුව මගින් සශ්‍රීකත්වය සෞභාග්‍යය ආරක්ෂාව හා විශ්වීය බල පරාක්‍රමය වැනි හැඟීම් නරඹන්නාට සංජානනය කෙරෙන දෘශ්‍යමය සංඥාර්ථයක් වෙයි.

**දෘශ්‍යමය ආඛ්‍යාන - ගිරා පොකුණු හෙල බිතු සිතුවම්**

ගිරා පොකුණු හෙල බිතු සිතුවම් ස්ථානයෙහි ද විශාල ප්‍රදේශයක් පුරා විසිරී තිබුණු බිතු සිතුවමක ශේෂව ඇති කොටස් වලින් පෙණ ගොබ සමූහයකින් යුත් විශාල නාග රුවක් හා නාගරුවෙහි වම්පසට වන්නට වූ කුඩා මානව රුවක්ද නිරූපිත ය. නාග රුවෙහි පෙණ හතරක් හා දඟර වූ නාග ශරීරය යන්තමින් හඳුනාගත හැකි ය. ලා පැහැ බදාම ස්තරය මත ලා පැහැ සායම අතුරා ඒ මත ඝන රේඛා වලින් හැඩතල මතු කර ඇත. රඹ පැහැ කහ පැහැය ශේෂ වූ සිතුවම් තුළ හඳුනාගත හැකි ය. ගිරා පොකුණු හෙල නාගයා ද ගිනි පැහැයෙන් යුතු හා පෙණ රාශියකින් යුතු නිසා අනන්ත හා තුලිත කුලයට අයත් බ්‍රාහ්මණ වර්ගයට අයත් ය. වසම්මලේ බිතු සිතුවම බොහෝ සෙයින් සමාන වූ ගිරා පොකුණු හෙල බිතු සිතුවමෙහි මානව රුව පිහිටීම පමණක් ප්‍රති විරුද්ධ දිශාවන්ට වී ඇත. ගිරා පොකුණු හෙල ආශ්‍රිතව ද විශාල පොකුණක් පිහිටා ඇත. එම පර්වතයට ගිරා පොකුණ යන නාමය ලැබී ඇත්තේ ද එබැවිනි. වර්තමානයේ පොකුණ ජරාවාස වුවද ජලය පිරී තිබේ. එබැවින් ගිරා පොකුණු හෙල නාග රුව ද ජලාශ්‍රිතව පිහිටා ඇති බැවින් සශ්‍රීකත්වය දියුණුව සෞභාග්‍යය අපේක්ෂා කිරීමේ සංකේතයකි. එම සශ්‍රීකත්වය යන අදහස සඳහා ඓතිහාසික සිද්ධීන් ද පාදක වෙයි. දුටුගැමුණු කුමරු සොළීන් හා යුද වැදීමේදී රට සහලින් ස්වයංපෝෂිත කිරීම වෙනුවෙන් තිස්ස කුමරු දිගාමඩුල්ල ප්‍රදේශයට පිටත් කළ බව ජනශ්‍රැතිවල විස්තර කෙරේ. දිගාමඩුල්ලේ පානම ප්‍රදේශය වඩා සශ්‍රීකම භූමි භාගයකි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ගිරා පොකුණු හෙල සහිත මෙම ප්‍රදේශය රක්ෂිත වනයක් බවට වෙන්කර ඇත්තේ එම සශ්‍රීක පොළොව අස්වැද්දීම නැවැත්වීම වෙනුවෙන් බව ද ජනශ්‍රැති වල කියැවේ. එහෙයින් ගිරා පොකුණු හෙලෙහි නිර්මිත නාග රාජ රුව ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ සශ්‍රීකත්වය අපේක්ෂා කළ දේවත්වයේ සංකේතය ලෙස සැලකිය හැකි ය. මෙම බිතු සිතුවම වර්තමානයේ ජලය සිඳී ඇති සැලව වැව දර්ශනය වන මානයේ පිහිටා ඇති බැවින් ද එකී අදහස තීව්‍ර කෙරෙයි. ගිරා පොකුණු හෙල බිතු සිතුවම පිහිටා ඇත්තේ ඉහළ පර්වතයක වන අතර එම ස්ථානයට ආකාස චෛත්‍යය මැනවින් දර්ශනය වේ. එබැවින් ඉහළ පිහිටා ඇති දිව්‍යමය අදහසක් සංකේතවත් කරනුයේ පිහිටි ස්ථානය පිළිබඳව වන කතිකාවේදී ය. පෙණ දහසක් සහිත අනන්ත නම් විෂ්ණු පිටුපස සිටින නාග රාජයා අනවතප්ත විල් ජලයෙහි ආරක්ෂකයා ලෙස පෙනී සිටියි. ගිරා පොකුණු හෙල හා සැලව වැව් පොකුණුවල ආරක්ෂකයා ලෙස පෙනී සිටින මෙම බිතු සිතුවමේ නාග රාජරුව එම ජලය භාවිත කර අස්වද්දන කෙත්වතු නිසා සරුසාර වන දිගාමඩුලු පුරවරයේ සශ්‍රීකත්වයේ නිමැවුම්කරුවා හඟවන සංඥාවක් ලෙස ද පෙනී සිටියි. දකුණු පස වන පුද්ගලයාගේ අත්ලෙහි වන දෙය හා ඉහළින් වන බඳුන වැනි උපකරණය අනුව සශ්‍රීකත්වය වෙනුවෙන් කෙරෙන යම් පූජාවක් හෝ පිදීමක් වැනි අදහසක් යැයි සිතිය හැකි ය.

**රූපය 19**: නාග රූව, ගිරාපොකුණුහෙල, බදාම මත සායම, 5-7 සියවස (?)



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**දෘශ්‍යමය ආඛ්‍යාන - කුඩුම්බිගල**

කුඩුම්බිගල පෙන කිහිපයකින් යුතු නාග රූව තද කහ පැහැය හා තද රත් පැහැයෙන් නිර්මාණය කර ඇත. මැකී ගිය සිතුවම් ශේෂ අතර ලා කහ පැහැය මත රේඛාව තිත භාවිත කරමින් ගොඩනගන ලද හැඩ හඳුනා ගත හැකි ය. එම තිත හා පැහැයේ ස්වභාවය භාවිත කර ගොඩ නගන ලද වසම්මලේ හා ගිරා පොකුණු හෙල නාග රූ වලට වෙසෙසින්ම සමාන ය. කුඩුම්බිගල පෙන කිහිපයකින් යුතු නාග රූව ද ගිනි පැහැයෙන් යුතු හා පෙණ රාශියකින් යුතු නිසා අනන්ත හා තුලිත කුලයට අයත් බ්‍රාහ්මණ වර්ගයට අයත් ය. එම ස්ථාන ද්වයෙහිම නාගරූ අසල පොකුණු පිහිටා ඇති අතර කුඩුම්බිගල නාග රූව අසලද පොකුණක් පිහිටා ඇත. මෙම ස්ථාන තුනෙහිම භාවිත කර ඇති දෘශ්‍ය රූප හා සංකේත සමානත්වයක් දරයි. එබැවින් මෙම ස්ථාන තුනෙහිම භාවිත කර ඇති දෘශ්‍ය රූප අනුව සශ්‍රීකත්වය දියුණුව සෞභාග්‍යය ආදිය දෘශ්‍යමය ආඛ්‍යාන ලෙස වැනි හඳුනාගත හැකි ය.

**නාග රූව චිත්‍රණය කිරීමේ කලාත්මක ඇගයීම්**

***චිත්‍රණය සඳහා සාහිත්‍යමය ප්‍රස්තුතයන්හි ආභාසය***

චිත්‍ර ශිල්පියා නාග රූව ගොඩනැගීමේ දී සාහිත්‍යමය ප්‍රස්තුතයන් පිළිබඳ අවධානය යොමු කරමින් යම් දාර්ශනික අදහසක් ජනිත කිරීමට අපේක්ෂා කර තිබේ. නාග සංකේත තුළ ගුප්ත අර්ථයක් මෙන් ම ගෞරවයක් ද ජනිත කෙරෙයි. නාග ලොව හා නාග ස්වරූපය පිළිබඳව විස්තර කළ වර්ණනා හා පුරාණෝක්ති වල ආභාසය ලබාගත් චිත්‍ර ශිල්පියා පරිසරයේ හමුවන නාගයාගේ දෘශ්‍යය රූව ප්‍රති නිර්මාණය කරමින් නාග යන හැඩය ගොඩනගා තිබේ. එම පෙන රාශියක් පෙන්වීම මගින් නාග රාජයාගේ ප්‍රභලත්වය සංකේතවත් කර තිබේ. නාග හා නාගිනී රූ මනුෂ්‍යය ස්වරූපයෙන් දක්වා ඇති අතර හඳුනාගැනීම පිණිස හිස්වැසුමට හෝ පිටුපසින් නාග පෙණය සහිත හැඩයක් නිර්මාණය කරයි. කලාකරුවා නාගයා සංකේතය මගින් දාර්ශනික ආධ්‍යාත්මීය ගුණාංගයක් තීව්‍ර කිරීම පිණිස භාවිත කරයි. නාග සංකේතය මගින් බහු අර්ථ සංජානනය කරන අවස්ථාවන්ද හමුවේ. කාලය දැක්වීම පිණිස, දීර්ඝායුෂ අපේක්ෂා කිරීම පිණිස, ජලය හා සෞභාග්‍යයද හැඟවීමේ සංකේත ලෙසද නාග රූව භාවිත කරයි. නාග ලොව වසන මහාකාල නම් නාග රාජයාට දීර්ඝායුෂ හිමි බව සඳහන් වේ (ජානගේ, 2000 දෙසැම්බර්: 67). නාගයා ජලයට අධිපති වන අතර වර්ෂාව ඇති කිරීමේ ශක්තියක්ද නාගය සතු බව කියවේ. ඌරු සිටාන වැව, පොවන්කුලම, මහන්කණ්ඩි වැව, හොරොව්වල ආදී ස්ථානගණනාවක පෙන කිහිපයක් සහිත නාග රූව නිරූපණය කළ කැටයම් එලක හමුවේ. මහකණ්ඩිය වැව් සොරොව්වේ පෙන හතක

නාග රුවක් සහ දෙපස නාග මානවිකාවන් දෙදෙනෙකුද නිරූපිත ය. නාග පොකුණේ හා කලුදිය පොකුණේ දියෙන් මතු වන ආකාරයේ නාග රූ ගොඩනගා ඇත. මේවාගේ ජලය හා එමගින් ලබාගන්නා සමෘද්ධිය පිළිබඳව හැඟවීම සංකේත ලෙස හඳුනාගත හැකි ය. පුන් කලසක් අත දරා සිටින මුරගලේ කැටයම් කර ඇති නාග රාජයා අනෝතප්ත විලෙහි වසන ජලයට අධිගෘහිත අනන්ත නම් නාග රාජයා බව ටී.ඩී.දේවේන්ද්‍රගේ අදහසයි (ජානගේ, 2000 දෙසැම්බර්: 70). වසම්මලේ, කුඩුම්බිගල, ගිරා පොකුණු හෙල යන බිතු සිතුවම් ස්ථානවල පෙන ගොබ රාශියකින් යුතු නාග රුව චිත්‍රණය කර ඇති අතර මෙම ස්ථාන ත්‍රයෙහිම ජලය පිරුණු පොකුණු දක්නට ලැබේ.

**ස්වාභාවිකත්වය හා නිර්මාණශීලීබව**

ස්වාභාවික දේවල්, ඉන්ද්‍රීය ගෝචර නොවන දේවල්, සාහිත්‍යයේ දී කියැවෙන චරිත, ස්ථාන, සිදුවීම් ආදී සියලු දේ නිමැවීමේ දී ඒවා නිසඟයෙන් ම නිර්මාණශීලී ස්වභාවයකට පත්වේ. අනුරාධපුර හා පොළොන්නරු යුගයේ බිතු සිතුවම් ශිල්පියා ඉතා දක්ෂ අන්දමින් ස්වාභාවිකත්වය හා නිර්මාණශීලී බවින් යුක්තව ගොඩනගා ඇත.

වසම්මලේ හා ගිරා පොකුණු හෙල යන ස්ථාන ද්වයෙහිම නාග රුව නිර්මාණය කර ඇත. නාග ගෝත්‍රිකයන්, පරිසරයේ වෙසෙන නාගයා, නාග දිව්‍යමය බල සහිත කණ්ඩායම, නාගරාජයින් ආදී විවිධ කණ්ඩායම් පිලිබඳ ව සාහිතයයේ දී ජනශ්‍රැතිවල විස්තර කෙරේ. මොවුන් කිසිවකුත් මිහිපිට අපගේ නෙතට ගෝචර නොවේ.

එහෙත් අපට පරිසරයේ දී හමු වනුයේ නාග යන සර්ප විශේෂ පමණි. එබැවින් චිත්‍ර ශිල්පියා කුමන නාග යන නමින් කුමන කණ්ඩායමක් වුවද සර්පයාගේ හැඩය අනුව චිත්‍රණය කර ඇත. ස්වාභාවික නාගයෙකුගේ මූලික හැඩය හොඳින් නිරීක්ෂණය කර නාග චරිතය ගොඩනගා තිබේ. නාගයාගේ පෙනය හොඳින් අධ්‍යයනය කර ඇස හොම්බ කෙලවර හා විෂ දලය මුඛයෙන් එළියට විදා සිටින ආකාරය ස්වාභාවික නාගයාගේ ආකාරයෙන්ම ගොඩනගා තිබෙන අතර පෙනය මධ්‍යයෙන් සමාන වර්ණයන්ගෙන් යුතු වෘර්ත රටාවක් ඉහල සිට පහලට දක්වමින් කොරපොතු සංකේතයක් ලෙස දක්වා තිබේ.

පෙනයේ කොරපොතු හැඩය හැඟවීම පිණිස පෙනයේ නැම්ම සහිත දාරය හඟවමින් එක ළඟ පුන පුනා සමානව ගලායන තිත් ගොඩනගා ඇත. එයින් පෙනයේ මූලික හැඩය තීව්‍ර කර තිබේ. නාගයාගේ ප්‍රබලත්වය තීව්‍ර කෙරෙනුයේ දීප්තිමත් ඇස හා ඒ අසලින්ම යොදා ඇති දිගු විෂ දළයෙනි. ස්වභාවික නාගයාට ඇත්තේ එක් පෙනයක් වුව ද නාගරාජයා යන අරුත ගම්‍යවීම පිණිස, නාගරාජයා සතු ප්‍රබලත්වය, බලය අභිමානය හැඟවීම පිණිස පෙන ගොබ රාශියක් ගොඩනගා තිබේ. පෙන රාශියක් තිබුනද එකම නාගයෙක් ලෙස සිලින්ඩරාකාර එක් කඳකින් යුතුව නිරූපිත ය.

එක් ශරීරයකින් හිස් රාශියක් මතු වීම ප්‍රබල බලපරාක්‍රමයක් ද සංකේතවත් කරයි. පෙනය ගොඩ නැගීමේ දී ගිරා පොකුණු හෙල චිත්‍ර ශිල්පියා හා වසම්මලේ චිත්‍ර ශිල්පීන්ගේ මූලික වෙනස්කම් හඳුනාගත හැකි ය. ගිරා පොකුණු හෙල චිත්‍ර ශිල්පියා පෙණය ගොඩ නැගීමේ දී තිත වැඩිපුර ප්‍රමාණයක් භාවිත කර තිබේ. එහෙත් මූලික හැඩය ගොඩ නැගීමේ හා නිර්මාණශීලී ස්වභාවයේ සමානතා හඳුනාගත හැකි ය. නාගයාගේ සිලින්ඩරාකාර කඳේ හැඩය ගොඩ නැගීමේ දී එක් එක් දාරවල ස්වභාවය සහ වක්‍ර ස්වභාවයත් නැමී වක්‍ර වන ස්වභාවයන් පිළිබඳව මූලික අවදානය යොමු කර තිබෙන අතර තිත ක්‍රමානුකූලව යෙදීම හා ලා සහ අඳුරු පැහැය භාවිත කිරීම මගින් මතු කර තිබේ. ස්වභාවික නාගයාගේ දැකගතහැකි කොරපොතු ගොඩ නැගීම කෙරෙහි අවධානය යොමු කර නැත. එබැවින් චිත්‍ර ශිල්පියාට අවශ්‍ය වී තිබෙනුයේ ස්වභාවික නාගයා ඒ අයුරින්ම ප්‍රතිනිර්මාණය කිරීම නොව ස්වභාවිකත්වයේ අනුසාරයෙන් නිර්මාණශීලී නාගයෙකු නිර්මාණය කිරීමට ය. මුචලින්ද, නන්දෝපනන් ද වැනි නාගරාජයින් දිව්‍යමය තත්වයන් ලඟාකරගෙන සිටින බැවින් ස්වභාවිකත්වය ඒ අයුරින්ම ගොඩ නැගීම ඉවත හරිමින් නිර්මාණාත්මක කාර්යයේ දී දිව්‍යමය තත්වයන් ලඟාකරගැනීමට චිත්‍ර ශිල්පියා උනන්දු වෙයි.

පෙන රාශියකින් තේජස, බල පරාක්‍රමය හා නාගරාජ යන සංකල්පය ද, ස්වභාවිකත්වය ඉක්ම වූ නිර්මාණාත්මක අංග ලක්ෂණ වලින් දේවත්වය පිළිබඳ අදහසක් ද, නාගයාගේ ස්වභාවික අංග වලින් නාගයා යන හැඟවීම් සංඥාර්තයද ලබාදෙමින් චිත්‍ර ශිල්පියා නාග සංකල්පය පිළිබඳව විශිෂ්ඨ අදහසින් නරඹන්නාට ලබා දෙයි. ඒ සඳහා චිත්‍ර ශිල්පියා භාවිතා කල දෘෂ්‍යාමය උපක්‍රමය වූයේ ස්වභාවිකත්වයේ ආභාසය ලබා ගනිමින් නිර්මාණශීලී සිතුවමක් වෙත ප්‍රවේශ වීමයි.

**රූපය 20:** නාගරුව ස්වභාවිකත්වයේ ආභාෂය ලබා ගනිමින් නිර්මාණශීලීව ගොඩනගා ඇති අයුරු, වසම්මලේ, බදාම මත සායම, 5 සියවස



මුලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**තිත ආශ්‍රයෙන් හැඩය මතුකිරීම**

තිත රේඛාවේ ආරම්භකම අවස්ථාවයි. රේඛාව යනු තිත් සමූහයක එකතුවකි. චිත්‍ර ශිලපීන් තිත රේඛාවත් සමඟ මිශ්‍රව හා තිත වෙන් වෙන්වද භාවිතා කර තිබේ. තිත සිතුවම අලංකාරවත් කරන මෝස්තරාත්මක රටාවක් ලෙස ද, යම්කිසි අවස්ථාවක හැඟවීමක් හෝ අර්ථයක් සංජානනය කිරීම වෙනුවෙන් ද භාවිත කර ඇත. පින්සලය, ඇඟිල්ල හෝ යම් කිසි උපකරණයක් තැබීම (Touch) මගින් තිත ගොඩ නැගේ. තිත තැබීමේ දී චිත්‍ර ශිල්පියා මූලික අරමුණක් සහිතව පින්සල එකතැනක තබමින් එක් ස්ථානයකට කේන්ද්‍රගතවේ. තිත තැබීමේ දී චිත්‍ර ශිල්පියා සතුව නිසඟයෙන්ම ගොඩ නැගෙන ක්‍රියාවලියක් වූයේ ශික්ෂණයි. තිත් මෝස්තර රටාවක් ගොඩ නගන චිත්‍ර ශිල්පියා සතුව ඉතා සියුම් දෘශ්‍ය ශික්ෂණයක් ගොඩ නැගේ. ඒ අයුරින්ම රේඛාව ගොඩනැගීමට වඩා කාලයක් තිත් ගොඩනැගීමට වැය කිරීමට සිදු වේ. එබැවින් තිත් භාවිත කිරීමේ දී චිත්‍ර ශිල්පියා බිතු සිතුවම සමඟ වැඩිපුර කාලයක් සහ විනයක් යෙදවීමට සිදු වේ.

වසම්මලේ බිතු සිතුවම් වල හා ගිරා පොකුණු හෙල බිතු සිතුවම් වල නාග රාජයාගේ පෙන ගොබය හා නාගයාගේ ශරීරය හැඟවීම පිණිස තිත භාවිත කර තිබේ. වසම්මලේ චිත්‍ර ශිල්පියා තිත භාවිතා කර ඇත්තේ තිත අනෙක් රේඛා සමඟ මිශ්‍ර කිරීමෙනි. එම තිත් සමූහය එකට යා කල විට වක්‍ර රේඛාවක් ගොඩ නැගේ. නාගයාගේ වක්‍ර උඩට නෙරූ පෙන ගොබය හැඟවීම පිණිස තිත භාවිතා කර ඇත. තිත් සමූහය එක දිගට සමාන්තරව පුන පුනා ගලා යමින් වක්‍රාකාර රේඛාවක් ලෙස නරඹන්නාට හැඟවීම හැඩයක මූලික අණුවක් ලෙස තිත භාවිතා කෙරේ. තිත හෝ තිත් කිහිපය පමණක් වෙනම ගත් කල අර්ථ ශුන්‍ය වෙයි. තිත් සමූහයම අනෙකුත් රේඛා වර්ණ හා හැඩ සමඟ සම්මිශ්‍රව නැරඹුව ද ඉක්බිති තිත් මගින් හඟවන හැඩය පිළිබඳ වින්දනාත්මකව යම් අදහසක් ලබා ගතහොත් නාගයාගේ පෙන ගොබය පිළිබඳව මූලික අවබෝධයක් ලබා ගත හැකි ය. ඒ අනුව වසම්මලේ චිත්‍ර ශිල්පියා තිත බිතු සිතුවම් අතර හැඟවීමේ සංඥාවක් ලෙස භාවිතා කර ඇත. වසම්මලේ බිතු සිතුවම් අතර තිත නාගයාගේ ශරීරය (කඳ ප්‍රදේශය) දෘශ්‍යමය විස්තරකතනය කෙරෙන අංගයක් ලෙස භාවිත කර ඇත. නාගයාගේ රවුම් සිලින්ඩාකාර ශරීරය හොඳින්ම නම්‍යශීලී ය. එය වක්‍රයකට සමාන ආකාරයට නවා සිටිව ආකාරය නාගරාජ මුරගල් වල දක්නට ලැබේ.එම වක්‍රව නැගී සිටින ආකාරය හැඟවීම පිණිස භාවිතා කරන දෘශ්‍යමය උපක්‍රමයක් ලෙස තිත භාවිතා කර තිබේ. වක්‍ර හැඩය මූලික රේඛා ද්වයෙන් වටකර හැඩය මතු කර තිබන අතර ශරීරයේ ද කෙලවරට තද පැහැය යොදා තිබේ. මධ්‍යය ලා රඹ පැහැයෙන් යුක්ත ය. ශරීරයේ වක්‍ර බව සිලින්ඩරකාර බව හොඳින්ම තීව්‍ර වීම පිණිස චිත්‍ර ශිල්පියා තද රත් පැහැයෙන් සම ප්‍රමාණයෙන් තිත සම පරතරයකින් රේඛාව ගොඩ නැගෙන ආකාරයට පුන පුනා ගොඩ නගා තිබේ. එය වක්‍ර කඳෙහි හරස් අතට දිවෙන රේඛාවන් සමූහයක් ලෙස ගොඩනගා ඇත.

ගිරා පොකුණු හෙල චිත්‍ර ශිල්පියා ද විශාල පෙන ගොබ රාශියක් සහිත නාග රුව හැඟවීම පිණිස තිත භාවිත කරයි. ගිරා පොකුණු හෙල චිත්‍ර ශිල්පියා ප්‍රථමයෙන්ම නාගරුව ගොඩනගා ලා කහ රඹ පැහැය අතුරා ඒ මත තද දුඹුරු රතු පැහැයෙන් වට රේඛා ගොඩනගා තිබේ. එම වට රේඛා කෙලවරෙන් අඳුරු කර මූලික පෙනගොබවල හා ශරීරයේ හැඩය ගොඩනගා තිබේ. ඉන් ඉක්බිති ලා රඹ පැහැති ශරීරය පුරා අපිළිවෙලින් සම්පූර්ණ ශරීරය වැසෙන සේ තිත් යොදා ඇත. එම තිත් අතර පරතරය යම් සමාන අවකාශයක් තබාගැනීමට චිත්‍ර ශිල්පියා වග බලාගෙන තිබේ. වසම්මලේ චිත්‍ර ශිල්පියා නාගයාගේ හැඩය ගොඩනැගීම පිණිස තිත තැබුවද ගිරා පොකුණු හෙල චිත්‍ර ශිල්පියා හැඩය පෙන්වීම පිණිස නොව,නාග ශරීරයෙහි ස්වභාවය කොරපොතු ආදිය නරඹන්නාට හැඟවීමේ දෘශය සංඥාර්ථය වෙනුවෙන් තිත භාවිත කර තිබේ.ගිරා පොකුණු හෙල චිත්‍ර ශිල්පියා ද අති දක්ෂ පුහුණු ශිල්පියෙකි. ඔහු තිත තැබීමේ දී චිත්‍ර ශිල්පියෙකු සතු ඉවසීම, ශික්ෂණය, ඒ සඳහා කල යුතු කැපවීම හා නිර්මාණය නිමා කිරීම සඳහා ලබා ගත යුතු කාලය පිළිබඳව මනා පරිචයක් සතු වූවකු බව පැහැදිලිය.

**රූපය 21**: නාගරුව, වසම්මලේ, බදාම මත සායම, 5 සියවස



මුලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 22:** නාගරුව වසම්මලේ, බදාම මත සායම, 5 සියවස



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 23:** නාගරුව, ගිරා පොකුණුහෙල, 5-7 සියවස



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**ඝනත්වය ගොඩනැගීම**

යම් ද්‍රව්‍යයක, වස්තුවක, මානව රුවක, සත්වයෙකුගේ හෝ කුමන දෙයක වුවද වටකුරු ස්වභාවය, වෘත්තාකාර ස්වභාවය, චක්‍රාකාර බව, පැතලි ස්වභාවය ඉක්මවූ ඝන ස්වභාවය බිතු සිතුවමක් මගින් තීව්‍ර කිරීමට ඉපැරණි චිත්‍ර ශිල්පියා උනන්දු වී තිබේ. චිත්‍ර ශිල්පියා බිතු සිතුවමක ඝනත්වය, රිද්මකබව, වටකුරු බව පෙන්වීමේ දී සරලව මූලික ඝන හැඩය වටරේඛා දෙකකින් වෙන්කරමින් හැඩය පිළිබඳ අදහසක් ලබාදෙයි. බිතු සිතුවමක ඝනත්වය යනු චිත්‍ර ශිල්පියා හා නරඹන්නා අතර සිදුවන සංඥාත්මක  ඒකාග්‍රතාවයකි. එය වඩාත් සාර්ථක වනුයේ චිත්‍ර ශිල්පියා ලබාදෙන සංඥාව නරඹන්නා ග්‍රහණය කර ගැනීමේ ශක්‍යතාව මත පදනම්ව ය. චිත්‍ර ශිල්පියා ඝනත්වය පිළිබඳව සංඥාවක් ලබාදෙයි. එනම් චිත්‍ර ශිල්පියා නිවැරදිව අඳිමින් “මෙය හස්තය යි” යන සංඥාව  නරඹන්නාට ලබාදෙන අතර  නරඹන්නා ද “මෙය හස්තයකි, එබැවින් හස්තය ඝනත්වයෙන් යුක්තය, එබැවින් බිතු සිතුවමේ හස්තයද ඝනත්වයෙන් යුක්ත විය යතු ය.” යන ප්‍රති සංඥාව නරඹන්නා විසින් ලබාගත යුතු ය. ද්‍රව්‍යයක ඝනත්වය ගොඩනැගීමේ ප්‍රමුඛ සාධකයක් ලෙස ආලෝකය හා අඳුර යොදා ගැනීම සිදු කිරීම වඩාත් සාර්ථක ශිල්පීය භාවිතයකි. සාමාන්‍යයෙන් ද්‍රව්‍යයකට හෝ හැඩයකට එක් පසෙකින් ආලෝකය ලැබෙන විට අනෙක් පස අඳුරක් නිසගයෙන්ම ළඟා කෙරේ. එම අඳුර සටහන් කර ගැනීම මගින් ඝනත්වය, හැඩය, වටකුරු බව තීව්‍ර ලෙස නරඹන්නාට හැඟවිය හැකි ය. එහෙත් දෑතේ දෙපසින්ම අඳුරක් වැටීම යනු  ස්වභාවික ආලෝකයක්

නොව චිත්‍ර ශිල්පියා ද්‍රව්‍යයේ හෝ මානව හැඩයේ ඝනත්වය, වටකුරු බව, හැඟවීම පිණිස ඉදිරිපත් කෙරෙන චිත්‍ර ශිල්පියාගේ නිර්මාණාත්මක ශිල්පක්‍රමයකි.

එහෙත් යම් ද්‍රව්‍යයකට හෝ වක්‍ර හැඩයකට දෙපසින් ආලෝකය ලැබුණු විට ද්‍රව්‍යයේ මධ්‍යයට අඳුර ලැබෙන අවස්ථාවක් ද හඳුනා ගත හැකි ය. එම ආලෝක තත්වය හා අඳුර ලැබීම කෘත්‍රිම ආලෝකය සැපයීමේ දී සිදුවන්නක් බැවින් ස්වභාවික ආලෝකය ලැබීමේ දී එක් පසක් ආලෝකමත් වී අනෙක් පස අඳුරු විම නිසඟයෙන්ම සිදු වෙයි.

මීට අමතරව බිතු සිතුවම් ශිල්පීන් ඝනත්වය පෙන්වීමේ දී විවිධ ආකාරයේ අංග භාවිත කල අවස්ථාද හමුවේ. එක සමාන පරතරයකින් පුන පුනා යොදන රේඛාව මගින් ඝනත්වය පිළිබඳව මූලික හැඟීමක් නරඹන්නාට ලබා දෙයි. ගිරා පොකුණු හෙල බිතු සිතුවම්වල හමුවන වාඩි වී එරමිණියා ගොතාගෙන සිටින මානව රුව සුරතින් යමක් දරා සිටියි. එම දරා සිටින උපකරණය හෝ ද්‍රව්‍ය මිටක් ද සහිත වෘත්තාකාර හැඩයකි. එම වෘත්තාකාර හැඩයේ වටකුරු වක්‍ර බව, හඳුනාගැනීම පිණිස චිත්‍ර ශිල්පියා ලබා දී ඇත්තේ වටකුරු රේඛාව පමණි. වටකුරු වක්‍ර රේඛවෙන් එය වෘර්තාකාර හැඩයක් බව තීව්‍ර වුව ද එහි ඝනත්වයේ ස්වභාවය නරඹන්නාට හඳුනාගත නොහැකි ය. එහෙත් චිත්‍ර ශිල්පියා එම වටකුරු බව තීව්‍ර කිරීම පිණිස අනෙකුත් රේඛාවල ද උපකාරය ලබා ගනී. වටකුරු රවුම්, වක්‍ර බවෙහි මූලික හැඩය සුරත් අල්ල මත තබා සිටින අතර මහපටැඟිල්ලේ රේඛාව ඉදිරියට නෙරා ඇති දබරැඟිල්ල නැවත වෘත්තාකාර හැඩය තුළට ගලාගිය රේඛාව මගින් (ඇඟිලිවල) ද්‍රව්‍යයෙහි ඝනත්වයක් ඇති බව නරඹන්නාට ඒත්තු ගැන්වීමට අවශ්‍ය ඉඩ අවකාශය ලබාදෙයි. එබැවින් මාපටැඟිල්ලේ කෙළවර සිට මැදඟිල්ල දක්වා දිවෙන කොටසෙහි ඉඩ අවකාශය යනු එම උපකරණයේ හෝ ද්‍රව්‍යයේ ඝනත්වය පිළිබඳව හැඟවීම් අවකාශයයි. ගිරා පොකුණු හෙල චිත්‍ර ශිල්පියා විශිෂ්ට අන්දමින් රේඛාවේ හැසිරවීම උපයෝගී කොටගෙන ඝනත්වය පිළිබඳව පූර්ව හැඟවීමකට අවශ්‍ය මූලික දෘශ්‍ය සංඥාවක් නරඹන්නාට ලබා දෙයි. සීගිරි බිතු සිතුවම් වල අප්සරා රූ ගොඩනැගීමේ දී චිත්‍ර ශිල්පීන් විවිධ උපක්‍රම භාවිත කර ඇත. ලා පැහැයෙන් ගොඩනගන ලද මූලික වර්ණය මූලික වට රේඛාවෙන් කර පියයුරෙහි මූලික හැඩතලය ගොඩනගා ඇත. යම් ලලනා රූ වල මූලික වක්‍ර හැඩතලය ගොඩනගා කෙළවර තද පැහැය ගොඩනගා තිබේ. ඉන් ඉක්බිති කෙටි රේඛා වක්‍ර හැඩය තීව්‍ර කිරීම පිණිස පුන පුනා යෙදීමෙන් වක්‍ර හැඩය, ඒවායේ ඝනත්වය මතු කිරීමට උත්සාහ දරා තිබේ. එක් එක් චිත්‍ර ශිලීපීන් වටකුරු බව ගොඩනැගීම පිණිස විවිධ ශිල්පීන් ගුරුකුල විවිධ ආකාරයෙන් උපක්‍රම හා විධික්‍රම භාවිත කර තිබේ.

මීට අමතරව වසම්මලේ බිතු සිතුවම් ශිල්පියා වටකුරු බව, ඝනත්වය පෙන්වීම සඳහා තිත පුනා පුනා යෙදීම භාවිතා කර තිබේ. වක්‍ර හැඩය, යම් ද්‍රව්‍යයක මානව හෝ සත්ව රුවක වක්‍ර හැඩය ඝනත්වය මතුකිරීමට තිත් සමූහයක් පුන පුනා යෙදීම යම් ක්‍රමානුකූල දෘශ්‍ය ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. එහි පළමු පියවර ලෙස සැලකීමේ දී මූලික හැඩය රේඛාවෙන් ගොඩනැගිය හැකිය. උදාහරණයක් ලෙස ඝනත්වය පෙන්වන හැඩය සිලින්ඩරාකාර හැඩයක් ලෙස සැලකුව හොත් එකී සිලින්ඩරාකාර හැඩයේ දෙකෙළවර රේඛාවෙන් පමණක් මූලික හැඩය ගොනුව තිබේ. එහෙත් එම සිලින්ඩරාකාර හැඩයෙන් මූලික හැඩයේ ඝනත්වය පිළිබඳව හැඟීමක් තීව්‍ර නොකෙරේ. එහෙත් දෙවන වාරයේ දී එකළඟ වක්‍ර රේඛා සමූහයක් ගොඩනැගීම මගින් සිලින්ඩරාකාර හැඩයේ වක්‍ර වටකුරු ස්වභාවය ඝනත්වය පිළිබඳ හැඟීමක් නරඹන්නාට ලබාගත හැකි ය. එම රේඛා සමූහයක් පුන පුනා යෙදිය යුතු වනුයේ සිලින්ඩරාකාර හැඩය ට අඳුර ලැබෙන ස්ථානය අනුවය. තෙවන පියවරේ දී රේඛා මදක් ඈතින් යෙදූව ද මූලික වක්‍ර වටකුරු හැඩයේ හැඟීම, ඝනත්වයේ හැඟීම නරඹන්නාට ලබාගත හැකිය. සිව්වන පියවරේ දී සිලින්ඩරාකාර හැඩයේ ස්වභාවය වඩාත් දුරස්වන රේඛා කිහිපයකින් ගොඩනැගිය හැකි ය. එම රේඛා සමාන්තර ඉඩකින් ගමන්ගන්නේ වුව ද එහි වක්‍ර වටකුරු බව ඝනත්වය හැඟවීමට බාධාවක් නොවෙයි. යම් විටෙක මෙම රේඛා සමූහයකින් කෙරෙන ක්‍රියාවලිය ඉතා සමාන අවකාශයකින් හෙබි රේඛා මගින් සරලව ඉදිරිපත් කළ හැකි ය. එහෙත් මෙම එකළඟ සමාන රේඛා සමූහයක් ගොඩනැගූ විට යම් ශෛලීගත ස්වභාවයක් ගොඩනැගීම නිසගයෙන්ම සිදුවන්නකි. මෙම පියවරවලදී ඍජු සිලින්ඩරාකර හැඩයක

මෙම සනත්වය සලකුණු කිරීම සිදු වූ අතර එම දුරස්ව සමාන දුරකින් පවතින රේඛාවේ හැඩය කෙටි තිත් මගින් ද සලකුණු කල හැකි ය. එම තිත් සමූහය එකතු වී මූලික සිලින්ඩරාකාර හැඩයේ වක්‍ර බව තීව්‍ර කරයි. එම දුරස්ව සමාන දුරකින් පිහිටි තිත් සමූහය මගින් දිගු සිලින්ඩරාකාර වක්‍ර වූ ද්‍රව්‍යයක්, බටයක් වැනි ද්‍රව්‍යයක්, සමාන වක්‍ර ගසක කඳක් හා සර්පයෙකුගේ වක්‍ර ශරීරය නිර්මාණය කළ හැකි ය. වසම්මලේ බිතු සිතුවම් ශිල්පියා නාග රුවෙහි කඳ නිර්මාණය කිරීමේ දී මෙම තිත් සහිත රේඛාත්මක හැඩතලය ඉතා උපක්‍රමශීලීව යොදාගෙන තිබේ. එය ඉතා පරිණත චිත්‍ර ශිල්පියෙකුගේ නිර්මාණාත්මක පරිණතභාවයේ දෘශ්‍ය විලාසයකි. එය සර්පයෙකුගේ කඳෙහි සනත්වය ගොඩනැගිය හැකි ඉතා සරලම, හස්ත කෞශල්‍යයෙන් යුතු, පුහුණුව ලද ශිල්පියෙකුගේ දෘශ්‍ය නිර්මාණ සාක්ෂරතාවය පෙන්විය හැකි හොඳම හා පහසුම ශිල්ප ක්‍රමයයි.

වසම්මලේ නාග රුවෙහි කඳ වක්‍ර හැඩය නැවත වක්‍රයක් බවට පත්වන ආකාරයට පිහිටුවා ගෙන ඇති නිසා (මුරගලෙහි සර්ප රුවෙහි කඳ පිහිටි ආකාරයට) එම තිත් සමූහය එක ලක්ෂ්‍යයක සිට සමානව විසිරී යන ආකාරයටදැක්විය හැකි වන අතර එය බිතු සිතුවම් ශිල්පියෙකුගේ මූලික දෘශ්‍ය අධ්‍යනයෙහි පරිණත අවස්ථාවක් ලෙස සනිටුහන් කල හැකි ය. ගිරා පොකුණු හෙලෙහි නාග පෙණය හා කඳ ගොඩ නැගීමේ දී තිත භාවිත කළ ද එහිදී රේඛාව මගින් මූලික වක්‍ර හැඩය ගොඩ නගා ඇති අතර තිත නාගරාජයාගේ පෙණ කොරපොතු පිළිබඳව හැඟවීමේ සංඥාවක් ලෙස භාවිත කර ඇත. ගිරා පොකුණු හෙල බිතුසිතුවම්වල දී වසම්මලේ බිතු සිතුවම් වල මෙන් තිත් සීමිත ප්‍රමාණයක් භාවිතා කර හැඩය සනත්වය තීව්‍ර කරනු වෙනුවට තිත් විශාල ප්‍රමාණයක් යොදා හැඩතලය හා සනත්වය ගොඩනගනු ලැබ ඇත. වසම්මලේ බිතු සිතුවම් වල දී නාගයාගේ විශාල පෙණ ගොබයෙහි වක්‍ර බව හා නැමීම යන පෙණ ගොබයේ සනත්වය හැඟවීම සඳහා ද තිත භාවිත කර ඇත. මූලික රේඛා යුගලය, එක් පසෙක වන වෘත්තාකාර මෝස්තර රටාව අනෙක් පස මදක් අඳුරු කළ පෙන ගොබයේ කෙළවර අතර වන හැඩය හැඟවීම පිණිස සමාන පරතරයක් සහිතව රේඛා ආකාරයට තිත ගොඩනගා ඇත. එයින් පෙණ ගොබයේ සනත්වය හොඳින්ම නරඹන්නාට සංජානනය කෙරෙයි.

**රූපය 24**: සිලින්ඩරාකාර හැඩයක ඝනත්වය නිරූපනය කරන අකාරය, කඩදාසි මත රේඛා



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 25**: සිලින්ඩරාකාර වක්‍ර ස්වභාවය තිත් මගින් නිරූපනය කිරීම, කඩදාසි මත රේඛා



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

**රූපය 26**: නාගරුව, වසම්මලේ, බදාම මත සායම, 5 සියවස



මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022

වසම්මලේ නාගරුවෙහි කඳ වක්‍ර හැඩය නැවත වක්‍රයක් බවට පත්වන ආකාරයට පිහිටුවා ගෙන ඇති නිසා (මුරගලෙහි නාග රුවෙහි කඳ පිහිටි ආකාරයට) එම තිත් සමූහය එක ලක්ෂයක සිට සමානව විසිරී යන ආකාරයට දැක්විය හැකි ය. එය බිතු සිතුවම් ශිල්පියෙකුගේ මූලික දෘශ්‍ය අධ්‍යනයෙහි පරිනත අවස්ථාවක් ලෙස සනිටුහන් කළ හැකි ය. ගිරා පොකුණු හෙලෙහි නාග පෙනය හා කඳ ගොඩ නැගීමේ දී තිත භාවිත කළ ද එහිදී රේඛාව මගින් මූලික වක්‍ර හැඩය ගොඩ නගා ඇති අතර තිත නාගරාජයාගේ පෙන කොරපොතු පිළිබඳවව හැඟවීමේ සංඥාවක් ලෙස භාවිත කර ඇත. ගිරා පොකුණු හෙල බිතුසිතුවම් වල දී වසම්මලේ බිතු සිතුවම් වල මෙන් තිත් සීමිත ප්‍රමාණයක් භාවිතා කර හැඩය ඝනත්වය තීව්‍ර කරනු වෙනුවට තිත් විශාල ප්‍රමාණයක් යොදා හැඩතලය හා ඝනත්වය ගොඩනගනු ලැබ ඇත. වසම්මලේ බිතු සිතුවම් වල දී නාගයාගේ විශාල පෙන ගොබයෙහි වක්‍ර බව හා නැමීම යන පෙන ගොබයේ ඝනත්වය හැඟවීම සඳහා ද තිත භාවිත කර ඇත. මූලික රේඛා යුගලය, එක් පසෙක වන වෘර්තාකාර මෝස්තර රටාව අනෙක් පස මදක් අඳුරු කල පෙන ගොබයේ කෙලවර අතර වන හැඩය හැඟවීම පිණිස සමාන පරතරයක් සහිතව රේඛා ආකාරයට තිත ගොඩනගා ඇත. එයින් පෙන ගොබයේ ඝනත්වය හොඳින්ම නරඹන්නාට සංජානනය කෙරෙයි.

**නිගමනය**

වසම්මලේ, ගිරා පොකුණු හෙල හා කුඩුම්බිගල යන බිතු සිතුවම් ස්ථානවල නාග රුව චිත්‍රණය කිරීමේදී, පෙන ගොබ රාශියක් යොදාගැනීම, ස්වාභාවිකත්වය නිර්මාණශීලීව යොදාගත් ආකාරය, නිදහස් රේඛාව, ඝනත්වය ගොඩනැගීම ආදිය චිත්‍ර ශිල්පියා විසින් යොදාගත් දෘශ්‍යමය ආඛ්‍යානයන් ලෙස හඳුනාගත හැකි ය. ඒවා දෘශ්‍යමය විශ්ලේෂණයකට ලක්කිරීමේදී චිත්‍ර ශිල්පියා සතු නිර්මාණ ශබ්‍යතාවන් මැනවින් විශද කෙරේ.

**සමුද්දේශ**


අදිකාරම්, ඊ. ඩබ්ලිව්. (1963). *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාස.* ජේ.කේ.ජී. ජයවර්ධන සහ සමාගම. කොළඹ.

අමරතුංග, වී. (1993). *ශ්‍රී ලංකාවේ සිතුවම් හා මූර්ති.* ආරිය ප්‍රකාශකයෝ. වරකාපොල.

ඇන්තනී., ජේ. (2006). *මහා සිංහලේ වංසකතාව.* ඇම්.ඩී.ගුණසේන සහ සමාගම. කොළඹ.

උල්ලුවිස්හේවා., පී. (2013). *සිත්තම් කලා විචාරය.* එස්. ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන.

කුමාරස්වාමි, ඒ. කේ. (1962) *මධ්‍යකාලීන සිංහල කලා.* සෝමරත්න., එච්.ඇම්. (පරි.). සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. කොළඹ.

ගමගේ, එස්. අයි. (2013). *සිංහල සාහිත්‍යය ඉතිහාසය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන.

ගයිගර්., වී. (1969). *මධ්‍යකාලීන සිංහල සංස්කෘතිය.* ආරියපාල., ඇම්.බී. (පරි.). ඇම්.ඩී.ගුණසේන සහ සමාගම. කොළඹ.

ගුරුළුගෝමීන්. (2017). *අමාවතුර.* සෝරත හිමි., වී. (සංස්.). ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන.

චාර්ල්ස්., එස්. පී. (2000). *පාරම්පරික සිංහල බිතු සිතුවම්.* මධ්‍යම සංස්කෘතික අරමුදල. කොළඹ.

චන්දවිමල., ආර්. (2015). පටිච්ඡ සමුප්පාද විවරණය. ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය. කොළඹ.

චන්දවිමල., ආර්. (2015). *ධර්ම විනිශ්චය.* ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය. කොළඹ.

පරණවිතාන., එස්. (1963). *ලංකාවේ ස්ථූපය.* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. කොළඹ.

පීරිස්., එම්. එම්. ඩී. (2007). *ශ්‍රී ලාංකේය චිත්‍ර සම්ප්‍රදාය.* ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව. කොළඹ.

බෂාම්. ඒ. එල්. (1995). *අසිරිමත් ඉන්දියාව.* (පරි.) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. කොළඹ.

බුද්ධඝෝෂ. (2017). *විශුද්ධි මාර්ගය.* ධර්මකීර්ති හිමි. (සංස්.) එන්.එස්.බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. කොළඹ.

*මහාවංශය සිංහල.* (2012). සුමංගල හිමි.,එච්.එස්. දේවරක්ෂිත.,බී. අබේරත්න.,ඩී.එච්.ඇස්., විජේසේකර., එන්. (සංස්.). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. කොළඹ.

මද්දුමාගේ., එම්. (1998). *සිතුවම් කලා අධ්‍යයනය.* එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මෙධානන්ද., ඒ. (2008). *නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය.* දයාවංශ ජයකොඩි සහ සමාගම.

මංජු ශ්‍රී., එල්. ටී. පී. (1977). *ලංකා බිතුසිතුවම් සටහන්.* ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය. කොළඹ.

මෙධානන්ද., ඒ. (2005). *ඓතිහාසික කුඩුම්බිගල.* දයාවංශ ජයකොඩි සහ සමාගම. කොළඹ.

මල්දෙණිය., එස්. ජී. (2016). *පොලොන්නරුවේ පැරණි ස්මාරකයන් හි චිත්‍රගත සැරසිලි මෝස්තර.* කර්තෘ ප්‍රකාශණ.

මුදලිගේ., ජී. එස්. ටී. (2014). *ලක්දිව බිතුසිතුවම්.* සූරිය ප්‍රකාශකයෝ. මරදාන.

විද්‍යාචක්‍රවර්තීන්. (2001 ). *අමෘතාවහ නම් බුද්ධ චරිතය හෙවත් බුත්සරණ.* තිලකසිරි ,එස්., සහ මනම්පේරි, පී. (සංස්.). රත්න පොත් ප්‍රකාශකයෝ. මරදාන.

විද්‍යාචක්‍රවර්තීන්. (2012). *අමෘතාවහ නම් වූ බුත්සරණ.* සෝරත හිමි., වී. (සංස්.). එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසේකර, එන්. (1964). *පැරණි සිංහල බිතුසිතුවම්.* ක්‍රිසැන්තස්., ඇස්. ඩී.ටී. (පරි.). රාජ්‍යය භාෂා දෙපාර්තමේන්තුව. කොළඹ.

සන්නස්ගල, පී. බී. (1964). *සිංහල සාහිත්‍යය වංශය.* ලේක්හවුස් මුද්‍රණාලය. කොළඹ.

සංඝරාජ., වී. (2009). *මෙතේ බුදු සිරිත නම් වූ අනාගතවංශය.* වටද්දර හිමි, එම්. (සංස්.). ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන.

සුමනජෝති., ජී. (1957). *සැළලිහිණි සන්දේශය.* ප්‍රකාශක නාමය සඳහන්ව නැත.

සෙනෙවිරත්න., ඒ. (2001). *සිංහල ශිෂ්ටාචාරයේ උදාගිර මිහින්තලාව.* එස්. ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන.

සෙනෙවිරත්න., ඒ. (2002). *පුරාණ අනුරාධපුරය.* ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන.

ස්ට්‍රෝං., ජේ. එස්. (2008). *බුද්ධ චරිතය.* ජයරත්න., පී. (අනුවා.). සංහිඳ මුද්‍රණ හා ප්‍රකාශන. කොළඹ.

හේවාපතිරණ., ඩී. (2012). *ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. කොළඹ.

හෝල්ට්., ජේ. කේ. (1994). *මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය.* මීගස්කුඹුර., පී.බී. (පරි.). ප්‍රදීප ප්‍රකාශකයෝ. මරදාන.

Bahl, S. K. (2012). *5000 years of INDIAN ART.* Roli Books.

Bandaranayake., S. (2006). *The Rock and Wall paintings of Sri Lanka.* Stamford Lake (pvt) Ltd. Pannipitiya.

### *ලිපි*

ජානගේ, වී. (2000- දෙසැම්බර්). නාග වන්දනයේ ඓතිහාසික පසුබිම හා නාග සංකේත. *නිශ්ශංක.* 1 (1), 64-72.

වජිර, එච්. (1995 ජනවාරි මාර්තු). ශ්‍රී ලංකාවේ පැරණි බිතු සිතුවම් සඳහා තලය සකසා ගැනීම. *සංස්කෘතික පුරාණය.* 1(12), 14-16.

සිල්වා, ආර්. ඩී. (1990). චිත්‍ර කලාව - ආදි යුගය ක්‍රි:පූ: 247-ක්‍රි:ව: 800 තෙක්. *චිත්‍ර කලාව.* 5, 3-49.

ස්ථාන නාම ලේඛන, වාර්තා, විශ්ව කෝෂ හා තොරතුරු පත්‍රිකා

සිංහල විශ්ව කෝෂය. (2006). ධර්මසිරි,ඒ. උල්ලුවිස්හේවා,පී. බණ්ඩාර,එස්. චිත්‍ර කලාව. *සිංහල විශ්ව කෝෂය.* (11). 99-195.

නිකලස්, සී. ඩබ්ලිව්. (1979). *පුරාතන හා මධ්‍යකාලීන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය.* කොළඹ.